
# විවාහය සහ පවුලේ සම්බන්ධතා

## සහභාගිවන්නාගේ අධ්‍යයන උපදේශක පොත



# විවාහය සහ පවුලේ සම්බන්ධතා

## සහභාගිවන්නාගේ අධ්‍යයන උපදේශක පොත

ප්‍රකාශනය
යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසු-දවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාව විසිනි
සෝල්ට් ලේක් නගරය, යූටා

**අදහස් සහ යෝජනා**

මෙම අධ්‍යයන උපදේශක පොත ගැන ඔබගේ අදහස් සහ යෝජනා අගයකරනු ලැබේ. කරුණාකර ඒවා මෙසේ ඉදිරිපත් කරන්නඃ

Curriculum Planning
50 East North Temple Street, Floor 24
Salt Lake City, UT 84150-3200
USA

ඊ-මේල්ඃ cur-development@ldschurch.org

කරුණාකර ඔබගේ නම, ලිපිනය, කොට්ඨාශය සහ ස්ටේකය සඳහන් කරන්න. අධ්‍යයන උපදෙස් පොතේ මාතෘකාව සඳහන්කිරීමට වගබලාගන්න. ඉන්පසු අධ්‍යයන උපදෙස් පොතේ ශක්තිය ගැන සහ එය දියුණුකල හැකි අංශ ගැන ඔබගේ අදහස් සහ යෝජනා ඉදිරිපත්කරන්න.

උපුටාගැනීම
© 2006 Intellectual Reserve, Inc. විසිනි.
සියලු හිමිකම් ඇව්රිනි
ඇමෙරිකා එක්සත් ජනපදයේ මුද්‍රණයකරන ලදී

ඉංග්‍රීසි අනුමැතියඃ 8/97
පරිවර්තන අනුමැතියඃ 8/97
*Marriage and Family Relations: Participant’s Study Guide* පරිවර්තනයයි
Sinhala

# පටුන

"පවුලඃ ලෝකයට ප්‍රකාශනයකි" . . . . . . iv
හැඳින්වීම. . . . . . v
විවාහය සහ පවුල් සම්බන්ධතා පාඨමාලාව නිරීක්ෂනයකිරීම . . . . . . vii

**අ කොටසඃ විවාහ ශක්තිමත්කිරීම**

1. "පවුල මැවුම්කරුවාණන්ගේ සැලසුමේ කේන්ද්‍රස්ථානයයි" . . . . . . 3
2. විවාහයේ එක්සත්කම වැඩිදියුණුකිරීම . . . . . . 8
3. විවාහයේ ප්‍රේමය සහ මිත්‍රත්වය පෝෂණයකිරීම . . . . . . 12
4. විවාහයේ අභියෝගවලට ප්‍රතිචාර දැක්වීම . . . . . . 16
5. අභියෝගවලට සුහවාදීව කථාකිරීම මගින් ප්‍රතිචාර දැක්වීම. . . . . . 19
6. ඇදහිල්ල සහ යාච්ඤා තුලින් විවාහ ශක්තිමත්කිරීම . . . . . . 23
7. කමාවේ සුවකිරීමේ බලය. . . . . . 27
8. පවුලේ මුදල් පාලනය . . . . . . 30

**ආ කොටසඃ පවුල් ශක්තිමත්කිරීමේ දෙමාපිය වගකීම්**

9. "දරුවෝ ස්වාමීන්වහන්සේ දෙන උරුමයක්ය" . . . . . . 39
10. පියවරුන් සහ මවුවරුන්ගේ පූජනීය කාර්‍යභාරය (1වෙනි කොටස; පියාගේ කාර්‍යභාරය) . . . . . . 44
11. පියවරුන් සහ මවුවරුන්ගේ පූජනීය කාර්‍යභාරය (2වෙනි කොටසඃ මවගේ කාර්‍යභාරය). . . . . . 49
12. ආදර්ශය සහ උපදේශය තුලින් ළමුන්ට ඉගැන්වීම . . . . . . 54
13. සුහාරංචි මූලධර්ම ළමුන්ට ඉගැන්වීම (1වෙනි කොටස). . . . . . 61
14. සුහාරංචි මූලධර්ම ළමුන්ට ඉගැන්වීම 2වෙනි කොටස). . . . . . 66
15. ළමයින් තීරණ ගැනීමේදී ඔවුන්ට මගපෙන්වීම . . . . . . 72
16. පවුලේ යාච්ඤාව, පවුලේ ශුද්ධ ලියවිලි අධ්‍යයනය, සහ පවුල් නිවාස සැන්දෑව. . . . . . 76

## පවුල

# ලෝකයට ප්‍රකාශණයකි

### යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසු-දවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාවේ පළවෙනි සභාපතිත්වය සහ ප්‍රේරිතයන් දොළොස්දෙනාගේ සභාව

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසු-දවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාවේ පළවෙනි සභාපතිත්වය සහ ප්‍රේරිතයන් දොළොස්දෙනාගේ සභාව වන අපි, ගරු ගාම්භීරව ප්‍රකාශකරන්නේ, මිනිසෙකු සහ ගැහැණියක අතර විවාහය, දෙවියන්වහන්සේ විසින් නියමකරන ලද බවත්, පවුල, උන්වහන්සේගේ දරුවන්ගේ සදාකාලික ගමනාන්තය සඳහා වන මැවුම්කරුවාණන්ගේ සැලසුමේ කේන්ද්‍රස්ථානය වන බවත්ය.

සෑම මනුෂ්‍ය වර්ගයාම—ස්ත්‍රී සහ පුරුෂ—මවා තිබෙන්නේ දෙවියන්වහන්සේගේ ප්‍රතිරූපයෙනි. හැම කෙනෙක්ම ස්වර්ගික දෙමව්පියන්ගේ ආදරණීය පුත්‍රයෙකු හෝ දියණියක වන බැවින් හැම කෙනෙකුටම දිව්‍යමය ස්වභාවයක් සහ ගමනාන්තයක් ඇත. ස්ත්‍රී පුරුෂ භාවය පුද්ගලයෙකුගේ, මැරෙන සුළු ජීවිතයට පෙර ජීවිතය, මැරෙන සුළු ජීවිතය සහ සදාකාලික ජීවිතයේ හඳුනාගැනීමට සහ අරමුණු සඳහා වන අත්‍යාවශ්‍ය විශේෂ ලක්ෂණයකි.

මරණයට පෙර ජීවිතයේ රාජ්‍යය තුල, ආත්මික පුත්‍රයෝ සහ දියණියෝ දෙවියන්වහන්සේ තම සදාකාලික පියාණන් බව හැඳිනගෙන නමස්කාර කල අතර, උන්වහන්සේගේ දරුවන්ට භෞතික ශරීරයක් ලබාගෙන සම්පූර්ණත්වය කරා වර්ධනයවීමට, පෙළොව මත අත්දැකීම් ලබාගැනීම සඳහා වන උන්වහන්සේගේ සැලසුමද පිළිගත්හ. තවද අවසානයේදී ඔහුගේ හෝ ඇයගේ දිව්‍යමය ගමනාන්තය සදාකාලික ජීවිතයේ උරුමයක් බවද අවබෝධකර ගනිති. සතුට ලැබීමේ දිව්‍යමය සැලසුම මගින් පවුල් සම්බන්ධතාවයන් සොහොන් ගෙයින් එපිටට පවත්වාගැනීමට හැකියාව ලබාදෙයි. ශුද්ධවූ දේව මාළිගාවල තිබෙන්නාවූ පූජනීය නියෝග සහ ගිවිසුම් මගින් යම් පුද්ගලයෙකුට දෙවියන්වහන්සේ වෙත නැවත යාමටත්, පවුල්වලට සදාකාලිකවම එක්වීමටත් හැකියාව ලබාදෙයි.

දෙවියන්වහන්සේ ආදම්ට සහ ඒවට දුන් පළමු නියෝගය, ස්වාමි පුරුෂයා සහ භාර්යාව වශයෙන් දෙමාපිය තත්වයට පත්වීමට ඔවුන් තුල තිබූ හැකියාවට අදාළව පවතී. දෙවියන්වහන්සේ විසින් සිය දරුවන්ට, වැඩිවෙමින් පොළාව සම්පූර්ණකිරීමට දුන් නියෝගය ක්‍රියාත්මකව පවතින බව අපි ප්‍රකාශ කරන්නෙමු. අපි තවදුරටත් ප්‍රකාශ කරන්නේ, පූජනීයවූ ප්‍රජනන ශක්තිය පාවිච්චිකල යුත්තේ, ස්වාමි පුරුෂයා සහ භාර්යාව වශයෙන් නීත්‍යානුකූලව විවාහවූ පුරුෂයෙක් සහ ස්ත්‍රියක අතර පමණක් බවය.

මැරෙන සුළු ජීවිතය නිර්මානය කලේ දේවත්වය ලබාදීමට බව අපි ප්‍රකාශ කරන්නෙමු. ජීවිතයේ පවිත්‍රතාවය සහ දෙවියන්වහන්සේගේ සදාකාලික සැලසුමට එහි ඇති වැදගත්කම ගැන අපි සහතික කරන්නෙමු.

ස්වාමි පුරුෂයා සහ භාර්යාවට තමන් එකිනෙකා වෙනුවෙනුත්, ඔවුන්ගේ දරුවන් වෙනුවෙනුත් ප්‍රේමයෙන් සැලකීමේ ගරු ගාම්භීර වගකීමක් ඇත. දරුවෝ ස්වාමීන්වහන්සේ දෙන උරුමයක්ය (ගීතාවලිය 127:3). දෙමාපියන්ට සිය දරුවන් ප්‍රේමයෙන් සහ ධාර්මිකව හදාවඩා ගැනීමේත්, ඔවුන්ගේ ශාරීරික සහ ආත්මික අවශ්‍යතාවයන් සපයාදීම, එකිනෙකාට ප්‍රේමයෙන් යුතුව සේවය කිරීමට ඔවුන්ට ඉගැන්වීම, දෙවියන්වහන්සේගේ පණත් පිළිපැදීම සහ ඔවුන් කොතැනක ජීවත්වුවද, නීතිගරුක රටවැසියන් ලෙස ජීවත්වීමට සැලැස්වීමේත් පූජනීය වගකීමක් ඇත. මෙම යුතුකම් ඉටුකිරීමේදී, ස්වාමි පුරුෂයෝ සහ භාර්යාවෝද, මව්වරු සහ පියවරුද දෙවියන්වහන්සේ ඉදිරියේ වගකිව යුතු වන්නෝය.

පවුල දෙවියන්වහන්සේගේ නියමයක්වේ. පුරුෂයෙකු සහ ස්ත්‍රියක අතර සිදුවන විවාහය උන්වහන්සේගේ සදාකාලික සැලසුමට අත්‍යාවශ්‍යවේ. දරුවෝ විවාහ බන්ධනය ඇතුළත ඉපිද, විවාහ පොරොන්දුවලට භක්තියෙන් යුතුව ගරුකරන පියෙකු සහ මවක මගින් ඇතිදැඩිවේ. විවාහ ජීවිතයේ සතුට වඩාත් හොඳින් ඉටුකරගත හැක්කේ, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ඉගැන්වීම් මත ගොඩනගා ගත් විටදීය. සාර්ථක විවාහ සහ පවුල් පවත්වාගත හැක්කේ, ඇදහිල්ල, යාච්ඥාව, පසුතැවිල්ල, සමාවදීම, ගරුකිරීම, ප්‍රේමය, දයාව, වැඩකිරීම සහ යහපත් විනෝදාත්මක වැඩසටහන් යන මූලධර්මයන් මත ගොඩනගාගත් විටදීය. දිව්‍යමය සැලසුමට අනුව පියවරු, ප්‍රේමයෙන් සහ ධාර්මිකව සිය පවුල්වල මූලිකත්වය උසුලමින්, ජීවිතයේ අවශ්‍යතාවයන් සපයාදීම මෙන්ම, සිය පවුල්වලට ආරක්ෂාව ලබාදීම ගැනද වගකිව යුතුය. මෙම පූජනීය වගකීම්වලදී පියවරු සහ මවුවරු, සමාන කොටස්කරුවන් ලෙස එකිනෙකාට උපකාරකිරීමට බැඳී සිටිති. ආබාධිතවීම, මරණයට පත්වීම හෝ එවන් වෙනත් තත්වයන්හිදී පෞද්ගලික සකස්කර ගැනීම අවශ්‍යව පවතී. අවශ්‍යවූ විටදී ඥාති පවුල්වල උපකාරයද ලබාදිය යුතුය.

පතිවෘත්තාවේ ගිවිසුම් කඩකරන, භාර්යාවට හෝ පුරුෂයාට හෝ දරුවන්ට අපවාද නගන හෝ පවුලේ වගකීම් පැහැර හරින පුද්ගලයාට යම් දිනෙක දෙවියන්වහන්සේ ඉදිරියේ වගකීමට සිදුවන බවට අපි අනතුරු හඟවන්නෙමු. එසේම පවුලක් කැඩී බිඳී යාමෙන් පුද්ගලයන්ටද, සමාජයට සහ ජාතීන්ටද පැරණි මෙන්ම නූතන අනාගතවක්තෘවරුන්ගේ අනාවැකි පරිදි මහත් විපත්තීන් පැමිණෙන බවටද අපි තව දුරටත් අනතුරු අඟවන්නෙමු.

සමාජයේ මූලික ඒකකයක් වශයෙන් පවුල පවත්වාගෙන ශක්තිමත්කිරීම සඳහා සැලසුම්කර තිබෙන මෙම ක්‍රියාදාමයන් වැඩිදියුණුකරන මෙන් සෑම තැනකම සිටින රටවැසියන්ගෙන්ද, රාජ්‍ය නිලධාරීන්ගෙන්ද අපි ඉල්ලා සිටිමු.

*මෙම ප්‍රකාශනය සභාපති ගෝර්ඩන් බී. හින්ක්ලි විසින් ඔහුගේ පණිවුඩයේ කොටසක් ලෙස, 1995 සැප්තැම්බර් 23 වෙනි දින යුටා, සොල්ට් ලේක් නගරයේ පවත්වන ලද ප්‍රධාන සහන සමිතියේ රැස්වීමේදී කියවන ලදී.*

# හැඳින්වීම

**මෙම පාඨමාලාවේ අරමුණ**

විවාහය සහ පවුල් සම්බන්ධතා පාඨමාලාව සැලසුම්කර තිබෙන්නේ, විවාහ සහ පවුල් ශක්තිමත්කර ඔවුන්ගේ පවුල් සම්බන්ධතාවයන් තුලින් ප්‍රීතිය භුක්තිවිඳීමට සහා සාමාජිකයන්ට උපකාර කිරීමය. එය කොටස් දෙකකට බෙදා ඇත. අ කොටස, "විවාහ ශක්තිමත්කිරීම," විශේෂයෙන්ම විවාහක ජෝඩුවලට සහ විවාහවීමට සූදානම්වන සාමාජිකයන් සඳහා ප්‍රයෝජනවත් වේ. ආ කොටස, "පවුල් ශක්තිමත්කිරීම සඳහා දෙමාපිය වගකීම්," දෙමාපියන්ට සහ මුත්තා සහ මිත්තනියන්ට "ස්වාමීන් වහන්සේගේ හික්මීමෙන්ද, අවවාදයෙන්ද [ළමුන්] ඇති දැඩිකිරීමට" ඔවුන් දරන උත්සාහයන්ට ආධාරකරයි. (එපීස 6:4).

මෙම පාඨමාලාව, ශුද්ධ ලියවිලිවල සහ පසු-දවස්වල අනාගතවක්තෘවරුන් සහ ප්‍රේරිතවරුන් උගන්වන ලද දහම් කරුණු සහ මූලධර්ම මත පදනම්වී ඇත. එමගින් විශේෂ අවධානයක් "පවුලඃ ලෝකයට ප්‍රකාශනයකි" යන්නට ලබාදී ඇති අතර, එය මෙම අධ්‍යයන උපදෙස් පොතේ 00 (iv) වෙනි පිටුවේ ඇතුළත්කර ඇත.

පාඨමාලාව නැවත බැලීම සඳහා, බලන්න පිටු vii–viii. මෙයට නිතරම යොමුවී, ඔබ ඉගෙනගත් දහම් සහ මූලධර්ම සමාලෝචනයකර මතු පාඩම්වලට ඔබව සූදානම්කරගන්න.

**ඔබගේම අවශ්‍යතාවයන් මත පාඨමාලාවට යොමුවීම**

ඔබගේ පෞද්ගලික අවශ්‍යතාවයන් අනුව යොමුවීම ඔබට තෝරාගත හැකිය. උදාහරණයක් ලෙස, ඔබ විවාහක නමුත් ළමයින් නැති නම්, පළවෙනි පාඩම් අටට යොමුවී ඒවා තෝරාගැනීමට ඔබට හැකිය, නමුත් අවසාන පාඩම් අට නොවේ. ඔබ තනි දෙමාපියෙක් නම්, ආ කොටසේ පාඩම්වලට පමණක් යොමුවීමට තීරණයකිරීමට ඔබට හැකිය.

**පාඨමාලාවට සහභාගීවීම**

මෙම පාඨමාලාවට සහාභාගිවීම තෝරාගැනීම මගින්, ඔබගේ පවුල ශක්තිමත්කිරීමට ආශාව ඔබ ප්‍රදර්ශනයකර ඇත. පාඨමාලාවේ සම්පූර්ණ ප්‍රයෝජනය ලැබීම සඳහා, පංති සාකච්ඡාවලට මෙම අධ්‍යයන උපදෙස් පොත පාවිච්චිකර, ඔබ ඉගෙනගන්නා දහම සහ මූලධර්ම යොදාගැනීමට පරිශ්‍රමදැරීම ඔබට අවශ්‍යවනු ඇත.

*පංති සාකච්ඡාවලට දායකවීම*

ඔබ සහ වෙනත් සහභාගිවන්නන් පංති සාකච්ඡාවලට දායකවන විට, ශුද්ධාත්මයාණන්ගේ පෙළඹවීමට ආරාධනාකර, එකිනෙකාට උගන්වා ඔවුන් ඥානයෙන් දියුණුකිරීමට ඔබට හැකියාව ලැබෙනු ඇත. ස්වාමීන්වහන්සේ මෙසේ කීසේක, ඔබ අතරෙන් ගුරුවරයෙකු පත්කර, සැමදෙනාටම එකවර කථා කිරීමට ඉඩ නොදෙන්න; නමුත් වරකට එක් කෙනෙකු කථාකිරීමට ඉඩදී, සියල්ලන්ටම ඔහුගේ කීම්වලට සවන්දීමට සලස්වන්න, එම සියල්ලෝම කථාකර නිමවී සියල්ලෝ සියල්ලන්ම ඥානයෙන් දියුණුකල පසු, එවිට සැම මිනිසෙකුටම සමාන වරප්‍රසාදයක් ලැබෙනු ඇත (බලන්න ඩීසහගී 88:122).

පාඩම්වලට සහභාගිවන සියල්ලන්ටම, ඔවුන්ගේ විවාහය සහ දරුවන් හදාවඩාගැනීමේ අත්දැකීම් නොසළකා එකිනෙකාගෙන් ඉගෙනගත හැකිය. පංති කාමරය තුල ඔබ ලබන අත්දැකීම් වඩාත් ප්‍රතිඵලදායක වන්නේ, පාඩම්වලට සම්බන්ධ අත්දැකීම් ඔබ බෙදාගෙන අන් අය කරන ලෙස ගෞරවයෙන් යුතුව සවන්දීමන්ය. සාකච්ඡාකල සත්‍යයන් ගැන ඔබ සාක්ෂිදරන විට, ඔබගේ සාක්ෂිය මෙන්ම අන් අයගේද සාක්ෂි ශක්තිමත්කිරීමට ඔබට හැකිය. කෙසේ වෙතත්, පංති සාකච්ඡාවට සුදුසු නොවන රහස්‍ය හෝ පූජනීය අත්දැකීම් සාකච්ඡා නොකිරීමට ඔබ ප්‍රවේශම්විය යුතුය. පංතියේ කාලසීමාව ගැන සහ ගුරුවරයා සහ අනෙක් සහභාගිවන්නන් ගැනද ඔබ සැලකිලිමත් විය යුතුය.

*මෙම අධ්‍යයන උපදෙස් පොත පාවිච්චිකිරීම*

හැම සතියකම පාඩමට පසුව, මෙම අධ්‍යයන උපදෙස් පොත පාවිච්චිකරමින් ඔබ ඉගෙනගත් දෙය සමාලෝචනය කරන්න. අධ්‍යයන උපදෙස් පොතට "අදාළකරගැනීමට අදහස් ඇතුළත්වේ, ඒවා ඔබ ඉගෙනගත් හැම පාඩමකම එන දහම සහ මූලධර්ම අනුව ජීවත්වීමට ඔබට උපකාරවත්වන යෝජනාවේ. ඊට අමතරව, හැම පාඩමකම සභාවේ ප්‍රධාන අධිකාරීත්වයේ ලිපියක් හෝ දෙකක්ද එහි ඇතුළත්ය. ඔබ විවාහක නම්, එම ලිපි ඔබගේ සහකරු සමග කියවා සාකච්ඡාකිරීමෙන් ඔබට විශාල ප්‍රයෝජනද ලබාගත හැකිය.

සමහර ලිපි ප්‍රධාන සම්මන්ත්‍රනවලදී සහ වෙනත් එවැනි අවස්ථාවලදී කල මුල් දේශනා වන අතර, අනෙක් ඒවා සභා සඟරාවලට ලියන ලද ඒවාය. ඒවා විවිධ ප්‍රකාශනවලින් ලබාගෙන තිබෙන බැවින්, මෙම අධ්‍යයන

උපදෙස් පොත අනුරූපව සකස්කිරීමේදී මඳ වෙනස්කම්කිරීම අවශ්‍යව තිබිනි. උදාහරණයක් ලෙස, ප්‍රධාන සම්මන්ත්‍රන ප්‍රකාශවල සමහර හැඳින්වීමේ අදහස් ඉවත්කර ඇති අතර, සමහර මාතෘකා සහ අදහස් වෙනස්කර ඇත. ඉගැන්වීම්වල වෙනස්කම් කර නොමැත.

*ඔබ ඉගෙනගන්නා දහම සහ මූලධර්ම අදාළකරගැනීම*

සුභාරංචිය හුදෙක් ඉගෙනගැනීම පමණක් ප්‍රමාණවත් නැත.මන්ද සුභාරංචිය ඔබගේ ජීවිතයේ ප්‍රතිඵලදායකවීම සඳහා, ඔබ ඉගෙනගත් දෙය අනුව ඔබ ජීවත්විය යුතුය. හැරල්ඩ් බී. ලී සභාපතිවරයා, සභාවේ 11වෙනි සභාපතිවරයා මෙසේ උපදෙස් දුන්නේය:

"සුභාරංචියේ සියලුම මූලධර්ම සහ නියෝග එක් අයුරකින් සුභාරංචියේ ඉගැන්වීම් අනුව ජීවත්වෙමින් සුභාරංචිය ඉගෙනගැනීමට ආරාධනාවකි. කිසි පුද්ගලයෙක් දසයෙන් කොටස මූලධර්මය ගැන ඔහු තම දසයෙන් කොටස ගෙවන තුරු නොදනියි. යමෙක් ප්‍රඥාවේ වචනය ආරක්ෂාකරන තුරු, ඔහු ප්‍රඥාවේ වචනය ගැන නොදනියි. ළමුන් හෝ වැඩෙන අය, දසයෙන් කොටස, ප්‍රඥාවේ වචනය, සබත් දිනය ශුද්ධව තබාගැනීම, හෝ යාච්ඤාව යන මෙම මූලධර්ම යමෙක් කථාකරනු ඇසීමෙන් පමණක් අවබෝධයක් ලබා නොගනි. අප සුභාරංචිය ඉගෙනගන්නේ ඒ අනුව ජීවත්වීමෙනි….

"…සුභාරංචියේ මෙම ඉගැන්වීම්වල හැම මූලධර්මයක්ම අනුව ජීවත්වීමෙන් ලැබෙන ආශිර්වාද අත්දකින තුරු අපට ඒවා ගැන කිසිවක් සැබවින්ම දැනගැනීමට නොහැකිය" (*Stand Ye in Holy Places* [1974], 215).

### අමතර උපකාරක

සභාව ලබාදෙන පහත සඳහන් උපකාරක මෙම පාඨමාලාවේ සාකච්ඡාවන මාතෘකා ගැන අමතර තොරතුරු ලබාදෙයි. ඒවා සභා බෙදාහැරීමේ මධ්‍යස්ථානවලින් ලබාගත හැකිය. මෙම ප්‍රකාශන ලබාගෙන ඒවා ඔබගේ නිවසේ පාවිච්චිකිරීමට ඔබට අවශ්‍යවිය හැකිය.

- *පවුලේ උපදෙස් පොත* (31180). මෙම උපදෙස් පොත, පවුල නම් සංවිධානය ගැන විස්තරකරමින්, නිවසේදී සුභාරංචිය ඉගැන්වීම ගැන තොරතුරු සපයා, පූජකවරයේ නියෝග සහ ආශිර්වාද සඳහා ක්‍රියාමාර්ගද පෙන්වා දෙයි.
- විවාහය සහ පවුල ගැන සභා සඟරාවල ඇතුලත් ලිපි.
- පවුල් නිවාස සැන්දෑව උපකාරක පොත (31106). මෙම පොත දෙමාපියන්ට ළමුන්ට පාඩම්වලට සූදානම්වීමට උපකාරකරයි. family home evening සඳහා (පිටු 3–160, 173–232). එහි පවුල් නිවාස සැන්දෑව සාර්ථක කරගැනීමට අදහස් ඇතුළත්වේ (පිටු 163–70) තවද ළමුන්ට මූලධර්ම සහ වගකීම් ඉගැන්වීම සඳහා නියමිත යෝජනාද ඇතුළත්ව ඇත (පිටු 235–62). එහි පවුලේ ක්‍රියාකාරකම් සඳහා අදහස්ද ඇතුළත්ව ඇත. (පිටු 265–340).
- *ඉගැන්වීමට වඩා ශ්‍රේෂ්ඨ කැඳවීමක් නැත* (36123). මෙම උපකාරකයේ සභා සාමාජිකයන්ව ශුභාරංචි ගුරුවරුන් ලෙස දියුණුකිරීම සඳහා උපකාරවත් මූලධර්ම සහ ප්‍රායෝගික යෝජනාද ඇතුළත්ව ඇත. ඈ කොටස, "නිවස තුල ඉගැන්වීම" (පිටු 125–48), විශේෂයෙන්ම දෙමාපියන්ට ප්‍රයෝජනවත්වේ.
- *ඉගැන්වීමේ උපදෙස් පොත* (34595). මෙම උපදෙස් පොත ශුභාරංචි ඉගැන්වීම් දියුණුකරගැනීමට සහ ඉගෙනගැනීමට යෝජනා සපයයි.
- *තරුණයන් ශක්තිමත්කිරීම සඳහා* (34285). මෙම පත්‍රිකාව දින යෙදීම, ඇඳුම් සහ බාහිර පෙනුම, මිත්‍රත්වය ඇතිකරගැනීම, අවංකකම, භාෂාව, මාධ්‍යය, චෛතසික සහ ශාරීරික සුවය, සංගීතය සහ රංගනය, ලිංගික පවිත්‍රතාවය, ඉරුදින හැසිරීම, පසුතැවිල්ල, සුදුසුතාවය, සහ සේවය ගැන සභාවේ ප්‍රමිතීන් පෙන්වා දෙයි.
- *දෙමාපියන්ගේ උපදෙස් පොත* (31125). තම දරුවන්ට ශාරීරික වැඩීම ගැන ඉගැන්වීමට දෙමාපියන්ට උපකාරවත්වන යෝජනා මෙම අත් පොතේ ඇතුළත්ව ඇත.
- *ප්‍රීතිමත් නිවසක කොන් ගල්* (33108). මෙම පත්‍රිකාවේ ගෝර්ඩන් බී. හින්ක්ලි සභාපතිවරයා පළවෙනි සභාපතිත්වයේ දෙවන උපදේශකවරයෙකු ලෙස සේවයකරන විටදී කළ ප්‍රකාශ ඇතුලත්වේ.
- *මුදල් සඳහා එකක්: පවුලේ මුදල් සඳහා උපදෙස් පොත* (33293). ප්‍රේරිතවරුන් දොළොස්දෙනාගේ ගණපූර්ණයේ වැඩිහිටි මර්වින් ජේ. ඈෂ්ටන්ගේ මෙම පත්‍රිකාව, පවුලේ මුදල් පාලනය ගැන ප්‍රායෝගික යෝජනා සපයයි.

# විවාහය සහ පවුල් සම්බන්ධතා පාඨමාලාව නිරීක්ෂණය කිරීම

## ආ කොටසඃ විවාහ ශක්තිමත්කිරීම

### 1 වෙනි පාඩමඃ "පවුල මැවුම්කරුවාණන්ගේ සැලසුමේ කේන්ද්‍රස්ථාන යි"

විවාහය සහ පවුලේ ඇති සදාකාලීන වැදගත්කම ගැන පසු-දවස්වල අනාගතවක්තෘවරු ප්‍රකාශකරති.

සදාකාලික විවාහයට, මෙම ජීවිතයේ සහ සදාකාලය මුළුල්ලේම සතුට සහ ආශිර්වාද රැගෙන ඒමට පුළුවන.

විවාහය සහ පවුල් සම්බන්ධතා පාඨමාලාව සැලසුම්කර තිබෙන්නේ අපගේ පවුල් සම්බන්ධතාවල සතුට අත්විඳීමට අපට උපකාරකිරීම සඳහාය

"අපගේ මිදුම්කරුවාණන්ගේ පර්වතය මත" අප අපගේ නිවාස ගොඩනගන විට, එය "ස්වර්ගයෙන් කොටසක් විය හැකිය."

### 2 වෙනි පාඩමඃ විවාහයේ එක්සත්කම වැඩිදියුණුකිරීම

ස්වාමිපුරුෂයන් සහ භාර්යාවන් එක මාංශයක් වීමට ස්වාමීන්වහන්සේ නියෝගකර ඇතිසේක.

ස්වාමි පුරුෂයන් සහ භාර්යාවන් එකිනෙකා සම සහකරුවන්සේ අගයකළ යුතුය

ස්වාමිපුරුෂයන් සහ භාර්යාවන් ඔවුන්ගේ පෞද්ගලික ගුණාංග සහ හැකියාවන් ගැන එකිනෙකාට ප්‍රශංසාකිරීමට ඉඩදිය යුතුය.

ස්වාමිපුරුෂයන් සහ භාර්යාවන් එකිනෙකාට පක්ෂපාතවිය යුතුය.

### 3 වෙනි පාඩමඃ විවාහයේ ප්‍රේමය සහ මිත්‍රත්වය පෝෂණයකිරීම

ස්වාමිපුරුෂයන් සහ භාර්යාවන් තම ප්‍රේමය එකිනෙකා වෙනුවෙන් පෝෂණයකිරීම අවශ්‍යවේ.

ආදරය සහ කරුණාව ප්‍රකාශකිරීමෙන් විවාහයේ ප්‍රේමය සහ මිත්‍රත්වය ජීවමානව තබයි.

විවාහයේ සැබෑ මිත්‍රත්වය නම් ප්‍රේමය ප්‍රකාශකිරීමය.

විවාහක ජෝඩු විසින් දයාව, ක්‍රිස්තුස්වහන්සේගේ පිවිතුරු දයාව ඇතිව සිටීමට පරිශ්‍රම දැරිය යුතුය.

### 4 වෙනි පාඩම; විවාහයේ අභියෝගවලට ප්‍රතිචාර දැක්වීම

සියලුම විවාහක ජෝඩු අභියෝග අත්දකිනු ඇත.

ස්වාමිපුරුෂයන් සහ භාර්යාවන් ඔවුන්ගේ විවාහය ගිවිසුම් සම්බන්ධතාවයක් ලෙස දකින්නේ නම්, ඕනෑම අභියෝගයක් ජයගත හැකිය.

අභියෝග නැගීසිටින විට, අමනාපයෙන් බලාපොරොත්තු කඩකරගැනීම වෙනුවට ඉවසීමෙන් සහ ප්‍රේමයෙන් ප්‍රතිචාරදැක්වීම අපට තෝරාගත හැකිය.

### 5 වෙනි පාඩම; අභියෝගවලට සුහවාදීව කථාකිරීම මගින් ප්‍රතිචාර දැක්වීම

සෑම විවාහක යුවලකටම තම අදහස්වල යම් වෙනස්කම් තිබෙන්නේය.

ස්වාමි පුරුෂයන් සහ භාර්යාවන් එකිනෙකාගේ ප්‍රශංසාත්මක ගුණාංග ගැන සෙවිය යුතුය.

සුහවාදීව කථාකිරීම, අසීරුකම් වළක්වා ඒවා විසඳාගැනීමට ඉවහල්වේ.

### 6 වෙනි පාඩමඃ ඇදහිල්ල සහ යාච්ඤාව තුලින් විවාහ ශක්තිමත්කිරීම

ස්වාමිපුරුෂයන් සහ භාර්යාවන් එක්ව කටයුතු කරමින් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඔවුන්ගේ ඇදහිල්ල වැඩිකර ගත යුතුය.

ස්වාමිපුරුෂයන් සහ භාර්යාවන් එක්ව යාච්ඤාකරන විට ඔවුන් ආශිර්වාදිතවේ.

### 7 වෙනි පාඩමඃ කමාවධී සුවකිරීමේ බලය

ස්වාමිපුරුෂයා සහ භාර්යාව අතර කමාවදීමේ ආකල්පය සමාදානය සහ විශ්වාසයත් ආරක්ෂාවත් ගෙනඒමට උදව්වෙයි.

ස්වාමිපුරුෂයා සහ භාර්යාව ඔවුන්ගේ දුර්වලකම් ගැන එකිනෙකාගේ කමාව සොයමින් වැරදි හඳාගැනීමට අවංකව උත්සාහ දැරිය යුතුය.

ස්වාමිපුරුෂයා සහ භාර්යාව එකිනෙකාට කමාවදීමට සොයාබැලිය යුතුය.

### 8 වෙනි පාඩම; පවුලේ මුදල් පාලනය

නිසියාකාර මුදල් පාලනයක් ප්‍රීතිමත් විවාහයකට අත්‍යාවශ්‍යවේ.

ස්වාමිපුරුෂයන් සහ භාර්යාවන් එකට කටයුතුකර මුදල් පාලනයේ ප්‍රධාන මූලධර්ම අනුගමනය කළ යුතුය.

### 9 වෙනි පාඩමඃ "දරුවෝ ස්වාමීන්වහන්සේ දෙන උරුමයක්ය"

ස්වර්ගික පියාණන්වහන්සේ තම ආත්මික දරුවන් පොළොවේ දෙමාපියන්ට බාරදෙනසේක.

දෙමාපියන් හැම ළමයෙකුගේම පෞද්ගලික අවශ්‍යතාවයන් සපුරාලීම ගැන සොයාබැලිය යුතුය.

ළමුන්ට තම දෙමාපියන්ගේ ප්‍රේමනීය සම්බන්ධතාවයක හිමිකමක් ඇත.

ළමා අපචාරය දෙවියන්වහන්සේ අමනාපකිරීමකි.

ළමෝ ඔවුන්ගේ දෙමාපියන්ට විශාල සතුටක් ගෙනදෙති.

### 10 වෙනි පාඩම; පියවරුන්ගේ සහ මවුවරුන්ගේ පූජනීය කාර්‍යභාරයන් (1වෙනි කොටසඃ පියයාගේ කාර්‍යභාරයන්)

පියවරු සහ මවුවරු එකට වැඩකරමින් ඔවුන්ගේ හැම දරුවෙක්ටම ඇදහිල්ල නැමැති පලිහ සමග සැපයුම් ලබා දිය යුතුය.

පියවරු ආදරයෙන් සහ ධාර්මිකව මූලිකත්වය ගත යුතුය.

පියවරු ඔවුන්ගේ පවුල්වලට ජීවිතයේ අවශ්‍යතාවයන් සහ ආරක්ෂාව ලබාදිය යුතුය.

### 11 වෙනි පාඩමඃ පියවරුන් සහ මවුවරුන්ගේ පූජනීය කාර්‍යභාරය (2වෙනි කොටසඃ මවුවරුන්ගේ කාර්‍යභාරයන්)

දෙවියන්වහන්සේගේ වැඩකටයුතුවලට මවුවරු සහභාගිවෙති

තම දරුවන් ඇති දැඩිකිරීමේ මූකික වගකීමක් මවුවරුන්ට ඇත.

පියවරු සහ මවුවරු සම කොටස්කරුවන් ලෙස එකිනෙකාට උදව් කළ යුතුය.

### 12 වෙනි පාඩම; ආදර්ශය සහ උපදේශය තුලින් ළමයින්ට ඉගැන්වීම

තම ළමයින්ට ඉගැන්වීම දෙමාපියන්ගේ වගකීමකි.

තම ළමයින්ට ඉගැන්වීමේදී ආනුභාවය ලැබීමට දෙමාපියන්ට පුළුවන.

දෙමාපියවරු ආදර්ශය සහ අවවාදය තුලින් උගන්වති.

### 13 වෙනි පරිච්ඡේදයඃ සුභාරංචි මූලධර්ම ළමයින්ට ඉගැන්වීම (1 වෙනි කොටස)

ශක්තිමත් ඇදහිල්ලකින් සිටීමට ළමයින්ට උපකාරකිරීමට දෙමාපියන්ගේ ඉගැන්වීම්වලට පුළුවන

සුභාරංචියේ පළවෙනි මූලධර්ම සහ නියෝග තම ළමයින්ට ඉගැන්වීම දෙමාපිය වගකීමකි.

දෙමාපියවරු "තම ළමයින්ට යාච්ඤාකිරීමට සහ ස්වාමීන්වහන්සේ ඉදිරියේ ඍජුව කටයුතුකිරීමට ඉගැන්විය යුතුය.

### 14 වෙනි පාඩමඃ සුභාරංචි මූලධර්ම ළමයින්ට ඉගැන්වීම (2වෙනි කොටස)

දෙමාපියවරු තම ළමයින්ට උගන්වන විට ඔවුන්ට ප්‍රේමය පෙන්වති.

දෙමාපියවරු ළමුන්ට අනුකම්පාකිරීම සහ සේවයකිරීම ගැන ඉගැන්විය යුතුය.

දෙමාපියන් ළමයින්ට අවංකකම ගැන සහ අන් අයගේ දේපලවලට ගරුකිරීමට ඉගැන්විය යුතුය.

අවංක සේවයේ විපාක ගැන දෙමාපියන් ළමයින්ට ඉගැන්විය යුතුය.

සදාචාරාත්මක පිරිසිදුකම ගැන දෙමාපියන් ළමයින්ට ඉගැන්විය යුතුය.

### 15 වෙනි පාඩමඃ ළමයින් තීරණ ගන්නා විට ඔවුන්ට මගපෙන්වීම

ළමුන් තීරණ ගන්නා විට ඔවුන්ට මගපෙන්වීම අවශ්‍යවේ.

ළමුන්ට ඔවුන්ගේ කර්තෘත්වය ධාර්මිකව ක්‍රියාත්මක කිරීමට උපකාර කිරීමට දෙමාපියන්ට පුළුවන.

අඥාන තීරණවල ප්‍රතිඵලවලින් ඉගෙනගැනීමට දෙමාපියන් ළමයින්ට ඉඩදිය යුතුය.

නොමග යන ළමයින්ට දෙමාපියන් නොවරදින ප්‍රේමය පෙන්විය යුතුය.

### 16 වෙනි පාඩමඃ පවුලේ යාච්ඤාව, පවුලේ ශුද්ධ ලියවිලි කියවීම, සහ පවුල් නිවාස සැන්දෑව

පවුලේ යාච්ඤාව සහ ශුද්ධ ලියවිලි අධ්‍යයනය සහ පවුලේ නිවාස සැන්දෑව සෑම පසු-දවස්වල ශුද්ධවන්ත පවුලකම ඉහළම ප්‍රමුඛස්ථාන විය යුතුය.

පවුල් එකට යාච්ඤාකරන විට ඔවුන්ට විශාල ආශිර්වාද ලැබේ.

පවුලේ ශුද්ධ ලියවිලි අධ්‍යයනය පවුල්වලට දෙවියන්වහන්සේට සමීපවීමට උදව්කරයි.

ලෝකයේ බලපෑම්වලින් තමන්ව ආරක්ෂාකරගැනීමට පවුලේ නිවාස සැන්දෑව පවුල්වලට උපකාර කරයි.

# අ කොටස
# විවාහ ශක්තිමත්කිරීම



# "පවුල මැවුම්කරුවාණන්ගේ සැලසුමේ කේන්ද්‍රස්ථානයවේ" 1

## අදාලකරගැනීම සඳහා අදහස්

ඔබගේම අවශ්‍යතා සහ තත්වයන් අනුව, මෙම යෝජනා එකක් හෝ දෙකම හෝ අනුගමනය කරන්න.

- "පවුලඃ ලෝකයට ප්‍රකාශනයකි" සමාලෝචනය කරන්න (පිටුව 00 iv). අනාවැකි උපදෙස් ඔබට වඩා හොඳින් අනුගමනය කළ හැකි මාර්ග නිශ්වයකරන්න.
- "පවුලඃ ලෝකයට ප්‍රකාශනයකි" (35602 හෝ 35538) පෝස්ටරය සහා බෙදාහැරීමේ මධ්‍යස්ථානයකින් ලබාගන්න. එය ඔබගේ නිවසේ ප්‍රසිද්ධ ලෙස ප්‍රදර්ශනය කරන්න.

## කියවීමේ පැවරුම්

පහත සඳහන් ලිපිය අධ්‍යයනය කරන්න. ඔබ විවාහක නම්, ඔබගේ සහකරු සමග ලිපිය කියවා සාකච්ඡා කරන්න.

### මෙලොව සහ සියලුම සදාකාලය දක්වා

වැඩිහිටි බොයිඩ් කේ. පැකර්
ප්‍රේරිතවරුන් දොළොස්දෙනාගේ ගණපූර්ණය

#### ප්‍රීතියේ ශ්‍රේෂ්ඨ සැලසුම

හිතවත් සොයුරු, සොයුරියනි, ශුද්ධ ලියවිලි සහ ප්‍රේරිතවරුන් සහ අනාගතවක්තෘවරුන්ගේ ඉගැන්වීම් අප ගැන ප්‍රකාශකරන්නේ මැරෙනසුළු ජීවිතයට පෙර අප දෙවියන්වහන්සේගේ ආත්මික දරුවන්වූ, පුතුන් සහ දියණියන් ලෙසය.[1] ස්ත්‍රී පුරුෂභාවය කලින් පැවතුන අතර, මැරෙනසුළු උපතේදී එය ආරම්භ නොවීය.[2]

ස්වර්ගයේ මහා සම්මන්ත්‍රනයේදී,[3] දෙවියන්වහන්සේගේ සැලසුම ඉදිරිපත් කෙරිනඃ[4] එනම් ගැලවීමේ සැලසුම,[5] මුදාගැනීමේ සැලසුම,[6] ප්‍රීතියේ මහා සැලසුමය.[7] සැලසුම මගින් ඔප්පුකිරීම ලබාදෙයි; සෑම දෙනාම යහපත සහ නපුර අතරින් තෝරාගත යුතුය.[8] අප කීකරුවන්නේ නම්, දෙවියන්වහන්සේගේ සම්මුඛයට නැවත යාම සඳහා උන්වහන්සේගේ සැලසුම මගින් ගැලවුම්කරුවෙක්, වන්දිගෙවීමක්, සහ නැවත නැගිටීමක්ද ලබාදෙයි.

විරුද්ධවාදියා කැරළිගසා ඔහුගේම සැලසුමක් සකස් කළේය.[9] ඔහුව අනුගමනය කළ අය මැරෙන සුළු ශරීරයක් ලබාගැනීමේ අයිතිවාසිකම ප්‍රතික්ෂේප කළේය.[10] අප මෙහි සිටීමෙන් ස්ථිරවන්නේ අපි අපගේ පියාණන්ගේ සැලසුම පිළිගත් බවය.[11]

ලූසිෆර්ගේ එකම අරමුණ වූයේ ප්‍රීතියේ මහා සැලසුමට විරුද්ධවී, ජීවිතයේ පවිත්‍රවූත් ඉතා අලංකාරවූත් ආකර්ෂණීය අත්දැකීම්වනඃ ප්‍රේමය, ආදරය, විවාහය සහ දෙමාපිය තත්වය දූෂිතකිරීමය.[12] ඔහුගෙන් ලැබෙන්නේ හද වේදනා සහ වැරදිකිරීමය.[13] ඔහු කරන තුවාල සුවකළ හැක්කේ පසුතැවිල්ලට පමණය.

#### දෙවියන්වහන්සේගේ සැලසුමට විවාහය සහ පවුල අවශ්‍යවේ

ප්‍රීතියේ සැලසුමට පිරිමි සහ ගැහැණු, මිනිසා සහ ස්ත්‍රිය, ස්වාමි පුරුෂයා සහ භාර්යාවගේ එකමුතුකම අවශ්‍යවේ.[14] අප හැසිරෙන අන්දම නිතරම පාලනයකරන ස්වභාවික ආවේගයන්ට ප්‍රතිචාරදක්වන ආකාරය ගැන දහම අපට උගන්වයි.

ආදම්ව නිර්මානයකර තිබෙන්නේ දෙවියන්වහන්සේගේ ප්‍රතිරූපයට සමාන ශරීරාකාරයෙන් වන අතර[15] ඔහුව උයනට ඇතුළත්කරන ලදී.[16] ආදම් පළමුව සිටියේ හුදකලාවය. ඔහු පූජකවරය දැරුවේය,[17] නමුත් ඔහුට තනිවම, ඔහුව නිර්මානයකිරීමේ අරමුණු සම්පූර්ණකිරීමට නොහැකිවිය. [18]

වෙනත් මිනිසෙකුට එය කළ නොහැකිවිය. තනිවම හෝ වෙනත් මිනිසුන් සමග හෝ ආදම්ට වර්ධනයවිය නොහැකිය. ඒවාටද වෙනත් කාන්තාවක් සමග එය කළ නොහැකිවිය. එකළද එය එසේ පරිදි අදද එසේමය.

සහකාරියක් ලෙස, ඒව නිර්මානය කෙරින. විවාහය ස්ථාපිත කෙරින.[19] ආදම්ට නියෝග කෙරුනේ (හුදෙක් කාන්තාවකට මෙන් නොව) "වෙනත් කිසිවෙකුට නොව" තම බිරිඳට බැඳී සිටීමටය.[20]

තේරීමකි, එසේ කිව හැකිය, ඒවට නියම කෙරින.[21] ඇයගේ තීරණයට ඇයට ප්‍රශංසා කළ යුතුය. එවිට "මිනිසුන්ව සිටිය යුතුයයි ආදම්ට හැගින."[22]

වැඩිහිටි ඔරසන් විට්නි වැටීම විස්තර කළේ "දෙයාකාර මාවතක් ලෙසය—පහතට, නමුත් ඉදිරියට යාමක් ලෙසය. එමගින් මිනිසාව ලෝකයට පා තැබීමට සලස්වා දියුණුවේ මහා මාර්ගයට ගෙනාවේය."[23]

දෙවියන්වහන්සේ ආදම්ට සහ ඒවාට ආශිර්වාද කොට "ඔවුන්ටඃ බෝවී, පූර්ණවීමට කී සේක."[24] තවද එසේ පවුල ස්ථාපනය කෙරින.

**දෙවියන්වහන්සේ මිනිසුන් සහ කාන්තාවන් එකසේ අගය කළසේක**

ගැහැණියකවීමට වඩා මිනිසෙකුවීම දෙවියන්වහන්සේ ඉදිරියේ යහපත් බවක් හෝ පුතුන්ට දියණියන්ට වඩා උසස් තත්වයක් උන්වහන්සේ දෙන බවට යෝජනාකෙරෙන කිසිදු එළිදරව්වක් නැත.

සියලුම ගුණාංග ශුද්ධ ලියවිලිවල සඳහන්ව ඇත—ප්‍රේමය, සතුට, ඇදහිල්ල, කරුණාව, දයාව—මිනිසුන් සහ කාන්තාවන් දෙපක්ෂයම බෙදාගනිති,[25] තවද මැරෙන සුළු දිවියේ උසස්තම පූජකවරයේ නියෝග ලබාදී තිබෙන්නේ මිනිසා කාන්තාව යන දෙදෙනාටමය.[26]

වැටීමෙන් පසුව, මැරෙන සුළු උපත සම්බන්ධ ස්වාධිපත්‍යයේ විශාල ප්‍රතිඵල ස්වභාවික නීතියේ තිබින. සභාපති ජේ. රූබන් ක්ලාක් කණි. හැඳින්වූ ලෙස ස්වභාව ධර්මයේ "සමච්චල්" ඇත.[27] එමගින් විවිධ අනියම්, අසම්පූර්ණ, සහ විකෘතීන් ඇතිවිය. කෙසේ වුවද මිනිසා ගැන සිතීමේදී එය අසාධාරණ වුවද, කෙසේ හෝ මිනිස්වර්ගයාට ඔප්පුකිරීමේ ස්වාමීන්වහන්සේගේ අරමුණුවලට ඒවා ගැලපෙන්නේය.

සෑම සුදුසු බුද්ධිබලයක්ම අනුගමනයකිරීම, සෑම ධාර්මික ඉල්ලීමකටම ප්‍රතිචාර දැක්වීම, සෑම උසස් මිනිස් සම්බන්ධතාවයක්ම පවත්වාගැනීම යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ දහමින් අනුමතව ඇති අතර, උන්වහන්සේගේ සභාවට එළිදරව්කල නියෝගවලින් ආරක්ෂාවී ඇත.

**මිනිසුන් සහ කාන්තාවන්ගේ කාර්‍යභාරය**

සොබාදහම මගින් ආදම් සහ එකිනෙකාට වෙනස්වීම නොවන්නට, ඔවුන්ට බෝවී පොළොව පූර්ණකිරීමට නොහැකිවිය. [28] විවිධත්වය ප්‍රදානයකිරීම ප්‍රීතියේ සැලසුමේ ප්‍රධාන කාරණය විය.

සමහර කාර්‍යභාරයන් පුරුෂ ස්වභාවයට ගැලපුන අතර, අනෙක් ඒවා ගැහැණු ස්වභායට ගැලපුනි. ශුද්ධ ලියවිලි සහ ස්වභාවික ක්‍රම මිනිසා ආරක්ෂකයා සහ සැපයුම්කරු බවට පත්කර ඇත. [29]

සභාවේ පරිපාලනයට සම්බන්ධ පූජකවරයේ එම වගකීම් නිවසින් බාහිරව ක්‍රියාත්මකකිරීම අවශ්‍ය ඒවාය. දේව ප්‍රකාශ මගින්, ඒවා මිනිසුන්ට බාරදී ඇත. ආරම්භයේ සිට ඒවා එසේ තිබී ඇත. මන්ද ස්වාමීන්වහන්සේ මෙසේ එළිදරව්කර ඇතිසේක, "මෙම පූජකවරයේ නියමය පියාගෙන් පුතාට බාරදීම සිථිරකර ඇත….මෙම නියමය ආදම්ගේ කාලයේදී ස්ථාපනය කෙරින."[30]

පූජකවරය උසුලන මිනිසා උත්කර්ෂයට සුදුසුවීමට කාන්තාවට වඩා වාසියක් ලබන්නේ නැත. කාන්තාව ඇයගේම ස්වභාවය මගින්, දෙවියන්වහන්සේගේ සම-නිර්මානයක් වන අතර, මූලිකවම ළමුන් පෝෂණය කරන්නියකි. සම්පූර්ණත්වය සහ උත්කර්ෂය සඳහා වන ගුණාංග සහ ලක්ෂණ කාන්තාවකට ස්වභාවයෙන්ම ලැබෙන අතර, විවාහය සහ මාතෘත්වයෙන් පිරිසිදුකරනු ලබයි.

අපගේ පියාණන්ගේ ප්‍රීතියේ සැලසුමට අනුකූල වීම සඳහා පූජකවරය දානයකරනු ලබන්නේ සුදුසු මිනිසුන් මත පමණය. සොබාදහමේ නීතිය, එළිදරව්කළ දේව වචනය සමග එකට කටයුතුකරයි. ඒ අනුව එය ඉතා හොඳින් ක්‍රියාකරයි.

පූජකවරයේ බියජනක වගකීම් ඇතුලත්වේ, "පූජකවරයේ ගුණාංග පවත්වාගැනීමට කිසිදු බලයකට හෝ බලපෑමකට හෝ කළ නොහැක්කකි. එය කළහැක්කේ ඒත්තුගැන්වීමෙන්, දීර්ඝ ඉවසීමෙන්,, ආචාරශීලීත්වයෙන් සහ නිහතමානීකමින් සහ අවංක ප්‍රේමය; සහ පිවිතුරු අවබෝධය මගින් පමණකි."[31]

යම් මිනිසෙකුට "අධර්මිෂ්ඨකමින් කිසියම් ලෙසකින්… පාලනයකිරීම, ආධිපත්‍යයදැරීම හෝ බලකිරීම හෝ කළ හැකිද,"[32] ඔහු "පූජකවරයට අයත් පොරොන්දු සහ ගිවිසුම්" කඩකරයි. [33] එවිට, "ස්වර්ගයන් ඔහුගෙන් ඉවත්වෙයි; ස්වාමීන්වහන්සේගේ ආත්මය ශෝකවෙයි."[34] ඔහු පසුතැවිලි නොවන්නේ නම්, ඔහුගේ ආශිර්වාද නැතිකරගන්නේය.

උත්කර්ෂමත් සෙලෙස්ටියල් ප්‍රකාශවලින් මිනිසා සහ කාන්තාවගේ විවිධ කාර්‍යභාරයන් නියමකර තිබීමෙන්, ඔවුන් පවුල් ජීවිතයේ වඩාත් ප්‍රායෝගික, සාමාන්‍ය හා පොළොව මත නිහතමානී අත්දැකීම් වඩා හොඳින් ප්‍රදර්ශනයකර ඇත.

මෑතකදී මා ඇසූ පරිදි එක් කථිකයෙක් සක්‍රමේන්තු රැස්වීමකදී කථාකරමින්, ඔහුගේ මුනුපුරන් නිතරම ඔවුන්ගේ සීයාගේ නිවසට නොගොස් මිත්තනියගේ නිවසට පමණක් යන්නේ මන්දැයි ඔහුට නොතේරෙන බවට චෝදනා කළේය. එම විශාල අභිරහස මම ඔහුට විසඳාදුනිමි: සීයා පයිස් පුළුස්සන්නේ නැත!

**ස්වභාවික සහ ආත්මික නීති සදාකාලිකය**

ජීවිතය පාලනයකරන ස්වභාවික සහ ආත්මික නීති ලෝකය බිහිවීමට පෙර සිටම ස්ථාපනයකර ඇත.[35] ඒවාට කීකකරුවීම හෝ අකීකරුවීමේ ප්‍රතිඵල අනුව, ඒවා සදාකාලිකය. ඒවා සමාජ හෝ දේශපාලන සැලකිලි මත පදනම්වී නොමැත. ඒවා වෙනස්කළ නොහැකිය. කිසිදු බලපෑමකට, කිසිදු විරුද්ධත්වයකට, කිසිදු නීතියකට ඒවා වෙනස්කළ නොහැකිය.

වසර කිහිපයකට පෙර මම ඉන්දියානු සෙමෙනේරි කිහිපයක් අධීක්ෂණය කළෙමි. මම ඇල්බිකිව් පාසලකට ගිය විට පළමු වසරේ පංතියක සිදුවීමක් ගැන විදුහල්පතිතුමා මට කීවේය.

පාඩම් කාලයේදී, පූස් පැටියෙක් පංතියට පැමිණ බාලයන්ගේ අවධානය යොමුකර ගත්තේය. සෑම දෙනාටම පෙනෙන පරිදි ඌව කාමරයේ ඉදිරිපිටට ගෙනෙන ලදී.

එක් බාලයෙක් "ඌ පිරිමි සතෙක්ද නැතිනම් ගැහැණු සතෙක්ද" යයි ඇසීය.

එම සාකච්ඡාවට සූදානම්ව නොසිටි ගුරුවරිය "එහි ප්‍රශ්නයක් නැහැ; ඌ පූස් පැටියෙක් පමණයි" යයි කීවාය,

නමුත් ළමයින් එකහෙළාම සිටිමින්, එක් කුඩා ළමයෙක් "ඌව පිරිමි සතෙක්ද, නැතිනම් ගැහැණු සතෙක්ද යයි අපට කිවහැකි අන්දම මම දනිමි" යයි කීවේය.

ගුරුවරිය දැනුවත්වී, "බොහොම හොඳයි, ඌව ගැහැණු සතෙක්ද, පිරිමි සතෙක්දැයි අපි කියන්නේ කොහොමද කියා ඔබ අපට කියන්න" යයි කීවාය.

පිරිමි ළමයා පිළිතුරු දෙමින්, "අපිට ඒකට ඡන්දයක් තියන්න පුළුවන්" යයි කීවේය.

යම් දේවල් වෙනස්කළ නොහැකිය. දහම වෙනස්කළ නොහැකිය.

"එළිදරව්කර තිබෙන මූලධර්ම," සභාපති වුඩ්රෆ් කීවේය. "මිනිස් දරුවන්ගේ ගැලවීම සහ උත්කර්ෂය සඳහාය… ඒවා මූලධර්මය, ඔබට ඒවා විනාශකළ නොහැකිය *ඒවා මිනිසුන්ගේ [හෝ කාන්තාවන්ගේ] සම්බන්ධතාවයකට විනාශකළ නොහැකිය.* ඒවා කිසිදා මිය නොයන මූලධර්මවේ….ඒවා පරිහරණයකිරීමට හෝ විනාශකිරීමට මිනිසාට ළඟාවිය නොහැකිය….මුළු ලෝකයේම බලය එකතුකළද එම මූලධර්ම විනාශකළ නොහැකිය….මෙම මූලධර්මවල බිඳක් හෝ කුඩා ප්‍රමාණයක් හෝ කිසිදා විනාශකළ නොහැකිය." [36]

II වන ලෝක යුද්ධ සමයේදී, සටන්කිරීමට මිනිසුන් කැඳවන ලදී, හදිසි තත්වය තුල, ලෝකය මුළුල්ලේම භාර්‍යාවන් සහ මවුවරුන් කිසිදාක නොවූ පරිදි වැඩකිරීමට ඇදදමන ලදී. යුද්ධයේ වඩාත්ම විනාශකාරී ප්‍රතිපලය සිදුවූයේ පවුලටය. එය මෙම පරම්පරාවටද ආවේනිකය.

## බෝවී වැඩිවෙමින් පොළොව පූර්ණකරපල්ලා

1942 ඔක්තෝබර් ප්‍රධාන සම්මන්ත්‍රනයේදී, පළවෙනි සභාපතිත්වය "සෑම දේශයකට සහ ප්‍රදේශයකම ශුද්ධවන්තයන්ට" පණිවුඩයක් නිකුත්කළේය. එමගින් ඔවුහු මෙසේ කීහ, "සභාවේ පළවෙනි සභාපතිත්වය ලෙස අපට පැවරුන ගුණගරුක බලයෙන්, අපි අපගේ ජනතාවට අවවාද කරමු."

තවද ඔවුහු මෙසේ කීහ: "ආදම්ට සහ ඒවාට දුන් උන්වහන්සේගේ පළමු නියෝග අතර, ස්වාමීන් වහන්සේ මෙසේද කීසේක: 'බෝවී වැඩිවෙමින් පොළොව පූර්ණ කරපල්ලා.' එම නියෝගය අපගේ කාලයේදීද උන්වහන්සේ නැවත කියනසේක. මෙම අවසාන කාලපරිච්ඡේදයේදී උන්වහන්සේ නැවතත් විවාහ ගිවිසුමේ මූලධර්මයේ සදාකාලික බව නැවතත් එළිදරව්කර ඇතිසේක….

"සෑම ස්වාමිපුරුෂයෙක් සහ භාර්‍යාවක්ම ආදම්ට සහ ඒවාට දුන් බෝවී පොළොව පූර්නකිරීමේ නියෝගයට කීකරුවීම යුතුකමක් බව ස්වාමීන්වහන්සේ අපට කියා ඇතිසේක. එවිට මාංශමය ශරීරයක් බලාසිටින තෝරාගත් ආත්මවල සේනාවට මෙහි පැමිණ දෙවියන්වහන්සේගේ ශ්‍රේෂ්ඨ සැලසුම යටතේ ඉදිරියට ගොස් සර්ව සම්පූර්න ප්‍රාණීන් විය හැකිය, මන්ද මෙම මාංශමය ශරීර නොමැතිව, ඔවුන්ගේ දෙවියන්වහන්සේ සැලසුම්කළ ගමනාන්තයට වර්ධනයවීමට ඔවුන්ට නොහැකිය. මෙලෙස, සෑම ස්වාමිපුරුෂයෙක් සහ භාර්‍යාවක්ම ශුද්ධවූ සදාකාලික ගිවිසුම යටතේ ඉපදෙන ළමුන්ගේ ඉශ්‍රායෙල් පියෙක් සහ මවක් වනු ඇත.

"මෙම තෝරාගත් ආත්ම පොළොවට ගෙනඒම මගින්, හැම පියෙක්ම සහ හැම මවක්ම ශරීර හිමි ආත්ම ඉදිරියේ සහ ස්වාමීන්වහන්සේද ඉදිරිපිට උන්වහන්සේ ලබාදුන් අවස්ථාවේ සහ යුතුකමේ ප්‍රයෝජනය ලබාගත් බව පිළිගනියි. මන්ද එම ආත්මවල ඉරණම සියලුම සදාකාලවලදී පැමිණීමට ඇති නිසාය, මෙයින් මතු ලැබෙන ආශිර්වාද හෝ දඬුවම්වල වැඩි කොටස තීරණයවන්නේ සැලකිල්ල, ඉගැන්වීම්, සහ දෙමාපියන් එම ආත්මවලට ලබාදෙන පුහුණුව මගින්ය.

"කිසිම දෙමාපියෙකුට එම යුතුකමින් සහ එම වගකීමෙන් සහ නිසි සැලකිල්ලෙන් ගැලවිය නොහැකිය. ස්වාමීන්වහන්සේ අපව දැඩි වගකීමකට පත්කර ඇතිසේක. මැරෙන සුළු මිනිසුන් ඉටුකරන මෙයට වඩා උදාර රාජකාරියක් තවත් නැත."

## මාතෘත්වය ශුද්ධවූ කැඳවීමකි

මවුවරුන් ගැන කථාකරමින්, පළවෙනි සභාපතිත්වය මෙසේ කීවේය: "මාතෘත්වය මෙලෙස ශුද්ධවූ කැඳවීමක් බවට පත්වෙයි, ස්වාමීන් වහන්සේගේ සැලසුම ක්‍රියාත්මක කිරීම සඳහා පූජනීය කැපවීමකි, ඇතිදැඩිකිරීම, හදාවඩා ගැනීම, ශරීරය, මනස සහ ආත්මය පෝෂණයකරමින්, තම පළමු තත්වය තබා, ඔවුන්ගේ දෙවන තත්වය තැබීමට මෙම පොළොවට පැමිණ, 'ඔවුන්ගේ ස්වාමීන්වූ දෙවියන්වහන්සේ ඔවුන්ට නියෝගකළ සියල්ල ඔවුන් කරන්නේදැයි බැලීමට' කරන භක්තිමත් කැපවීමකි. (ආබ්‍රහම් 3:25) ඔවුන්ගේ දෙවන තත්වය ආරක්ෂාකිරීමට ඔවුන්ට මගපෙන්වීම මාතෘත්වයයි, තවද 'තම දෙවන තත්වය ආරක්ෂාකරන අය සදාකාලයෙන් සදාකාලයට ඔවුන්ගේ හිස් මත මහිමයේ වැඩිවීමක්ද ලබනු ඇත්තේය.' (op. cit.) [ආබ්‍රහම් 3:26]

"මාතෘත්වයේ මෙම දිව්‍යමය සේවය ලබාදිය හැක්කේ මවුවරුන්ට පමණය. එය අන්අයට පැවරීමට නොහැකිය. හෙදියන්ට එය කළ නොහැකිය; මහජන ළමා නිවාසවලට එය කළ නොහැකිය; කුලියට ගත් අයට එය කළ නොහැකිය— හැකිතරම් දුරට ආධාරය ලබාගැනීමට හැකි පියවරුන්ගේ, සොහොයුරන්ගේ, සහ සොයුරියන්ගේ ප්‍රේමනීය අත්වලට, පරීක්ෂාකාරී සැලකිල්ල අවශ්‍ය ප්‍රමාණයට ලබා දිය හැකිය."

පළවෙනි සභාපතිත්වය මෙසේ උපදෙස් දුන්නේය "තම දරුවා කෙරෙහි අන් අයගේ සැලකිල්ල මත විශ්වාසය තබන මව, ඇය රත්රන්වලට හෝ කීර්තියට හෝ සමාජ සේවයකට හෝ මවගේ කටයුතු කිසිවක් නොකරන මව, අත්හරිනු ලබන දරුවා තම මව් ලජ්ජාවට පමුණුවන බව මතකතබාගත යුතුය.' (හිතෝපදේශ 29:15) අපගේ කාලයේදී ස්වාමීන්වහන්සේ ප්‍රකාශකර තිබෙන පරිදී, දෙමාපියන් තම ළමයින්ට සභාවේ දහම ගැන උගන්වන්නේ නැත්නම්, පාපය දෙමාපියන්ගේ හිස මත වන්නේය (බලන්න ධීසහයී 68:25)

"මාතෘත්වය දේවත්වයට සමීපය. මනුෂ්‍යාවර්ගයා බාරගත් උසස්තම, ශුද්ධතම සේවය එය වන්නේය. තම ශුද්ධවූ කැඳවීමට සහ සේවයට ගෞරවකරන ඇය, දේවදූතයන්ට දෙවෙනි තත්වයට පත්වේ." [37]

පළවෙනි සභාපතිත්වයේ එම පණිවුඩය එය දුන් කාලයට වඩා අඩුවෙන් නොව වැඩියෙන්, අද කාලයට අවශ්‍යවේ. එසේම එම පළවෙනි සභාපතිත්වයේ පණිවුඩයට සමාන හඬක් සහා සංවිධානයේ කිසිම ආකාර පරිපාලනයකින් ලැබී නැත.[38]

ස්වභාවයෙන් හෝ යම් තත්වයක් යටතේ විවාහයේ සහ දෙමාපිය තත්වයේ ආශිර්වාද නොලබන, හෝ දරුවන් හදාවඩා ගනිමින් සහ ඔවුන්ට උදව්කිරීමට අහිංසකව හුදකලාව වැඩකිරීමට සිදුව තිබෙන අයට පණිත් රැකීම අනුව—සදාකාලයේ ආශිර්වාද ප්‍රතික්ෂේප නොකරනු ලබයි. [39] සභාපති ලොරෙන්සෝ ස්නෝ පොරොන්දුවූ ලෙස, "එය ස්ථිර සේම, සුභවාදීය." [40]

### වස්තුව සහ යතුරුවල උපමා කථාව

මම උපමා කථාවකින් අවසන් කරමි.

වරක් මිනිසෙක් හට තම උරුමය ලෙස යතුරු දෙකක් ලැබුනි. පළමු යතුර, ඔහුට පවසූ පරිදි, බිංගෙය විවෘතකිරීමට බැවින්, ඔහු එය කෙසේ හෝ ආරක්ෂාකළ යුතුය. දෙවන යතුර බිංගෙයි තිබෙන සේප්පුවේ යතුර වන අතර, එහි මිළ කල නොහැකි වස්තුවක් තැන්පත්ව ඇත. මෙම සේප්පුව විවෘතකර එහි තැන්පත්ව ඇති වටිනා දේවල් නිදහසේ පාවිච්චිකිරීමට ඔහුට හැකිය. ඔහුගේ උරුමයන් ඔහුගෙන් සොරාගැනීමට බොහෝ අය සොයන බවට ඔහුට අනතුරු ඇඟවින. ඔහු එම වස්තුව සුදුසු ලෙස පාවිච්චිකරන්නේ නම්, එය පුරවනු ලබන බවත්, සදාකාලයටම අඩු නොවන බවටත්, ඔහුට පොරොන්දු ලැබින. ඔහු එය අන් අයගේ ප්‍රයෝජනය උදෙසා යොදවන්නේ නම්, ඔහුට හිමිව තිබෙන ආශිර්වාද සහ සතුට වැඩිවනු ඇත.

එම මිනිසා තනිවම බිංගෙයට ගියේය. ඔහු පළමුව දොර විවෘත කළේය. ඔහු අනෙක් යතුරෙන් සේප්පුව විවෘතකිරීමට උත්සාහ කළ නමුත් ඔහුට එය නොහැකි විය, මන්ද සේප්පුවේ අගුළු දෙකක් තිබින. ඔහුගේ යතුරෙන් පමණක් එය විවෘත නොවීය. ඔහු කෙතෙක් උත්සාහ කළද, ඔහුට එය විවෘතකිරීමට නොහැකිවිය. ඔහු ව්‍යාකූල විය. ඔහුට යතුරු දී තිබින. සේප්පුව නිත්‍යානුකූලව ඔහුගේ බව ඔහු දැන සිටියේය. ඔහු උපදෙස්වලට කීකරුවී ඇත. නමුත් ඔහුට සේප්පුව විවෘතකිරීමට නොහැකිවිය.

යථා කාලයේදී කාන්තාවක් බිංගෙට ආවාය. ඇයද යතුරක් අතැතිව සිටියාය. එය ඔහු දරාසිටින යතුරට වඩා පැහැදිළි ලෙසම වෙනස් විය. ඇයගේ යතුර අනෙක් අගුලට ගැලපුනි. තමාගේ නීත්‍යානුකූල උරුමය ඇය නොමැතිව තනිවම ලබාගැනීමට නොහැකි බව ඔහු නිහතමානීව දැනගත්තේය.

උපදෙස් පරිදි ඔවුන් දෙදෙනාම එක්ව සේප්පුව විවෘතකරන බවටත්, ඔහු බිංගෙය රැකගෙන එය ආරක්ෂාකරන බවටත්, ඇය සේප්පුව රැකගන්නා බවටත් ඔවුහු ගිවිසුම් කළහ. බිංගෙයි රැකවලා වශයෙන් ඔහුට යතුරු දෙකක් තිබීම ගැන ඇය සැලකිලිමත් නොවූවාය. මන්ද ඔහුගේ සම්පූර්ණ අරමුණ වූයේ, ඔවුන් දෙදෙනාටම බොහෝ වටිනා දෙය ඇය රැකගන්නා විට ඇය ආරක්ෂිතව සිටීමය. ඔවුන් දෙදෙනාම එක්ව සේප්පුව විවෘතකර, ඔවුන්ගේ උරුමය භුක්ති වින්දෝය. ඔවුහු සතුටුවූහ, මන්ද පොරොන්දුවී තිබින. එය ඉබේම පුරවනු ලැබින.

එම නිධානය තම දරුවන්ටද දිය හැකි බව දැඩි සතුටකින් යුතුව ඔවුහු දැනගත්හ; හැම කෙනෙකුටම, අවසාන පරම්පරාව දක්වා අඩු නොවී, සම්පූර්ණ ප්‍රමාණයම ලබාගත හැකිය.

සමහරවිට, ඔවුන්ගේ පරම්පරාවේ කිහිපදෙනෙක් නොමිලේ ලැබෙන යතුර තිබෙන සහකරු හෝ සුදුසුව සිටිමින් නිධානයට සම්බන්ධ ගිවිසුම් තැබීමට කැමතිවන කෙනෙකු සොයා නොගනු ඇත. එසේවුවද, ඔවුන් පණිත් තබන්නේ නම්, ඔවන්ට ඉතා කුඩා ආශිර්වාදයක් පවා ප්‍රතික්ෂේප නොවනු ඇත.

ඔවුන්ගේ නිධානය වැරදිලෙස පාවිච්චිකිරීමට සමහරෙක් ඔවුන්ව පෙළඹවිය හැකි බැවින්, යතුරු සහ ගිවිසුම් ගැන ඔවුන්ගේ දරුවන්ට ඉගැන්වීමට ඔවුහු ප්‍රවේශම්වූහ.

යථා කාලයේදී, කෙනෙකුට යතුරු දෙකක්ද, තවෙකෙකුට එක් යතුරක්ද දීම නිසා ඔවුන්ගේ පරම්පරාව අතරින් රැවටුන හෝ ඊර්ෂ්‍යාවන්ත හෝ ආත්මාර්ථකාමී කිහිපදෙනෙක් පැමිණියහ. යයි ආත්මාර්ථකාමියා විමසීය. මට කැමති පරිදි තනිවම නිධානය අයිතිකරගෙන පාවිච්චිකිරීමට මට බැරි "මන්ද"?

සමහරු ඔවුන්ට දී තිබෙන යතුර අනෙක් යතුරට සමානව සකස්කිරීමට උත්සාහ ගත්හ. සමහරවිට, එවිට එය අගුල් දෙකටම ගැලපෙන බව ඔවුහු සිතූහ. තවද එනිසා සේප්පුව ඔවුන්ට වැසී ගියේය. ඔවුන් සකස්කල යතුරු ප්‍රයෝජන නැතිවී, ඔවුන්ගේ උරුමයද නැතිවී ගියේය.

නිධානය කෘතඥපූර්වකව ලබාගෙන එයට සම්බන්ධ නීතිවලට කීකරුවූ අය, මෙලොව සහ සදාකාලය දක්වා ඇති සීමා රහිත සතුට ගැන දැන සිටියහ.

අපගේ පියාණන්ගේ ප්‍රීතියේ සැලසුම ගැන මම සාක්ෂි දරමි, තවද වන්දිගෙවීම සිදුකල උන්වහන්සේගේ නාමයෙන් එය එසේ බවට සාක්ෂි දරමි.

1993 ඔක්තෝබර් මස වැඩිහිටි පැකර් Church General Conference හි කළ කථාවකිනි. (බලන්න Conference Report, ඔක්තෝ. 1993, 27–31; හෝ *Ensign*, නොවැ. 1993, 21–24).

සටහන්

1. බලන්න දහම සහ ගිවිසුම 76:24; තවද බලන්න ගණන්කථාව 16:22; හේබ්‍රෙව් 12:9.
2. බලන්න Doctrine and Covenants 132:63; First Presidency, "The Origin of Man" (නොවැ. 1909), James R. Clark තුලිනි, සකස්., *Messages of the First Presidency of The Church of Jesus Christ of Latter-day Saints,* 6 වෙනි වෙළුම. (1965–75), 4:203; තවද බලන්න Spencer W. Kimball, "The Blessings and Responsibilities of Womanhood," *Ensign,* මාර්තු. 1976, 71; Gordon B. Hinckley, Conference Report තුලිනි, ඔක්තෝ. 1983, 115; හෝ *Ensign,* නොවැ. 1983, 83.
3. බලන්න *Teachings of the Prophet Joseph Smith,* තෝරා. Joseph Fielding Smith (1976), 348–49, 357, 365.
4. බලන්න ආබ්‍රහම් 3:24–27.
5. බලන්න යෙරොම් 1:2; ඇල්මා 24:14; 42:5; මෝසෙස් 6:62.
6. බලන්න යාකොබ් 6:8; ඇල්මා 12:25–36; 17:16; 18:39; 22:13–14; 39:18; 42:11, 13.
7. ඇල්මා 42;8.
8. බලන්න ඇල්මා 42:2–5.
9. බලන්න 2 නිෆායි 9:28; ඇල්මා 12:4–5; හීලමන් 2:8; 3 නිෆායි 1:16; දහම සහ ගිවිසුම 10:12, 23; මෝසෙස් 4;3.
10. බලන්න *Teachings of the Prophet Joseph Smith,* 181, 297.
11. බලන්න *Teachings of the Prophet Joseph Smith,* 181.
12. බලන්න 2 නිෆායි 2: 18; 28:20.
13. බලන්න ඇල්මා 39:5; මොරෝනි 9:9.
14. බලන්න දහම සහ ගිවිසුම 130:2; 131:2; 1 කොරොන්ති 11:11; එපීස 5:31.
15. බලන්න මෝසෙස් 6:8–9.
16. බලන්න මෝසෙස් 3:8.
17. බලන්න මෝසෙස් 6;67.
18. බලන්න මෝසෙස් 3:18.
19. බලන්න මෝසෙස් 3:23–24.
20. දහම සහ ගිවිසුම 42:22
21. බලන්න මෝසෙස් 4:7–12.
22. 2 නිෆායි 2:25.
23. *Cowley and Whitney on Doctrine* , සකස්. Forace Green (1963), 287.
24. මෝසෙස් 2:28; තවද බලන්න උත්පත්ති 1:28; 9:1
25. බලන්න ගලාති 5:22–23; දහම සහ ගිවිසුම 4:5–6; ඇල්මා 7:23–24.
26. බලන්න දහම සහ ගිවිසුම 131:2.
27. බලන්න "Our Wives and Our Mothers in the Eternal Plan" (කථාව දෙන ලද්දේ Relief Societyස සම්මන්ත්‍රනය, 3 ඔක්තෝ. 1946), *J. Reuben Clark: Selected Papers on Religion, Education, and Yout,* තුලිනි, සකස්. David H. Yarn Jr. (1984), 62.
28. බලන්න උත්පත්ති 1:28, සටහන 28 ආ.
29. බලන්න දහම සහ ගිවිසුම 75:28; 1 තිමොති 5:8.
30. දහම සහ ගිවිසුම 107:40–41; තවද බලන්න දහම සහ ගිවිසුම 84:14–16.
31. දහම සහ ගිවිසුම 121;41–42.
32. දහම සහ ගිවිසුම 121:37.
33. දහම සහ ගිවිසුම 84:39.
34. දහම සහ ගිවිසුම 121;37.
35. බලන්න *Teachings of the Prophet Joseph Smith,* 308, 367.
36. *The Discourses of Wilford Woodruff,* තෝරා. G. Homer Durham (1946), 25–26.
37. Conference Report තුලිනි, ඔක්තෝ. 1942, 7, 11–12.
38. බලන්න දහම සහ ගිවිසුම 107:8–9, 22, 91.
39. බලන්න දහම සහ ගිවිසුම 137:7–9.
40. "Discourse by President Lorenzo Snow," *Millennial Star,* 31අගෝ. 1899, 547.

# විවාහයේ එක්සත්කම වැඩිදියුණුකිරීම

# 2

## අදාළකරගැනීමට අදහස්

ඔබගේම අවශ්‍යතාවයන් සහ තත්වයන් අනුව, මෙම යෝජනා එකක් හෝ දෙකම අනුගමනයකරන්න.

- එක්සත්කම ගැන පහත සඳහන් ශුද්ධ ලියවිලි කියවන්න; 1 කොරොන්ති 1:9–10; පිලිප්පි 1:27; මොසායා 18:21; දහම සහ ගිවිසුම 38:27; මෙම වාක්‍යාංශ ස්වාමිපුරුෂයා සහ භාර්යාව අතර සම්බන්ධතාවයට අදාළවිය හැකි අන්දම ගැන සිතාබලන්න.
- ඔබගේ කාලයේදී ඔබ දෙදෙනාට තිබෙන සමාජ, වෘත්තීමය, ග්‍රාමීය සහ සභා කටයුතු ඇතුළු ප්‍රශ්න ගැන ඔබගේ සහකාරිය සමග සාකච්ඡාකරන්න. එකිනෙකාගේ අවශ්‍යතාවයන් තේරුම්ගැනීමට කාලය වැයකර, ඔබගේ අනෙක් කටයුතු එකිනෙකා සමග ඇති පක්ෂපාතීත්වයට බාධාවක් නොවන බවට සහතිකකරගන්න.

## කියවීමේ පැවරුම

පහත සඳහන් ලිපිය අධ්‍යයනය කරන්න. ඔබ විවාහක නම්, ඔබගේ සහකාරිය සමග ලිපිය සාකච්ඡා කරන්න.

### එනම් අපි ඒකත්වයක් වනු ඇත

වැඩිහිටි හෙන්රි බී. අයිරින්
ප්‍රේරිතවරුන් දොළොස්දෙනාගේ ගණපූර්ණය

#### "නුඹලා ඒකත්වයක් නොවේ නම් නුඹලා මාගේ නොවන්නෙහුය"

ලෝකයාගේ ගැලවුම්කරුවාණන් වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේ උන්වහන්සේගේ සභාවේ කොටසක් වන අයට මෙසේ කීසේකඃ ඒකත්වයක් වෙයල්ලා, නුඹලා ඒකත්වයක් නොවන්නේ නම්, නුඹලා මාගේ නොවන්නෙහුය (බලන්න ඩීසහඝී 38:27). එසේම පුරුෂයා සහ ස්ත්‍රිය මැවීමේදී, විවාහය තුල සම්බන්ධතාවය ඔවුන්ට බලාපොරොත්තුවක් ලෙස දුන්නේ නැත; එය නියෝගයකි! "එබැවින් පුරුෂතෙමේ තමාගේ පියාද මවුද අත්හැර තම භාර්යාවට ඇලුම්වන්නේයඃ ඔවුහු එක මාංශයක් වන්නෝය" (උත්පත්ති 2:24). අපගේ ස්වර්ගික පියාණන්ට අවශ්‍යවන්නේ අපගේ හදවත් එකට බැඳ තැබීමය. ප්‍රේමයේ එම එක්සත්කම හුදෙක් කල්පිතයක් නොවේ. එය අවශ්‍යතාවයකි.

අප ඒකත්වයක් වීමේ අවශ්‍යතාවය මෙම ජීවිතයට පමණක්ම නොවේ. එය අවසානයකින් තොර විය යුතුය. දෙවියන්වහන්සේ විසින් පළවෙනි විවාහය උයනේදී ඉෂ්ඨකරන ලද්දේ ආදම් සහ ඒවා අමරණීයව සිටියදීය. උන්වහන්සේ ආරම්භයේ සිටම මිනිසුන්ට කාන්තාවන්ට පුරුෂයා සහ ස්ත්‍රිය වශයෙන් සදාකාලයටම එකට සිටීමේ කැමැත්ත ඇති කලේ, සර්ව සම්පූර්ණ ධර්මිෂ්ඨ සම්බන්ධයකින් පවුල් මෙන් වාසය කිරීමටය. උන්වහන් සේගේ දරුවන් ඔවුන් අවට සිටින සියල්ලන්ම සමග සමාදානයෙන් ජීවත්වීමට උන්වහන්සේ ඔවුන් තුල කැමැත්තක් ඇති කළසේක.

නමුත් වැටීමත් සමග සමාදානයෙන් ජීවත්වීම පහසු නොවන බව පැහැදිළි විය. ශෝකාන්තයක් මුලින්ම ඇතිවිය. කේන්, තම සොහොයුරවූ ආබෙල් මැරුවේය. ආදම්ගේ සහ ඒවාගේ දරුවෝ සාතන්ගේ පරීක්ෂාවන්වල යටත්වැසියන් බවට පත්වූහ. දක්ෂකම, වෛරය සහ කපටිකම සමගින් සාතන් තම ඉලක්කයන් හඹාගියේය. එය අපගේ ස්වර්ගික පියාණන්ගේ සහ ගැලවුම්කරුවාණන්ගේ අරමුණෙහි විරුද්ධ පැත්ත විය. උන්වහන්සේලා අපට සර්ව සම්පූර්ණ එක්සත්කමක් සහ සදාකාලික සතුටක් ලබාදෙනසේක. සාතන්, උන්වහන්සේලාගේ සහ අපගේද සතුරා, ගැලවීමේ සැලසුම ගැන මැවීමට පෙර සිටම දැන සිටියේය. පවුල්වල එම පූජනීය, ප්‍රීතිමත් සම්බන්ධතාවය පවතින්නේ සදාකාලික ජීවිතය තුල බව ඔහු දැනසිටියි. සාතන්ගේ කැමත්ත වන්නේ අපගේ ආදරණීය අයගෙන් අපව වෙන්කර, අපව දුකට පත්කිරීමය. එසේම අපට බේදී වෙන්වී සිටිය හැකි බවට බලාපොරොත්තු ඇතිකරමින් මනුෂ්‍ය හදවත්වලට අසමගියේ බීජය වපුරන්නේත් ඔහුය.

අප හැම කෙනෙකුට එක්සත්වීම හෝ වෙන්වීම යන යමක් ගැන හැඟීමක් ඇතිවී ඇත. සමහර අවස්ථාවලදී පවුල් තුල සහ සමහරවිට වෙනත් වටපිටාවන් වලදී, එක් පුද්ගලයෙක් තවත් කෙනෙකු මත ඔහුගේ හෝ ඇයගේ කැමැත්තෙන් තොරව, ප්‍රේමයෙන් සහ පරිත්‍යාගයෙන් යුතුව සැලකිල්ලක් දක්වන බව අපි දැක ඇත්තෙමු. එසේම අපි සියලුදෙනාම වෙන්වීමෙන් සහ තනිවීමෙන් ඇතිවන කණගාටුව සහ හුදකලාවීම ගැනද යමක් දන්නෙමු. අප තෝරාගත යුත්තේ කුමක්දැයි අපට කීම අවශ්‍ය නොවේ. අපි එය දන්නෙමු. නමුත් මේ ජීවිතයේදී අපි එක්සත්කම අත්විඳ, එය සදකාලිකවම මතු පැමිණෙන ලෝකයේදී පවා ලබාගැනීමට සුදුසුවීම සඳහා අපට බලාපොරොත්තුවක් අවශ්‍යවේ. එසේම එම ශ්‍රේෂ්ඨ

ආශිර්වාදය ලැබෙන අන්දම දැනගැනීමද අපට අවශ්‍යවේ. එවිට අපි කළ යුතු කුමක්දැයි අපට දැනගත හැකිය.

**ගැලවුම්කරුවාණන්වහන්සේ එක්සත්කම ඇතිකරගැනීමට හැකියාවක් ලබාදෙනසේක.**

ලෝකයාගේ ගැලවුම්කරුවාණන් එම එක්සත්කම ගැන සහ එය ලබාගැනීම සඳහා අප අපගේ ගති පැවතුම් වෙනස්කරන අන්දම ගැනද කථාකළසේක. උන්වහන්සේ මරණයට පත්වීමට පෙර තම ප්‍රේරිතවරුන් සමග පැවැත්වූ අවසාන රැස්වීමේදී දුන් උන්වහන්සේගේ යාච්ඤාවේදී එතුමා එය පැහැදිළිව ඉගැන්වූසේක. එම දිව්‍යමය අලංකාර යාච්ඤාව යොහාන්ගේ පොතේ වාර්තාකර ඇත. සදාකාලික ජීවනයට හැකියාව ඇතිකිරීම සඳහා උන්වහන්සේ අප සියලුදෙනාම වෙනුවෙන් භයානක පරිත්‍යාගයට මුහුණදීමට සූදානම්ව සිටියහ. උන්වහන්සේ විසින් පත්කරන ලැබුවාවූද, උන්වහන්සේ විසින් ප්‍රේමකලාවූද, තම සභාව මෙහෙයවීමට උන්වහන්සේ විසින් යතුරු බාරදීමට සිටින තම ප්‍රේරිතවරුන් අතැර යාමට එතුමා සූදානම්ව සිටියහ. තවද එසේ එතුමා, ශ්‍රේෂ්ඨ පුතෙකු ශ්‍රේෂ්ඨ දෙමාපියෙකුට යාච්ඤාකරන ලෙස, තම පියාණන්ට යාච්ඤා කළසේක. උන්වහන්සේගේ වචන තුල ගැලවුම්කරුවාණන් සහ එතුමාගේ සේවකයන් අනුගමනයකරන අපගේ ස්වර්ගික පියාණන්ගේ සියලුම දරුවන් මෙන් පවුල් ඒකත්වයක් වන අන්දම අපි දකින්නෙමු:

"ඔබ මා ලෝකයට එවූවාක්මෙන්ම මමද ඔවුන් ලෝකයට යැවීමි.

"සත්‍යතාවෙන් ඔවුන්ද පවිත්‍රවන පිණිස ඔවුන් උදෙසා මා කැපකර ගතිමි.

"මොවුන් ගැන පමණක් නොව, මොවුන්ගේ වචනය කරණකොටගෙන මා කෙරෙහි විශ්වාස කරන්නවුන් ගැනත්;

"ඔවුන් සියල්ලන් ඒකත්වයක්වන පිණිස පියවූ ඔබ මා තුලෙහිද, මා ඔබ තුළෙහිද සිටින්නාක් මෙන්ම ඔබ මා එවූ බව ලෝකයා විශ්වාසකරන පිණිසත්, අප තුළ ඔවුන් ඒකත්වයක්වන පිණිසත් යාච්ඤාකරමි" (යොහාන් 17:18–21).

එම වචන කිහිපය තුළින් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සුභාරංචියට හදවත් එකක් කිරීමට ඉඩලැබෙන අන්දම ගැන එතුමා පැහැදිළි කළසේක. සත්‍යයය විශ්වාසකරන අයට එතුමාගේ අවසර ලත් සේවකයන් ලබාදෙන නියෝග සහ ගිවිසුම් පිළිගතහැකි බව උන්වහන්සේ ඉගැන්වූසේක. ඉන්පසු, එම නියෝගවලට සහ ගිවිසුම්වලට කීකරුවීම තුළින් ඔවුන්ගේ ස්වභාවය වෙනස්වනු ඇත. ඒ අන්දමින් ගැලවුම්කරුවාණන්ගේ වන්දිගෙවීම මගින් පවිත්‍රවීමට අපට හැකියාව ලබාදෙයි. ඉන්පසුව, පියාණන්වහන්සේ සහ එතුමාගේ පුත්‍රයාණන් සමග සදාකාලය දක්වා ජීවත්වීමට අපට මෙම ජීවිතයේ සමාදානය තිබිය යුතු නිසා එක්සත්කමින් අපට ජීවත්විය හැකිය.

එදා සිටි ප්‍රේරිතවරුන් සහ අනාගතවක්තෘවරුන් මෙහෙ කළාක් මෙන්, වර්තමානයේද, ආදම් සහ ඒවාගේ ළමුන් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඇදහිල්ලේ එක්සත්කමට ගෙනඒමට තිබේ. ඔවුන් ඉගැන්වූ දේවල්වල සහ අප උගන්වන දේවල අවසාන අරමුණ වන්නේ, පවුල් එක්සත් කිරීමය: ස්වාමිපුරුෂයන්, භාර්‍යාවන් ළමයින්, මුනුපුරන්, මුතුන්මිත්තන් සහ අවසානලෙස එය තෝරාගන්නා ආදම් සහ ඒවාගේ මුළු පවුලම එක්සත්කිරීමය.

**අන් අය සමග එක්සත්වීමට ආත්මයාණන් මෙහෙයවයි**

ගැලවුම්කරුවාණන්ගේ වචන ඔබට මතකය, "ප්‍රේරිතවරුන් ගැන කථාකරමින්"—"සත්‍යතාවෙන් ඔවුන්ද පවිත්‍රවන පිණිස—ඔවුන් උදෙසා—මා කැපකරගතිමි" (යොහාන් 17:19). ශුද්ධාත්මයාණන්වහන්සේ පවිත්‍රකරුවෙක් වනසේක. අනාගතවක්තෘ ජෝසෆ් ස්මිත් තුළින් ස්වාමීන් වහන්සේ මෙල්කිසදෙක් පූජකවරය නැවත පිහිටුවූ නිසා, එතුමා අපගේ සහායකයෙකු ලෙස ලබාගැනීමට අපට පුළුවන. අද එම පූජකවරයේ යතුරු පොළොව මත ඇත. එහි බලය මගින් අපට ගිවිසුම් තැබීමට හැකි අතර, එමගින් අපට නිරන්තරයෙන්ම ශුද්ධාත්මයාණන් ඇතිව සිටීමට ඉඩ ලැබේ.

මිනිසුන් එම ආත්මයාණන් ඇතිව සිටින විට, අපට සමගිය බලාපොරොත්තුවිය හැකිය. ආත්මයාණන් සත්‍යයේ සාක්ෂිය අපගේ හදවත්වල තබන අතර, එම සාක්ෂිය බෙදාගන්නා අයව එමගින් ඒකාබද්ධකරයි. දෙවියන්වහන්සේගේ ආත්මය විවාදය ඇති නොකරයි (බලන්න 3 නිෆායි 11:29). එය මිනිසුන් අතර කළහය ඇතිකරන වෙනස් හැඟීම් ඇති නොකරයි (බලන්න Joseph F. Smith, *Gospel Doctrine,* 5වෙනි ප්‍රකා. [1939], 131). එමගින් පෞද්ගලික සමාදානය සහ අන් අය සමග එක්සත් හැඟීමක් ඇතිකරයි. එය ආත්ම ඒකාබද්ධකරයි. ඒකාබද්ධ පවුලක්, එකමුතුවූ සභාවක්, ලෝක සාමයක් ඒකාබද්ධවූ ආත්මවල පදනම මත රඳාපවතී.

**සක්‍රමේන්තු යාච්ඤාවල තැබූ පොරොන්දු ඉෂ්ඨකිරීම**

ශුද්ධාත්මයාණන්වහන්සේ මිතුරෙකු කරගැනීමට කළ යුතු දේවල් ගැන කුඩා ළමයෙකුට පවා තේරුම්ගත හැකිය. සක්‍රමේන්තු යාච්ඤාව අපට කියයි. හැම සතියකම අප අපගේ සක්‍රමේන්තු රැස්වීම්වලට සහභාගිවන විට එය අපි අසන්නෙමු. එම පූජනීය මොහොතේදී අප බව්තීස්මයේදී තැබූ පොරොන්දු අපි අළුත්කරන්නෙමු. එසේම එම අප ලැබූ පොරොන්දු සභාවේදී අපව සාමාජිකයන් ලෙස ස්ථිරකරන විටදී ස්වාමීන්වහන්සේ අපට—ශුද්ධාත්මයාණන් ලැබෙන පොරොන්දුව සිහිපත්කරනසේක. සක්‍රමේන්තුවේ වචන මේවාය: ඔබවහන්සේගේ පුත්‍රයාණන්ගේ නාමය ඔවුන් මත ගැනීමට සහ උන්වහන්සේව නිතරම සිහිපත්කරමින්, ඔවුන්ට දුන් පණත් ආරක්ෂාකිරීමට ඔවුහු කැමතිවන්නාහ. (බලන්න ධීසහගී 20:77).

ගිවිසුම ආරක්ෂාකිරීම මගින් අපට උන්වහන්සේගේ ආත්මයාණන් ලබාගත හැකිය. පළමුව, එතුමාගේ නාමය අප මත ගැනීමට අපි කැමතිවන්නෙමු. එහි අදහස අප උන්වහන්සේ මෙන් විය යුතුබවය. අපගේ ජීවිතවල උන්වහන්සේව අපි පළමු ස්ථානයේ තබන්නෙමු. අපට අවශ්‍ය හෝ අපට අවශ්‍යවන බවට ලෝකයා අපට

උගන්වන දේවල් වෙනුවට, අපට අවශ්‍යවන්නේ උන්වහන්සේට අවශ්‍ය දෙයයි. අපි පළමුව ලෝකයේ දේවලට ප්‍රේමකරන තාක් කල්, අප තුළ සමාදානයක් ඇති නොවනු ඇත. පවුලක් හෝ ද්‍රව්‍යමය දේවල් තුලින් සුවපහසුව සොයන ජාතියක කල්පිතයක් තැබාගැනීමෙන් අවසානයේදී ඔවුන් බෙදීයනු ඇත (බලන්න Harold B. Lee, *Stand Ye in Holy Places* [1974], 97). එකිනෙකාට සේවයකිරීමේ කල්පිතය වන ස්වාමීන්වහන්සේ අපගෙන් අපේක්ෂාකරන දෙය කිරීමෙන්. ස්වභාවයෙන්ම එය අප මත ස්වාමීන්වහන්සේගේ නාමය ගැනීමක් වන බැවින්, අපව ආත්මික තත්වයට ගෙනඒමට හැකිවීමෙන් එය පොළොවේ ස්වර්ගයක කොටසක් වන්නේය.

දෙවනුව, උන්වහන්සේව නිතරම සිහිපත්කරන බවට අපි පොරොන්දු වන්නෙමු. උන්වහන්සේගේ නාමයෙන් යාච්ඤාකරන හැම අවස්ථාවකම අපි එය කරන්නෙමු. විශේෂයෙන්ම අපි නිතරම කළ යුතු ලෙස, අපි උන්වහන්සේගෙන් කමාව ඉල්ලන විට, අපි එතුමාව සිහිපත් කරන්නෙමු. එම මොහොතේ පසුතැවිල්ල සහ කමාවට හැකියාව ලබාදෙන එතුමාගේ ආත්ම පරිත්‍යාගය අපට සිහිපත්වේ. අපි ආයාචනාකරන විට, උන්වහන්සේ පියාණන් සමග අපගේ මැදහත්කරුවාණන් බව අපට සිහිපත්වේ. කමාවේ සහ සමාදානයේ හැඟීම් ඇතිවන විට, එතුමාගේ ඉවසීම සහ එතුමාගේ අසීමිත ප්‍රේමය ගැන අපට සිහිපත්වේ. එම මතකයෙන් අපගේ හදවත් ප්‍රේමයෙන් පුරවනු ලබයි.

පවුල් වශයෙන් එක්ව අප යාච්ඤාකරන විට සහ අප ශුද්ධ ලියවිලි කියවන විටද උන්වහන්සේව සිහිපත්කරන පොරොන්දුව අපි තබන්නෙමු. උදය කෑම මේසය ළඟ යාච්ඤාකිරීමේදී, එක් ළමයෙකුට තව කෙනෙක් වෙනුවෙන් ඒදින පරීක්ෂණය හෝ යම් ක්‍රියාවක් හොඳින් කිරීමට ආශිර්වාදිතවීමට යාච්ඤාකළ හැකිය. ආශිර්වාද ලැබෙන විට, ආශිර්වාදිතවූ ළමයාට උදෑසන තිබූ ප්‍රේමය සහ යාච්ඤාව පිළිගැන්වූ මැදහත්කරුවාණන්ගේ නාමයේ කරුණාව සිහිපත්වනු ඇත. හදවත් ප්‍රේමයෙන් බැඳෙනු ඇත.

ශුද්ධ ලියවිලි කියවීමට පවුලක් ලෙස එකතුවන හැම අවස්ථාකදීම උන්වහන්සේ සිහිපත්කිරීමේ පොරොන්දුව අපි තබන්නෙමු. ඒවා ස්වාමීන්වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන සාක්ෂිදරයි, මන්ද එය නිතරම ලැබෙන අනාගතවක්තෘ වරුන්ගේ පණිවුඩය වන නිසාය. ළමයින්ට නිතරම වචන මතක නොතිබුනද, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වන සත්‍ය කර්තෘවරයාණන් ඔවුන්ට සිහිපත්වනු ඇත.

### සියලුම පණත්වලට කීකරුවන්න

තුන්වෙනිව, අප සක්‍රමේන්තුව ගන්නා විට උන්ව හන්සේගේ පණත්, ඒවා සියල්ලම ඉටුකරන බව අපි පොරොන්දු වන්නෙමු. සභාපති ජේ. රූබන් ක්ලාක් කණි., ඔහු නිතරම කළ ලෙස—එක්සත්කම සඳහා ප්‍රධාන සම්මන්ත්‍රණ කථාවකදී—ඉල්ලීමක් කරමින්, පණත් තෝරාගෙන කීකරුවීම ගැන අපට අනතුරු ඇඟවීය. ඔහු එය මේ අන්දමින් කීවේය: "අප්‍රයෝජන හෝ අනවශ්‍ය හෝ කිසිවක් ස්වාමීන්වහන්සේ අපට දී නැත. උන්වහන්සේ ශුද්ධ ලියවිලි පුරවා තිබෙන්නේ අපට ගැලවීම ලබාගැනීම සඳහා අප කළ යුතු දෙවල් වලින්ය."

සභාපති ක්ලාක් මෙසේද කීය: "අපි සක්‍රමේන්තුව භුක්තිවිඳින විට, උන්වහන්සේගේ පණත්වලට කීකරුව ඒවා ආරක්ෂාකරන බවට අපි ගිවිසුම් කරන්නෙමු. අත්හැර දැමීමක් එහි නැත. විශිෂ්ඨ ඒවා එහි නැත, විවිධත්වයක්ද එහි නැත." (Conference Report තුලිනි, අප්‍රේ. 1955, 10–11). අප සියලුම පාපවලට පසුතැවෙන විට, හුදෙක් එක පාපයකට නොව, අප ප්‍රතිඥාදෙන්නේ සියලුම පණත් තැබීමටය. එය අසීරුබව පෙනුනද, එය ව්‍යාකුල නැත. අපි හුදෙක් ගැලවුම්කරුවාණන්ගේ අධිකාරීබලයට යටහත්ව, උන්වහන්සේ කුමක් නියෝග කළද ඒවාට කීකරුවන බවට පොරොන්දු වන්නෙමු. (බලන්න Mosiah 3:19). අපට පවුලක් ලෙසද, සභාවක් ලෙස සහ අපගේ ස්වර්ගික පියාණන්වහන්සේගේ දරුවන් ලෙස එකට බැඳීමට ඉඩ සලසන්නේ අප යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ අධිකාරීබලයට යටත්වූ විටය.

ස්වාමීන්වහන්සේ එම අධිකාරීබලය එතුමාගේ අනාගතවක්තෘවරුන් තුලින් යටහත් සේවකයන්ට ලබාදෙනසේක. එම ඇඳහිල්ල ස්වාමීන්වහන්සේගේ සංදේශයකයක් රැගෙන යන නිවාස ගුරුවරයෙකු හෝ බැහැදැකීමේ ගුරුවරයෙකුගේ කැඳවීමකට හැරෙනු ඇත. එතුමාගේ නියමය අනුව අපි එතුමා වෙනුවෙන් යන්නෙමු. සාමාන්‍ය මිනිසෙක් සහ තරුණ කණිෂ්ඨ සහායකයෙක් නිවාසවලට ගොස් ස්වර්ගීය බලයෙන් ඔවුන්ට උපකාර ලැබී, එම පවුල්වල එක්සත්වන බව ඇතිවී, ඔවුන් අතර දැඩිබව, බොරුකීම්, හතුරුකම් සහ පරුෂවචන කීම් නැති බව සහතික කරති. සුපුරුදු ලෙස, ඔවුන් අපට තරවටුකරන විට, ඔවුන්ගේ එම සීමාවන් නොසළකාහැරීමට එම ඇදහිල්ල—එම ස්වාමීන්වහන්සේ කැඳවූ සේවකයන්—අපට උපකාරකරනු ඇත. ඔවුන්ගේ යහපත් අභිප්‍රායන් ඔවුන්ගේ මනුෂ්‍ය සීමාවන්වලට වඩා පැහැදිළිව අප දකිනු ඇත. අපගේ අමනාප හැඟීම් අඩුවී, ඔවුන්ව කැඳවන ලද ආචාරීන්වහන්සේට වඩාත් කෘතඥ හැඟීමක් අපට ඇතිවේ.

### එක්සත්කමට දයාව අත්‍යාවශ්‍යවේ

සමහර පණත් කැඩූ විට එක්සත් කම විනාශකරදමයි. සමහර ඒවා අප කථාකරන දෙයට සම්බන්ධ අතර, සමහර ඒවා අන් අය කියන දෙයට අප දක්වන ප්‍රතිචාරයට සම්බන්ධය. අපි කිසිවෙකු ගැන නපුරු දේවල් කථා නොකළ යුතුය. අපි හැකි හැම විටකම එකිනෙකාගේ යහපත බැලිය යුතු වෙමු (බලන්න David O. McKay, Conference Report තුලිනි. ඔක්තෝ. 1967, 4–11).

එසේ වුවත්, පූජනීය දේවලට අවඥාවෙන් කථාකරන අයට විරුද්ධව අපි නැඟීසිටිය යුතු වෙමු. මන්ද එම වරදේ යම් ප්‍රතිඵල ආත්මයාණන් අමනාපයට පත්කර විවාදය සහ ව්‍යාකුලබවක් ඇතිකරන නිසාය. සභාපති ස්පෙන්සර් ඩබ්ලිව්. කිම්බල් වාද නොකර නැගීසිටින මාර්ගය පෙන්වා දුන්නේය, ඔහු ආරෝග්‍යශාලාවේ වැතිර සිටිමින්, උපස්ථායකයෙකු අමතු විට, ඔහු මොහොතකින් කලකිරී ස්වාමීන්වහන්සේගේ නාමය නිකරුනේ ඇදගත්තේය:

"'කරුණාකර! කරුණාකර! එතුමා මගේ ස්වාමීන්වහන්සේ, එතුමාගේ නමටයි ඔබ අපහාසකරන්නේ,' යයි කීවේය. එහි තද නිහැඬියාවක් විය. ඉන්පසුව ඔහු යටහත් හඬකින්, 'මට කණගාටුයි'" කීවේය (*The Teachings of Spencer W. Kimball,* සකස්. Edward L. Kimball [1982], 198). ආනුභාසම්පන්න, ප්‍රේමනීය තරවටුවක් එක්සත්කමට ආරාධනාවක් විය හැකිය. ශුද්ධාත්මයාණන් මෙහෙයවනු ලබන විට එයට ඇහුම්කන් දීමට අසමත්වීම, අසමගියට හේතුවන්නේය.

අපට එක්සත්කම ලබාගැනීමට නම්, අප සිතන අන්දම සම්බන්ධ අප තැබිය යුතු පණත් ඇත. අපව අමනාපයට පත්කල අයට අප සමාව දී ඔවුන් ගැන ද්වේෂය නැතිකර ගත යුතුය. ගැලවුම් කරුවාණන්වහන්සේ කුරුසියෙන් අපට ආදර්ශයක් තැබූසේක: "පියාණෙනි, ඔවුන්ට කමාවුව මැනව; මක්නිසාද ඔවුන් කරන්නේ මොකද කියා ඔවුහු නොදනිති" (ලූක් 23:34). අප නිසා අමනාපවන අයගේ හදවත් ගැන අපි නොදනිමු. එසේම අපගේම අමනාපය සහ වේදනා ඇතිවන සියලුම මාර්ග ගැනද අපි නොදනිමු. අපද ඇතුළු, අසම්පූර්ණ ලෝකයක ප්‍රේමය දක්වන අන්දම ගැන පාවුළු ප්‍රේරිතවරයා අපට මෙසේ කියයි, "ප්‍රේමය බොහෝ ඉවසිලිවන්තය, ගුණවන්තය; ප්‍රේමය ඊර්ෂ්‍යාවන්නේ නැත; ප්‍රේමය පාරට්ටුකරගන්නේ නැත, උඩගුවන්නේ නැත, අශෝභන ලෙස හැසිරෙන්නේ නැත, තමාගේම කාරණා සොයන්නේ නැත, කෝපවන්නේ නැත, නපුර ගණන්ගන්නේ නැත." (1 කොරොන්ති 13:4–5). තවද ඉන්පසුව ඔහු අන් අයගේ වැරදිවලට ප්‍රතිචාර දක්වන අයුරු සහ අපගේම වැරදි අමතකකරන අන්දම ගැන බරපතල අවවාදයක්ද දෙමින් මෙසේ ලීවේය, "එසේය දැන් අපට කැඩපතකින් අඳුරු ලෙස පෙනෙන් නේය; නුමුත් මතු මුහුණට මුහුණ පෙනෙනවා ඇත. දැන් මගේ දැනගැන්ම අඩුය; නුමුත් මා දැනගනු ලැබූ ලෙසම…මතු මම දැනගන්නෙමි" (1 කොරොන්ති 13:12).

## පිරිසිදුව සිටිමින් අහංකාර නොවීමට ප්‍රවේශම්වන්න

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ව්‍යවස්ථා සහ නියෝගවලට කීකරුවීම තුලින්, එක්සත්කමේ දීමනාව ලැබෙන අන්දම ගැන හැම සතියකම අපට සිහිපත්කිරීමට සක්‍රමේන්තු යාච්ඤාවට පුළුවන. උන්වහන්සේගේ නාමය අප වෙත ගෙන, උන්වහන්සේව නිතරම සිහිපත්කිරීමට සහ උන්වහන්සේගේ සියලුම පණත් ආරක්ෂාකිරීමට අප තැබූ ගිවිසුම් අප ආරක්ෂාකරන විට, උන්වහන්සේගේ ආත්මයාණන්ගේ මිත්‍රත්වය අපට ලැබෙන්නේය. එය අපගේ හදවත් මෘදුකර, අපව එක්සත්කරයි. නමුත් අවවාද දෙකක් ඇති අතර, ඒවා එම පොරොන්දුව සමග තිබිය යුතුය.

පළමුව, ශුද්ධාත්මයාණන් අප සමග නැවතී සිටින්නේ, අප පිරිසිදුව සිටිමින්, ලෞකික දේවල්වලට ආශාකිරීමෙන් නිදහස්ව සිටීමෙන් පමණය. අපිරිසිදුව සිටීමේ තෝරා ගැනීම ශුද්ධාත්මයාණන් පලවාහරියි. ආත්මයාණන් වාසයකරන්නේ ලෝකයට වඩා ස්වාමීන්වහන්සේව තෝරාගත් අය සමග පමණය. "නුඹ පිරිසිදුව සිටපන්න" (3 නිෆායි 20:41; බලන්න ඩීසහසී 38:42) සහ නුඹේ මුළු හදින්ද,…බලයෙන් සහ ශක්තියෙන්ද දෙවියන්වහන්සේට ප්‍රේමකරපන්න ( බලන්න ඩීසහසී 59:5) මේවා යෝජනා නොව නමුත්, පණත්ය. තවද ඒවා ආත්මයාණන්ගේ මිත්‍රත්වයට අත්‍යාවශ්‍යවන අතර, ඒවා නොමැතිව අපට ඒකත්වයක් විය නොහැකිය.

අනෙක් අවවාදය නම් අහංකාරකමින් ප්‍රවේශම්වීමය. පවුලකට හෝ ජනතාවකට ආත්මයාණන් විසින් මොළොක්කර පැමිණෙන එක්සත්කම විශාල බලයක් රැගෙන එයි. එම බලය සමග ලෝකයේ පිළිගැනීමද ලැබෙනු ඇත. එම පිළිගැනීම ප්‍රශංසාව හෝ වෛරය වුවද, එය අපව අහංකාර කරයි. එය ආත්මයාණන් අමනාපකරයි. අහංකාරකමට, එම ස්ථිර අසමගියේ හේතුවට විරුද්ධ ආරක්ෂාවක් ඇත. එය නම්, දෙවියන්වහන්සේ අප මත වගුරුවන දීමනාවන්ය. එය උන්වහන්සේගේ අනුග්‍රහයේ සලකුණක් පමණක්ම ලෙස නොව නමුත් අප වටා සිටින අය සමග ශ්‍රේෂ්ඨ සේවයකට සම්බන්ධවීමේ අවස්ථාවකි. යම් මිනිසෙක් සහ ඔහුගේ බිරිඳ ඒකත්වයක් වීමට ඉගෙනගන්නේ එකිනෙකා තේරුම්ගැනීම සඳහා ඔවුන්ගේ සමානකම් පාවිච්චිකරමින් සහ ඔවුන්ගේ වෙනස්කම් ගැන එකිනෙකාට ප්‍රශංසාකරමින් එකිනෙකාට සහ ඔවුන් අවට සිටින්නන්ටද සේවය කිරීමෙන්ය. ඒ අන්දමට, අපගේ දහම පිළිනොගන්නා අය සමගද එක්සත්වීමට අපට හැකි නමුත්, අපගේ ස්වර්ගික පියාණන්ගේ දරුවන්ට ආශිර්වාදකිරීමට අප තුල ඇති කැමැත්තද බෙදාගත හැකිය.

අපට සමාදානකරන්නන්වී, දෙවියන්වහන්සේගේ දරුවන්ට ආශිර්වාදකිරීම සඳහා කැඳවීමට සුදුසුවිය හැකිය (බලන්න මතෙව් 5:9).

දෙව්වූ අපගේ පියාණන්වහන්සේ ජීවමානවනසේක. උන්වහන්සේගේ ප්‍රේමනීය පුත්‍රයාණන්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ, සභාවේ ප්‍රධානත්වය වන අතර, එය පිළිගන්නා සියල්ලන්ටම එතුමා සමාදානයේ ප්‍රමිතිය ලබාදෙනසේක.

1998 අප්‍රේල් මස Church General Conference හි කළ කථා වකිනි. (බලන්න Conference Report, අප්‍රේ. 1998, 85–89; හෝ *Ensign*, මැයි 1998, 66–68).

# විවාහයේ ප්‍රේමය සහ මිත්‍රත්වය පෝෂණයකිරීම

# 3

## අදාළකරගැනීමට අදහස්

ඔබගේම අවශ්‍යතාවයන් සහ තත්වයන් අනුව, මෙම යෝජනා එකක් හෝ දෙකම හෝ අනුගමනයකරන්න.

- මොරෝනි 7:45–48 අධ්‍යයනයකරන්න. මෙම කොටසේ සඳහන් දයාවේ ගුණාංගවල ලැයිස්තුවක් සකස්කරන්න. මෙම ගුණාංග ඔබගේ ජීවිතය තුළ දියුණුකරගැනීමට අභිප්‍රායක් ඇතිකරගන්න. ස්වාමිපුරුෂයන් සහ භාර්යාවන්ට මෙම ගුණාංගවලින් ඔවුන්ගේ ප්‍රේමය සහ මිත්‍රත්වය පෝෂණයකරගැනීමට උපකාරවිය හැකි මාර්ග ගැන සිතාබලන්න.
- ඔබගේ සහකරු සමග, හැම සතියකම එක්ව කාලයගතකිරීමට සැලැස්මක් සකස්කරන්න. මෙම නියමිත කාලවේලාවන් දිනදර්ශනයක හෝ සටහන් පොතක ලියා තබා සිහිපත්කිරීම අවශ්‍යවිය හැකිය.

## කියවීමේ පැවරුම්

පහත සඳහන් ලිපිය අධ්‍යයනයකරන්න. ඔබ විවාහක නම්, මෙම ලිපිය ඔබගේ සහකරු සමග කියවා සාකච්ඡාකරන්න.

### විවාහය තුළ ඒකත්වයක්වීම

සභාපති ස්පෙන්සර් ඩබ්ලිව්. කිම්බල්
සභාවේ 12වෙනි සභාපතිවරයා

ගෞරවනීය, ප්‍රීතිමත් සහ සාර්ථක විවාහයක් සැබවින්ම සැම සාමාන්‍ය පුද්ගලයෙකුගේම මූලික ඉලක්කයකි. විවාහය සමහරවිට සියලුම තීරණවල බොහෝ වැදගත් එකක්වන අතර, ඉතාමත් ප්‍රතිඵලදායක බලාපොරොත්තු සහිතය. මන්ද එයින් ක්ෂණික ප්‍රීතිය පමණක්ම නොව, නමුත් සදාකාලික සතුටද බලාපොරොත්තුවන නිසාය. එහි බලපෑම ඊට සම්බන්ධිත දෙදෙනාට පමණක්ම නොව, නමුත් ඔවුන්ගේ පවුල්වලට සහ විශේෂයෙන්ම ඔවුන්ගේ ළමයින්ට මෙන්ම බොහෝ පරම්පරා ගණනක ඔවුන්ගේ ළමයින්ටද බලපානු ලබයි.

මෙම ජීවිතය සහ සදාකාලය දක්වාම සහකාරියක් තෝරාගැනීමේදී, සැබවින්ම වඩාත් ප්‍රවේශමෙන් සැලසුම්කිරීම, සිතාබැලීම සහ යාච්ඤාකිරීම සහ උපවාසකිරීම කළ යුත්තේ, සියලුම තීරණවලට වඩා මෙය නිවැරදි බව සහතිකකරගැනීම සඳහාය. සැබෑ විවාහයක් තුළ සිත් තුළ මෙන්ම හදවත් තුළද එක්සත්කමක් තිබිය යුතුය. හැඟීම්වලට තීරණගැනීම සම්පූර්ණයෙන්ම නිශ්චයකිරීම නොකළ යුතුය. නමුත් උපවාසයෙන්, යාච්ඤාවෙන් සහ බලවත්ව සළකාබැලීම මගින් ශක්තිමත්කරගත් සිතට සහ හදවතට, විවාහයේ ප්‍රීතිය සඳහා වැඩිම අවස්ථාවක් දීම සුදුසුය. එමගින් පරිත්‍යාගය, බෙදාගැනීම සහ විශාල පරාර්ථකාමීත්වයක් ගෙනඑනු ලබයි.

බොහෝ රූපවාහිනී දර්ශන සහ මිථ්‍යා ප්‍රබන්ධ කථා විවාහයෙන් අවසන්වේ. "ඔවුහු ඉන්පසුව සතුටින් ජීවත්වෙති." හුදෙක් චාරිත්‍රානුකූල උත්සවයක් පැවැත්වීමෙන් පමණක් සාර්ථක විවාහයක සතුටක් නොලැබෙන බව අපට අවබෝධවී ඇත. සතුට විදුලි ලාම්පුවක බොත්තමක් එබීමෙන් මෙන් ලැබෙන්නේ නැත; සතුට සිතේ ස්වභාවයක් නිසා එය පැමිණෙන්නේ තමා තුලින්මය. එය උපයාගත යුතුය. එය මුදලට මිළදීගත නොහැකිය; එය නිකරුනේ ගත නොහැකිය.

සමහරෙක් සතුට ගැන සිතන්නේ පහසු, සුඛෝපභෝගී සහ නිරන්තර ත්‍රාසයෙන් යුත් ජීවිතයක් ලෙසය; නමුත් සැබෑ විවාහය සතුට මත පදනම්ව ඇති බැවින් එය, ඊට වඩා දෙයකි. එය ලැබෙන්නේ දීමෙන්, සේවයකිරීමෙන්, බෙදාගැනීමෙන්, පරිත්‍යාගයෙන් සහ පරාර්ථකාමයෙන්ය.

වෙනස් පසුබිමකින් පැවතෙන දෙදෙනෙක් චාරිත්‍රානුකූල උත්සවවලින් පසුව සැබෑ තත්වයට මුහුණදිය යුතු බව ඉක්මණින්ම දැනගනිති. තවදුරටත් කල්පිත ලෝකයක් කෙරෙහි විශ්වාසය තැබීමක් නැත; අපි අඳුරෙන් එළියට විත් අපගේ දෙපා පොළොව මත ස්ථිරව තැබිය යුතුය. වගකීමෙන් කටයුතුකළ යුතුය, අළුත් රාජකාරි බාරගත යුතුය. පෞද්ගලික නිදහස යම් ප්‍රමාණයකින් අත්හැරදැමිය යුතු අතර, යම් දේවල්, ආත්මාර්ථකාමී නොවන ලෙස සකස්කරගැනීම් බොහොමයක් කළ යුතුය.

විවාහයෙන් පසුව තම සහකරුගේ කලින් හෙලිනොකළ හෝ නොදුටු යම් දුර්වලකම් ගැන යමෙක් ඉක්මණින්ම දැනගතහැකිය. විවාහයට ආශ්‍රය කරන කාලයේදී නිතරම දියුණුකරගත් ගුණාංග දැන් වැඩෙන්නේ ඉතා සෙමිනි. විවාහ ආශ්‍රයේදී කුඩාවට සහ නොවැදගත් ලෙස පෙනුන දුර්වලකම් දැන් තරමක් ලොකු ප්‍රමාණවලින් වැඩෙයි. හදවත් තේරුම්ගැනීමේ පැය, තම තරාතිරම තේරුම්ගැනීම, සාමාන්‍ය යහපත් බුද්ධිය, සාධාරණව සිතීම, සහ

සැලසුම්කිරීමේ පැය පැමිණ ඇත. වසර ගණනාවක පුරුදු දැන් ඔවුන්ගෙන් එළිදරව්වෙයි; සහකරු ලෝභ හෝ අකීකරු, කම්මැලි හෝ කාර්යශීලී, භක්තිමත් හෝ අභක්තික විය හැකිය; ඔහු කරුණාවන්ත සහ සහයෝගය දෙන හෝ නොරිසුම්කාරී හෝ කෝපකාරී හෝ ඉල්ලන හෝ දීමටකැමති, අහංකාර හෝ තැකීමක් නැති කෙනෙක් විය හැකිය. ඥාතීන්ගේ ප්‍රශ්න සමීපව පෙනෙන්ට පටන් ගනියි. තවද සහකරු හා සමග ඔවුන්ට ඇති සම්බන්ධතාවයන් නැවතත් දියුණුවෙයි.

නිතරම මෙන් එකඟත්වයට පැමිණීමට සහ බරපතල වගකීම් ඉටුකිරීමට ඇති අකමැත්ත ක්ෂණිකව දක්නට ඇත. නිර්ලෝභීව වියදම්කර ජීවත්වීමට ආර්ථිකය පසුබාන අතර බාලයන්ට නිතරම "අසල්වැසියන්ට තිබෙන දේවල් තමන්ටත් තිබීමට" දැඩි ආශාවක් ඇතිවෙයි. අවශ්‍ය පරිදි මූල්‍යමය වියදම් සකස්කරගැනීමට නිතරම අකමැත්තක් ප්‍රදර්ශනයවේ. තරුණ මවුවරුන් නිතරම ඉල්ලා සිටින්නේ ඔවුන්ගේ පියවරුන්ගේ සෞභාග්‍යමත් නිවාසවල මුලින් භුක්තිවින්ද සියලුම සැප සම්පත් ඔවුන්ගේ නිවාසවලද තිබිය යුතු බවය. ඔවුන්ගෙන් සමහරෙක් එම සම්පත් සහිතව ජීවත්වීම සඳහා විවාහයෙන් පසුව දිගටම රැකියාව කිරීමට ඉතා කැමැත්තක් දක්වති. එහි ප්‍රතිඵලයක් ලෙස් ඔවුහු තම නිවසේ රාජකාරීන් පසෙක තබා නිවාසවලින් පිටවී, වෘත්තීමය හෝ වෙළඳ කටයුතු රැකියා සොයමින් ගොස්, මෙලෙස ආර්ථිකය ගොඩනගා පවුල් තහවුරුකර ගනිති. එවිට සාමාන්‍ය පවුල් ජීවිතයක් ගතකිරීම ඉතා අපහසු වන්නේය. සහකරුවන් දෙදෙනාම රැකියාකිරීම තුලින්, සහයෝගය වෙනුවට තරඟය පවුල තුලට ඇතුළුවෙයි. වෙහෙසට පත්වූ සේවකයන් දෙදෙනා අසීරුවෙන් නිවසට පැමිණෙති, පෞද්ගලික අහංකාරය, නිදහස දක්වා වැඩිවී, ඉන්පසුව දුරාවබෝධය නැගීසිටියි. කුඩා මිත්‍යාවන් ස්මාරක පිරමීඩයක් බවට පත්වෙයි.

විවාහය අසීරු දෙයක් නිසාත්, වෙන්වුන සහ කලකිරුන විවාහයන් පොදු, එහෙත් සැබෑ දෙයක් වුවද, සදාපවතින සතුට අසීරු නොවන බැවින්, විවාහය මිනිස් මොළයකට තේරුම්ගැනීමට පවා නොහැකි ලෙස ඉතා උසස් ප්‍රමෝදයක් විය හැකිය. මෙය සෑම යුවලකටද, සෑම පුද්ගලයෙකුටද ලඟාකරගත හැකිය. "ආත්ම සහකාරකම" මිත්‍යාවක් සහ මුලාවකි; සෑම තරුණ මිනිසෙක් සහ සෑම තරුණ කාන්තාවක්ම දැඩි උනන්දුවකින් සහ යාච්ඤාවෙන් යුතුව සහකරුවෙක් සොයා, ඒ පුද්ගලයා සමග ජීවිතය වඩාත් අනුකූලතාවයකින් සහ අලංකාරව ගතකිරීමට සොයයි, එහෙත් ඕනෑම යහපත් මිනිසෙක් සහ ඕනෑම යහපත් කාන්තාවක්ම වාගේ ඔවුන් දෙදෙනාම මහන්සිවී වැඩකිරීමට කැමති නම් සතුට ලබාගැනීමට පුළුවන.

සෑම යුවලකටම ප්‍රීතිමත් විවාහයක් සහතිකකරන කිසිදා නොවරදින සූත්‍රයක් ඇත; නමුත් වෙනත් සූත්‍ර මෙන්, එම මූලික ද්‍රව්‍යයන් ඉවත්කිරීම, අඩුකිරීම හෝ සීමාකිරීම හෝ නොකළ යුතුය. විවාහයට පෙර තෝරාගැනීම සහ විවාහයෙන් පසු ආශ්‍රයකිරීමේ ක්‍රියාවලිය එක සමානව වැදගත්ය. නමුත් විවාහයට වඩා වැදගත් නොවේ. එහි සාර්ථකත්වය රඳාපවතින්නේ පුද්ගලයන් දෙදෙනා මතය—එක් අයෙකු මත නොවේ, නමුත් දෙදෙනාම මතය.

දැනටමත් සඳහන්කර තිබෙන පරිදි යුක්තිසහගත ප්‍රමිතීන් මත පදනම්ව ආරම්භවී තිබෙන විවාහයක, තනිව හෝ සහකරුවන් දෙදෙනාම තුල තිබෙන බලයෙන් හැර, එය විනාශකල හැකි සංයෝගවූ වෙනත් බලයක් නැත; තවද ඔවුන් සාමාන්‍ය වගකීම් ඉෂ්ඨකළ යුතුය. අන් අය සහ වෙනත් ආයතන යහපතට හෝ අයහපතට බලපෑ හැකිය. මූල්‍යමය, සමාජමය, දේශපාලනික සහ වෙනත් තත්වයන් බර දරාගන්නා බව පෙනිය හැකිය; නමුත් විවාහයක් පළමුව සහ නිතරම රඳාපවතින්නේ සහකරුවන් දෙදෙනා මතය. ඔවුන් අධිෂ්ඨානශීලීව, පරාර්ථකාමීව සහ ධර්මිෂ්ඨව සිටිනම්, ඔවුන්ට නිතරම තම විවාහය සාර්ථකව සහ ප්‍රීතිමත්ව ගතකළ හැකිය.

එම සූත්‍රය සරලය; හැම එකකටම බොහෝ කාරණා තිබුනද අවශ්‍යවන්නේ ද්‍රව්‍ය ස්වල්පයකි.

පළමුව, විවාහය සඳහා නිසි ලෙස අවතීර්ණවිය යුතුය. එමගින් සහකරුගේ තෝරාගැනීම් සිතාබලා, ඔහු දෙදෙනාටම වැදගත්වන සියලුම කාරණාවල සම්පූර්ණත්වයේ ඉහළටම හැකිතරම් දුරට ලඟාවීමට බලයි. තවද ඉන්පසුව, එම දෙදෙනාම දේවමාළිගාවේ අල්තාරය ලඟට පැමිණ, මෙම එකට ගතකරන ජීවිතය සාර්ථකකරගැනීමට වෙහෙසවී කටයුතුකල යුතු බව අවබෝධකර ගනිති.

දෙවනුව, විශාල පරාර්ථකාමයක් තිබිය යුතුය, ආත්මාර්ථය අමතකකර පවුල් ජීවිතයේ සියල්ලක්ම සහ පවුලේ යහපතට අදාළවන සියල්ලද සම්පූර්ණයෙන්ම මෙහෙයවා, ආත්මාර්ථකාමී ආශාවන් යටපත්කළ යුතුය.

තෙවැනිව, ආශ්‍රය දිගටම පවත්වමින් ආදරය, කරුණාව ප්‍රකාශකිරීම සහ ප්‍රේමය පුබුදුවා තබාගෙන එය වර්ධනයවීම තිබිය යුතුය.

හතරවෙනුව, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සුභාරංචියේ පැහැදිළිකර තිබෙන පරිදි, ස්වාමීන් වහන්සේගේ පණත් අනුව සම්පූර්ණ ජීවිතයක් ගතකල යුතුය.

මෙම ද්‍රව්‍ය නිසි ලෙස මිශ්‍රකර දිගටම ක්‍රියාත්මක කිරීමෙන්, අසතුට පැමිණීම, වරදවා තෙරුම්ගැනීම් පැවතීම, හෝ කැඩීයාම් සිදුවීමටද හැකියාවක් ඇත්තේම නැත. දික්කසාද බලධාරීන්ට වෙනත් ක්ෂේත්‍රයකට මාරුවීමක් අවශ්‍යවිය හැකි අතර, දික්කසාද උසාවිද අගුළුදැමීමට සිදුවනු ඇත.

විවාහයේ අල්තාරයට ලඟාවන දෙදෙනා විසින් ඔවුන් බලාපොරොත්තුවන ප්‍රීතිමත් විවාහයකට එළඹීම සඳහා විවාහය නීත්‍යානුකූලව සියල්ල සපුරාලන්නක් නොවන බව අවබෝධකරගත යුතුය. නමුත් එහි අදහස පරිත්‍යාගය, බෙදාගැනීම, සහ පෞද්ගලික නිදහස යම් ප්‍රමාණයකට අඩුකිරීමට පවා සිදුවීමය. එහි අදහස, දීර්ඝ කාලීනව අමාරුවෙන් වියදම් අඩුකිරීමය. එහි අදහස, ළමුන් වෙනුවෙන් වන මූල්‍යමය බර දැරීම, සේවා බර, සැපයුම් සහ කණගාටු නමැති බර දැරීමය; නමුත් එහි තවත් අදහසක් නම්, සියල්ල පිළිබඳව ගැඹුර සහ මිහිරිතම හැඟීමක් ඇතිකරගැනීමය.

විවාහයට පෙර, එක් එක් පුද්ගලයාටම තමන් කැමති පරිදි යාමට ඒමට, හොඳයයි තමාට පෙනෙන පරිදි තම ජීවිතය සංවිධානයකර සැලසුම්කිරීමට, ආත්මාර්ථය මුල්කරගත් තීරණ ගැනීමට, නිදහස තිබින. පෙම්බරිය අවබෝධකරගත යුතු දෙයක් නම්, ඔවුන් පොරොන්දු තැබීමට පෙර, ඔවුන් එකිනෙකා සම්පූර්ණයෙන්ම ඔවුන්ගේ අළුත් කුඩා පවුල නිතරම කුමන සහකරුගේ වුවද යහපතට මුල්තැන දිය යුතුබවට සම්පූර්ණයෙන්ම පිළිගෙන තිබෙන බවය. එක් එක් පාර්ශවය "මම" සහ "මගේ" යන්න ඉවත්කර ඒ වෙනුවට "අපි" සහ "අපේ" යන්න යොදාගත යුතුය. හැම තීරණයක්ම සලකාබලා, එය දෙදෙනෙකුට හෝ වැඩි දෙනෙකුට බලපාන බව සිතිය යුතුය. ඇය බරපතල තීරණයකට එළඹෙන විට, එයින් දෙමාපියන්ට, ළමයින්ට, නිවසට, සහ ඔවුන්ගේ ආත්මික ජීවිතයට ඇතිවිය හැකි බලපෑම් ගැන බිරිඳ සලකාබැලිය යුතුය. ස්වාමිපුරුෂයාගේ රැකියාව තොරාගැනීම, ඔහුගේ සමාජ ජීවිතය, ඔහුගේ මිතුරන්, ඔහුගේ සෑම ආශාවක්ම එළිපිටම සලකාබලා, ඔහු පවුලේ කොටසක් බව මුළු කණ්ඩායමම සලකාබැලිය යුතුය.

විවාහය නිතරම එකසමානව නැති අතර අසීරුකම්ද පවතිනු ඇත. නමුත් එය විශාල සමාදානයක් සහිත එකක් විය හැකිය. යුවලට දුගීබව, රෝගාබාධ, බලාපොරොත්තු කඩවීම්, අසමත්වීම්, සහ පවුලේ මරණ පවා ඇතිවිය හැකිය. නමුත් මේවායින් පවා ඔවුන්ගේ සමාදානය උදුරාගත නොහැකිය. ආත්මාර්ථය විවාහයට ඇතුළු නොවන තාක් කල්, එය සාර්ථක එකක් විය හැකිය. සම්පූර්ණ පරාර්ථකාමය නිවසේ තිබෙන්නේ නම්, කරදර සහ ප්‍රශ්න දෙමාපියන්ව නොබිඳිය හැකි සම්බන්ධයකින් එකට එක්කරයි. 1930 ගණන්වල පරිහානි කාලය තුළදී දික්කසාදවල පැහැදිළි අඩුවීමක් තිබිනි. දුගීබව, අසමත්වීම්, බලාපොරොත්තු කඩවීම්—ඒවා දෙමාපියන් එකට බැඳතබයි. විපත සම්බන්ධතාවයන් තදකරන අතර, එය විනාශකිරීමට සමෘධියට පුළුවන.

ආත්මාර්ථය මත පදනම්වූ විවාහය සම්පූර්ණයෙන්ම වාගේ අසමත්වීම නියතය. වස්තුව සඳහා විවාහවූ තැනැත්තා හෝ නම්බුව හෝ සමාජ තත්වයට විවාහවූ තැනැත්තා නියත ලෙසම බලාපොරොත්තු කඩකර ගනියි. ගෞරවයෙන් හෝ අහංකාරකමින් තෘප්තිමත්වීමට විවාහවන තැනැත්තා හෝ තවත් පුද්ගලයෙකුට එදිරිවාදීව හෝ ඔහුව වේදනාවට පත්කිරීමට හෝ විවාහවන තැනැත්තා තමාව පමණක් මෝඩයෙකු කරගනියි. නමුත් සතුට ලබාදීමට මෙන්ම එය ලබාගැනීමටද, සේවය ලබාදෙමින් මෙන්ම එය ලබාගැනීමටද විවාහවී, දෙදෙනා ගැන සහ ඉන්පසුව පවුලක් වන විට ඕනෑ එපාකම් සොයන තැනැත්තාට හොඳ අවස්ථාවක් ලැබෙන අතර, ඔහුගේ විවාහයද ප්‍රීතිමත් එකක් වනු ඇත.

ප්‍රේමය මලක් වැනිය. එසේම ශරීරය මෙන්, එයට නිරන්තර පෝෂණය අවශ්‍යවේ. මැරෙන සුළු ශරීරය නිතරම පෝෂණය නොකරන්නේ නම් ඉක්මණින්ම දිරාපත්වී මැරී යයි. මෘදු මල ආහාර සහ ජලය නොමැතිව වියලී මැරී යයි. ප්‍රේමයද එසේය. එමෙන්ම, එය දිගටම ප්‍රේමයෙන් පෝෂණය කිරීම, සැලකිල්ල සහ ප්‍රශංසාව ප්‍රකාශකර, කෘතඥතාවයේ ප්‍රකාශ සහ පරාර්ථකාමීව සලකාබැලීම නොකරන්නේ නම්, සදාකල් පැවතීම අපේක්ෂාකළ නොහැකිය.

සම්පූර්ණ පරාර්ථකාමය ස්ථිරලෙසම ඉෂ්ඨකරගැනීමේ තවත් සාධකයක් සාර්ථක විවාහයක ඇත. එක් අයෙක් සැමදාම අනෙකාගේ රුචි අරුචිකම්,, සුවපහසුව සහ සතුට සොයන්නේ නම්, විවාහයේ ප්‍රේමය තිබෙන අතර, විවාහයේ ශක්තිමත්බව බලවත් ප්‍රමාණයකින් වැඩිවන්නේය. බොහෝ ජෝඩු ඔවුන්ගේ විවාහය පරනවීමට සහ ඔවුන්ගේ ප්‍රේමය ශීතලවීගිය පරණ පාන් මෙන් හෝ ගෙවීගිය විහිළුවක් හෝ ශීතවීගිය කරියක්බවට පත්වීමට ඉඩ සලසයි. සත්‍යලෙසම ප්‍රේමයට බොහෝ වැදගත්වන ආහාර නම්, සිතාබැලීම, කරුණාව, කල්පනාකාරීවීම, සැලකිලිමත්වීම, ආදරය ප්‍රකාශකිරීම, කෘතඥතාවයේ වැළඳගැන්ම, ප්‍රශංසාව, ගෞරවය, මිත්‍රත්වය, විශ්වාසය, ඇදහිල්ල, කොටස්කාරකම, සමානතාවය, සහ අන්‍යෝන්‍ය පැවැත්මය.

විවාහයේ නියම සතුට විඳීමට නම්, යමෙක් ස්වාමීන්වහන්සේගේ පණත් නිරන්තරයෙන්ම ඇදහිළිමත්ව පිළිපැදීමය. අවිවාහක හෝ විවාහක කිසිවෙක්, ඔහු ධර්මිෂ්ඨ නොවන්නේ නම් උස්තම සතුට කිසිදා ලබා නොගනියි. යම් තාවකාලික තෘප්තියක් සහ රැවටිලිකාර තත්වයන් සහිත අවස්ථාවන් ඇත. නමුත් ස්ථිර, සම්පූර්ණ සතුටක් ලැබෙන්නේ පිරිසිදුබව සහ සුදුසුතාවය තුළින් පමණකි. ආගමානුකූලව ගැඹුරු ආගමික වැටහීමක් ඇති පුද්ගලයෙක්, අක්‍රීය ජීවිතයකින් කිසිදා සතුටක් නොලබයි. හෘද සාක්ෂිය නිතරම විපතට බරවන අතර, ඒවා මගහරින්නේ නැති නම්, එම තත්වය මත විවාහය දැනටමත් උවදුරෙහි හෙලා ඇත. අප්‍රසන්න හෘදසාක්ෂිය ජීවිතය බොහෝ කරදරකාරී කරයි, විශේෂයෙන්ම සාමාජිකයන් විවිධ ප්‍රමාණවලින් අක්‍රීයවනවිටදී, එම අක්‍රීයබව විවාහයට විනාශකාරීවේ.

ආගමික විවිධත්වයන් වඩාත් පීඩාසහිතවන අතර, සියලුම වෙනස්කම් අතර තිබෙන වඩාත් නොවිසඳුන ඒවාද වේ.

විවාහය දෙවියන්වහන්සේගේ නියමයකි. එය හුදෙක් සමාජ චාරිත්‍රයක් පමණක්ම නොවේ. නිසියාකාර සාර්ථක විවාහයක් නොමැතිව, කිසිවෙකුට කිසිදා උත්කර්ෂයට පත්විය නොහැකිය. විවාහවීමට සුදුසු සහ නිසි ආකාරය දැනගැනීමට ඔබගේ දෙවියන්වහන්සේගේ වචනය කියවන්න.

එය සත්‍යයක් බැවින්, කල්පනාකාරී බුද්ධිමත් පසුදවස්වල ශුද්ධවන්තයා සිය ජීවිතය ප්‍රවේශමෙන් සැලසුම්කර තම මාර්ගයේ බාධක නොමැති බව ස්ථිරකර ගනියි. එක් අයෙක් බරපතල වරදක් කිරීම මගින්, එක් අයෙක් විසින් මාර්ගයේ බාධක ඇතිකිරීමෙන් එය ඉවත්කිරීමට නොහැකිව, එමගින් සදාකාලික ජීවිතය සහ දේවත්වය—අපගේ අවසාන ගමනාන්තය අවහිරකිරීමට හැකිය. යම් දෙදෙනෙක්, ඔවුන්ගේ ජීවිතවලට වඩා දෙවියන්වහන්සේට ප්‍රේමකරමින්, තමන්ගේම ජීවිතවලට වඩා එකිනෙකාට ප්‍රේමකරමින්,

සම්පූර්ණ සමගියෙන් යුතුව සුහාරංචි සැලසුම ඔවුන්ගේ මූලික පදනම ලෙස සලකා එකට කටයුතුකරන්නේ නම්, ස්ථිර ලෙසම ඔවුන් මෙම විශාල සතුට ලබනවා ඇත. ස්වාමිපුරුෂයා සහ භාර්යාව එකට එක්ව නිතරම ශුද්ධවූ දේවමාළිගාවට ගොස්, ඔවුන්ගේ නිවස තුල ඔවුන්ගේ පවුල සමග දණගසමින්, අත් අල්ලාගෙන ඔවුන්ගේ ආගමික රැස්වීම්වලට ගොස්—මානසිකව සහ ශාරීරිකව—ඔවුන්ගේ ජීවිත පතිවෘත්තාවෙන් ශුද්ධව තබාගන්නා විට, එවිට ඔවුන්ගේ සිතිවිලි සහ ආශාවන් සහ ආදරය සම්පූර්ණයෙන්ම එක් අයෙකු මත, ඔවුන්ගේ සහකරු මත කේන්ද්‍රවී. දෙදෙනාම දෙවියන්වහන්සේගේ රාජ්‍යය ගොඩනැගීමට එක්ව කටයුතුකරන විට, එවිට සතුට උච්ඡස්ථානයක පවතියි.

සමහර අවස්ථාවල විවාහය තුල වෙනත් බැඳීම්වලට වඩා, වැදගත් දෙයක් ස්වාමීන්වහන්සේ කීසේකඃ නුඹගේ භාර්‍යාවට නුඹ නුඹගේ මුළු සිතින්ම ප්‍රේමකර, වෙනත් කිසිවෙකුටත් වඩා ඇය වෙත ඇලෙන්නෙහිය (බලන්න ධීසහගී 42:22).

මෙහි අදහස සම්පූර්ණයෙන්ම වාගේ "නුඹගේ භාර්‍යාවට නුඹ නුඹගේ මුළු සිතින්ම ප්‍රේමකර, වෙනත් කිසිවෙකුටත් වඩා ඔහු වෙත ඇලෙන්නෙහිය." නිතරම මෙන්, මිනිසුන් ඔවුන්ගේ මවුවරුන්ට සහ ඔවුන්ගේ පියවරුන්ට සහ ඔවුන්ගේ මිතුරන්ට නිරන්තර ඇලීමක් ඇත. සමහරවිට මවුවරු ඔවුන්ගේ දරුවනට තිබූ තම බැඳීම අත්හැරීමට කැමති නැති අතර, ස්වාමිපුරුෂයන් මෙන්ම භාර්යාවන්ද අවවාද, උපදෙස් ලබාගෙන ඒවා රහසිගතව තබාගැනීමට තම මවුවරුන් සහ පියවරුන් වෙත නැවත යති. එසේවුවද, බොහෝ කරුණු සම්බන්ධයෙන් ඇලීම තිබිය යුත්තේ භාර්‍යාවට විය යුතු අතර, සියලුම කිට්ටු ආශ්‍රයන් සියල්ලම අන් අයගේ අතිශය රහස් සහ පෞද්ගලික දේවල් ලෙස තබාගත යුතුය.

ජෝඩු දෙපැත්තේම අනෙක් ඥාතීන්ගෙන් වෙන්ව ඉක්මණින්ම ඔවුන්ගේම නිවාස සොයාගනිමින්, ඉතා හොඳින් කටයුතුකරති. නිවස අති චාම්, විශාල නොවන නමුත්, නිදහස් පදිංචි ස්ථානයක් විය යුතුය. ඔබගේ විවාහ ජීවිතය ඇයගේ ඥාතීන්ගෙන් සහ ඔබගේ ඥාතීන්ගෙන් නිදහස්විය යුතුය.ඔබ කිසිදාටත් වඩා ඔවුන්ට ප්‍රේමකරයි; ඔබ ඔවුන්ගේ උපදෙස් සතුටින් පිළිගනියි; ඔවුන්ගේ මිත්‍රත්වය ඔබ අගයකරයි; නමුත් ඔබට උපදෙස් දෙන අයගේ උපදෙස් ලැබීමෙන් පසුව යාච්ඤාවෙන් යුතුව ඒවා සලකාබලා ඔබගේම තීරණවලට නතුවෙමින්, ඔබ ඔබගේම ජීවිතයක් ගතකරයි. ඇලීම යනුවෙන් හුදෙක් එම නිවසේම සිටීම අදහස් නොවේ, එහි අදහස සමීපව ලංවී, එකට බැඳී සිටීමයඃ

"එසේහෙයින්, නීත්‍යානුකූල වන්නේ—ඔවුන් ජෝඩුව එක මාංශයක්වීමය, තවද පොළොව එහි මැවීමේ අවසානය දක්වා මේ සියල්ලටම පිළිතුරු දෙනු ඇත;

තවද එය ලෝකය සෑදීමට පෙර මිනිසාගේ මැවීම අනුව, මිනිසාගේ ප්‍රමාණයෙන් පුරවනු ලබනු ඇත (බලන්න ධීසහගී 49:16–17).

සොයුරු සොයුරියනි, මෙය ස්වාමීන්වහන්සේගේ ලෝකය බව මම කියමි. එය බොහෝ බොහෝ සේ බරපතල වන අතර, ස්වමීන්වහන්සේ සමග වාද කරන කිසිවෙක් එහි සිටිය යුතු නැත. උන්වහන්සේ ජනතාව සෑදූසේක. එතුමා කොන්දේසි දන්නාසේක. එතුමා සැලසුම තහවුරුකළසේක. එසේම මෙම කරුණු ගැන එතුමා සමග වාදකිරීමට අප ප්‍රමාණවත්ලෙස බුද්ධිමත් හෝ ප්‍රමාණවත් ලෙස හැකියාවක් හෝ අපට නැත. හරි දෙය සහ සත්‍යය කුමක්ද කියා එතුමා දන්නාසේක.

සිතාබලන ලෙස අපි ඔබට කියන්නෙමු. ඔබගේ විවාහය නිවැරදි බවට වගබලාගන්න. ඔබගේ ජීවිතය නිවැරදි බවට වගබලාගන්න. විවාහයේ ඔබගේ කොටස නිසියාකාරව ඉදිරියට ගෙනයාමට වගබලාගන්න.

මාර්තු 1977 *Ensign*, සඟරාවෙනි, පිටු 3–5.

# විවාහයේ අභියෝගවලට ප්‍රතිචාරදැක්වීම

4

## අදාළකරගැනීම සඳහා අදහස්

ඔබගේම අවශ්‍යතා සහ තත්වයන් මත මෙම යෝජනා එකක් හෝ වැඩියෙන් අනුගමනයකරන්න.

- පහත සඳහන් කියවීමේ පැවරුම් යටතේ, වැඩිහිටි ලීන් ජී. රොබින්ස් "විපත සඳහා වට්ටෝරුවක්" ගැන විස්තරකරයි. මෙම පිටුවේ ඔහුගේ එම විස්තරය කියවන්න. ඉන්පසුව නිවසේ සමගිය සඳහා වට්ටෝරුවක් දියුණුකරගන්න. එවැනි වට්ටෝරුවකට ඔබ එකතුකරන අවශ්‍ය ද්‍රව්‍යයන් ගැන නිශ්චයකරන්න.
- අභියෝගවලට අමනාපයෙන් වෙනුවට ඉවසීමෙන් සහ ප්‍රේමයෙන් ප්‍රතිචාර දැක්වීමට පොරොන්දුවක් තබාගන්න. මෙම පොරොන්දුව ඔබට නිතරම සිහිපත්කරන ඔබට කළ හැකි යමක් ගැන තීරණයකරන්න. උදාහරණයක් ලෙස, කාසියක් හෝ වෙනත් කුඩා දෙයක් ඔබගේ සපත්තුව තුල දැමීමට හෝ ඔබගේ සාක්කුව තුළ සටහනක් මේ සඳගා තබාගැනීමට ඔබට හැකිය.

## කියවීමේ පැවරුම්

පහත සඳහන් ලිපිය කියවන්න. ඔබ විවාහක නම්, ඔබගේ සහකරු සමග ලිපිය කියවා සාකච්ඡාකරන්න.

### කර්තෘත්වය සහ කෝපය

හැත්තෑවරුන්ගේ
වැඩිහිටි ලීන් ජී. රොබින්ස්

#### සාතන් පවුල් තුළ කෝපය කළඹවයි

"මට මෙම පොළොව මත පවුලක් ඇත. *මට ඔවුහු බොහෝ හොඳින් සළකති.*" අපගේ එක් ගීතිකාවක වචනවල ප්‍රකාශවනලෙස, සෑම ළමයෙකුගේම අභිප්‍රාය එයවෙයි ("Families Can Be Together Forever," *Hymns,* අංක. 300 ඉතාලි අකුරු ඇතුළත්ය).

පවුලේ ප්‍රකාශනය තුලින් අපි මෙසේ ඉගෙනගන් නෙමු, "මැවුම්කරුවාණන්ගේ සැලසුම තුල පවුල කේන්ද්‍රස්ථානයවේ" එසේම "ස්වාමිපුරුෂයාට සහ භාර්‍යාවට එකිනෙකාට ප්‍රේමකරමින් රැකබලාගැනීමට උදාර වගකීමක්" සහ "ඔවුන්ගේ දරුවන් ප්‍රේමයෙන් සහ ධර්මිෂ්ඨකමින් යුතුව ඇතිදැඩිකිරීමේ වගකීමක්ද ඇත" (පවුලඃ ලෝකයට ප්‍රකාශනයකි," *Ensign*, නොවැ. 1995, 102).

පවුල සාතන්ගේ මූලික ඉලක්කයක්ද වෙයි. ඔහු පවුලට විරුද්ධව යුද්ධයක් ආරම්භකරයි. ඔහුගේ එක් උපක්‍රමයක් නම්, ඔහුගේ සියුම් කූට උපක්‍රම තුලින් සතුරු මාර්ගවලින් රහසිගතව පැමිණ අපගේම නිවාස සහ ජීවිතවලට ඇතුළුවීමය.

ඔවුන්ගේම නිවාසතුලදී සාතන්, පවුල් කඩාබිඳ දමා විනාශකරයි. ඔහුගේ උපක්‍රමය පවුල් සාමාජිකයන් අතර කෝපය කැළඹවීමය. සාතන් වනාහි විවාදයේ පියා වන අතර, ඔහු මිනිසුන්ගේ හදවත් එකිනෙකා කෙරෙහි *කෝපයෙන් කළඹවයි*" (3 නිෆායි 11:29; ඉතාලි අකුරු ඇතුළත්ය). *කැළඹීම,* යන ක්‍රියාපදය විපත සඳහා වට්ටෝරුවක් මෙන් පෙනෙයි. කෝපය මඳ රස්නෙන් දමයි, තෝරාගත් වචන කිහිපයකින් කළඹා; ඉතිරීමට සලස්වයි; උතුවන තෙක් දිගටම කළඹයි; නිවෙන්ට තබයි; හැඟීම් දින කිහිපයක් ශීතලවීමට තබයි; ශීතලෙන්ම බෙදයි; ඉතිරිය බොහෝය.

#### කෝප නොවීම තෝරාගැනීමට අපට පුළුවන

ඔහුගේ උපායමාර්ගයේ එක් කපටි අංශයක් වන්නේ කර්තෘත්වයෙන් කෝපය විසංධිකර, අප හැඟීම්වල වහලුන් බවත්, ඒවා අපට පාලනයකරගැනීමට නොහැකි බවට අප තුල විශ්වාසයක් ඇතිකිරීමය. "මට මගේ හැඟීම් පාලනයකරගන්න බැරිවුනා" යයි කියනු අප අසා ඇත. කෙනෙක් තම ඉවසීම නැතිකරගැනීම යන්න වචනවල සිත්ගත් තේරීමක්වී, එය පුළුල් ලෙස පාවිච්චිවන වාක් සම්ප්‍රදායක් බවට පත්වී ඇත. "යමක් නැතිකරගැනීම" අඟවන්නේ, "අදහසක් ඇතිව නොවේ," "වැරදීමකින් ඇතිවූවක්" "කැමැත්තක් ඇතිව නොකරන ලද දෙයක්" "වගකිව යුතු නැති බවක්ය"— සමහරවිට ප්‍රවේශම් නොවීම විය හැකිය, නමුත් "වගකීමක් නැතිවීමය."

"ඔහු මාව කුපිත කළා" අප අසන තවත් වාක්‍ය කණ්ඩයකි, එයද කර්තෘත්වය පාලනයකිරීමට නොහැකිවීම අඟවයි. මෙයද බැහැරකළ යුතු මිථ්‍යාවකි. කිසිවෙකු අපව කුපිතකරන්නේ නැත. අන් අය අපව කෝපකරන්නේ නැත. සම්බන්ධිත කිසිම බලයක් නැත. කෝපවීම චෛතසික තේරීමකි, තීරණයකි, එමනිසා, කෝප නොවීම තෝරාගැනීමට අපට පුළුවන. අපි තෝරාගනිමු!

"නමුත් මට කරන්ට දෙයක් නැහැ," යයි කියන අයට, විලියම් විල්බැන්ක් ප්‍රතිචාර දක්වමින්, "විකාර" යයි කීවේය.

"කළහය,...කෝපය සඟවයි, ඒ ගැන කථාකළ හොත්, කෑ ගැසීම සහ මොරදීම," කෝපයට සම්බන්ධිත සෑම දෙනාම දැනසිටින ඇඟවීමය. "අප තෝරාගන්නේ අතීතයේදී අපට සාර්ථක බව ඔප්පුවී ඇති දෙයකි. අපගේ ප්‍රධානියා අපව කළකිරීමට පත්කළ විට, අප කොපමණ කලාතුරකින් අපව පාලනය කිරීම නැතිකරන්නේද, අපගේ මිතුරන් හෝ පවුලේ අය මගින් කොපමණ වතාවක් අප අමනාපයට පත්වන්නේද? කියා අප කිසිදා නොදකිනු ඇත" ("The New Obscenity," *Reader's Digest,* දෙසැ. 1988, 24; ඉතාලි අකුරු ඇතුළත්ය).

විල්බැන්ක් සිය අතීතයේදී උසස් පාඨශාලාවේ පැසි පන්දු කණ්ඩායමට බැඳීමට උත්සාහකර ජයගත්තේය. පුහුණුවීමේ පළමු දින ඔහුගේ පුහුණුකරු කණ්ඩායම බලාසිටින විට, එකිනෙකා ක්‍රීඩාකිරීමට ඔහුට සැලැස්වීය. ඔහු පහසු පහරක් අත්හැරු විට, ඔහු අමනාපයට පත්ව කලබලවී කෙඳිරීය. පුහුණුකරු ඔහු වෙත ගොස, "ඔබ එවැනි වරදක් නැවත කළ හොත් ඔබ නැවතත් මගේ කණ්ඩායමේ ක්‍රීඩාකරන්නේ නැත" යයි කීවේය. ඊළඟ වසර තුනේදී, ඔහු කිසිදාක පාලනය නැතිකර නොගත්තේය. වසර ගණනාවකට පසුව, ඔහු එම සිද්ධිය ගැන නැවත සිත යොමුකල විට, පුහුණුකරු ඔහුට ජීවිතයේ මහත් වෙනසක මූලධර්මයක් උගන්වා ඇති බව ඔහුට වැටහුනේය. කෝපය පාලනය කරගත හැකිය (බලන්න "The New Obscenity," 24).

### ස්වාමීන්වහන්සේගේ ඉගැන්වීම්

එපීස 4:26 ජෝසෆ් ස්මිත් පරිවර්තනයේ, පාවුළු තුමා මෙම ප්‍රශ්නය අසයි, "නුඹට පව් නොකර, කෝපවීමට පුළුවන්ද?" ස්වාමීන්වහන්සේ මෙම ප්‍රශ්නයට ඉතා පැහැදිළිව පිළිතුරු දුන්සේක:

"වාදකිරීමේ ජීවයක් සතු තැනැත්තේ මට අයත් නොවන්නේය. ඔහු අයත්වන්නේ වාදයෙහි පියාවූ යක්ෂයාටය, තවද ඌ එකිනෙකා සමග කෝපයෙන් වාද විවාද කිරීමට මිනිසුන්ගේ හදවත් කළඹන්නේය.

"බලන්න, එක් මිනිසෙක් අනිකෙකුට එරෙහිව ඔවුන්ගේ හදවත් කෝපකරන සේ ඔවුන් කැළඹීම මගේ ධර්මය නොවේ; එහෙත් මගේ ධර්මය වන්නේ එවැනි දේවල් නැති කිරීමය" (3 නිෆායි 11:29–30).

ස්වාමීන්වහන්සේගේ මෙම ධර්මය හෝ නියෝගය කර්තෘත්වය ගැන ඇඟවීමක් මෙන්ම තීරණයක් ගැනීම සඳහා හෘදසාක්ෂියේ මනසට අදාළකරගැනීමකි. ස්වාමීන්වහන්සේ අපගෙන් අපේක්ෂා කරන්නේ කෝප නොවන තේරීම් කිරීමය.

කෝපයට පත්වීම සාධාරණීයකිරීමටද නොහැකිය. මතෙව් 5, 22වෙනි පදයෙන් ස්වාමීන්වහන්සේ මෙසේ කියනසේක, "නුමුත් මම නුඹලාට කියමි: හේතුවක් නොමැතිව තමාගේ සහෝදරයාට කෝපවෙන කවරෙකු නමුත් විනිශ්චයට සුදුස්සෙක් වන්නේය" (ඉතාලි අකුරු සහිතය). "හේතුවක් නොමැතිව" යන වාක්‍ය කණ්ඩය ජෝසෆ් ස්මිත් ආනුභාසම්පන්න පරිවර්තනයේ නොමැතිවීම කෙතරම් වැදගත්ද (බලන්න මතෙව් 5:24), 3 නිෆායි 12:22 අනුවාදයේද එය නැත. "හේතුවක් නොමැතිව" යන වාක්‍ය කණ්ඩය ස්වාමීන්වහන්සේ විසින් ඉවත්කර තිබීමෙන් උන්වහන්සේ අපට සමාවක් නොදෙනසේක "නමුත් මෙය මාගේ දහම වන්නේය, එනම් එවැනි දේවල් නැතිකළ යුතුය" (3 නිෆායි 11:30). අපට අමනාපය "ඉවත්කල හැකිය" මන්ද එතුමා අපට එසේ උගන්වා අණ කර ඇතිසේක.

### කෝපය යනු සාතන්ගේ පෙළඹවීමට යටත්වීමකි

කෝපය යනු අපගේ ආත්ම පාලනය පාවාදී සාතන්ගේ පෙළඹවීමට යටත්වීමකි. එය සිතිවිලි පාපයක්වන අතර එමගින් වෛර හැඟීම් හෝ හැසිරීමට යොමුකරවයි. එය මහාමාර්ගයේ මාර්ග කෝපයකි, ක්‍රීඩාභූමියේ ප්‍රචන්ඩත්වයකි, එසේම නිවෙස් තුලද ප්‍රචන්ඩව හැසිරෙන ගිනි බෝම්බයකි.

අපරීක්ෂාකාරී කෝපය, ඉක්මණින්ම නපුරු වචන සහ වෙනත් ආකාර චෛතසික අපවාදවලින් පිපිරීමට හැකි අතර, මෘදු හදවතක් කැළැල්කළ හැකිය. එය "කටට ඇතුල්වන දෙයින්" ගැලවුම් කරුවාණන් කී ලෙස, "මනුෂ්‍යයා අපවිත්‍ර කරන්නේය" (මතෙව් 15:11).

ඩේවිඩ් ඕ. මැකේ මෙසේ කීවේය. "ස්වාමිපුරුෂයා සහ භාර්‍යාව කිසිවිටෙක 'ඔවුන්ගේ නිවස ගිනිගැනීමකදී හැර' ශබ්දනගා කථා නොකළ යුතුය'" (*Stepping Stones to an Abundant Life,* සකස්. Llewelyn R. McKay [1971], 294).

ශාරීරික හිංසාව කෝපය උමතුව දක්වා ගොස් කිසිදා සාධාරණ නොවන අතර අධර්මිෂ්ඨ දෙයකි.

කෝපය තවත් කෙනෙක් තුළ වරදකාරී හැඟීමක් ඇතිකිරීමට තැත්කිරීමක් හෝ ඔවුන්ව නිවැරදිකිරීමට උත්සාහකිරීමේ අශීලාචාර ක්‍රමයකි. එය නිතරම විනය වැරදි ලෙස ලේබල්කිරීමක් වන නමුත්, සම්පූර්ණයෙන්ම වාගේ නිතරම අහිතකර ප්‍රතිඵලදායකය. එමනිසා ශුද්ධලියවිලිවලින් මෙසේ අවවාදකරයි, "පුරුෂයෙනි, නුඹලාගේ භාර්‍යාවන්ට කර්කශ නොවී, ඔවුන්ට ප්‍රේමකරපල්ලා" තවද "පියවරුනි, නුඹලාගේ දරුවන් කලනොකිරෙන පිණිස ඔවුන් කෝප නොකරල්ලා" (කොලෝසි 3:19, 21).

### "මම නැවත කිසිදා කෝපයට පත් නොවෙමි"

තේරීම සහ වගකීම වෙනස් නොකළැකි මූලධර්ම වෙයි. කෝපය තේරීමක් නිසා, ප්‍රකාශනයේ අනතුරු ඇඟවීමක් කර ඇත, "එම පුද්ගලයන්...සහකරු හෝ දරුවන්ට හිංසාකරන අයට...යම් දිනෙක දෙවියන්වහන්සේ ඉදිරියේ ගණන්දීමට සිදුවනු ඇත."

කර්තෘත්වයේ සහ කෝපයේ සම්බන්ධතාවය තේරුම්ගැනීම අපගේ ජීවිතවලින් කෝපය ඉවත්කිරීමේ පළමු පියවරවේ. කෝප නොවීම තෝරාගැනීමට අපට පුළුවන. එසේම එම තේරීම අදම, දැන්ම කිරීමට අපට පුළුවන: "මම නැවත කිසිදා අමනාපයට පත්නොවෙමි" මෙම අධිෂ්ඨානය ගැන සිතාබලන්න.

දහම සහ ගිවිසුමේ 121 වෙනි කොටස නිවැරදි නායකත්ව මූලධර්ම ඉගෙනගැනීමට අපට ඇති එක් හොඳම මූලාශ්‍රයකි. සමහරවිට 121 වෙනි කොටසේ ඉතා වැදගත් කරුණු සහකරුවන් සහ දෙමාපියන් වෙනුවෙන්ය. අප අපගේ පවුල්වලට නායකත්වයදිය යුත්තේ, ඒත්තුගැන්වීමෙන්, දීර්ගඉවසීමෙන්, ආචාරශීලීත්වයෙන්, කරුණාවෙන් සහ නිහතමානීත්වයෙන් සහ අවංක ප්‍රේමය මගින්ය (බලන්න ඩීසහසී 121:41–42).

හැම දරුවෙක්ගේම සිහිනය වන ඔවුන්ට යහපත්ව සළකන පවුලක් මෙහි පොළොව මත සිටීම සැබෑවක් බවට පත්වේවා.

1998 අප්‍රේල් මස වැඩිහිටි රොබින්ස් විසින් Church General Conference හි කළ ප්‍රකාශනයකි, (බලන්න Conference Report, අප්‍රේල්. 1998, 105–6; හෝ *Ensign*, මැයි 1998, 80–81).

# සුභවාදීව කථාකිරීම තුළින් අභියෝගවලට ප්‍රතිචාර දැක්වීම

# 5

## අදාලකරගැනීම සඳහා උපදෙස්

ඔබගේම අවශ්‍යතාවයන් සහ තත්වයන් අනුව, මෙම යෝජනා එකක් හෝ දෙකම අනුගමනයකරන්න.

- පහත සඳහන් ඉගැන්වීමේ පැවරුම තුළින්, වැඩිහිටි ජෝයි ක්‍රිස්ටන්සන් මෙසේ කියයිඃ "නිරන්තර විවේචන හෝ ඇනුම්පදවල ප්‍රතිඵලයක් ලෙස ටික දෙනෙක් යහපත් වෙනසක් කිසිදා ලබා නැත. අප ප්‍රවේශම් නොවන්නේ නම්, අප දියුණුව පතා ඉදිරිපත්කරන යම් විවේචන *විනාශකාරීවේ.* සමහර වේලාවලදී යම් දේවල් ප්‍රකාශ නොකර සිටීම වඩා හොඳය" (බලන්න පිටුව 19). එළඹෙන සතිය තුළදී, අන් අය ගැන ඔබ සිතන සහ කියන දේවල් ගැන අවධානය යොමුකරන්න. ඔබ කියන සෑම දෙයකින්ම කරුණාවන්තවී, ගුණවත්වීමට උත්සාහ දරන්න.
- ඔබගේ සහකරුගේ ප්‍රශංසාත්මක ගුණාංග සොයන්න. මෙම ගුනාංග වල ලයිස්තුවක් සාදා, ඔබගේ සහකරු සමග ඒවා බෙදාගන්න.

## කියවීමේ පැවරුම්

පහත සඳහන් ලිපිය අධ්‍යයනය කරන්න, ඔබ විවාහක නම්, ඔබගේ සහකරු සමග ලිපිය කියවා සාකච්ඡාකරන්න.

### විවාහය සහ ප්‍රීතියේ ශ්‍රේෂ්ඨ සැලසුම

හැත්තෑවරුන්ගේ
වැඩිහිටි ජෝයි ජේ. ක්‍රිස්ටන්සන්

බාබරා සහ මා දරුවන් සය දෙනෙකු සමග ආශිර්වාදිතවී ඇත. වසර කිහිපයකට පෙර, අපි ඔවුන් සියලුදෙනාම රැගෙන ඔවුන්ගේ සීයා සහ ආච්චී බැහැදැකීමට යන විට, මගේ පියා "ජෝයි, ඔබ බාබරා සමග ඔබට නැවැත්විය නොහැකි යමක් ආරම්භකර ඇත" යයි කීවේය.

මෙම පාස්කු සමයේ මුළු ලෝකයාටම අපි ප්‍රකාශකරන්නේ, යේසුස්වහන්සේ ක්‍රිස්තුස්වහන්සේ බවත්, උන්වහන්සේගේ ශුද්ධවූ පූජකවරය සහ මුද්‍රාකිරීමේ බලය තුළින්, විවාහ සහ පවුල්වල නැවතීම කිසිදා අවශ්‍ය නොවන බවය—කිසිදා අවසානයක් නොවීමය.

අද මම ඔබ සියලුදෙනාටම අපගේ විවාහ ගැන කථාකිරීමට කැමැත්තෙමි. මෙම ප්‍රායෝගික යෝජනා අට, අපගේ විවාහ දැන් සහ අනාගතයේදීත් ශක්තිමත්කිරීමට ප්‍රයෝජනවත් විය හැකි බව අපගේ බලාපොරොත්තුවයි

#### විවාහයේ වැදගත්කම මතකතබාගන්න

1. ඔබගේ විවාහයේ ප්‍රධාන වැදගත්කම ගැන මතකතබා ගන්න. අපගේ ස්වර්ගයේ වැඩසිටින පියාණන්වහන්සේගේ "ප්‍රීතියේ ශ්‍රේෂ්ඨ සැලසුම" තුළ විවාහයේ ඇති වැදගත්කම ගැන කියවෙන වැඩිහිටි බෲස් ආර්. මැකොන්කිගේ මෙම වචනවලට සවන්දෙන්න.

"මැරෙන සුළු ජීවිතයේ උපතේ සිට අප දේවමාළිගාවේ විවාහවීමේ අවස්ථාව දක්වා, සම්පූර්ණ සුභාරංචි සැලසුමේ අපට කිරීමට ඇති සියල්ල වන්නේ එම විවාහ බන්ධනයේ ශුද්ධවූ නියමයට ඇතුළුවීම සඳහා සූදානම්ව සුදුසුවීමය, එමගින් අපව මෙම ජීවිතයේ සහ මතු පැමිණෙන ජීවිතයේද ස්වාමිපුරුෂයන් සහ භාර්යාවන් බවට පත්කරනු ඇත.

"නිර්මානය සහ පවුල් ඒකක සම්පූර්ණකිරීමට වඩා වැදගත් වෙනත් කිසිවක් මෙම ලෝකයේ තවත් නැත" ("Salvation Is a Family Affair," *Improvement Era,* ජූනි 1970, 43–44).

#### ඔබගේ විවාහයේ සාර්ථකත්වය පතා යාච්ඤාකරන්න

2. ඔබගේ විවාහයේ සාර්ථකත්වය පතා යාච්ඤාකරන්න. වසර ගණනකට පෙර, ප්‍රධාන අධිකාරීන් දූතමෙහෙයට පැමිණි සියලුම ධර්මදූතයන් සම්මුඛව සාකච්ඡාකිරීම පොදු දෙයක්ව තිබියදී, එකල දොළොදෙනාගේ ගණපූර්ණයේ සාමාජිකයෙකුවූ වැඩිහිටි ස්පෙන්සර් ඩබ්ලිව්. කිම්බල්, සිය දූතමෙහෙය නිමකිරීමට ආසන්නව සිටි වැඩිහිටියෙකු බැහැදුටුවේය.

"ඔබව මුදාහැරියවිට, ඔබගේ සැලසුම කුමක්ද වැඩිහිටිය?"

"ඕ, නැවතත් විද්‍යාලයට යාමට මම සැලසුම්කරමි." ඉන්පසුව ඔහු සිනහමුසුව මෙසේ කීවේය, "ඉන්පසුව මගේ බලාපොරොත්තුව ප්‍රේම සම්බන්ධයක් ඇතිකරගෙන පසුව විවාහවීමය."

වැඩිහිටි කිම්බල් මෙම ඥානවන්ත උපදේශය දුන්නේය, "හොඳයි, ඔබ ප්‍රේමකරන තැනැත්තියම විවාහකරගැනීමට බලාපොරොත්තු නොවන්න, *ඒ වෙනුවට ඔබ විවාහවන අයට ප්‍රේමකිරීමට හැකිවීම සඳහා යාච්ඤාකරන්න."*

අපි යාච්ඤාකළ යුත්තේ, වඩාත් කරුණාවන්තවීමට, ආචාරශීලීවීමට, ඉවසීමට, කමාවදීමට, සහ *විශේෂයෙන්ම,* ආත්මාර්ථය අඩුකිරීමටය.

වඩා හොඳ විවාහ කොටස්කරුවන් වීමෙන් අපව වළක්වන අපගේ පෞද්ගලික ප්‍රශ්න හෝ දුර්වලතාවයන් හඳුනාගැනීම සඳහා, අපි යාච්ඤාවෙන් ස්වාමීන්වහන්සේ වෙතට පැමිණ මෝර්මන්ගේ පොතේ බලවත් පොරොන්දුවේ ප්‍රතිලාභ නෙළාගත යුතුවෙමු: "මිනිසුන් මා වෙතට පැමිණෙන්නේ නම් ඔවන්ගේ දුර්වලකම් මම ඔවුන්ට පෙන්වා දෙන්නෙමි...; මන්ද ඔවුන් මා ඉදිරියේ යටහත්වී, මා තුළ ඇදහිලිමත්වන්නේ නම්, එවිට ඔවුන්ගේ දුර්වලකම් ඔවුන්ට ශක්තියක් බව හරවන්නෙමි" (ඊතර් 12:27).

තවද එලෙසම යාච්ඤාකිරීමද අවශ්‍යතාවයකි. සභා නායකයන් සහ විවාහ උපදේශකවරුන් බොහෝ දෙනෙක් පෙන්වාදෙන පරිදි, දිනපතාම එකට එක්ව යාච්ඤාකරන ජෝඩු අතර බරපතල කරදරයකට පත්වූ එකද විවාහයක්වත් ඔවුන් දැක නැත. ප්‍රශ්න පැනනැගී, විවාහවලට තර්ජන පවතින විට, යුවලක් ලෙස එකට යාච්ඤාකිරීම සමහරවිට වඩාත් වැදගත් ප්‍රතිකාරයක්විය හැකිය.

**ඔබගේ සහකරුට සවන්දෙන්න**

3. සවන්දෙන්න. ඔබගේ සහකරුට සවන්දීමට කාලය වෙන්කරන්න; එය නිතිපතාම මෙන් සැලසුම් කරන්න. එකිනෙකා බැහැදැක විවාහයේ කොටස්කරුවෙකු ලෙස ඔබ කටයුතුකරන අයුරු තක්සේරු කරන්න.

බ්‍රෙන්ට් බාලෝ සොහොයුරා පූජකවරයේ සොහොයුරන් කණ්ඩායමකට ප්‍රශ්නයක් ඉදිරිපත් කළේය. "ඔබලාගෙන් කී දෙනෙක් එළිදරව්වක් ලබාගැනීමට කැමතිද?" සෑම අතක්ම එසවින. ඉන්පසුව ඔහු, ඔවුන් සියලුදෙනාම තම නිසේවලට ගොස්, ඔවුන් වඩා හොඳ ස්වාමිපුරුෂයන් වන්නේ කෙසේදැයි ඔවුන්ගේ භාර්යාවන්ගෙන් ඇසීමට යෝජනාකළේය. ඔහු මෙසේද කීවේය, "මම මාගේම අවවාදය අනුගමනයකර, වඩාත් විස්තර සහිත සාකච්ඡාවක් [මගේ බිරිඳ] සුසාන් සමග එදින දහවල් පැයකට වඩා සාකච්ඡා කළෙමි!" ("To Build a Better Marriage," *Ensign,* සැප්තැ. 1992, 7). එවැනි සාකච්ඡාවක් අප ඕනෑම කෙනෙකුට එළිදරව්වක් විය හැකිය.

ඔබලාගෙන් කිසිවෙක් හෝ සොහොයුරෙනි, මේ මෑතකදී මා අසන ලද මෙවැන්නක් ඔබගේ බිරිඳ කියනු අසා තිබේද? "ජෝයි, ඔබ සවන්දෙනවාද?" මා සවන්දෙනවාදැයි දැනගැනීමට අවශ්‍යවූ එකම පුද්ගලයා ඇය පමණක්ම නොවේ. ටික කලකට පෙර, මම නිදාසිටියදී අපගේ කුඩා මිණිපිරිය පැමිණ මගේ ඇස් පිහාටුව ඔසවමින්, "සීයා, ඔබ ඔතන සිටිනවාද" යයි ඇසුවාය. අපි "එතැන සිටිමින්" අපගේ සහකාරියට ප්‍රතිචාරශීලී විය යුතුවෙමු.

**නොනවතාම ඇනුම්පදකීමෙන් වළකින්න**

4. "නොනවතාම ඇනුම්පදකීමෙන්" වළකින්න. එකිනෙකාගේ වැරදි නිතරම විවේචනය නොකරන්න. අප කිසිවෙක් සර්ව සම්පූර්ණ නොවන බව පිළිගන්න. ක්‍රිස්තුස් මෙන් වීම සඳහා අපගේ නායකයන් අපගෙන් ඉල්ලාසිටින ලෙස අප සියලුදෙනාටම දුර ගමනක් යාමට ඇත.

සභාපති කිම්බල් හඳුන්වන ලෙස "නොනවතාම ඇනුම්පදකීම," ඕනෑම විවාහයක වටිනාකම අඩුකිරීමකි ("Marriage and Divorce," *1976 Devotional Speeches of the Year* [1977], 148). සාමාන්‍යයෙන් අප හැම කෙනෙක්ම අපගේ දුර්වලතාවයන් ගැන වේදනාවෙන් යුතුව දැනුවත්ව සිටින අතර, අපට නිරන්තර සිහිපත්කිරීම් අවශ්‍ය නොවේ. නිරන්තර විවේචන සහ ඇනුම්පද කීමේ ප්‍රතිඵලයක් ලෙස කිහිප දෙනෙක් යහපතට වෙනස්වී ඇත. අප ප්‍රවේශම් නොවන්නේ නම්, *වර්ධනය* තකා අප ඉදිරිපත්කරන සමහර විවේචන සැබවින්ම *විනාශකාරීය.*

සමහර අවස්ථාවලදී යම් දේවල් නොකියා සිටීම වඩා හොඳය, අළුත විවාහවූ, ලෝරා වෝල්ටර්ස් සඟරාවක කියවා ඇති පරිදි, විවාහයක් ශක්තිමත්කිරීම සඳහා, ජෝඩු නිතිපතාම අවංකව අදහස් ප්‍රකාශකරන සැසි වාර පැවැත්විය යුතු අතර, එහිදී ඔවුන් සොයාගත් කෝපකරවන කරුණු සටහන්කර ගත යුතුය. ඇය මෙසේ ලීවාය:

"අප සොයාගත් කෝපයට පත්කරවන කරුණු පහක් අපට නම්කිරීමට තිබුන අතර මා පටන් ගනිමින්... ඔහු ග්‍රේප්ෆෘට් කන අන්දම මට රුචි නොවන බව ඔහුට කීවෙමි. ඔහු එය කැවේ දොඩම් ගෙඩියක් ලෙස ලෙලි ගසාය! ග්‍රේප්ෆෘට් ඒ අන්දමින් කන මා දන්නා කිසිවෙක් නැත. ගැහැණු ළමයෙකුට ජීවිත කාලයක්, සදාකාලයම දක්වා පවා තම ස්වාමිපුරුෂයා දොඩම් ගෙඩියක් ලෙස ග්‍රේප්ෆෘට් කන අන්දම බලාසිටීම අපේක්ෂාකල හැකිද?...

[මගේ කරුණු පහ] මා නිමකිරීමෙන් පසුව, මා ගැන ඔහු අප්‍රියකරන දේවල් කීමේ ඔහුගේ වාරය පැමිණියේය. 'හොඳයි, ඇත්තම කිවහොත්, ඔබ ගැන අප්‍රියජනක කිසිවක් සිතාගැනීමට මට නොහැකිය, සොඳුර' යයි [ඔහු] කීවේය.

"හුස්මක් හෙළයි.

"මම ඉක්මණින් පිටුපසට හැරුණෙමි, මන්ද කෙසේ පැහැදිළි කරන්නේදැයි මම නොදත්තෙමි, මගේ දෙනෙතට පිරුන කඳුළු මගේ මුහුණ දිගේ ගලා ගියේය."

වෝල්ටර්ස් සොයුරිය අවසන්කරමින්, "අසමාන විවාහක ජෝඩු ගැන මා අසන සෑම විටකම, මා දැන් හඳුන්වන ග්‍රේප්ෆෘට් රෝගයෙන් ඔවුන් පීඩා විඳින්නේදැයි මම කල්පනාකරමි" යයි කීවාය ("The Grapefruit Syndrome," *Ensign*, අප්‍රේ. 1993, 13).

එසේය, සමහර අවස්ථාවලදී, නොකියූ යම් දේවල් අත්හැරීම වඩා හොඳය.

### ඔබගේ විවාහය ප්‍රාණවත්ව තබාගන්න

5. ඔබගේ විවාහය ප්‍රාණවත්ව තබාගන්න. ඔබ දෙදෙනාම—එක්ව කටයුතුකිරීමට කාලය සකසාගන්න. පවුලක් මෙන් දරුවන්ද සමග එකට සිටීම වැදගත්වන ලෙස, එකට සිටීමට සතිපතා නියමිත වේලාවක් ඔබට අවශ්‍යවේ. එසේ සකස්කිරීමෙන් ඔබගේ විවාහය පෝෂණයකිරීම වැදගත්වන බව ඔබගේ දරුවන්ට එමගින් වැටහෙයි. එයට කැපවීම, සැලසුම්කිරීම, සහ කාලසටහනක් අවශ්‍යවේ.

එය වියදම් අධික නොවිය යුතුය. වඩාත් වැදගත් කරුණ වන්නේ එකට කාලය ගතකිරීමය.

වරක් මගේ මාමා දහවල් ආහාරයෙන් පසුව වැඩකිරීම සඳහා ගොවිබිමට යාමට නිවසින් පිටවනවිටදී, මගේ නැන්දනිය ඔහු අමතා, "ඇල්බට්, ඔබ දැන්ම මා වෙත පැමිණ ඔබ මට ආදරයකරන බව කියන්න" යයි කීවාය. ඔහු සිනහසෙමින් විහිළුවට මෙන්, "එල්සී, අපි විවාහවන විට, මා ඔබට ආදරය බව මම ඔබට කීවෙමි, එය කිසිදා වෙනස්වන්නේ නැත. මම ඔබට එය දැනගන්ට සලස්වමි" යයි කීවේය. "මම ඔබට ප්‍රේමකරමි" යන ප්‍රකාශය විටින්විට කීම අසීරුය. එය දිනපතා පාවිච්චිකරන්න.

### "මට කණගාටුයි" කීමට ඉක්මන්වන්න

6. "මට කණගාටුයි" කීමට ඉක්මන්වන්න. ඉක්මණින් කීමට වචන ගොනුකරගැනීම අසීරුවුවද, සම්පූර්ණ වැරැද්ද ඔබ අතේ නොවුනද, "මට කණගාටුයි, කරුණාකර මට සමාවෙන්න," යයි ඉක්මණින් කියන්න. අවංක ප්‍රේමය වර්ධනයවන්නේ, පෞද්ගලික අතපසුවීම් සහ වැරදි පිළිගැනීමට සූදානම්වීමේ කැමැත්ත මගින්ය.

අසීරුකම් නැගීඑන විට, ඒවා සාකච්ඡාකර විසඳාගැනීම වැදගත්වන නමුත්, කාලය ගැනීම වඩා හොඳ වන අවස්ථාවන්ද ඇත. කිසිත් නොකියා සිටීම හෝ දහයට හෝ අවශ්‍යනම් දහස දක්වා පවා ගණන්කිරීම වැගත්වේ. තවද විටින්විට, ඔබගේ කෝපයත් සමග හිරු බැසයෑම දක්වා පවා සිටීමෙන් උදෑසනදී නැවත ඔබගේ ප්‍රශ්න වඩාත් විවේකයෙන්, සන්සුන්ව සහ හොඳින් විසඳාගැනීමට අවස්ථාවක් ලැබේ.

විටින්විට, මෙවැනි යමක් අපට ඇසේ, 'මන්ද. අපි විවාහවී දැනට පනස් වසරකි, අපට වෙනස් මතයක් කිසිදා ඇතිවී නැත." එය සත්‍ය සිද්ධියක් නම්, එවිට එක් කොටස්කරුවෙක් අනෙකා මත ප්‍රධානත්වය දරයි, නැතහොත් යමෙක් ප්‍රකාශකළ පරිදි, එය සත්‍යයට අමුත්තෙකි. ඕනෑම ඥානවන්ත යුවලකට තම අදහස්වල වෙනස්කම් ඇත. අපගේ අභියෝගය වන්නේ ඒවා විසඳාගන්නා අන්දම පිළිබඳව අපට ඇති විශ්වාසයයි. එය යහපත් විවාහයක් වඩා හොඳ එකක් කිරීමේ ක්‍රියාවලියේ එක් අංගයකි.

### ඔබගේ හැකියාවන් අනුව ජීවත්වන්න

7. ඔබගේ හැකියාවන් අනුව ජීවත්වන්න. විවාහයේ ඉතාමත් අසීරු අභියෝග කිහිපයක් මුදල් අංශවලින් පැනනැගෙයි. "ඇමෙරිකා නීතිඥ සංගමය…පෙන්වාදෙන පරිදි සියයට 89ක් වන සියලුම දික්කසාදවලට හේතුව මුදල් මත වන අඬදබර සහ චෝදනාවන්ය" (Marvin J. Ashton, "One for the Money," *Ensign,* ජූලි 1975, 72). ඔබගේ ආදායමට සරිලන පරිදි යම් මිළදීගැනීම් කල්දැමීමට හෝ අත්හැරදැමීමට කැමතිවන්න. පළමුව ඔබගේ දසයෙන් කොටස ගෙවා, හැකිතරම් දුරට ණයවීමෙන් වළකින්න. ඔබට ලැබෙනවාට වඩා ඩොලර් පනහක් අඩුවෙන් වියදම් කිරීම සතුට සමකරන අතර, පනහක් වැඩිපුර වියදම්කිරීම දුක්ඛිතකම සමකරන බව මතකතබාගන්න. කතුර සහ ඔබගේ ණයවර පත් එළියට ගෙන වැඩිහිටි ජෙෆ්රි ආර්. හොලන්ඩ් හඳුන්වන "ප්ලාස්ටික් සැත්කම" කිරීමට කාලය පැමිණ ඇත." ("Things We Have Learned—Together," *Ensign,* ජූනි 1986, 30).

### නිවසේ සහ පවුලේ වගකීම් බෙදාගන්න

8. නිවසේදී සහ පවුලේ වගකීම්වලදී අවංක කොටස්කරුවෙකු වන්න. නිවස හිඳගෙන සිටින නවාතැනක් ලෙස පමණක් බව අපේක්ෂා කරමින්, ජීවත්වීමට ඉපැයීම තම වැඩකොටස බව සිතමින්, නිවසේ සහ ළමයින්ගේ වගකීම් තම බිරිඳට අයත් බව සිතන ස්වාමිපුරුෂයෙක් නොවන්න. නිවස සහ පවුල ගැන සැලකීමේ කාර්‍යය එක් පුද්ගලයෙකුගේ වගකීමට වැඩි දෙයකි.

ඔබ දෙදෙනාම කොටස්කාරකමට එක්ව සිටින බව මතකතබාගන්න. අපගේ යහන සෑම උදෑසනකම මිතිත්තුවකටත් වඩා අඩුවෙන් කළ හැකි බව බාබරා සහ මම දැනසිටි අතර, එය එදිනම කරන්නෙමු. මට එය කිරීමට ඇය ඉඩදෙන්නේ මුළු දවසේම මා ගැන යහපත් හැඟීමක් ඇතිකරගැනීමට මට උපකාරයක් ලෙස බව ඇය කියයි. මා සිතන ලෙස එයට යම් හේතුවක් ඇත.

එක්ව ශුද්ධ ලියවිලි කියවීමට කාලය සොයාගෙන, සභාපති කිම්බල්ගේ මෙම ගැඹුරු උපදේශය අනුගමනය කරන්න: "ස්වාමිපුරුෂයා සහ භාර්‍යාව එක්ව නිතරම ශුද්ධවූ දේවමාළිගාවට යාම, ඔවුන්ගේ පවුල සමග එකතුව ඔවුන්ගේ නිවස තුළ යාච්ඤාවෙන් දණගැසීම, අත් අල්ලාගෙන ඔවුන්ගේ ආගමික රැස්වීම්වලට යාම, ඔවුන්ගේ ජීවිත නිර්මලව, මානසිකව සහ ශාරීරිකව මුළුමනින්ම තබාගැනීම,…දෙදෙනාම දෙවියන්වහන්සේගේ රාජ්‍යය ගොඩනැගීමට එකට වැඩකරන විට, සතුට එහි හිණිපෙත්තේම පවතියි" (*Marriage and Divorce* [1976], 24).

සාරාංශය

- ඔබගේ විවාහයේ ප්‍රධාන වැදගත්කම මතකතබාගන්න.
- එහි සාර්ථකත්වය පතා යාච්ඤාකරන්න.
- සවන්දෙන්න.
- නොනවත්වා ඇනුම්පද කීමෙන් වළකින්න.
- ඔබගේ විවාහය ප්‍රාණවත්ව තබාගන්න.
- "මට කණගාටුයි" යයි කීමට ඉක්මන්වන්න
- ඔබගේ හැකියාව අනුව ජීවත්වීමට ඉගෙනගන්න.

- නිවසේ සහ පවුලේ වගකීම්වලදී අවංක කොටස්කරුවෙකු වන්න.

යේසුස්වහන්සේ ක්‍රිස්තුස්වහන්සේ බවත්, එම තුන්වෙනි දවසේ සොහොන් ගෙය හිස්ව තිබූ බවත්, එසේම "ආදම් තුළ සියල්ලන් මැරෙන්නාක් මෙන්ම, ක්‍රිස්තුස්වහන්සේ තුළ සියල්ලෝම ජීවත්කරනු ලබනබවට" මම සාක්ෂිදරමි (1 කොරොන්ති 15:22). මෙලෙස යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නැවත පිහිටුවූ සුභාරංචිය තුළ ඇති මුදුාකිරීමේ බලයට කෘතඥපූර්වකව, අපට විශ්වාසකින් යුතුව කවියෙක් සමග මෙසේ කිව හැකිය, "මරණයෙන් පසුව නුඹුත් මම නුඹට ප්‍රේමකරන්නෙමි" (Elizabeth Barrett Browning, *Sonnets from the Portuguese*, අංක. 43, පේළිය 14).

1995 අප්‍රේල් මසදී වැඩිහිටි ක්‍රිස්ටන්සන් විසින් Church General Conference හි කළ කථාවකිනි (බලන්න Conference Report, අප්‍රේ. 1995, 84–87; හෝ *Ensign*, මැයි 1995, 64–66).

# ඇදහිල්ල සහ යාච්ඤාව තුළින් විවාහ ශක්තිමත්කිරීම

# 6

## අදාළකරගැනීම සඳහා අදහස්

ඔබගේම අවශ්‍යතා සහ තත්වයන් අනුව, මෙම යොජනා එකක් හෝ දෙකම අනුගමනයකරන්න.

- ස්වර්ගික පියාණන් සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ ඔබගේ ඇදහිල්ල ශක්තිමත්කිරීමට ඔබට කළ හැකි එක් දෙයක් තීරණයකරන්න.
- ඔබගේ සහකරු සමග යාච්ඤාකිරීමට හැම දිනකම වෙලාවක් පිහිටුවාගන්න.

## කියවීමේ පැවරුම

පහත සඳහන් ලිපිය කියවන්න, ඔබ විවාහක නම්, ඔබගේ සහකරු සමග ලිපිය කියවා සාකච්ඡාකරන්න.

### ජීවිතයේ සතුට ලබාගැනීම

ප්‍රේරිතයන් දොළොස්දෙනාගේ ගණපූර්ණයේ
වැඩිහිටි රිචඩ් ජී. ස්කොට්

#### විවිධත්වය මධ්‍යයේ ස්ථිරත්වය

මෑතකදී මම අලංකාර පැසිෆික් දූපත්වල උතුරු වෙරළේ සිටගෙන අරුණ උදාවන මුහුද දෙස බලා සිටියෙමි. අතිවිශාල රළගෙඩි එකාකාරව ඉදිරියට විත් වෙරළේදී බිඳීයන නිත්‍යතාවය මගින් මම වශීවීමි. එමගින් ස්වාමීන්වහන්සේගේ සැලසුමේ එකාකාරබවත්, එය හා බැඳුනු සදාකාලික නීතිය සහ, විනිශ්චය දරාගැනීමේ ආරක්ෂාකාරීබව සහ කීකරුකම මගින් ලබාගන්නා දයාවේ මෘදුභාවයද මට සිහිපත් කරවීය. හැම රළක්ම විවිධ ස්ථානවලදී ක්ෂිතිජයේ ගැටී වෙරළ දක්වා එහි අද්විතීය මාවත සොයාගන්නා බව මම දුටුවෙමි. සමහර රළ ගල් උඩින් ගලා ගොස්, සුදු ජලයට හැරෙයි. අනෙක් ඒවා හුදකලාව වෙරළේ ගැටෙයි. ඒවා තෙත් වැල්ලේ රූටාගොස් රටා මවයි. ඉන්පසුව පෙන පිඬු නංවා ගලායයි.

ස්වාමීන්වහන්ස් අපට ලබාදී තිබෙන අවසන් නොවන විවිධ හැකියාවන් ගැන මම සිතුවෙමි. අපට එපමණටම නිදහසක්, අපගේ අද්විතීය පෞද්ගලිකත්වයන් සහ දක්ෂතා දියුණුකිරීම, අපගේ පෞද්ගලික සිහිවටන, අපගේ පෞද්ගලික දායකත්වයන් ඇත. ප්‍රතාපවත් සාගරය තවදුරටත් බැලීමට අවස්ථාවක් නොමැතිවුවද, පසුව නිර්මානයවන මහිමාන්විත ප්‍රභාමත් හිරුගේ දර්ශනය මවාගැනීමට මම උත්සාහ කළෙමි. මම ගෞරවයෙන් යුතුව මෙම විශිෂ්ඨ දර්ශනය බලාසිටින විට, වලාකුළක ජනේලයක් නිර්මානයවිය; නැගී එන හිරුගේ දිළිසෙන රැස් අහසෙන් විවරවී, එහි දිළිසීම, පාට, එහි ජීවය සමගින් සෑම දෙයක්ම වෙනස් කළේය. එය ස්වාමීන්වහන්සේට අමතර ආශිර්වාදයක් බෙදාගැනීමට අවශ්‍යවීමක්, සහ උන්වහන්සේගේ ඉගැන්වීම් ස්පර්ශකරන සෑම දෙනාටම සංකේතයක් ලෙස ලැබෙන බලාපොරොත්තු දීමක් වැනිය. අප ජීවත්වන මෙම අපූර්ව ලෝකය වෙනුවෙන්ද, අපගේ ස්වර්ගික පියාණන්වහන්සේ එතරම් නිදහසේ දර්ශනයකිරීමට කැමති අයට බෙදාදෙන කෘතඥතාවය වෙනුවෙන්ද කඳුළු පිරුනි. සැබවින්ම ජීවිතය අලංකාරය.

#### ජීවිතයේ අලංකාරය ගැන කෘතඥවන්න

ඔබගේ ජීවිතය කෙතරම් අලංකාරවිය හැකිදැයි සොයාගැනීමට හැම දිනකම ඔබ කාලය ගන්නේද? ඔබ හිරු බැසයාම—වළාකුල්, වෘක්ෂලතා, කඳු, සහ මිටියාවත් සිපගෙන බැසයන හිරුරැස්, යහපත් රාත්‍රිය, සමහර අවස්ථාවලදී ශාන්තවද, සමහර අවස්ථාවලදී පාට සහ විලාශය සමෘද්ධිමත්ව යනු බලාසිට කොපමණ කාලයක් ගතවී ගොස්ද?

ස්වාමීන්වහන්සේ එතුමාගේ ස්වර්ගයේ ආශ්චර්යයන්—දිළිසෙන තාරකා, සඳ රැස්,—අපගේ සිතුම් පැතුම් එතුමාගේ ශ්‍රේෂ්ටත්වය සහ මහිමය විවෘතකළ විට වළාකුල් රහිත රාත්‍රියක කුමන පුදුමයක්ද?

සරුපසක සිටවූ බීජයක් දළුලා, ශක්තිමත්ව, සහ කුඩා නොවැදගත් ලෙස පෙනෙන අංකුරයක් එනු බලාසිටීම කෙතරම් සිත් බඳනා සුළුද. එය ඉවසිලිවන්තව වැඩීම ආරම්භවී, එහි ස්වභාවය දියුණුකරගෙන, ස්වාමීන්ව හන්සේගේ බීජානු නීතිය අනුව එහි වැඩීම පවත්වයි. සැලකිල්ලද සමග සැබවින්ම එය නියමය අනුව සිදුවෙයිඃ අනුග්‍රහය සහ අලංකාරය හිසින්දරා සිටින. ලිලී මලක්; සුවඳැති මින්ට් පැළයක්; පීච් ගසක්; ඇවකාඩෝ ගසක්; හෝ අලංකාර මලක් අද්විතීය රසයක්, පැහැයක් සහ සුවඳක් ගෙනදෙයි.

කුඩා රෝස පොහොට්ටුවක් පිබිදීම ඔබ අවසන් වරට දුටුවේ කවදාද? හැම දිනකම එය අළුත් සහ සිත්බඳනා ලෙස, එය ප්‍රභාමත් රෝස මලක් වන තුරු අලංකාරබවේ පොරොන්දුවක්ද සමග වැඩෙයි.

ඔබ දෙවියන්වහන්සේගේ එක් උදාර නිර්මානයකි. උන්වහන්සේගේ අභිප්‍රාය වන්නේ, ඔබගේ තත්වයන් ගැන නොසලකා, ඔබගේ ජීවිතය මහිමාන්විතව අලංකාරවීමය. ඔබ කෘතඥව කීකරුවන විට, ඔබට දෙවියන්වහන්සේ බලාපොරොත්තුවන තැනැත්තා වීමට පුළුවන.

### ජීවිතයේ සතුට දෙවියන්වහන්සේ තුල විශ්වාසය මත රඳාපවතී

කණගාටුව, බලාපොරොත්තු කඩවීම, සහ බරපතළ අභියෝග ජීවිත සිද්ධීන්වේ. ජීවිතය තුළින්ම පමණක්ම නොවේ. මෙම සමහර සිද්ධීන්වල අසීරුකම මම අවම නොකරමි. ඒවා දීර්ඝ කාලයක් පුරා පැවතිය හැකි නමුත්, ඔබ කරන සෑම දෙයකම බාධකයක් වීමට ඒවාට ඉඩනොදිය යුතුය. ස්වාමීන්වහන්සේ ලිහායි ලවා මූලික සත්‍යයක් ප්‍රකාශකරවූ සේක, "මිනිසුන් ජීවත්වන්නේ ඔවුන්ට සතුට ලැබීමට හැකිවීම."[1] එය නියමයන් සහිත ප්‍රකාශයකිඃ "ඔවුන්ට සතුට ලැබීමට *හැකිවීම.*" එය ස්වාමීන්වහන්සේ සඳහා නියමගත නොවේ. උන්වහන් සේගේ අභිප්‍රාය අප හැම කෙනෙක්ම සතුටින් සිටීමය. ඔබ පණත්වලට කීකරුව, ආචාරීන්වහන්සේ තුල ඇදහිල්ල ඇතිව, සහ මෙම පොළොව මත සතුට ලැබීම සඳහා අවශ්‍ය දේවල් කරන විට එය ඔබට නියමයක් නොවන්නේය.

ජීවිතයේ ඔබගේ සතුට රඳාපවතින්නේ, ස්වර්ගික පියාණන් සහ එතුමාගේ ශුද්ධවූ පුත්‍රයාණන් සහ උන්වහන්සේගේ ප්‍රීතියේ සැලසුම මගින් ඔබට සත්‍ය ලෙසම සතුට ගෙන ඒමට හැකි බවට ඔබ තුල පවතින විශ්වාසය මතය. උන්වහන්සේලාගේ දහම ගැන සිතා බැලීමෙන් මෙම පොළොවේ අලංකාරයෙන් සතුටුවීමට ඔබට හැකිවී, අන් අය හා ඔබගේ සම්බන්ධතාවයද පෝෂණයකරයි. එමගින් ඔබට සහනය ලබාදී, ස්වර්ගයේ වැඩසිටින පියාණන්වහන්සේට යාච්ඤාකිරීමෙන් සහ ඒවාට එතුමා නැවත දෙන පිළිතුරුවලින් ලැබෙන ඔබගේ අත්දැකීම් ශක්තිමත්කරයි.

### දර්ශනය සහ ඉවසීම

ඇසට සමීපව තබන ගලක් පෙනෙන්නේ විශාල ද්‍රව්‍යයක් ලෙසය. බිමට දමන්න, එය සාමාන්‍ය ලෙස පෙනේ. එලෙස, ඔබගේ ජීවිතයේ ප්‍රශ්න සහ පරීක්ෂාවන් ආත්මික දහම දර්ශනයකිරීමෙන් බැලීම අවශ්‍යවේ, එසේ නොමැති නම්, ඒවාට පහසුවෙන්ම අපගේ දර්ශනය හඹායාමට, අපගේ ශක්තිය උරාගැනීමට, සහ පොළොව මතදී අප ලැබිය යුතු ස්වාමීන්වහන්සේගේ අභිප්‍රාය වන සතුටෙන් සහ අලංකාරයෙන් අපට අහිමිකරයි. සමහරෙක් ප්‍රශ්න නැමැති සාගරය තුලට දැමූ ගල් වැනිය. ඔවුහු ඒවා මගින් ගිල්වනු ලබති. පොරොප්පයක් වන්න. ප්‍රශ්නයක ගිලියන විට, සතුටින් යුතුව නැවතත් සේවයකිරීම සඳහා පාවීමට නිදහස පතා සටන්කරන්න.

ඔබ මෙහි පොළොව මත සිටින්නේ දිව්‍යමය අරමුණක් සඳහාය. එය නිමක් නොමැතිව විනෝදවීමට හෝ නිරන්තර පූර්ණ සතුටක් විඳීම සඳහා හෝ නොවේ. ඔබ මෙහි සිටින්නේ පරීක්ෂාකිරීමටය, ඔබව ඔප්පුකිරීමටය, එවිට ඔබ වෙනුවෙන් ස්වාමීන්වහන්සේ සතුව තිබෙන අමතර ආශිර්වාද ලබාගැනීමට ඔබට පුළුවන.[2] එලදායි ඉවසීම අවශ්‍යවන්නේය.[3] මෙම ජීවිතයේදීම සමහර ආශිර්වද ලබාදෙනු ඇත; අනෙක් ඒවා තිරයෙන් එහා පැමිණෙනු ඇත.

ඔබගේ පෞද්ගලික වැඩීම සහ දියුණුව ස්වාමීන්වහන්සේගේ අභිප්‍රායවේ. එම දියුණුව ඉතා වේගයෙන් වැඩිවන්නේ, මුලින් ඔබ පුද්ගලිකව එයට කැමති හෝ අකමැතිවුවද ඔබ කැමැත්තෙන්ම ඔබ මුහුණදෙන සෑම අත්දැකීමක්ම තුලින් එතුමාගේ මගපෙන්වීම ලබන විටය. ඔබ ස්වාමීන් වහන්සේව විශ්වාසකරන විට, ඔබ ඔබගේ හදවත සහ ඔබගේ සිත උන්වහන්සේගේ කැමත්තට යොමුකරන විට, උන්වහන්සේගේ කැමැත්ත කිරීමට ආත්මික මග පෙන්වීම ලැබීමට ඔබ ඉල්ලූවිට, ඔබට විශාලතම සතුටක් සහ මෙම මැරෙන සුළු ජීවිතයේ අත්දැකීම්වලින් බොහෝ දේවල් ඉටුකරගැනීමට සහතිකයක් ලැබෙන්නේය. ඔබට කිරීමට කියන සෑම දෙයක් ගැනම ඔබ ප්‍රශ්න කරන්නේ නම්, හෝ සෑම අප්‍රසන්න අභියෝගයකටම බලවත්ව විරුද්ධවන්නේ නම්, ස්වාමීන් වහන්සේ ඔබට ආශිර්වාදකිරීම ඔබ අසීරුකරන්නේය.[4]

ඔබගේ කර්තෘත්වය, තේරීම් කිරීමේ අයිතිවාසිකම, ලබාදී නැති නම්, එවිට ඔබට අවශ්‍ය දෙය ගැනීමට ඔබට පුළුවන. මෙම දිව්‍යමය දීමනාව ලබාදී ඇත්තේ, එවිට ඔබගේ ස්වර්ගයේ වැඩසිටින දෙවියන්වහන්සේට ඔබගෙන් අවශ්‍ය දෙය තෝරාගැනීමට ඔබට පුළුවන. ඒ අන්දමින් උන්වහන්සේගේ අභිමතය ලෙස ඔබට මගපෙන්වීමට උන්වහන්සේට හැකියාව ලැබේ.[5] එම මාවත මහත් සතුටකට සහ ප්‍රීතියකට මග පෙන්වයි.

### විපත මධ්‍යයේ සතුටින් ජීවත්වන්න

තම අභියෝගවලින් සමාදානය සලසාගෙන විපත මධ්‍යයේ සතුටින් ජීවත්වන ආනුභාමත් පුද්ගලයන්ගෙන් ඉගෙනගන්න. කොඳුනාරටියේ භයානක රෝගයකින් පෙළුන එක් ප්‍රියමනාප කාන්තාවක් ජීවිතයේ සතුට ලැබුවාය. ඇය ප්‍රීතියේ සැලසුම තේරුම්ගත්තාය. දේවමාළිගා නියෝග ලබා ගෙන, පොරොන්දු ආශිර්වාද ලබාගැනීමට සුදුසුවීම සඳහා තමාට හැකි සියල්ල කළාය. ඇයගේ පුද්ගලික ජර්නලය මෙසේ වාර්තා කරයිඃ

"එය මනරම් ග්‍රීෂ්ම දිනයකි. මම එදින තැපැල් ලිපි රැගෙන ඔන්චිල්ලාවේ හිඳගතිමි. උණුසුම් හිරු එළියේ, ස්වභාව ධර්මයේ සහ මා අවට ඇති ගස්වල මිහිරි සුවඳ විඳිමින් මම සතුටින් සිටියෙමි. හිඳගෙනම සිටිමින් මෙම පොළොව මත මා තවමත් ජීවත්වසිටීම ගැන ආඩම්බරවුනෙමි.... ස්වාමීන්වහන්සේ මට බොහෝ කරුණාවන්තවූසේක. මම තවමත් මෙහි සිටිමින් සතුටුවීම ගැන එතුමාට කෙසේ ස්තුතිකරම්ද? මම එතරම්ම—සතුටට පත්වූ බැවින්, මෙම නිවස තුල හිඳිමින් හිරු එළිය විශාල ජනේලයට ගලාඑන විට, මට කැගසමින් නටන්ට සිතුනි. ජීවත්ව සිටීම ගැන මම සතුටුවෙමි."

නිර්භීත මවක් දිරිමත්ව දුර්වලකරන රෝගයක් සමග සටන්කරමින් නොකියූ පැය ගණනාවක් මහන්සිවීමක් විශාල සියුම් කලා කාතියක් මගින් සම්පූර්ණකර ඇත. එය පරීක්ෂාවෙන් අත්දකින යුවලකට ලැබුනු දීමනාවක් විය. මන්ද එය යුවලකට මිළකල නොහැකි වස්තුවකි. විපතක් ඉදිරියේ දැරූ උත්සාහයන් නිතර සිහිපත්කරවන මාහැඟි ප්‍රතිඵලය. පවිත්‍ර ප්‍රේමයේ සහ කැමැත්තෙන් කරන පරිත්‍යාගයක බලාපොරොත්තු පොදිබැඳගත් දරාසිටින පණිවුඩයකි.

### ඔබට කිරීමට තිබෙන දේවල සතුට සොයාගන්න

දැඩි අභියෝගාත්මක තත්වයන් යටතේ සතුට සොයගන්නා අන්දම ළමෝ අපට උගන්වති. ළමුන්ට අවශ්‍ය නොවන දේවල් ගැන සිතාබලා කළකිරීමට ඔවුන් තවමත් ඉගෙනගෙන නැත. ඔවුන්ට තිබෙන සෑම දෙයකින්ම ඔවුහු සතුටක් ලබති. කුඩා ළමයෙක් ඇලක ඉවුරක් මත සෙල්ලම්කරනු මට මතකය. ඔහු මාළු අල්ලන නූලක් ඉවතදමන ලද බීම කෑන් දෙකක කෙළවර ගැට ගසා තිබුනි. ඔහු එක කෑනයක් අත්තක් උඩට වීසිකර, එය ජලයෙන් පිරවීය. ඔහු අනෙක් කෑනය අදිමින් එය යාමට සලස්වයි. පළමු කෑනයේ බරින් එය යට යන විට අනෙක් කෑනය උඩ යයි. ඔහු සතුටින් සිනහසෙමින් නැටුවේය.

සරළ තරුණ්‍යයේ අත්දැකීම් අප වටකරගනියි. ඒවා කෝපය ලිහිල්කර ආත්මික බව ඔසවන ආරක්ෂිත කරාම විය හැකිය. ඔබට නොතිබෙන හෝ නැතිවුන දෙයක් ගැන කල්පනා නොකරන්න. ස්වාමීන්වහන්සේ සතු සියල්ලම කීකරුවන්නාට බෙදාදීමට එතුමා පොරොන්දුවූසේක. ඔබට මෙම ජීවිතයේ තාවකාලික අඩුපාඩු තිබිය හැකිය. නමුත්, නිර්භීතව ජීවත්වී ඔබ සුදුසුබව ඔප්පුකරන්නේ නම්, මතු ජීවිතයේදී සම්පූර්ණත්වය ඔබගේ ආශිර්වාදය වන්නේය.

ස්වාමීන්වහන්සේගේ ප්‍රඥාව තුල, ඔබගේ ජීවිතයේදී වන්දි වශයෙන් වන ආශිර්වාදය ලබාගන්න. ඔබට වඩාත් අවශ්‍යවන දෙය උන්වහන්සේ ඔබට අභිමිකරනසේක. නොපෙනෙන අයට හෝ ඇසීම නැති අයට, වෙනත් සංඥාවන් එතුමා මුවහත් කරනසේක. රෝගී අයට, එතුමා ඉවසීම, අවබෝධය, අන් අයගේ කරුණාව වෙනුවෙන් වැඩිපුර කෘතඥතාවය දෙනසේක. ආදරය කළ අයෙකු නැතිවීම සමග, උන්වහන්සේ ප්‍රේම බන්ධනය ගැඹුරුකර, සිහිවටන පෝෂණයකර, අනාගත එක්සත්කමේ බලාපොරොත්තු අවුළුවනසේක. ඔබ ස්වාමීන්වහන්සේගේ කැමැත්ත, කැමැත්තෙන්ම පිළිගෙන,එතුමා තුළ ඇදහිල්ල ක්‍රියාත්මක කරන්නේ නම්, වන්දිගෙවීමේ ආශිර්වාද ඔබට සොයාගත හැකිය.[6]

ඇල්මාගේ විපතට පත් ජනතාවට ස්වාමීන්වහන්සේ මෙසේ කීසේක:

"මම බර සැහැල්ලු කරන්නෙමි...නුඹලාට ඒවා නුඹලාගේ ශරීරය මත තිබේදැයි හැඟීමක් පවා නැත...; තවද මා මෙය කරන්නේ නුඹලා මෙතැන් සිට මා ගැන සාක්ෂියක් ලෙස සිටිමින්, සහ නුඹලා නිශ්චිතවම මා ස්වාමීන් බවත්, මාගේ ජනතාවගේ විපතේදී මා ඔවුන් බැහැදකින බව නුඹලා දැනගන්නා පිණිසය.

"තවද..., බර...සැහැල්ලුකර ඇත; එසේය, ස්වාමීන් වහන්සේ ඔවුන්ව ශක්තිමත්කළ නිසා, ඔවුන්ගේ බර පහසුවෙන් දරාගැනීමට ඔවුන්ට හැකිවිය, තවද ඔවුහු සතුටින් සහ ඉවසීමෙන් ස්වාමීන්වහන්සේගේ සියලුම කැමත්තට යටත්වූහ."[7]

### නිර්මානය කිරීමෙන් ජීවිතයේ සතුට භුක්තිවිදීමට ඔබට උපකාරකරයි

උත්පාදකිරීමට උත්සාහදැරීමෙන් සතුට ගෙන එනු ලබයි. ගෞරවනීය ස්වාමිපුරුෂයන් නිවසට කැඳවීමෙන් පසුව, කැමිලා කිම්බල්, සහ හෙලන් රිචඩ් සොහොයුරියෝ තීන්තගෑමට ඉගෙනගත්හ. ඔවුහු කලාවේ උරුමයන් අත්හැරියා පමණක් නොව, නමුත් ඔවුන්ට කවදාවත් හිරුබැසයාම, මුහුණක්, ගසක්වත් නැවත දැකගැනීමට නොහැකිවනු ඇත. ඔවුන්ට දැන් පාටවල සහ හැඩයේ සියුම් වෙනස තේරුම්ගත හැකිවීමෙන් ඔවුන් අවට ඇති අලංකාරයෙන් ප්‍රීතිවිය හැකිය

සංගීතය, රංගනය, ප්‍රතිමා කලාව, හෝ කවිය වැනි යමක් තෝරාගන්න. නිර්මානය කිරීමෙන් ජීවිතයේ සතුට භුක්තිවිදීමට ඔබට උපකාර කරයි. එය කෘතඥතාවයේ ආකල්පයක් උපදවයි. එය දක්ෂතා දියුණුකරයි, ක්‍රියාකිරීමට, සහ ජීවිතයේ අරමුණ සෙවීමට එය ඔබගේ හැකියාව මුවහත්කරයි. එය හුදකලාව සහ සිත්වේදනා පළවාහරියි, එය උනන්දුවෙන් කථාකිරීමට සහ ජීවිතයේ ආශාවන් අළුත්කරයි.

### සේවයකිරීම: සතුටට මාර්ගයකි

අන්අයට කැමැත්තෙන් සේවයකිරීම සදා සතුටට මාර්ගයකි. සභාපති ස්පෙන්සර් ඩබ්ලිව්. කිම්බල් මෙසේ කීවේය: "දෙවියන්වහන්සේ අප ගැන සැලකිලිමත්ව අප ගැන පරීක්ෂාවෙන් සිටිනසේක. නමුත් අපගේ අවශ්‍යතාවයන් එතුමා ඉටුකරන්නේ තවත් මනුෂයෙකු තුලින්ය. එමනිසා, වඩාත් වැදගත්වන්නේ අපි එකිනෙකාට සේවයකිරීමය."[8]

මම දන්නා කාන්තාවක් අතිශයින්ම සතුටිනි සිටින්නීය. හැම උදෑසනකම ඇය සිය ස්වර්ගයේ වැඩසිටින පියාණන්ගෙන් ඇයට උපකාරයක් කළ හැකි යමක් දෙස ඇයව යොමුකරන ලෙස ඉල්ලයි. එම අවංක යාච්ඤාවට නැවත නැවත පිලිතුරු ලැබී ඇත. බොහෝ දෙනෙකුගේ බර සැහැල්ලුවී, ඔවුන්ගේ ජීවිත ප්‍රභාමත්විය. ස්වාමීන් වහන්සේ විසින් මගපෙන්වන මෙවලමක් වීමෙන් ඇය නිරන්තරයෙන්ම ආශිර්වාදිත වූවාය.

### අසීරුතාවය වර්ධනයට වෙනස් කල හැකිය

අපි ජීවිතයේ මුහුණදෙන සෑම අසීරුතාවයක්ම, අපගේම නොසැලකිල්ල හෝ නීතිකැඩීම නිසාම පැමිණෙන ඒවා වුවද, අත්දැකීම් වර්ධනයවීමට ඉහළට තැබූ අත්‍යාවශ්‍ය ඉණිමගක් ලෙස, වෙනස් කිරීමට, ස්වාමීන්වහන්සේට පුළුවන් බව මම දනිමි.[9] නීතිකැඩීම වර්ධනයේ මගක් බවට මම ඇත්තවශයෙන්ම නිර්දේශ නොකරමි. එය වේදනාකාරීය, අසීරුය, එනිසා සම්පූර්ණයෙන්ම අනවශ්‍යය.

එනිසා වඩාත් ඥානවන්ත සහ වඩාත් පහසුවන්නේ ධර්මිෂ්ටව ඉදිරියට යාමය. නමුත් නිසි පසුතැවිල්ල, ස්වාමීන්වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඇදහිල්ල, සහ උන්වහන්සේගේ පණත්වලට කීකරුවීම මගින්, නීති කැඩීමෙන් ඇතිවන බලාපොරොත්තු කඩවීම පවා නැවත සතුටට පරිවර්තනය කළ හැකිය.

සතුට ලැබීම සඳහා ඔබට කළ හැකි දේවල්වල ලැයිස්තුවක් සකස්කරන්න, ඒවා නම්:

- ශුද්ධ ලියවිලි මෙනෙහිකර ප්‍රීතියේ සැලසුම තේරුම්ගන්න.
- යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඇදහිල්ල ඇතිව යාච්ඤාකරන්න.
- අන්අයට ප්‍රේමකරමින් සේවයකරන්න.
- දේවමාළිගා නියෝග ලබාගන්න. අන්අයට ආශිර්වාදකිරීමට නැවත එන්න.
- අනාගතවක්තෘවරයාට සවන්දී, ඔහුගේ උපදෙස්වලට කීකරුවන්න.
- ඔබ සතු දේවල් ගැන කෘතඥවන්න.
- ෑඩියෙන් සිනහසෙන්න.

ඔබගේ ලැයිස්තුව ප්‍රීතියට සහ සතුටට මාර්ගය ලබාදෙයි.

### අභියෝගය තාවකාලික නමුත් සතුට සදාකාලිකය

ප්‍රසිද්ධ බ්‍රසීලියානු ගීතයක බොහෝ දෙනෙක් විශ්වාසකරන මුසාවාද නිතර කියවෙයි: කණගාටුව කිසිදා අවසන් නොවේ, නමුත් සතුට අවසන්වේ. ගැලවුම්කරුවාණන් තුල ඇදහිල්ල සහ උන්වහන්සේගේ ඉගැන්වීම්වලට කීකරුවීමෙන්, සතුට කිසිදා අවසන් නොවන නමුත් කණගාටුව අවසන්වන බවට මම සාක්ෂිදරමි.

ඔබ හෝ ආදරයකරන කෙනෙක් මුහුණපාන යමක් කෙතරම් අසීරුවුවද, එය ඔබගේ ජීවිතය අභිබවා යාම හෝ ඔබගේ සියලුම අශාවන්වල කේන්ද්‍රස්ථානය නොවිය යුතුය. අභියෝග අත්දැකීම් වඩවන අතර, තාවකාලික දර්ශන රඟදැක්විය යුත්තේ ප්‍රසන්න ජීවිතයක පසුතලයේ සිටය. ඔබ ගැන හෝ ඔබ ගැන බලාපොරොත්තු තබා තිබෙන අය වෙනුවෙන් හෝ ඔබට වෙනත් විකල්පයක් නොමැති නම්, යම් සිද්ධියකින් එතරම් කළබලයට පත් නොවන්න. බොහෝ දේවල් ශරීරය අළුත් කිරීමක් බව මතකතබාගන්න. යම් ආත්මික සහ චෛතසික අභියෝග සුවවීමට කලක් ගතවේ.

ස්වාමීන්වහන්සේ මෙසේ කියා ඇතිසේක, "විපතේදී ඉවසන්න, මන්ද නුඹට මුදල් ඇත්තේය, නමුත් ඒවා දරාගන්න. මන්ද බලන්න, නුඹගේ දවස් අවසානය පවා, මා නුඹ සමගය."[10] ඔබ ඉවසීමෙන් සිටින විට, "මා නුඹ සමගය" යන ප්‍රකාශයේ අදහස ඔබට තේරුම් යනු ඇත. දෙවියන්වහන්සේගේ ප්‍රේමය සමාදනය සතුට ගෙනඑයි.

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඔබගේ ඇදහිල්ල ජීවිතයට සදාපවතින අර්ථයක් ලබාදෙයි. ඔබ උත්කර්ෂය දක්වා ගමනක් යන බව මතකතබාගන්න. සමහර අවස්ථාවලදී ඔබට ඇති අත්දැකීම්වලින් අන් ඒවාට වඩා සතුටක් ලැබෙන නමුත්, ඒ සියල්ලේම ස්වාමීන්වහන්සේගේ අරමුණක් ඇත.[11]

ස්වාමීන්වහන්සේගේ සාක්ෂිකරුවෙක් වශයෙන්, ඔබට වරදක්කල බවට හැඟෙන ඕනෑම අයෙකුට කමාව දීමට මම ඔබව දිරිමත්කරමි. යම් නීති කැඩීමක් කර තිබේ නම්, ඒවාට පසුතැවිලිවීමෙන්, ආචාරීන්වහන්සේට ඔබව සුවපත්කළ හැකිය.

ඔබගේ ස්වර්ගයේ වැඩසිටින පියාණන්වහන්සේට සහ උන්වහන්සේගේ ආදරණීය පුත්‍රයාණන්ට ප්‍රීතියේ සැලසුමට සහ එහි පදනම වන සුභාරංචි මූලධර්මවලට ස්තුතිකරන්න. උන්වහන්සේලා ලබාදී තිබෙන නියෝග සහ ගිවිසුම්වලට කෘතඥවන්න. ඔබගේ ජීවිතය සමාදානය සහ සතුට සමග ඔටුනු පැළඳවීමට, එයට අරමුණක් සහ අර්ථයක් දීමට උන්වහන්සේලාට බලය ඇති බවට මම ගරු ගම්භීරව සාක්ෂිදරමි. කණගාටුව සහ බලාපොරොත්තු කඩවීම් තාවකාලික බව ඔබ දැනගන්නවා ඇත. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිසා සතුට සදා සදාතනිකය. උන්වහන්සේ ජීවත්වන සේක, උන්වහන්සේ ඔබට ප්‍රේමකරනසේක, උන්වහන්සේ ඔබට උපකාර කරන බවටද මම ගරු ගම්භීරව සාක්ෂි දරමි.

1996 අප්‍රේල් මසදී වැඩිහිටි ස්කොට් විසින් Church General Conference හි කළ ප්‍රකාශයකිනි. (බලන්න Conference Report, අප්‍රේ. 1996, 31–35; හෝ *Ensign*, මැයි 1996, 24–26).

සටහන්

1. 2 නීෆායි 2:25.
2. බලන්න ආබ්‍රහම් 3:25.
3. බලන්න මොසායා 3:19.
4. බලන්න 1 නීෆායි 3:7.
5. බලන්න දහම සහ ගිවිසුම 58:26–32.
6. බලන්න ඔරසන් එෆ්. විට්නි Spencer W. Kimball, *Faith Precedes the Miracle* (1972), 98.
7. මොසායා 24:14–15.
8. *The Teachings of Spencer W. Kimball*, සංස්. Edward L. Kimball (1982), 252.
9. බලන්න යෙසායා 40:31.
10. බලන්න දහම සහ ගිවිසුම 24:8.
11. බලන්න Joseph F. Smith, *Gospel Doctrine*, 5වෙනි සංස්. (1939), 177.

# කමාවේ සුවකිරීමේ බලය 7

## අදාලකරගැනීම සඳහා උපදෙස්

ඔබගේම අවශ්‍යතාවයන් සහ තත්වයන් අනුව, මෙම යෝජනා එකක් හෝ දෙකම අනුගමනයකරන්න.

- පහත සඳහන් ශුද්ධ ලියවිලි කොටස්වල එන කමාවදීමේ උදාහරණ අධ්‍යයනයකරන්නඃ ලූක් 23:33–34; ක්‍රියා 7:58–60; 1 නිෆායි 7:8–21.
- වඩාත් කමාවදීමට සහ අන් අයගේ කමාව සඳහා වඩාත් සුදුසුවීමට පොරොන්දුවක් තබන්න.

## කියවීමේ පැවරුම

පහත සඳහන් ලිපිය කියවන්න, ඔබ විවාහක නම්, ඔබගේ සහකරු සමග ලිපිය කියවා සාකච්ඡා කරන්න.

### කමාවදීම ඔබගෙන් අපේක්ෂාකරන්නකි

ගෝර්ඩන් බී. හින්ක්ලි සභාපතිවරයා
පළවෙනි සභාපතිත්වයේ පළවෙනි උපදේශකවරයා

අපට වරදක්කර තිබෙන අය කෙරෙහි කමාවදීමේ ආකල්පය සහ ප්‍රේමයේ සහ දයාවේ ආකල්පය වනාහි යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සුභාරංචියේ නිත්‍ය සාරය වන්නේය. අප හැම කෙනෙකුටම මෙම ආකල්පය අවශ්‍යවේ. මුළු ලෝකයටම එහි අවශ්‍යතාවය ඇත. ස්වාමීන්වහන්සේ එය ඉගැන්වූසේක. වෙනත් කිසිවෙකු ආදර්ශමත් නොවූ ලෙස උන්වහන්සේ එයට ආදර්ශයක්වූසේක.

කල්වාරියේ කුරුසිය මත, උන්වහන්සේ වේදනා වින්ද අවස්ථාවේ, දුෂ්ට වෛරයෙන් පිරුන චෝදනාකරුවන් උන්වහන්සේ ඉදිරිපිට සිටියදී, භයානක කුරුසපත්කිරීමකට උන්වහන්සේව රැගෙන ආ අය වෙනුවෙන්, උන්වහන්සේ කෑගසමින්, "පියාණෙනි, ඔවුන්ට කමාවුව මැනවඃ ඔවුන් කරන්නේ මොකද කියා ඔවුහු නොදනිති" යි කීසේක (ලූක් 23:34).

එතරම් ත්‍යාගශීලීව කමාවදීමට අප කිසිවෙකු කැඳවා නැත. නමුත් අපි හැම කෙනෙක්ම කමාව සහ දයාව සහිතව ඉදිරියට යාමට දිව්‍යමය වශයෙන් ප්‍රකාශවූ යුතුකමකට යටත්ව සිටින්නෙමු. ස්වාමීන්වහන්සේ එළිදරව්වේ වචනවලින් මෙසේ ප්‍රකාශකර ඇතිසේකඃ "මාගේ ගෝලයෝ, පැරණි කාලයේදී, එකිනෙකාට විරුද්ධව අවස්ථාවන් සොයමින් ඔවුන්ගේ හදවත් තුලින් එකිනෙකාට කමාව නොදුන්හ; මෙම නපුර නිසා ඔවුන් දුකට පත්ව බලවත්ව හික්මවනු ලැබීය

"එසේහෙයින්, මම නුඹලාට කියමි, එනම් නුඹලා එකිනෙකාට කමාව දිය යුතුය; මන්ද තම සහෝදරයාට කමාව නොදෙන්නා සිය වරදට ස්වාමීන්වහන්සේ ඉදිරියේ වරදක් කර ඇත; මන්ද ඔහු තුල විශාල පාපයක් ඇත.

"ස්වාමීන්වන, මම, මා කමාව දෙන තැනැත්තාට කමාව දෙන්නෙමි, නමුත් සියලුම මනුෂ්‍යයන්ට කමාවදීම නුඹලාගෙන් අපේක්ෂා කෙරේ.

තවද නුඹලා නුඹලාගේ හදවත් තුලින් මෙසේ කිව යුතුය—දෙවියන්වහන්සේ මා සහ නුඹ අතරින් විනිශ්චයකර, නුඹගේ ක්‍රියාවන් අනුව නුඹට විපාක දෙත්වා (බලන්න ඩී.සහ.ගි. 64:8–11).

මෙම දෙවියන්වහන්සේ දුන් මූලධර්මය සහ ඊට සම්බන්ධිත මූලධර්මය වන පසුතැවිල්ල අප කොපමණ අදාළකරගත යුතුද! කුඩා මී තුඹසක් වැනි දුරාවබෝධය කන්දක් වැනි විවාදයකට පත්වන මිනිසුන්ගේ නිවාසවලට එහි ඇති අවශ්‍යතාවය අපි දකින්නෙමු. නොවැදගත් මත භේදයන් නොමියෙන තිත්තකම් දක්වා වර්ධනයවීම අසල්වැසියන් අතර අපි දකින්නෙමු. ආරවුල් බේරාගෙන කමාවදීම ප්‍රතික්ෂේපකරන ව්‍යාපාර හවුල්කරුවන් අතර අපි එය දකින්නෙමු, බොහෝ අවස්ථාවලදී, එකට හිඳගෙන සන්සුන්ව එකිනෙකා සමග කථාකිරීමට කැමැත්තක් තිබේනම්, අපි සියලුදෙනාටම ආශිර්වාදයක්වන පරිදි ප්‍රශ්නය නිරාකරණය කරගත හැකිය. ඒ වෙනුවට, ඔවුහු පළිගැනීම පෝෂණයකරමින් ප්‍රතික්‍රියාවලට සැලසුම්කරති.

සභාව සංවිධානයකළ පළමු වසරේදී, අනාගතවක්තෘ ජෝසෆ් ස්මිත්ව නැවත නැවත සිරබාරයට ගනිමින්, ඔහුට හිරිහැරකිරීමට සොයමින් සිටි අය විසින් බොරු චෝදනා මත නඩු විගාගකරන කාලයේ, එළිදරව්වක් තුලින් ස්වාමීනවහන්සේ ඔහුට මෙසේ කීසේක, නුඹව නීතිය ඉදිරියට ගෙනයන කවරෙකු වුවද, නීතිය මගින් ශාපකරනු ලබන්නේය (බලන්න ඩී.සහ.ගි. 24:17). සමහර අය අතර තම පළිගැනීම පෝෂණයකරමින් දුෂ්ඨ චේතනාවෙන් කටයුතුකරන අය අපගේ කාලයේද මම දැක ඇත්තෙමි. තම තරගය ජයග්‍රහනයකරන සමහර අය අතර පවා තරමක සමාදාන සිතක් පෙනෙන්ට ඇත. ඔවුන් ඩොලර් සොයන අතරතුර ඔවුන් බොහෝ අගනා දෙයක් නැතිකරගෙන ඇත.

## තිත්තකමින් වැළකෙන්න

ගයි ද මෝපසාන්ට්, ප්‍රන්ශ කතුවරයා, පොල දවසේ ගමට පැමිණි හෝචිකෝන් නම් ගොවියෙක් ගැන කථාවක් කියයි. මහජන චතුරශ්‍රය තුලින් ගමන්කරමින් සිටියදී, වටකුරු ගල් අතර තිබූ නූල් කැල්ලක් ඔහුගේ දෙනත්වලට හසුවිය. ඔහු එය අහුලාගෙන තම සාක්කුවේ දමාගත්තේය. ඔහුගේ ක්‍රියාවන් අසරු සන්නාහ සාදන්නෙක් විසින් බලාසිටින ලද අතර, ඔහු ගොවියා සමග කලින් ආරවුලක් ඇතිවී තිබින.

එදින පසුව නැතිවූ පසුම්බියක් ගැන වාර්තාකෙරින. හෝචිකෝම්ව සන්නාහ සාදන්නාගේ චෝදනාව මත සිරභාරයට ගන්නා ලදී. ඔහුව නගරාධිපතිවරයා ඉදිරියට ගෙනයනු ලදුව, තමා අහුලාගත් නූල් කැල්ල පෙන්වා ඔහු දැඩි ලෙස තම නිර්දෝෂභාවය ඔහුට කියා සිටියේය. නමුත් සිනහසුන ඔහු එය විශ්වාස නොකළේය.

ඊලග දිනයේ පසුම්බිය සම්භවූ අතර, හෝචිකෝම් සියලු වරදින් නිදහස් කෙරින. නමුත් බොරු චෝදනාව නිසා ඔහුට සිදුවූ අගෞරවය වෙනුවෙන් පළිගැනීමේ චේතනාවෙන් පෙළුන ඔහු, තිත්තකමින් යුතුව ප්‍රශ්නය අත්හැරීමට ඔහු අකමැති විය. කමාවදී අමතක කිරීමට අකමැතිව, ඔහු තවත් කුඩා දෙවල් සිතමින් කථා කළේය. ඔහු තම ගොවිපළ නොසලකා හැරියේය. ඔහු ගිය සෑම තැනකදීම, ඔහුට මුනගැසුන සෑම දෙනාටම තමාට සිදුවුන අසාධාරණය ගැන ඔහු රෑ දාවල් ඒ ගැනම කීවේය. දුකින් පීඩාවට පත් ඔහු බලාපොරොත්තු රහිතවම රෝගීවී මිය ගියේය. මරණ මංචකයේදී සිහිමුළාවූ ඔහු, නැවත නැවත මිමුනුවේ, "නූල් කැල්ලක්, නූල් කැල්ලක්" කියාය (*The Works of Guy de Maupassant* [n.d.], 34–38).

මෙම කථාව චරිත සහ අවස්ථා වෙනස්කර, අපගේම කාලයේදී බොහෝ වාර ගණනාවක්ම නැවත නැවත කිව හැකිය. අපට හිරිහැරකළ අයට කමාවදීම අප ඕනෑම කෙනෙකුට කෙතරම් අසීරු දෙයක්ද. අපට කළ නපුර ගැන අශුභවාදීව සිතීමට අපි සියලුදෙනාම පුරුදුවී ඇත. එම සිතිවිල්ල විනාශකාරී පිළිකාවක් බවට පත්වේ. කමාවදී අමතකකිරීමේ ගුණාංගයට වඩා, අදාළකරගැනීමට වැඩිපුර අවශ්‍යවන ගුණාංගයක් අපගේ කාලයේ තිබේද? මෙය දුර්වලකමේ සලකුණක් ලෙස දකින අයද සිටිති. එය දුර්වලකමක්ද? වැරදි නිසා අමනාපයට පත්ව පීඩාවිඳීමට, පළිගැනීමේ ආකල්පයකින් ජීවිතය ගතකිරීමට, ප්‍රතික්‍රියාකිරීමට සැලසුම්කරමින් කෙනෙකුගේ හැකියාවන් නැතිකරදැමීමට ශක්තියක් හෝ බුද්ධියක් හෝ අවශ්‍ය නොවන බව මම කියමි. පළිගැනීම පෝෂණයකිරීම තුල සමාදනයක් නැත. "පළිගැනීමට" ඔබට හැකියාව ලැබෙන දිනය දක්වා ජීවත්වීමෙන් සතුටක් ලැබිය නොහැකිය.

අපගේ ජීවිතවල තිබෙන "දුර්වලවූ, නිෂ්ඵලවූ ගුරුකම්" ගැන පාවුළු තුමා කථාකරයි (බලන්න ගලාති 4:9). අපට නින්දාකර තිබෙන අය කෙරෙහි නොනවතින වාර ගණනාවක් තිත්ත සිතවිලිවලින් සහ කුට සංඥාවලින් යුතුව යමෙකුගේ ජීවිතය නාස්තිකිරීමට වඩා දුර්වල නිෂ්පලවූ යමක් තවත් තිබේද?

ජෝසෆ් ස්මිත් සභාවේ මූලාසනය ඉසුලූ කාලයේ අපගේ ජනතාව කෙරෙහි විශාල තිත්තකමක් ඇතිවී තිබින. දුෂ්ට චෝදනාවල, සහ ඔහුගේම සමාජයේ පවා කතෘ වාක්‍යයේ විවේචනවල බෙරපදයට නියම ඉලක්කයවී සිටියේද ඔහුය. ඔහුව අවඥාවට පාත්‍රකෙරින, කාටූන් චිත්‍රවලින් සමච්චල් කරමින් විහිළුවට ලක් කෙරින. ඔහුව පත්කළ විනෝද ක්‍රියාවට ඔහු දැක්වූ ප්‍රතිචාරයට සවන්දෙන්නඃ "ඔවුන්ට ඉඩහරින්න. ඔවුන්ට එසේ කිරීමට ඉඩදෙන්න. ඔවුන්ට අවශ්‍ය දෙය කථාකිරීමට නිදහස දෙන්න. ඔවුන්ගේම කථා කීමටත්, ඔවුන්ගේම දෛවය ලිවීමටත් ඉඩහරින්න." (*Gospel Doctrine*, 5වෙනි ප්‍රකා. [1939], 339). තවද ඉන්පසුව, කමාවදීමේ සහ අමතකකිරීමේ ආකල්පයකින් යුතුව අළුත් දියුණුවකින් සභාව ඉදිරියට ගෙනයාමට සහ විශිෂ්ඨ කාර්ය සාධනයක් සඳහා ඔහු ඉදිරියට ගියේය. ඔහුගේ මරණය සිදුවුන කාලයේ, ඔහුට සමච්චල්කළ බොහෝ දෙනෙක් ඔහු සම්බන්ධව ප්‍රශංසාත්මක උපහාර ලියූහ.

මා ඉදිරියේ හිඳගෙන සිටි යුවලකට සවන්දීමක් ගැන මට සිහිපත්වේ. වන් අතර තිත්තකමක් තිබුනි. එක් කාලයක් ඔවුන්ගේ ප්‍රේමය ගැඹුරු සහ අවංකවූ බව මම දනිමි. නමුත් එකිනෙකාගේ වැරදි ගැන කථාකිරීමේ පුරුද්දක් ඔවුහු ඇතිකරගත්හ. අප කරන වැරදි වැනි දේවලට කමාවදීමට අකමැතිවූහ. එසේම ඒවා අමතකර ඒවා දරාගෙන ජීවත්වීමට අකමැතිවූහ. කලක් ඔවුන් දැන සිටි ප්‍රේමය තුනීවන තුරු එකිනෙකා විවේචනයකළහ. එය අළු බවට හැරී, "වැරදි නැති" දික්කසාදයක් යයි හැඳින්වෙන ප්‍රකාශයක් විය. දැන් එහි ඇත්තේ හුදකලාව සහ දෝෂාරෝපන පමණකි. පසුතැවිල්ල සහ කමාවදීම සුළු ප්‍රමාණයකට හෝ පවා තිබුනේ නම්, ඔවුන් තවමත් එකට හිඳිමින්, මුල්කාලවලදී ඔවුන් බොහෝ ලෙස ආශිර්වාදිතවූ මිත්‍රත්වය භුක්තිවිඳිමින් සිටින බව මට විශ්වාසය.

## කමාවදීම තුලින් ලැබෙන සමාදානය

එකිනෙකා කෙරෙහි වෛරයෙන් තම හදවත් කෝපයෙන් පැසවමින් යමෙක් සිටී නම්, කමාවදීමට ශක්තිය දීමට ස්වාමීන්වහන්සේගෙන් ඉල්ලන ලෙස මම ඔබට ආයාචනාකරමි. මෙම කැමැත්ත ප්‍රකාශකිරීම පසුතැවිල්ලේ මූලික කරුණවේ. එය පහසු නොවිය හැකිය, එසේම එය ඉක්මණින්ම නොපැමිණිය හැකිය. නමුත් ඔබ එය අවංකව සොයමින් එය දියුණුකරන්නේ නම්, එය පැමිණෙනු ඇත. තවද ඔබ කමාව දාන් තැනැත්තා ඔබට දිගටම තර්ජනයකරන්නේ නම්, සමාදානවීම සඳහා ඔබ කර ඇති දේවල් ගැන ඔබ දැනසිටියි. වෙනත් අන්දමකින් නොලැබෙන සමාදානය ඔබගේ හදවතට පැමිණෙනු ඇත. එම සමාදානය උන්වහන්සේගේ සමාදානය වන අතර එතුමා මෙසේ කීසේකඃ

"මක්නිසාද නුඹලා මනුෂ්‍යයන්ට ඔවුන්ගේ වරද කමා කරන්නහු නම්, නුඹලාගේ ස්වර්ගීයවූ පියාණන්වහන්සේ නුඹලාටත් කමාකරනසේක;

"නුමුත් නුඹලා මනුෂ්‍යයන්ට ඔවුන්ගේ වරද කමා නොකරන්නහු නම්, නුඹලාගේ පියාණන්වහන්සෙත් නුඹලාගේ වරද කමා නොකරනසේක" (මතෙව් 6:14–15).

## අකීකරු පුත්‍රයා

ලූක් පහළොස් වෙනි පරිච්ඡේදයේ දැක්වෙන කථාන්තරයට වඩා වැඩි ලක්ෂණ කථාන්තරයක් වෙනත් සියලුම කථාවල තිබේදැයි මම නොදනිමි. එය පසුතැවිලිවූ පුතෙකුගේ සහ කමාවදෙන පියෙකුගේ කථාවකි. එය දුරාචාරව ජීවත්වෙමින් තම උරුමය නාස්තිකළ, තම පියාගේ උපදෙස් ප්‍රතික්ෂේපකරමින්, ඔහුට ආදරයකළ අය නොසලකාහැරි පුත්‍රයෙකුගේ කථාවකි. ඔහු තමා සන්තක සියල්ල වියදම් කළ පසු, "ඔහුට තමා ගැන සිතෙන විට" ඔහුට කුසගිනිවී, මිත්‍රයන් නොමැතිව සිටියේය (ලූක් 15:17). ඔහු සිය පියා වෙත හැරුනේය. තම පුත්‍රයාව දුරදී දුටු ඔහු, "ඔහුගේ ගෙළ වැළගෙන ඔහුව සිපගත්තේය" (ලූක් 15:20).

මෙම කථාව කියවන ලෙස මම ඔබෙන් ඉල්ලමි. සෑම දෙමාපියෙක්ම එය නැවත නැවත කියවිය යුතුය.සෑම නිවැසියෙක්ම වටකරගැනීමට එය ප්‍රමාණයෙන් විශාල මෙන්ම සියලුම මනුෂ්‍යවර්ගයා වටකරගැනීමට තරම් ප්‍රමාණවත් ලෙස විශාලය. මන්ද පසුතැවිලිවී, අපගේ ස්වර්ගික පියාණන් වහන්සේගේ කමාවේ දයාව ලබා, පසුව උන්වහන්සේගේ ආදර්ශය අනුගමනය කිරීමට තරම් අප සියලු දෙනාම අකීකරු පුත්‍රයන් සහ දියණියන් වන්නෙමුද?

උන්වහන්සේගේ ආදරණීය පුත්‍රයාණන්, අපගේ මිදුම්කරුවාණන්, කමාව සහ දයාව සමගින් අප වෙත ලඟාවනසේක, නමුත් එසේ කරමින් එතුමා පසුතැවිලිවීමට අණකරනසේක. අවංක සහ උදාර කමාවේ ආකල්පයඑම අවශ්‍ය පසුතැවිල්ලේ ප්‍රකාශයක් බවට පත්වේ. ස්වාමීන් වහන්සේ කීසේක–තවද මම අනාගතවක්තෘ ජෝසෆ්ට දුන් එළිදරව්වෙන් උපුටා දක්වමි;

"එමනිසා මම නුඹලාට නියෝගකරමි, පසුතැවිලි වෙයල්ලා—පසුතැවිලිවෙයල්ලා, මගේ මුඛයේ කෙවිටෙන්, මගේ කෝපයෙන්, සහ මගේ අමනාපයෙන් පහර නොදීමට වගබලාගනිල්ලා, තවද නුඹලාගේ වේදනා බලවත්වනු ඇත—කෙතරම් බලවත්දැයි නුඹලා දන්නේ නැත, නුඹලා දැන නොසිටීම කෙතරම් විශිෂ්ඨද, එසේය, දරාගැනීම කෙතරම් අසීරුදැයි නුඹලා දන්නේ නැත.

"මන්ද බලව, දෙවියන්වහන්සේ වන, මම, සියල්ලන්ම වෙනුවෙන් මෙම වේදනා විඳ ඇත්තෙමි. ඔවුන් පසුතැ වෙන්නේ නම්, ඔවුන් වේදනා නොවිඳිනු නැත;

"නමුත් ඔවුන් පසුතැවෙන්නේ නැති නම්, මා මෙන් ඔවුන්ද වේදනා විඳිය යුතුය;

එම වේදනා දෙවියන් වුවද, මාහට සියල්ලටම වඩා විශාල ලෙස, වේදනාව නිසා වෙව්ලීමට සහ සෑම සිදුරකින්ම ලේ වහනයවීමට සහ ශරීරය සහ ආත්මිකවද වේදනා විඳීමට සැලැස්වීය….

උන්වහන්සේගෙන් ඉගෙනගෙන සහ එතුමාගේ වචනවලට සවන්දී; එතුමාගේ ආත්මය තුල යටහත්වීමෙන් අපට එතුමා තුල සමාදානය ඇතිවන්නේ යයි ස්වාමීන්ව හන්සේ කීසේක (බලන්න ධීසහසී 19:15–18, 23).

පණිත එය වන්නේය, තවද එතුමාගේ පොරොන්දුව එය වන්නේය, උන්වහන්සේ තම ශ්‍රේෂ්ඨ ආදර්ශමත් යාච්ඤාවෙන් මෙසේ ආයාවනා කළසේක, "පියාණෙනි,… අපේ ණයකාරයන්ට අප කමාකළාක් මෙන් අපේ ණයත් අපට කමාකළ මැනව" (මතෙව් 6:9, 12).

## "තුවාල…බැඳගන්න"

ඒබ්‍රහම් ලින්කන් භයානක සිවිල් යුද්ධයේ ශෝකාන්තය ගැන කථාකළ වචන අලංකාර නොවන්නේද: "කිසිවෙකු කෙරෙහි ද්වේෂ නොකර, සියලුදෙනාටම දයාවෙන්,… අපි…තුවාල…බැඳගමු" (John Bartlett, *Familiar Quotations* තුලිනි, [1968], 640).

මගේ සොයුරු සොයුරියනි, අපි තුවාල බැඳගමු—ඕ, කැපෙන වචනවලින්, මුරණ්ඩුකමින් ඇතිවූ වේදනාවලින්, අපට වරදකළ අයගෙන් "පළිගැනීමට" සැලසුම්කිරීමෙන් වළකිමු. අප සියලුදෙනාටම මෙම පළිගැනීමේ ආකල්පය ඇත්තේ සුළු වශයෙනි. වාසනාවකට මෙන්, අප කැමති නම්, අපි [අපව] දයාවේ බැම්මෙන් සළුවකින් මෙන් සරසාගෙන, එය අභිබවායාමට අප සියලුදෙනාටම බලය ඇත. එය සම්පූර්ණත්වයේ සහ සමාදානයේ බැම්ම වන්නේය (බලන්න ධීසහසී 88:125).

"වැරදිකිරීම මනුෂ්‍ය ගතියකි, කමාවදීම දේවගතියකි" (Alexander Pope, *An Essay on Criticism,* 2:1711). පරණ තුවාලවල වේදනාව ගැන සිතීමෙන් සමාදානයක් නොවන්නේය. සමාදානය ඇත්තේ පසුතැවීම සහ කමාවදීම තුලය. මෙ ක්‍රිස්තුස්වහන්සේගේ මිහිරි සමාදනයයි. එතුමා මෙසේ කීසේක, "සමාදනකරන්නෝ ආශිර්වාදලද්දෝය: මක්නිසාද ඔවුහු දෙවියන්වහන්සේගේ පුත්‍රයෝ යයි කියනු ලබන්නෝය" (මතෙව් 5:9).

1991 ජුනි *Ensign* සඟරාවෙනි, පිටු 2–5.

# පවුලේ මුදල් පාලනය

# 8

## අදාළකරගැනීම සඳහා අදහස්

ඔබගේම අවශ්‍යතාවයන් සහ තත්වයන් අනුව, මෙම යෝජනා එකක් හෝ දෙකම අනුගමනයකරන්න.

- ඔබ මෑතකදී මිළදී ගත් භාණ්ඩවල ලැයිස්තුවක් සකස්කරන්න. ඔබට අත්‍යාවශ්‍ය හැම භාණ්ඩයකම අ යන අකුර ලියන්න. ඔබට වුවමනා නමුත් අවශ්‍ය නොවන හැම භාණ්ඩයකම වු යන අකුර ලියන්න. ඔබගේ වියදම්කරන පුරුද්ද අගයකිරීමට මෙම ලැයිස්තුව යොදාගන්න. අවශ්‍ය නොවන දේවලට ඔබ වැඩිපුර මුදල් වියදම්කරන්නේ නම්, ඔබගේ මුදල් වඩාත් ඥානවන්තව පාවිච්චිකරන මාර්ග ගැන සලකාබලන්න.
- ඔබගේ සහකරු සමග, ඉදිරි කාල වකවානුවක් සඳහා අයවැයක් සාදන්න—සමහරවිට සතියක හෝ දෙකක කාලයකට සෑහෙන්නේය. 32 පිටුවේ අදර්ශය මගපෙන්වීමක් වශයෙන් පාවිච්චිකිරීම ගැන සලකාබලන්න. ඔබ සකස්කල අයවැය අනුව ජීවත්වීමට එක්ව කටයුතු කරන්න.

## කියවීමේ පැවරුම

පහත සඳහන් ලිපිය කියවන්න. ඔබ විවාහක නම්, ඔබගේ සහකරු සමග ලිපිය කියවා සාකච්ඡා කරන්න.

### වෙනස අතර ස්ථිරබව

සභාපති එන්. එල්ඩන් ටැනර්
පළවෙනි සභාපතිත්වයේ පළවෙනි උපදේශකවරයා

අද ඔබ සමග මා බෙදාගැනීමට අදහස්කරන්නේ, ස්ථිර මූලධර්ම ගැන මා සොයාගත් දේවල්ය, ඒවා අනුගමනය කරන්නේ නම්, ඕනෑම ආර්ථික තත්වයන් යටතේ මුල්‍යමය ආරක්ෂාවක් සහ සිතේ සමාදානයද ගෙනඑන්නේය.

#### "නුඹලා පළමුව දෙවියන්වහන්සේගේ රාජ්‍යය සොයාපල්ලා"

ප්‍රථමයෙන්, මම මෙම ආර්ථික මූලධර්ම අදාළකරගත යුතු දර්ශනයක පදනමක් ගොඩනගා තහවුරුකිරීමට කැමැත්තෙමි.

දිනක් මගේ මුනුපුරෙක් මට මෙසේ කීවේය: "මම ඔබ සහ වෙනත් සාර්ථක මිනිසුන් ගැන සොයා බලා, මගේ ජීවිතය සාර්ථකකර ගැනීමට මට අවශ්‍ය බවට මම තීරණයක් ගත්තෙමි, මට හැකි පමණ සාර්ථක මිනිසුන් සම්මුක පරීක්ෂණයකට යොදාගෙන ඔවුන්ගේ සාර්ථ කත්වයට හේතුව නිශ්වයකිරීමට මට අවශ්‍යව තිබේ. එනිසා ඔබගේ අත්දැකීම් ගැන නැවත බැලීමේදී, සීයා, සාර්ථකත්වයේ වඩාත් වැදගත් සාධකය ලෙස ඔබ විශ්වාසකරන්නේ කුමක්ද?

මා දන්නා පරිදි සාර්ථකත්වයේ ශ්‍රේෂ්ඨතම සූත්‍රය ස්වාමීන්වහන්සේ දී තිබෙන බව මම ඔහුට කීවෙමි: "පළමුකොට උන්වහන්සේගේ රාජ්‍යයද උන්වහන්සේගේ ධර්මිෂ්ඨකමද සොයාපල්ලා; මේ සියල්ලත් නුඹලාට දෙනුලබන්නේය" (මතෙව් 6:33).

රාජ්‍යය පළමුව නොසොයන සමහර මිනිසුන් මුදල් අතින් සමෘද්ධිමත්වන බවට සමහරු වාද කරති. මෙය සත්‍යයකි. නමුත් පළමුව අපි රාජ්‍යය සොයන්නේ නම්, හුදෙක් භෞතික සම්පත් ස්වාමීන් වහන්සේ අපට පොරොන්දු නොවනසේක. මගේම අත්දැකීම්වලින් හේතුව මෙය නොවන බව මම දනිමි. හෙන්රික් ඉබ්සන්ගේ වචනවලින්: "මුදල් බොහෝ දේවල්වල පොත්ත විය හැකි නමුත් මදය නොවන්නේය. එය ඔබට ආහාර සපයයි, නමුත් ආශාව නොවේ; බෙහෙතකි, නමුත් සෞඛ්‍යය නොවේ; අඳුනන අයවේ, නමුත් මිතුරන් නොවේ; සේවකයන් වේ, නමුත් ඇඳහිළිමතුන් නොවේ. සතුටුවීමේ දවස් වේ, නමුත් සමාදනය හෝ සතුට නොවේ" (*The Forbes Scrapbook of Thoughts on the Business of Life* තුලිනි [1968], 88).

භෞතික ආශිර්වාද සුභාරංචියේ කොටසක් වන්නේ, එවා නිසි අන්දමින් සහ නිසි අරමුණකින් ඉටුකරගත්විටය. සභාපති හග් බී. බ්‍රවුන්ගේ අත්දැකීමක් මට සිහිපත්වේ. I වෙනි ලෝක යුද්ධයේදී තරුණ සොල්දාදුවෙකු වශයෙන් මම ආරෝග්‍යශාලාවේ වැඩිහිටි මිතුරෙකු බැහැදකීමට ගියෙමි. මෙම මිතුරා කෝටිපතියෙකි. ඔහු වයස අසූවේදී, මරණයේ දොරටුව අසළ වැතිරී සිටියි. ඔහුගේ දික්කසාදවූ බිරිඳ හෝ ඔහුගේ කිසිදු දරුවෙක් හෝ ඔහුව බැලීමට ආරෝග්‍යශාලාවට පැමිණීමට තරම් වත් සැලකිල්ලක් නොදැක්වීය. සභාපති බ්‍රවුන් ඔහුගේ මිතුරාට සිදුවූ දේවල් ගැන කල්පනාකල විට, "මුදල්වලින් ගත නොහැකි දෙයක් ඔහු නැතිකරගෙන ඇත. ඔහුගේ ශෝකාන්ත සහ දුක්මසු තත්වය වටහාගත්තේය," ඔහු සිය මිතුරා අමතා, ඔහුට නැවතත් ජීවත්වීමට ලැබෙන්නේ නම් ඔහුගේ ජීවිතය වෙනස්කරගන්නේ කෙසේදැයි ඔහුගෙන් ඇසුවේය.

දින කිහිපයකට පසුව මියගිය, වයසක මිතුරා, මෙසේ කීවේයː "'මා ජීවිතය ගැන නැවත සිතාබැලීමේදී මට ලබාගැනීමට ඉඩ තිබුනාවූ වඩාත් වැදගත් සහ වටිනා වස්තුව, කෝටිගණන් වස්තුව ගොඩගැසීමේ ක්‍රියාවලියේදී මට අහිමිවිය, එය නම් *දෙවියන්වහන්සේ තුල සහ ආත්මයේ අමරණීයබව ගැන මගේ මවට තිබූ සරල ඇදහිල්ලය.*

"'...ජීවිතයේ වඩාත් වටිනා දෙය කුමක්දැයි ඔබ මගෙන් ඇසුවා. කවියෙක් යොදාගත් වචනවලට වඩා හොඳ වචනවලින් ඔබට පිළිතුරුදීමට මට නොහැකියි.'" ඔහුගේ සූට්කේසයෙන් කුඩා සටහන් පොතක් ගන්නා ලෙස සභාපති බ්‍රවුන්ගෙන් ඉල්ලු ඔහු, "මම පිටස්තරයෙක්මි" යන කවිය එයින් කියවීය.

මගේ මව මට ඉගැන්වූ ඇදහිල්ලට මම පිටස්තරයෙක්මි,

මගේ මව හඬුවිට ඇයට සවන්දුන් දෙවියන්වහන්සේට මම ආගන්තුකයෙක්මි,

දැන් මා වැතිර සිටින තැනට මට ගෙන ආ සහනයට සහ

මගේ පියා මියගිය විට ඔහුගේ අත් අල්ලාගෙන සිටි, සදාතනික අත්වලට මම ආගන්තුකයෙක්මි.

ශ්‍රේෂ්ඨ ලෝකය පැමිණ මා කැඳවූ විට, සියල්ලන්ටම අනුව ඒමට මම අතැර ගියෙමි,

මගේ අන්ධබවින් මා දැනුවත්ව එතුමාගේ අත්වලින් මගේ අත් කිසිදා මම අත්හැර නැත.

මගේ අවසිහියෙන් කිසිදා නොසිතන එම කීර්තියේ බුබුල කුහරයකි,

රත්රන්වල පොහොසත්කම සරුව පිත්තලය. මා දැනගත්දා සිට එය එසේමය.

යම් දේවල් සොයමින් මම ජීවිතකාලයම ගතකළෙමි. මට ඒවා ලැබුන විට මම ඒවා ඉවතදැමූවෙමි,

මම සටන්කරමින් බොහෝ ජයග්‍රහනවලින් ත්‍යාග ලබා ඇත,

නමුත් කීර්තිය, සහ වාසනාව සහ සතුට වටා ඇති ඒවා සියල්ලම දෙන්නේ,

මගේ මව සතුව තිබූ එම *ඇදහිල්ල* මට තිබුනහොත් පමණය

"සභාවේ ඉපදුන නමුත් එයින් බොහෝ දුරට ගසාගෙන ගිය මියයන මිනිසෙකුගේ සාක්ෂිය එයවෙයි. මුදල්වලට ගත හැකි ඕනෑම දෙයක් ලබාගත හැකිව තිබූ නමුත්, ලෞකික දේවල් එකතුකිරීම සඳහා ජීවිතයේ බොහෝ වැදගත් දේවල් අහිමිකරගත් හුදකලාවූ මිනිසෙකුගේ බිඳුනු හදවතක ශෝකාලාපය එයවේ." *Continuing the Quest* [1961], 32–35; ඉතාලි අකුරු ඇතුලත්ය ).

මෝර්මන්ගේ පොතේ, අනාගතවක්තෘ යාකොබ් මේ කරුණ සම්බන්ධව අපට වැදගත් උපදෙස් කිහිපයක් දෙයිː

"නමුත් නුඹලා වස්තුව සෙවීමට ප්‍රථම, නුඹලා දෙවියන්වහන්සේගේ රාජ්‍යය සොයාපල්ලා.

"තවද නුඹලා ක්‍රිස්තුස්වහන්සේ තුල බලාපොරොත්තුවක් ඇතිකරගත් පසුව, *නුඹලා වස්තුව සොයන්නෙහුය; නුඹලා ඒවා සොයන්නෙහු නම්;* තවද නුඹලා ඒවා සොයන්නේ යහපත කිරීමේ අදහසින් යුතුවය—වස්ත්‍ර නැති අයට වස්ත්‍ර දීමට, සහ කුසගිනි අයට අහාර දීමට, සහ වහලුන්ට නිදහස දීමට සහ රෝගීන්ට සහ දුකට පත්වූවන්ට සහනය පතා ආලේපකිරීමටය" (යාකොබ් 2:18–19; ඉතාලි අකුරු ඇතුලත්ය).

ඉන්පසුව අඩිතාලම සහ බලාපොරොත්තුව මේවායː අපි පළමුව රාජ්‍යය සෙවිය යුතුය, වැඩකරමින්, සැලසුම්කරමින් ඥානවන්තව වියදම්කරමින්, අනාගතය සඳහා සැලසුම් කරමින්, එම රාජ්‍යය ගොඩනැගීමට උපකාරකිරීම සඳහා අපට ආශිර්වාදකර තිබෙන එම වස්තුව වියදම්කළ යුතුය. මෙම සදාකාලික දර්ශනය මගින් මගපෙන්වනු ලැබීමෙන් සහ මෙම ස්ථිර අඩිතාලම මත ගොඩනැගීමෙන්, අපට විශ්වාසයකින් යුතුව අපගේ දිනපතා කටයුතු සහ ජීවිතයේ ක්‍රියාවන් කරගෙන යාමට පුළුවන. එය ප්‍රවේශමෙන් සැලසුම්කර උනන්දුවෙන් කළ යුතුය.

ආර්ථික ස්ථිරතාවයේ මූලධර්ම පහක් පැහැදිළිකිරීමට මා අදහස්කරන්නේ මෙම මූලික අවශ්‍යාංගයන්ට අනුකූලවය.

### දසයෙන් කොටස අවංකව ගෙවන්න

*අවශ්‍යාංග අංක 1ː දසයෙන් කොටස අවංකව ගෙවන්න.* මා නිතරම කල්පනාකරන්නේ, අපගේ දසයෙන් කොටස ගෙවීම ස්වාමීන්වහන්සේට සහ සභාවට ත්‍යාගදීමක් නියෝජනය කරන්නේ නැති බව අප අවබෝධවන්නේද කියාය. දසයෙන් කොටස ගෙවීම ස්වාමීන්වහන්සේට තිබෙන ණයෙන් නිදහස් වීමකි. අපගේ සියලුම ආශිර්වාදවල, ජීවිතයද පවා ඇතුළුව, මූලාශ්‍රයවන්නේ ස්වාමීන් වහන්සේය.

දසයෙන් කොටස ගෙවීම පණතකි, පොරොන්දුවක් සහිත පණතකි. අපි මෙම පණතට කීකරුවන්නේ නම්, අප, "දේශයේ සමෘද්ධිමත්වන බවට" පොරොන්දුවක් අපට ඇත. මෙම සමෘද්ධියට ලෞකික භාණ්ඩවලට වඩා දේවල් ඇතුළත්ය—එයට යහපත් ශරීර සෞඛ්‍යයක සතුට සහ ප්‍රාණවත් මනසක්ද ඇතුළත්ය. එයට පවුලේ ශක්තිමත්බව සහ ආත්මික දියුණුවද ඇතුළත්ය. දැනට තම දසයෙන් කොටස සම්පූර්ණයෙන්ම නොගෙවන අය, එසේ කිරීමට ඇදහිල්ල සහ ශක්තිය සොයන බව මම බලාපොරොත්තුවෙමි. ඔබ මෙම යුතුකම ඔබගේ මැවුම්කරුවාණන්ට සම්පූර්ණකරන විට, ඔබට විශාල, අති විශාල සතුටක් ලැබෙනු ඇත. එම සතුට ගැන දන්නේ මෙම පණතට ඇදහිලිමත්වන අය පමණකි.

### අරපිරිමැස්මෙන් ජීවත්වන්න

*අවශ්‍යාංග අංක 2ː ඔබ උපයන ප්‍රමාණයට අඩුවෙන් ජීවත්වන්න.* ඔබට වියදම්කිරීමට හැකි ප්‍රමාණයට වඩා ඔබට ඉපයීමට මාර්ගයක් කිසිදා නොමැති බව මම සොයාගෙන ඇත්තෙමි. පුද්ගලයෙකුගේ සිතට සමාදානය ගෙනඑන්නේ ඔහු උපයන මුදල් ප්‍රමාණය නොව ඔහුගේ මුදල් පාලනයකිරීමේ හැකියාව බව ස්ථිරවී ඇත. මුදල

කීකරු සේවකයෙක් විය හැකි නමුත්, කර්කශ වැඩපවරන ස්වාමියෙකි. මඳ ප්‍රමාණයක් ඉතිරිකර ජීවත්වීමේ ප්‍රමිතියක් ගොඩනගාගත් අය, මතුවන තත්වයන් පාලනයකර ගනිති. ඔවුහු වහල්භාවයේ සිටිති. සභාපති හීබර් ජේ. ග්‍රාන්ට් වරක් මෙසේ කීවේය: "මනුෂ්‍ය හදවතකට, පවුලකට සමාදානය සහ සතුට සහ ගෙන එන යමක් තිබේ නම්, එය අපගේ හැකියාව අනුව ජීවත්වීමය. එසේම හදවතක් අඹරා, කළකිරවා, අධෛර්‍යමත්කරන යම් දෙයක් තිබේ නම්, යමෙකුට ගෙවාදැමිය නොහැකි ණය සහ ගැතිබවය" (*Gospel Standards,* සකස්. ජී. හෝමර් ඩර්හැම් [1941], 111).

අප උපයන ප්‍රමාණයට වඩා අඩුවෙන් වියදම්කිරීමේ මූලධර්මය සරළ එකකි—එය හික්මීම වශයෙන් හැඳින්වේ. ජීවිතයේ මුල් භාගයේ හෝ පසුව හෝ, අපි අවසානයේදී අපවද, අපගේ කෑදරකම් සහ අපගේ ආර්ථික ආශාවන් හික්මවාගැනීමට ඉගෙනගන්නෙමු. යමෙක් තමා උපයන ප්‍රමාණයට වඩා අඩුවෙන් වියදම්කර, අවශ්‍ය අවස්ථාවට ගැනීමට යමක් ඉතිරිකරගන්නේ නම්, ඔහු කෙතරම් වාසනාවන්තද?

**අවශ්‍යතාවය සහ වුවමනාව පැහැදිළිව වටහාගන්න**

*අවශ්‍යාංග අංක 3: අවශ්‍යතාවය සහ වුවමනාව පැහැදිළිව වටහාගන්න.* භාණ්ඩ ආශාව මිනිසා සෑදුවකි. අපගේ තරඟකාරී වෙළඳ ක්‍රමය අසීමිත භාණ්ඩ සහ සේවා නිෂ්පාදනකර අපව පොළඹවන්නේ වඩාත් පහසු සුඛෝපභොගී භාණ්ඩ ලබාගැනීමේ ආශාව ඇතිකිරීමටය. එම ක්‍රමය හෝ මෙම භාණ්ඩ හෝ සේවාවන් තිබීම මම විවේචනය නොකරමි. මා සැලකිලිමත්වන්නේ අපගේ ජනතාව මිළදීගැනීම්වලදී හොඳින් විනිශ්වයකිරීම පමණකි. පරිත්‍යාගය අපගේ සදාකාලික හික්මීමට වැදගත් කොටසක් බව අප ඉගෙනගත යුතුය.

මේ රටේ සහ වෙනත් රටවල, II වන ලෝක යුද්ධයෙන් පසුව ඉපදුන දෙමාපියන් සහ ළමුන් බොහෝ දෙනෙක් දැන සිටියේ සමෘද්ධිමත් තත්වයන් ගැන පමණකි. බොහෝ දෙනෙක් ක්ෂණික තෘප්තියට හසුවී සිටියහ. වැඩකිරීමට හැකි අයට රැකියා අවස්ථා තිබුනේ සුළු වශයෙනි. ඊයේ සුඛෝපභෝගී දේවල් බොහොමයක් අද අවශ්‍යතාවයන් ලෙස සැලකේ.

මෙය ආදර්ශයක් කරගත් තරුණ ජෝඩු තම විවාහය පටන්ගත් විගසම ඔවුන්ගේ නිවාස බඩුමුට්ටුවලින් සරසා සුඛෝපභොගීව සිටීමට අපේක්ෂාකරති. මේවා ලබාගැනීමට ඔවුන්ගේ දෙමාපියන් වසර ගණනාවක් පරිශ්‍රම සහ පරිත්‍යාගයන් කර ඇත. ඉතා වැඩි ප්‍රමාණයක් ඉතා ඉක්මණින් වුවමනාවීම මගින්, තරුණ ජෝඩු ලෙහෙසි ණයවර සැළසුම්වලට වසඟවෙති. එමගින් ඔවුන් ණයවීමට පටන් ගනිති. මෙය ඔවුන්ව සභාව යෝජනාකරන ආහාර ගබඩාකිරීම් සහ ආරක්ෂක වැඩසටහනට අවශ්‍ය මුදල් තබාගැනීමෙන් ඈත්කර තබයි.

දැඩි ආශාව සහ දුර්වල මුදල් පාලනය විවාහ සම්බන්ධතාවයන්හි විශාල පීඩාවක් ඇතිකරයි. විවාහ ජීවිතයේ බොහෝ ප්‍රශ්න, පෙනෙන්ට තිබෙන පරිදි ආරම්භවන්නේ ආර්ථික ප්‍රශ්න—පවුල පවත්වාගැනීමට ප්‍රමාණවත් නොවන ආදායම, හෝ උපයන ආදායම වැරදි ලෙස පාලනයකිරීම නිසාය.

එක් තරුණ පියෙක් මුදල් ගැන උපදෙස් පතා තම සභානායකවරයා වෙත පැමිණ නිතරම කියවෙන කථාවක් කීවේය: "සභානායකතුමනි, මා හොඳින් පුහුණුවූ ඉංජිනේරුවෙක් වන අතර, මම හොඳ වැටුපක් උපයමි. පාසල් යන කාලයේ පටන් මුදල් උපයන අන්දම ගැන මට කියාදී ඇතිබව පෙනේ. නමුත් මුදල් පාලනයකරන අන්දම ගැන මට කිසිවෙක් කීවේ නැත."

සෑම ශිෂ්‍යයෙකුටම පරිභෝජන අධ්‍යාපනය ගැන පංති හැදෑරීමට කැමත්තක් ඇති බව මා විශ්වාසකරන අතර, මූලික පුහුණුව දෙමාපියන් මත පැවරේ. මෙම වැදගත් පුහුණුව අපගේ පොදු පාසල්වලට සහ විශ්ව විද්‍යාලවලට සම්පූර්ණයෙන්ම පවරාදීමට දෙමාපියන්ට නොහැකිය.

මෙම පුහුණුවේ වැදගත් කොටසක් විය යුත්තේ ණයවීම ගැන පැහැදිළිකිරීමය. අප බොහෝ දෙනෙකුට දෙයාකාර මූල්‍යමය ණයවීම් ඇත—පරිභෝජන ණය සහ ව්‍යාපාරික ණය වශයෙනි. පරිභෝජන ණය වන්නේ, අප දිනපතා ජීවිතයේදී පාවිච්චිකරන හෝ පරිභෝජනයකරන භාණ්ඩ ණයට මිළදී ගැනීමය. උදාහරණවලට ඇඳුම්, භාණ්ඩ, ලී බඩු, යනාදිය කොටස් වශයෙන් ගෙවීමට මිළදීගැනීම් ඇතුළත්විය හැකිය. පරිභෝජන ණය වන්නේ, අපගේ අනාගත ඉපයීම් උකස්කර ආරක්ෂාකිරීමය. මෙය ඉතා භයානක විය හැකිය. අපට රැකියාව අහිමිවුහොත්, ආබාධිතවුවහොත්, හෝ බරපතල හදිසි අවස්ථාවන්ට මුහුණදීමට සිදුවුව හොත්, අපගේ යුතුකම් ඉටුකිරීමට අපට අසීරුතා මතුවිය හැකිය. කොටස් වශයෙන් ගෙවීමට මිළදීගැනීම් වඩාත් මිළ අධික මිළදීගැනීමේ ක්‍රමයකි. අප මිළදීගන්නා බඩුවලට අධික පොළියක් හා සේවා ගාස්තුද ඊට එකතුකරනු ලැබේ.

තරුණ පවුල්වලට සමහර අවස්ථාවලදී ණයට මිළදී ගැනීමට අවශ්‍යවන බව මට අවබෝධවේ. නමුත් සැබෑ ලෙසම අවශ්‍යවන දේවලට වඩා මිළදී නොගැනීමට සහ ඔබගේ ණය හැකි ඉක්මණින්ම ගෙවා දැමීමටත් අපි ඔබට අනතුරු අඟවමු. මුදල් අතරින් අසීරුවූ විට, අමතර පොළී මුදල්වල බරින් වළකින්න.

ආයෝජන ණය සම්පූර්ණයෙන්ම ආරක්ෂිතවී එය පවුලේ ආරක්ෂාවට බරක් නොවිය යුතුය. සැක සහිත ව්‍යාපාරවල ආයෝජනය නොකරන්න. සැක සහිත ආකල්පය මතට හැරීමට පුළුවන. වඩ වඩාත් එකතුකිරීමේ පාලනය නොවූ ආශාව මගින් බොහෝ වාසනාවන් විනාශ කෙරෙයි. අතීතයේ වේදනාවන් තුලින් අපි පාඩම් ඉගෙනගෙන කාලය, ශක්තිය, සහ ලෞකික බඩු බාහිරාදියට වහලුන්වීම වළක්වාගෙන, කෑදරකම නැතිකර සාමාන්‍ය සෞඛ්‍යය පවත්වා ගමු.

සභාපති ස්පෙන්සර් ඩබ්ලිව්. කිම්බල් මෙම සිතිවිලි පොළොඹවන උපදේශය ලබාදී ඇත;

"ගතවුන කාලයට දෙවෙනි නොවන සමෘද්ධිමත් ජනතාවක්වීමට ස්වාමීන්වහන්සේ අපට ආශිර්වාදකර ඇතිසේක. අපගේ බලයට අනුව ලබාදී තිබෙන මූලාශ්‍ර යහපත් මෙන්ම අපගේ මෙම පොළොව මත වැඩවලට

අවශ්‍යවේ. නමුත් අප බොහෝ දෙනෙක් රැලවල්, රංචු සහ අක්කර සහ අටුකොටු සහ වස්තුවට ආශාවී බොරු දෙවිවරුන් වශයෙන් ඒවාට වන්දනාකරමින්, අපව පාලනයකිරීමට ඒවාට බලයදීම ගැන මම බියවෙමි. අපගේ ඇදහිල්ලට දරාගැනීමට නොහැකි තරම් මෙම දේවල්වල වැඩිපුර යහපත්කමක් තිබේද? බොහෝ මිනිසුන් ඔවුන්ගේ කාලයෙන් වැඩි කොටසක් තම ප්‍රතිරූපයට සේවයකරමින් ගතකරති. එයට ඇතුළත්වන්නේ, ප්‍රමාණවත් මුදල්, තොග, සහතික, ආයෝජන සහතික, දේපළ, ණයවරපත්, බඩුභාණ්ඩ, මෝටර් රථ, මුළු ජීවිතයම ලෞකික *ආරක්ෂාවක්* සහිතව දීර්ඝකාලීන, ප්‍රීතිමත් ජීවිතයක් ගතකිරීමේ බලාපොරොත්තුවය. අමතක කළ කාරණාව නම්, මෙම බොහෝ මූලාශ්‍ර පාවිච්චිකිරීමේ අපගේ පැවරුම වන්නේ, අපගේ පවුල්වල සහ ගණපූර්ණවල දෙවියන්වහන්සේගේ රාජ්‍යය ගොඩනැගීමට බවය" ("The False Gods We Worship," *Ensign,* ජූනි 1976, 4).

සාක්ෂියක මාර්ගයකින්, සභාපති කිම්බල්ගේ ප්‍රකාශයට මම මෙයද එකතුකරමි. පවුලේ සාධාරණ අවශ්‍යතාවයන්ට සහ වුවමනාවන්ට වැඩියෙන් විශාල වශයෙන් දේපළ තිබීමෙන් සතුට සහ සිතේ සමාදානය වැඩිවුන කිසිම අවස්ථාවක් ගැන මම නොදනිමි.

## අයවැය ඥානවන්තව කරන්න

*අවශ්‍යාංග අංක 4: අයවැයට අනුකූලව සමෘධිමත්ව ජීවත්වන්න.* මගේ මිත්‍රයෙකුට දියණියක් සිටින අතර ඇය **බීවයියූ** අර්ධ වාරාන්තර විදේශීය අධ්‍යයන වැඩසටහකට සහභාගිවීමට විදේශයකට ගියාය. ඇය නිරන්තරයෙන්ම වැඩිපුර මුදල් ඉල්ලා නිවසට ලිපි ලියුවාය. ඔහු ඒ ගැන බොහෝ සේ සැලකිලිමත්ව දුර බැහැර සිටින ඇයට දුරකථනයෙන් කථාකර අමතර අරමුදල් වල අවශ්‍යතාවය ගැන ඇයගෙන් ප්‍රශ්න කළේය. සාකච්ඡාවේ එක් අවස්ථාවකදී දියණිය පැහැදිළිකරමින්, "නමුත් තාත්තා, ඔබ එවූ සෑම ශතයක්ම වියදම්කළ ආකාරය ගැන ඔබට කීමට මට පුළුවනි" යයි කීවාය.

ඔහු පිළිතුරුදෙමින්, "ඔබට කාරණාව පැහැදිළි නැති බව පෙනේ. මම අයවැය ගැන සැලකිලිමත් වෙමි—වියදම්වල සැලසුමක්—මුදල් ගියේ කොහේදැයි කියා ලියූ දිනපොතක් නොවේ" යයි කීවේය.

සමහරවිට දෙමාපියවරු නිවසට විදුලි පණිවුඩයක් එවූ පාසල් පාසල් ශිෂ්‍යයෙකුගේ පියා මෙන් විය යුතුය, "මුදල් නැහැ, විනෝදයක් නැහැ, ඔබගේ පුත්‍රයා." ඔහුගේ පියා ඊට විදුලි පණිවුඩයක් මෙසේ යැවීය, "කෙතරම් කණගාටුවක්ද, හරිම අවාසනාවක්, ඔබගේ පියා."

වසර ගණනාවක් බොහෝ මිනිසුන් සම්මුකව පරීක්ෂාකිරීමෙන් මාගේ නිරීක්ෂණය වන්නේ, බොහෝ මිනිසුන්ට ක්‍රියාත්මක අයවැයක් නොමැතිවීමෙන්, එහි නියමයන්ට කීකරුවීමට තමන්ව හික්මවාගෙන නැති බවය. බොහෝ අය සිතන්නේ අයවැයක් මගින් ඔවුන්ගේ නිදහස වළකන බවය. ඊට ප්‍රතිවිරුද්ධව, සාර්ථක මිනිසුන් දැනසිටින පරිදි, අයවැයක් හැකිතරම් දුරට සැබෑ ආර්ථික නිදහසක් ඇතිකරයි.

අයවැය සහ මුදල් පාලනය සංකීර්ණතාවයක් හෝ කාලය කාදැමීමක් විය යුතු නැත. ආගමනයවූ පියෙකු කී කථාවකට අනුව, ඔහු ගෙවීමට තිබෙන මුදල් සපත්තු පෙට්ටියක තැබීය. ඔහුට ලැබීමට තිබෙන මුදල් නූල්කටින යන්ත්‍රයකද, ඔහුගේ මුදල්, මුදල් යන්ත්‍රයකද තැබීය.

"මේ අන්දමින් ඔබ ඔබගේ ව්‍යාපාර කෙසේ කරන් නේදැයි මට නොතේරේ," යයි ඔහුගේ පුතා කීවේය. "ඔබගේ ලාභය කොපමණදැයි ඔබ දන්නේ කෙසේද?

පුතා, යයි ව්‍යාපාරිකයා කීවේය, "මා බෝට්ටුවෙන් පිටතට ආ විට, මට තිබුනේ මා හැඳ සිටි කලිසම පමණි. අද ඔබගේ නැගනිය, කලා ගුරුවරියකි, ඔබගේ සොහොයුරා වෛද්‍යවරයෙකි, එසේම ඔබද ගණන් පරීක්ෂකවරයෙකි. මට කාර්එකක්, නිවසක් සහ හොඳ ව්‍යාපාරයක් තිබේ. ඒ සියල්ලම සඳහා ගෙවා ඇත. ඉතින් ඔබ ඒ සියල්ලම එකතුකර, මගේ කලිසම එයින් අඩුකරන්න, එවිට මගේ ලාභය එහි ඇත."

ඕනෑම හොඳ අයවැයක විවිධ මූලධාතු හතරක් ඇති බව ඥානවන්ත මූල්‍යමය උපදේශකවරු උගන්වති. *පළමුවෙන්* ඉඩ ලබාදිය යුත්තේ මූලික ක්‍රියාත්මක අවශ්‍ය තාවයන් වන, ආහාර, ඇඳුම් යනාදියටය.; *දෙවැනිව,* නිවස සඳහා අවශ්‍යතාවයන්ටය.; *තුන්වෙනිව,* ඉතිරිකිරීම්, සෞඛ්‍යාරක්ෂණ සහතික, ජීවිත රක්ෂණ සහතික; සහ *තුන්වෙනිව,* ඥානවන්ත ආයෝජන සහ අනාගතය සඳහා ගබඩාකිරීමේ වැඩසටහනක්ටය.

මෙම මූලධාතු දෙකක් ගැන මම අදහස් දක්වමි. අපගේ ජීවිතවල බලාපොරොත්තු රහිතබවට වඩා ස්ථිරව පෙනෙන වෙනත් කිසිවක් නැත. වෛද්‍ය ගාස්තු ඉහළයාමත් සමග, බරපතල හදිසි අනතුරු, රෝගාබාධ හෝ මාතෘ වියදම්, විශේෂයෙන්ම අකාල දරු උපත් වියදම් දැරීමට බොහෝ පවුල්වලට ඇති එකම ක්‍රමය සෞඛ්‍ය රක්ෂණය වන්නේය. ජීවිත රක්ෂණය මගින් නිරන්තර ආදායම් සපයන්නේ සපයන්නා අකාලයේ මියගිය විටය. සෑම පවුලක්ම නිසි සෞඛ්‍ය සහ ජීවිත රක්ෂණ ක්‍රමය ලබාගත යුතුය.

මෙම මූලික දේවල් ඉටුකරගත් විට, අපි සකසුරුවම් පාලනය මගින් ක්‍රමානුකූලව ආයෝජනය සඳහා අරමුදලක් නිර්මානය කළ යුතුය. මා සොයාගත් පරිදි ක්‍රමානුකූලව ඉතිරිකිරීමේ පුරුද්ද මුලින් දියුණුකර නොගත් මිනිසුන් ආයෝජනය මගින් සාර්ථකවී ඇත්තේ සුළු වශයෙනි. මෙයට හික්මීම සහ අවබෝධශීලී විනිශ්චය අවශ්‍යවේ. ආයෝජනය කිරීමට බොහෝ මාර්ග ඇත. මගේ එකම අවවාදය වන්නේ ඔබගේ ආයෝජන උපදේශකයන් ඥානවන්තව තෝරාගැනීමය. ඔවුන් සාර්ථක ආයෝජන වාර්තා පවත්වාගැනීම මගින් ඔබගේ විශ්වාසයට සුදුසු බවට වගබලාගන්න.

## අවංකවන්න

*අවශ්‍යාංග අංක 5: ඔබගේ සියලුම මූල්‍යමය කටයුතුවලදී අවංකවන්න.* අවංකත්වයේ උත්කෘෂ්ඨ බව කිසිදා පරණ නොවන්නේය. අප කරන සෑම දෙයකටම

එය අදාළවන්නේය. සභාවේ නායකයන් සහ සාමාජිකයන් ලෙස, අපි අවංකත්වයේ සාරය වියයුත්තෙමු.

සොයුරු සොයුරියනි, මෙම මූලධර්ම පහ තුලින්, මා පෙන්වාදීමට තැත් කළේ මූල්‍යමය සහ මූලාශ්‍ර පාලනයේදී සැබෑ ක්‍රමය ලෙස එහි ගුණාංග පෙන්වාදීමටය.

ඒවා අදාළකර ගැනීම තුලින් අප හැම කෙනෙක්ම ප්‍රතිලාභ ලැබීම මගේ බලාපොරොත්තුවයි. ඒවා සත්‍ය බව සහ මෙම සභාව සහ අපි නියැලී සිටින එහි කටයුතු සත්‍ය බවට මම සාක්ෂිදරමි.

1979 ඔක්තෝබර් මස ප්‍රධාන සුහසාධන සැසිවාරයකදී සභාපති ටැනර් කළ ප්‍රකාශනයකිනි Church General Conference හි (බලන්න Conference Report, ඔක්තෝ. 1979, 117–21; හෝ *Ensign,* නොවැ. 1979, 80–82).

දින සිට ______________________ දක්වා ______________________ අයවැය
දිනය දිනය

| ආදායම | සැලසුම්කිරීම් | සැබෑ ආදායම් |
|---|---|---|
| බදු ගෙවීමෙන් පසුව පඩි හෝ වැටුප | | |
| වෙනත් ආදායම් | | |
| මුළු ආදායම | | |

| වියදම් | සැලසුම්කිරීම් | සැබෑ වියදම් |
|---|---|---|
| දසයෙන් කොටස | | |
| වෙනත් සභා ආධාර | | |
| දීර්ඝකාලීන ඉතිරිකිරීම් | | |
| හදිසි අවස්ථා සඳහා ඉතිරිකිරීම් | | |
| ආහාර | | |
| උකස් හෝ කුලිය | | |
| උපයෝගී භාණ්ඩ | | |
| ප්‍රවාහන | | |
| ණය ගෙවීම් | | |
| රක්ෂණ | | |
| වෛද්‍ය ගාස්තු | | |
| ඇඳුම් | | |
| වෙනත් | | |
| වෙනත් | | |
| වෙනත් | | |
| මුළු වියදම | | |

# ආ කොටස
# පවුල් ශක්තිමත්කිරීමේ දෙමාපිය වගකීම



# “දරුවෝ ස්වාමීන්වහන්සේ දෙන උරුමයක්ය” 9

## අදාළකරගැනීම සඳහා අදහස්

ඔබගේම අවශ්‍යතාවයන් සහ තත්වයන් අනුව, මෙම යෝජනා එකක් හෝ දෙකම හා පාවිච්චිකරන්න.

- ඔබගේ ළමයෙක් හෝ ඔබගේ ඥාති පවුලක ළමයෙකු සමග හෝ පෞද්ගලිකව කාලය ගතකිරීමට කැපවන්න. ඔබ හැම ළමයෙකු සමගම කථාකරන විට, ඔහු හෝ ඇය කැමති දෙයක්, අවශ්‍යතාවයක් හෝ අභියෝගයක් ගැන අළුතින් යමක් දැනගැනීමට උත්සාහකරන්න.
- ඔබගේ බිරිඳ සමග ඔබගේ ළමයින් සමග කථාකිරීමට කාලය යොදවන්න. හැම ළමයෙකුගේම ශක්තිය සහ අභියෝග ගැන සිතාබලන්න. හැම ළමයකුගේම අවශ්‍යතාවයන් සපුරාලීමට ඔබට කළ හැකි දෙවල් ගැන අදිටන්කරන්න.

## කියවීමේ පැවරුම

පහත සඳහන් ලිපිය අධ්‍යයනයකරන්න. ඔබ විවාහක නම්, ඔබගේ සහකරු සමග ලිපිය කියවා සාකච්ඡාකරන්න.

### අගනා ළමුන්, ස්වාමීන්වහන්සේ දෙන දීමනාවක්ය

සභාපති තෝමස් එස්. මොන්සන්
පළවෙනි සභාපතිත්වයේ පළවෙනි උපදේශකවරයා

මතෙව් පොතේ සඳහන් පරිදි, යේසුස්වහන්සේ සහ එතුමාගේ ගෝලයෝ අන්වෙසක් ගත් කන්දෙන් පහළට බැසගිය පසුව, ගලීලයේ මඳක් නැවතී සිට, ඉන්පසුව කපර්ණවුමට පැමිණියහ. ගෝලයෝ යේසුස්වහන්සේ අමතා, “ස්වර්ගරාජ්‍යයෙහි ඉතා උතුම්වන්නේ කවුදැ?යි” ඇසූහ.

“”යේසුස්වහන්සේ කුඩා දරුවෙක් තමන් ලඟට කැඳවා ඔවුන් මැද සිටුවා:

“සැබවක් නුඹලාට කියමි-නුඹලා හැරී කුඩා දරුවන් මෙන් නූණොත්, කිසිසේත් ස්වර්ගරාජ්‍යයට ඇතුල් නොවන්නහුය.

“එබැවින් මේ කුඩා දරුවා මෙන් යටත්වන කවුරු නුමුත් ස්වර්ගරාජ්‍යයෙහි ඉතා උතුම් තැනැත්තාය.

“තවද යමෙක් මාගේ නමින් මෙබඳු කුඩා දරුවෙකු පිළිගන්නේද, ඔහු මා පිළිගන්නේය.

නුමුත් මා කෙරෙහි අදහන මේ බාලයන්ගෙන් එක්කෙනෙකුටවත් බාධාකරන යමෙක් ඇද්ද ඔහුගේ බෙල්ලේ මහත් ඇඹරුම් ගලක් එල්ලා මුහුදේ ගැඹුරේ ගිල්වීම ඔහුට යහපත යයි කීසේක.”[1]

මා සිතන ලෙස එය වැදගත්වන්නේ, යේසුස්වහන්සේ මෙම කුඩා දරුවන්ට ආදරය කළේ ඔවුන් මෙම පොළොවට පැමිණීමට පෙර පැවැත්මෙන් එතරම් මෑතකදී පැමිණීමය. එදා ළමුන් සහ දැන් ළමුන්ද අපගේ ජීවිත ආශිර්වාදකරමින්, අපගේ ප්‍රේමය දල්වමින්, සහ යහපත් ක්‍රියාවලට අපව පොළඹවති.

වර්ඩ්ස්වර්ත් කවියා මෙලෙස අපගේ උපත ගැන කථාකිරීමේ යම් පුදුමයක් තිබේද; මහිමයේ වළාවන් ඇදගෙන අපි දෙවියන්වහන්සේ වෙතින් පැමිණෙන්නෙමු. එතුමා අපේ නිවස්නයයි.”[2]

මෙම කුඩා ළමුන්ගෙන් බොහොමයක් ඔවුන්ගේ පැමිණීම ඉතා ආශාවෙන් බලාපොරොත්තුවන දෙමාපියන් වෙත පැමිණෙති මවුවරු සහ පියවරු අප උපත වශයෙන් හඳුන්වන එම ආශ්චර්යයේ කොටසක්වීම ගැන සතුටුවෙති. කිසිදු පරිත්‍යාගයක් එතරම් ශ්‍රේෂ්ඨ නැත, කිසිදු වේදනාවක් එතරම් බරපතල නැත, කිසිදු කල්ගතවීමක් එතරම් දීර්ඝ නැත.

ඇමෙරිකාවේ නගරයක සිදුවූ සිද්ධියක් මාධ්‍ය මගින් මෙසේ අපට දන්වන විට අප තිගැස්සීම පුදුමයක් නොවේ. එනම්, “කඩදාසි බෑගයක දවටා කසල බාල්දියක දමා තිබී හමුවූ අලුත උපන් ගැහැණු දරුවෙක් දැන් ආරෝග්‍යශාලාවේ සුපරීක්ෂාව යටතේ පසුවේ. දරුවා හොඳ සනීපයෙන් පසුවෙයි. ‘ඇය සැබවින්ම ලක්ෂණ, නිරෝගී දරුවෙකි,’ යයි ආරෝග්‍යශාලාවේ ප්‍රකාශකයෙක් බදාදා කීවේය. ළදරුවා සොයගනු ලැබුවේ, සේවකයන් ඔවුන්ගේ කසල ට්‍රක්රථයේ පිටුපස කොටසට කසල බාල්දිය හිස්කරන විට සුන් බුන් අතර යමක් සෙලවෙන බව දැක ඇති නිසාය. බලධාරීහු මව ගැන සෙවිල්ලෙන් සිටිති.”

අපගේ ජීවිතවලට අනුග්‍රහය දක්වන ළමයින් අපගේ නිවාසවලට සහ අපගේ හදවත්වලින් ආදරයෙන් පිළිගැනීම, අපගේ උදාර රාජකාරියකි, අපගේ මාහැඟි වරප්‍රසාදයකි— අපගේ පූජනීය ප්‍රස්ථාවක් පවාද වේ.

අපගේ ළමයින්ට ඉගෙනගැනීමට පංතිකාමර තුනක් තිබෙන අතර, ඒවා එකිනෙකෙන් සම්පූර්ණයෙන්ම වෙනස්ය: මා කථාකරන්නේ, පාසැලේ පංති කාමරය, සභාවේ පංති කාමරය සහ පංති කාමරයක් වශයෙන් හඳුන්වන නිවස යනාදිය ගැනය.

## පාසලේ පංති කාමරය

පොදු අධ්‍යාපනය ගැන සභාවට නිරන්තරයෙන්ම සැලකිල්ලක් තිබූ අතර, එහි සාමාජිකයන්ට ගුරු-දෙගුරු ක්‍රියාකාරකම්වලට සහ අපගේ තරුණ පක්ෂයේ අධ්‍යාපනය වැඩිදියුණුවන වෙනත් අවස්ථාවන්ට සහභාගිවීමටද දිරිමත් කළේය.

පොදු අධ්‍යාපනයේ ගුරුවරයාට තිබෙන ප්‍රස්ථාවන් වන, ප්‍රේමකිරීම, ඉගැන්වීම සහ උනන්දුශීලී පිරිමි ළමයින් සහ ගැහැණු ළමයින්ද, තරුණයන් සහ තරුණියන්ද ඉගෙනීමට පෙළඹවීම තරම් වෙනත් වැදගත් දර්ශනයක් තවත් නැත. සභාපති ඩේවිඩ් ඕ. මැකේ මෙසේ කීවේය: "ලෝකයේ ගෞරවනීයම වෘත්තිය වන්නේ ඉගැන්වීමය. නිවසේ ස්ථිරතාවය සහ පවිත්‍රතාවයද, ජාතියක ආරක්ෂාව සහ නිත්‍යතාවයද, රඳාපවතින්නේ තරුණ පක්ෂයට නිසියාකාරව ඉගැන්වීම මතය. දෙමාපියෝ දරුවාට ජීවත්වීමේ ප්‍රස්ථාවය ලබාදෙති; ගුරුවරයා දරුවාට හොඳින් ජීවත්වීමේ හැකියාව ලබාදෙයි."[3] ප්‍රමාණවත් පහසුකම්ද, හොඳම පොත්, සහ අපගේ කෘතඥතාවය සහ විශ්වාසය පෙන්වන වැටුප්ද ලබාදීම මගින් ඔවුන්ගේ වැදගත්කම සහ ඔවුන්ගේ මෙහෙයේ වටිනාකම අපි හඳුනාගනීවි යයි මම විශ්වාස කරමි.

අපගේ තරුණයන්ගේ ගුරුවරුන්ව අප හැම කෙනෙක්ම අදරයෙන් යුතුව සිහිපත් කරන්නෙමු. මාගේ මූලික පාසලේ සංගීත ගුරුවරිය ෂාර්ප් මහත්මිය වීම ප්‍රීතිදායකවූ බව මම සිතමි. සිය ශිෂ්‍යයන්ට සංගීතය කාවැද්දීමට හැකියාවක් ඇයට තිබූ අතර, සංගීත භාණ්ඩ සහ එහි නාදය හඳුනාගන්නා අන්දමද අපට ඉගැන්වූවාය. සෞඛ්‍යය පාඩම ඉගැන්වූ රූත් ක්‍රෝ මහත්මියගේ පෙළඹවීම ගැන මට හොඳින් මතක තිබේ. මේවා අසීරු කාලයන් වුවද, හයවෙනි ශ්‍රේණියේ හැම ශිෂ්‍යයෙක්ම දන්ත සුව සටහනක් තබාගැනීම සහතික කළාය. ඇය පෞද්ගලිකවම හැම ශිෂ්‍යයෙකුගේම දන්ත සෞඛ්‍යය ගැන පරීක්ෂාකර, කිසිදු ශිෂ්‍යයෙක් නිසියාකාර දන්ත සැලකිල්ලකින් තොරව, කිසිදු පොදු හෝ පෞද්ගලික වැඩවලට නොයා යුතු බවට ස්ථිර කළාය. භූගෝලය ඉගැන්වූ, බර්කෝස් මහත්මිය, ලෝක සිතියම් දිගහරිමින්, ජාතීන්ගේ අග නගරයන් සහ හැම රටකම විශේෂ ලක්ෂණ, භාෂාව, සහ සංස්කෘතිය සළකුණු කළ අතර, මෙම දේශයන් සහ ජනතාව බැහැදැකීම ගැන මා බලාපොරොත්තුවූනේ හෝ සිහින දුටුවේ ඉතා මඳ වශයෙනි.

ඕ, අපගේ ළමයින්ගේ ජීවිත ගුරුවරුන්ට කෙතරම් වැදගත්ද, ඔවුහු ඔවුන්ගේ ආත්මික බව උසස්කරමින්, ඔවුන්ගේ බුද්ධිය මුවහත්කරමින් සහ, ඔවුන්ගේ ජීවිත සුමගට පොළඹවති.

## සභාවේ පංති කාමරය

සභාවේ පංති කාමරය සෑම ළමයෙකුගේම සහ තරුණයෙකුගේම අධ්‍යාපනයට වැදගත් ප්‍රමාණයක් එකතුකරයි. මෙම කර්තව්‍යයේදී එක් එක් ගුරුවරයා විසින් තම පාඩම්වලට සවන්දෙමින්, ඇයගේ සාක්ෂියේ පෙළඹවීම අත්විඳින අයට ඉහළට පිවිසීමට පහසුකම් සපයාදෙයි. ප්‍රාථමිකයේ, ඉරුදින පාසලේ, තරුණ කාන්තා රැස්වීම්වල සහ ආරෝනික පූජකවරයේ අයට, ස්වාමීන්වහන්සේගේ ආනුභාවය යටතේ කැඳවන ලද, හොඳින් සූදානම්වූ ගුරුවරුන්ට, හැම ළමයෙක්, හැම තරුණයෙක්ම ස්පර්ශකරමින්, සියලුදෙනාටම, "හොඳම... පොත්වලින් ප්‍රඥාවේ වචනය සෙවීමට. ඉගෙනීම සෙවීමට, අධ්‍යයනය මගින් සහ ඇදහිල්ල මගින් පවා පෙළඹවීමට පුළුවන."[4] දිරිගැන්වීමේ වචනයක් සහ ආත්මික සිතිවිල්ලක් අගනා ජීවිතයකට බලපෑමක් කළ හැකි අතර, අමතක නොවන මුද්‍රාවක් අමරණීය ආත්මයක කෙටීමටද පුළුවන.

වසර ගණනාවකට පෙර, සභා සඟරා උපහාර උළෙලකදී, සභාපති හැරල්ඩ් බී. ලී සහ එම සොහොයුරිය සමග අපි හිඳගෙන සිටියෙමු. අපගේ ගැටවර දියණියවූ ඇන්ට සභාපති ලී මෙසේ කීවේය: "ස්වාමීන්වහන්සේ ලක්ෂණ මුහුණක් සහ ශරීරයක් සහිතව ඔබට ආශිර්වාදකර ඇත. ඇතුළාන්තයද බාහිර ලෙසම ලක්ෂණට තබාගන්න. එවිට ඔබ සැබෑ සතුටක් සමග ආශිර්වාදිතවනු ඇත." මෙම ප්‍රධාන ගුරුවරයා අපගේ ස්වර්ගික පියාණන්ගේ සෙලස්ටියල් රාජ්‍යයට යාම සඳහා ආනුභාසම්පන්න මගපෙන්වීමක් ඇන්ට ලබාදුන්නේය.

සභා පංතිකාමරයක යටහත් ආනුභාසම්පන්න ගුරුවරයෙකුට ඇයගේ ශිෂ්‍යයන්ට ශුද්ධ ලියවිලිවලට ප්‍රියකිරීම ක්‍රමයෙන් සිතට කාවැද්දිය හැකිය. මන්ද, ගුරුවරයාට පැරණි ප්‍රේරිතයන් සහ ලෝකයාගේ ගැලවුම්කරුවාණන්ව, පංති කාමරයට පමණක් නොව, අපගේ ළමයින්ගේ හදවත්වලට, සිතට, සහ ආත්මවලටද කැඳවිය හැකිය.

## නිවස වශයෙන් හැඳින්වෙන පංති කාමරය

සමහරවිට පංති කාමර සියල්ලටම වඩා වැදගත්වන්නේ, නිවසේ පංති කාමරයවේ. අපි අපගේ ආකල්පයන් සහ අපගේ ගැඹුරු විශ්වාසයද සකස්කරගන්නේ නිවස තුලය. බලාපොරොත්තු අතිකරගන්නේ හෝ විනාශවන්නේ නිවස තුලය. අප නිවසින් පිටවන විටදී, අපි එහි කරන දේවල්වලින් අපගේ ජීවිතවල ගමන්මග නිශ්චයකරයි. වෛද්‍ය ස්ටුවර්ට් ඊ. රොසෙන්බර්ග්, *විශ්වාසයට මාවත*, නම් ඔහුගේ පොතේ මෙසේ ලීවේය, "සියලුම අළුත් නිෂ්පාදන සහ නූතන සැලසුම් කෙතෙක් තිබුනද, යමෙකු තෘප්තිමත් කළ හැකි ආදේශකයක්, කිසිවෙක් තවමත් නිෂ්පාදනයකර නැති අතර, කිසිදා නිෂ්පාදනය කරන්නේද නැත."[5]

ප්‍රීතිමත් නිවසක් යනු පූර්ව ස්වර්ගයකි. සභාපති ජෝර්ජ්. ඇල්බට් මෙසේ ඇසීය: "අපගේ නිවාස සතුටින් තිබීම අපට [අවශ්‍යද] [?] අපට අවශ්‍ය නම්,

එය යාච්ඤාවේ, ස්තුතිකිරීමේ සහ කෘතඥතාවය පවතින ස්ථානයක්වීමට සලස්සන්න."[6]

ළමුන් ශරීරික සහ මානසික ආබාධ සහිතව මෙම මැරෙන සුළු ජීවිතයේ උපත ලබන අවස්ථා ඇත. අපට හැකි තරම් උත්සාහ කරමු, එවන් අවස්ථා සිදුවන්නේ මන්ද, කෙසේද යන්න තේරුම්ගැනීම පහසු නොවේ. එවන් දරුවෙකු තම දෑතට ගෙන, ඔවුන්ගේ ජීවිතයට ඇතුල්කරගෙන, පරිත්‍යාගශීලීව, ස්වර්ගික පියාණන්ගේ දරුවන්ට ප්‍රේමය දක්වන දෙමාපියන්ට මම ආචාරකරමි.

එක් ග්‍රීෂ්මයකදී, ඇෂ්පෙන් ග්‍රෝව් පවුල් කඳවුරේදී, එක් මවක් උපතේදී ආබාධිතව තම මවගෙන් සම්පූර්ණයෙන්ම යැපෙන යෞවනියකට ඉවසීමෙන් යුතුව පෝෂ්‍යකරනු මම දුටුවෙමි. මව තම දියණියගේ හිස සහ ගෙල ඍජුව තබාගනිමින් හැම ආහාර හැන්දක්ම සහ හැම දිය උගුරක්ම දෙමින් උපස්ථාන කළාය. නිහඬවම මම මෙසේ සිතුවෙමි. *වසර 17ක්ම, එම මව මෙම සේවය සහ අන් හැම දෙයක්ම මෙම දියණියට ලබාදී, තම පහසුව ගැනද, තම සතුට ගැනද, තම ආහාර ගැනද කිසිදා නොසිතුවාය.* මෙවන් මවුවරුන්ට, මෙවන් පියවරුන්ට, මෙවන් දරුවන්ට දෙවියන්වහන්සේ ආශිර්වාද කරත්වා, එතුමා එසේ කරනසේක.

**ළමයින්ගේ අහිංසකත්වය**

ලෝකයේ තිබෙන බලවත්ම මානසික සම්බන්ධතාවය පැමිණ තිබෙන්නේ කිසිදු විශිෂ්ඨ සිද්ධියකින් වත්, නවකථාවල හෝ ඉතිහාස පොත්වලින්වත් නොව, නමුත් හුදෙක් නිදාසිටින තම දරුවා දෙස බලාසිටින දෙමාපියන්ගෙන් බව, ලොව සෑම තන්හිම සිටින දෙමාපියෝ අවබෝධකරගෙන සිටිති.

එසේ කරන විට, චාර්ල්ස් එම්. ඩිකින්සන්ගේ වචනවල සත්‍යතාවය මගේ මනසට පැමිණෙයි:

*ඔවුහු හදවත්වල සහ නිවැසියන්ගේ ප්‍රතිමාවන්ය!*
*ඔවුහු වෙස්වලාගත් දෙවියන්වහන්සේගේ සුරදූතයන්ය;*
*හිරුඑළිය තවමත් ඔවුන්ගේ කේසකලාපයේ නිදාසිටියි,*
*එතුමාගේ මහිමය ඔවුන්ගේ දෙනෙත් තුල තවමත් බැබලෙයි;*
*මෙම අලස ළමුන් නිවෙස්වලින් සහ ස්වර්ගයෙන්ය,*
*ඔවුහු මා වඩාත් ආචාරශීලී සහ මෘදුකර ඇත;*
*තවද යේසුස්වහන්සේ, ස්වර්ගරාජ්‍යය ළමයෙකුට සමාන කලේ*
*මන්දැයි මම දැන් දනිමි.*[7]

ළමයින් සමග අපට ඇති දිනපතා අත්දැකීම්වලින්, ඔවුන් හොඳින් තේරුම්ගෙන නිතරම ගැඹුරු සත්‍යයන් ප්‍රකාශකරන බව අපි දන්නෙමු. *නත්තල් කැරොල්* නාට්‍යයේ නිෂ්පාදක, චාර්ල්ස් ඩිකන්ස්, නිහතමානී බොබ් ක්‍රැට්චිට් පවුල බොහෝ කල් බලාසිටි සුළු නත්තල් රාත්‍රී භෝජනයක් සකස්කිරීම විස්තරකරමින් මෙම සත්‍යය අපට පෙන්වාදෙයි. බොබ්, පියා, තම දුර්වල පුංචි පුතා ටිම්ව උරහිස මත තබාගෙන නැවත නිවසට පැමිණෙයි. පුංචි ටිම් "කිහිලි කරුවක් දරාසිටි අතර ඔහුගේ පාදවලට යකඩ රාමුවක් සවිකර තිබින."

බොබ්ගේ බිරිඳ ඔහු අමතා, "කුඩා ටිම්ගේ හැසිරීම කොහොමද?" යයි ඇසුවාය.

"'රත්රන් මෙන් හොඳයි,' බොබ් කීවේය, 'ඉතා හොඳයි. කෙසේ හෝ ඔහු කල්පනාකාරියි, බොහෝ විට ඔහුම හිඳගනියි. එසේම ඔබ කිසිදා අසා නැති අමුතු දේවල්ද සිතයි. නිවසට එන අතර ඔහු මා අමතා, ඔහු දැක ඇති සභාවේ අය, ඔහු අංග විකල නිසා, නත්තල් දින කොරවූ සිඟන්නන් ඇවිදීමට සහ අන්ධයන්ට පෙනීමට සැලැස්වූයේ කවුදැයි ඔවුන්ට සිහිපත්වන බව ඔහු සිතන බව කීවේය."[8]

චාර්ල්ස් ඩිකන් විසින්ම මෙසේ කීවේය, "මෙම කුඩා අයට මම ආදරය කරමි. දෙවියන්වහන්සේගේ එතරම් නැවුම් ඔවුහු අපට ආදරයකරන විට, එය සුළු දෙයක් නොවේ."

ළමුන් ඔවුන්ගේ ආදරය ප්‍රකාශකරන්නේ අව්‍යාජවූ සහ අමුතුම ක්‍රම මගින්ය. ටික කාලයකට ඉහත, මගේ උපන්දිනයේදී, එක් කුඩා මාහැඟි දැරියක්, මට අතින් ලියන ලද උපන්දින කාඩ්පතක් ත්‍යාගකළාය. එහි කවරයේ ඇය ප්‍රියකරන කුඩා සෙල්ලම් ඉබ්බෙක් දමා තිබූ අතර, එය ත්‍යාගයක් වශයෙන් ලැබීමෙන් මා සතුටුවන බව ඇය සිතුවාය.

"ලෝකයේ ප්‍රියජනක සියලුම දර්ශන අතර, දරුවෙක් යමක් දෙන විට, ඔහු දෙන ඕනෑම කුඩා දෙයක් වුවද, තරම් ලක්ෂණ වෙනත් කිසි දසුනක් නැත. දරුවා ලෝකය ඔබට ලබාදෙයි. ඔබට කිසිදා කියවීමට නොලැබෙන දෙයක් ලෙසින් ඔහු ඔබට ලෝකය විවෘතකර දෙයි. නමුත් යම් ත්‍යාගයක් සොය ගත්විට, එය නිතරම හාස්‍ය උපදවන යම් කුඩා දෙයකි, ඇදයට අලවන ලද,…විකටයෙකු ලෙස පෙනෙන්නෙකි. ළමයෙකුට දීමට හැකිව තිබෙන්නේ ඉතා සුළු දෙයකි, මන්ද ඔහු ඔබට සෑම දෙයක්ම දී ඇතැයි ඔහු කිසිදා නොදන්නා නිසාය."[9]

ජෙනී මට දුන් ත්‍යාගයද එවැන්නකි.

ළමුන් එන්ඩවුකර තිබෙන්නේ, ඔවුන්ගේ ස්වර්ගික පියාණන්ට ඇදහිල්ල ඇතිව, ඔවුන්ගේ මිහිරි යාච්ඤාවලට පිළිතුරුදීමට උන්වහන්සේගේ හැකියාව සහ කැමැත්ත ඇතිවය. ළමයෙකු යාච්ඤාකරන විට දෙවියන්වහන්සේ සවන්දෙන බව මගේ පෞද්ගලික අත්දැකීමවේ.

මුලින් ඇට්ලන්ටා බ්‍රේව්ස් බේස් බෝල් සමාජශාලාවට ක්‍රීඩා කළ බැරී බොනල් සහ ඩේල් මර්ෆි යන සුප්‍රසිද්ධ වෘත්තීමය බේස් බෝල් ක්‍රීඩකයන් දෙදෙනාගේ අත්දැකීම මම ඔබ සමග බෙදාගමි. දෙදෙනාම සභාවට හැරී ආ අය වන අතර, බැරී බොනල් විසින් ඩේල් මර්ෆිව් බව්තීස්මකරන ලදී.

1978 කාලය තුලදී සිදුවුන අත්දැකීමක් බැරී විස්තර කළේ 'ජීවිතය වෙනස්කිරීමක්' ලෙසය. ඔහු දුර්වලව ක්‍රීඩාකිරීම නිසා, ලකුණු 200ක් පමණක් ලබමින්, ඉතා අසීරු පරිශ්‍රමයක් දරමින් සිටියේය. ඔහු තමා ගැනම විශ්වාසයක් නොමැතිව, දුක්මුසු හැඟීමකින් සිටියේය. ආරෝග්‍යශාලාවට යාමට ඩේල් මර්ෆි ඔහුට කථාකළ විට එහි යාමට ඔහුට සැබෑ ඕනෑකමක් නොතිබුන නමුත්, කෙසේ හෝ ඔහු ගියේය. එහිදී ඔහුට [ඇට්ලන්ටා]

බ්‍රේව්ස් බලගතු ආධාරකරුවෙකුවූ රිකී ලිට්ල්ව හමුවිය. නමුත් එම බාලයා ලියුකේමියා රෝගයෙන් පීඩාවින්දේය. රිකී මරණයට ආසන්නව බව හොඳින් පෙනෙන්ට තිබිනි. සැනසිලිදායක දෙයක් කීමට බැරිට තද බල ආශාවක් ඇතිවුවද, ප්‍රමාණවත් කිසිවක් ඇතිබව නොපෙනුනි. අවසානයේදී, ඔවුන්ට කිරීමට යමක් තිබේදැයි ඔහු ඇසුවේය. තරුණයා මඳක් අවිනිශ්චිතව සිට, ඉන්පසුව ඊලඟ තරගයේදී ඔහු වෙනුවෙන් හැම කෙනෙක්ම හෝමරයක් ගසන ලෙස කීවේය. 'ඩේල්ට එම ඉල්ලීම එතරම් අසීරු දෙයක් නොවීය, ඔහු ඇත්තවශයෙන්ම එම රාත්‍රියේ හෝමර් දෙකක් ගැසුවේය. නමුත් මට ප්ලේට් එක අසල පරිශ්‍රම දැරීමට සිදුවීමෙන් පසුගිය වසරේදී හෝමරයක් ගැසුවේ නැත යයි බැරී [පසු කලෙක] කීවේය. එවිට මට උණුසුම් හැඟීමක් මා තුල ඇතිවනු දැනී, එය බාරගන්නා ලෙස මම රිකීට කීවෙමි.' "එදින රාත්‍රී, බැරී එම කාලය සඳහා තම එකම හොමරය ගැසීය.[10] ළමයෙකුගේ යාච්ඤාවට පිළිතුරු ලැබී ඇත. ළමයෙකුගේ ප්‍රාර්ථනාව ඉටුවී ඇත.

### ආරක්ෂාව සඳහා අවශ්‍යතාවයක්

සියලුම ළමයින්ට ප්‍රේමනීය දෙමාපියන්, ආරක්ෂිත නිවාස, සහ හිතවත් මිතුරන් සිටීනම්, ඔවුන්ගේ ලෝකය කෙතරම් විශ්මිතවනු ඇතිද, අවාසනාවකට මෙන්, සියලුම ළමයි එතරම් අසීමිතව ආශිර්වාදිතවී නැත. තම පියවරු තම මවුවරුන්ට දරුනු ලෙස පහරදෙන බවට සමහර ළමයි සාක්ෂිදරන අතර, තවත් කොටසක් එවැනි අපවාදවල මුවවිට සිටිති. කෙතරම් බියසුළු කමක්ද, කෙතරම් දුශ්චරිතයක්ද, කෙතරම් ලජ්ජාවක්ද!

සෑම ප්‍රදේශයකම ප්‍රාදේශීය ආරෝග්‍යශාලාවලට තුවාලවලින් සහ පහරදීම්වලින් යුත් මෙවැනි ළමයි "ළමයා දොරට අසුවුනා" හෝ "පඩිපෙළින් වැටුනා" යන ගෙතු බොරුවලින් ඇතුලත් කරති. ළමුන්ට හිරිහැර කරන බොරුකාරයන්, කෛරාටිකයෝ යම් දිනෙක ඔවුන්ගේ වැරදි ක්‍රියාවන් සඳහා සුළිසුලඟ කපාගන්නෝය. ශාන්ත, තුවාල ලත්, අපචාරයෙන් පීඩාවිඳි සහ අහිංසකව සිටි ළමයින්, උපකාර ලැබිය යුතුය

දිස්ත්‍රික් විනිශ්චයකාරවරයෙක්, මට එවූ ලිපියක මෙසේ ප්‍රකාශකර තිබුනි: "ළමුන් ලිංගික අපචාරවලට යොදාගැනීම ශීලාචාර සමාජයක එක් දූෂිත, විනාශකාරී සහ සිත් කෙලෙසන අපරාධයකි. ළමුන් ශාරීරිකව, මානසිකව සහ ලිංගිකව අපචාරයට ලක්කිරීමේ වාර්තාවල භයානක ලෙස වැඩිවීමක් ඇත. අපගේ උසාවි මෙම පිළිකුල් හැසීරීම් වාර්තාවලින් යටවී ඇත."

අපගේ සභාව මෙම නිහීන සහ නීච හැසිරීමට සමාවක් දෙනු නොලැබේ. ඒ වෙනුවට අපි, දෙවියන්වහන්සේගේ මාහැඟි දරුවන්ට කරන එවැනි සැලකීම්වලට රළු කොන්දේසිවලින් දඬුවම් කරන්නෙමු. දරුවා ගළවාගැනීම, පෝෂණයකිරීම, ප්‍රේමකිරීම සහ සුවකිරීමට ඉඩහරිමු. වරදකරුවා නීතිය ඉදිරියට ගෙනගොස් වගකීමට සළස්වමු. මන්ද ඔහුගේ හෝ ඇයගේ ක්‍රියාවන්ට වෘත්තීමය පිළියම් ලබා එවන් දුෂ්ඨ සහ දරුණු හැසිරීම අඩුකල යුතුය. ඔබ සහ මම එවන් හැසිරීමක් දැනගෙන එය මුළුනුපුටාදැමීමට අසමත්වන්නේ නම්, අපි එම ප්‍රශ්නයේ කොටස්කරුවන් වන්නෙමු. අපි වරදේ කොටසක් බෙදාගන්නෙමු. අපි දඬුවමේ කොටසක් අත්දකින්නෙමු.

මා වඩා රළු ලෙස කථාකර නොමැති බව මම විශ්වාසකරමි. නමුත් මා මෙම කුඩා දරුවන්ට ප්‍රේමකරන අතර, ස්වාමීන්වහන්සේත් ඔවුන්ට ප්‍රේමකරනසේක. මෙම ප්‍රේමය ගැන 3 නිෆායි විස්තරකරන පරිදි යේසුස්වහන්සේ ළමුන්ට ආශිර්වාදකිරීමේ අත්දැකීමට වඩා ස්පර්ශශීලී විස්තරයක් තවත් නැත. එයින් කියවෙන්නේ යේසුස්ව හන්සේ රෝගීන් සුවකිරීම, ජනතාවට ඉගැන්වීම, සහ ඔවුන් වෙනුවෙන් ස්වර්ගීය පියාණන්ට යාච්ඤාකිරීමය. නමුත් ඉන්පසුව, මෙම මාහැඟි වචන මම උපුටාදක්වමි:

"[යේසුස්වහන්සේ] ඔවුන්ගේ කුඩා දරුවන් එකිනෙකා තමන්වහන්සේ වෙත කැඳවා ඔවුන් ආශිර්වාදකර ඔවුන් වෙනුවෙන් පියාණන්වහන්සේට යාච්ඤා කළසේක.

"තවද උන්වහන්සේ මෙසේ කළ පසු නැවතද හැඬූසේක;

"තවද උන්වහන්සේ සමූහයාට කථා කොට මෙසේ කීසේක: බලන්න නුඹලාගේ කුඩා දරුවන්.

"තවද ඔවුන් බැලීමට සැරසෙත්ම ඔවුහු ස්වර්ගය දෙස නෙත් යොමුකළහ. තවද ඔවුහු ස්වර්ගය විවරවෙනු දුටහ; තවද ගින්නෙක් වටවූවාක් මෙන් දේවදූතයන් ස්වර්ගයෙන් බසිනු ඔවුහු දුටහ;...තවද දේවදූතයෝ ඔවුන්ට උපස්ථාන කළහ." [11]

ඔබ මෙසේ ඇසීමට හැකිය, *එවැනි දේවල් වර්තමානයේ පවා සිදුවන්නේද?* වසර ගණනාවකට පෙර දූතමෙහෙයක සේවයකල සීයා සහ ආච්චී කෙනෙකුගේ ලක්ෂණ විස්තරයක් සහ ඔවුන්ගේ කුඩා මුනුපුරා ආශිර්වාදිතවූ අන්දම ගැනද මම ඔබ සමග බෙදාගමි. ධර්මදූත සීයා මෙසේ ලිවීය:

"මගේ බිරිඳ ඩියානා සහ මම දැන් ජැක්සන් ඔහියෝ වල සේවයකරමි. අපි දූතමෙහෙයේ කැඳවීම බාරගන්නා විට, අපට තිබූ එක් ලොකුම ප්‍රශ්නය වුනේ අපගේ පවුලය. ඔවුන්ට ප්‍රශ්න ඇතිවූ විට අපි එහි නොසිටීමය.

"අපි අපගේ දූතමෙහෙයට පිටත්වීමට ටිකකට පෙර, අපගේ මුනුපුරා, ආර්.ජේ., වයස අවුරුදු දෙක-හමාරක් වූ ඔහු, වපර ඇසක් හරිගැස්සීමට ශල්‍යකර්මයක් කර තිබුනි. ඔවුන් සමග යාමට ඔහුගේ මව මට කීවේ ආර්. ජේ. සහ මා සැබෑ මිතුරන්වූ නිසාය. ශල්‍යකර්මය හොඳින් සිදු කෙරින. නමුත් ආර්. ජේ. ශල්‍යකර්මයට පෙර සහ පසුවද හැඬුවේ පවුල් සමාජිකයන් කිසිවෙකුට ශල්‍යාගාරයට යාමට නොහැකි නිසාය., එසේම ඔහු බියව සිටියේය.

"මාස හයකට පමණ පසුව, අපි අපගේ දූතමෙහෙයේ නියැලෙමින් සිටියදී, අනෙක් ඇසද හරිගස්සාගැනීමට ආර්. ජේට අවශ්‍යවිය. ඔහුගේ මව ඇමතුමක් දෙමින්, ඇයගේ කැමැත්ත දෙවෙනි ශල්‍යකර්මය සඳහා ඔවුන් සමග යාමට මා එහි පැමිණීම බව ප්‍රකාශකළාය. ඩියානා සහ මම උපවාසකරමින් සහ යාච්ඤාකරමින් අපගේ මුනුපුරාගේ ශල්‍යකර්මය කාලය තුලදී ඔහුට සහනය පතා ස්වාමීන්වහන්සේට යාච්ඤා කළෙමු.

"ශල්‍යකර්මය නිමවීමෙන් පසු ඉක්මනින්ම අපි ඇමතුමක් දුන් විට දැනගන්ට ලැබුනේ, ආර්.ජේට කලින් අත්දැකීම සිහිපත්වී ඔහුගේ දෙමාපියන් නැතිව යාමට අකමැතිවූ බවය. නමුත් ඔහු ශල්‍යාගාරයට ඇතුල්වූ විගසම, ඔහු සන්සුන් විය. ඔහු ශල්‍යකර්ම මේසය මත වැතිරී, ඔහුගේ උපැස් යුව ලඉවත්කර ශාන්ත ආකල්පයකින් ශක්‍යකර්මටයට මුහුණදුන්නේය. අපි ඉතා ස්තුතිවන්ත වූවෙමු; අපගේ යාච්ඤාවලට පිළිතුරු ලැබී ඇත.

"දින දෙකකට පසුව, අපි අපගේ දියණියට ඇමතුමක්දී ආර්.ජේ. ගැන ඇසුවෙමු. ඔහු හොඳින් සිටින බව පවසා, මෙම සිද්ධිය ඇය අපට කීවාය: ශල්‍යකර්මයෙන් පසුව සවස, ආර්.ජේ. අවදිවී ඔහුගේ මව අමතා, ශල්‍යකර්මය කරන කාලය තුලදී ඔහුගේ සීයා එහි සිටිබව කීවේය. ඔහු මෙසේ කීවේය, 'සීයා එහි සිටිමින් හැම දෙයක්ම නිසි ලෙස කළේය.' බලන්න, නිර්වින්දන වෛද්‍යවරයා එම දරුවාට සීයා ලෙස පෙනීමට ස්වාමීන්වහන්සේ සැලස්වූසේක. නමුත් ඔහුගේ සීයා සහ ආච්චී ඒ වන විට සිටියේ සැතපුම් 1800ක් ඈත දුතමෙහෙයකය."

සීයා ඔබගේ ඇඳ ලඟ නොසිටියා විය හැකිය ආර්. ජේ. නමුත් ඔබ ඔහුගේ යාච්ඤාවල සහ ඔහුගේ සිතිවිලිවල සිටියේය. ඔබ ස්වාමීන්වහන්සේගේ හස්තයේ නැළවුන අතර, අප සියලුදෙනාගේම පියාණන් විසින්ද ආශිර්දිතවිය.

මා හිතවත් සොයුරු සොයුරියනි, ළමුන්ගේ සිනහම අපගේ හදවත් ප්‍රමුදිත කෙරෙත්වා, ළමුන්ගේ ඇදහිල්ල අපගේ ආත්ම සනසත්වා, ළමුන්ගේ ප්‍රේමය අපගේ කටයුතු ඉක්මන් කරත්වා. "ළමයින් දෙවියන්වහන්සේ දෙන දීමනාවක්ය."12 අපගේ ස්වර්ගික පියාණන්වහන්සේ මෙම මිහිරි ආත්ම, මෙම ආචාරීන්වහන්සේගේ විශේෂ මිතුරන්ට සදා ආශිර්වාදකරන සේක්වා!

ජූනි 2000 *Ensign*, සඟරාවෙනි, පිටු 2–5.

සටහන්

1. මතෙව් 18:1–6.
2. "Ode: Intimations of Immortality from Recollections of Early Childhood."
3. *Gospel Ideals* (1954), 436.
4. දහම සහ ගිවිසුම 88:118.
5. *The Road to Confidence* (1959), 121.
6. Conference Report තුලිනි, අප්‍රේ. 1944, 32.
7. *The Children*, Jack M. Lyon සහ අන් අය වෙතිනි, කතෘවරු., *Best-Loved Poems of the LDS People* (1996), 21.
8. *A Christmas Carol and Cricket on the Hearth* (දි. නැ), 50–51.
9. Margaret Lee Runbeck, *Bits & Pieces*, 20 සැප්තැ. 1990.
10. James L. Ison, *Mormons in the Major Leagues* (1991), 21.
11. 3 නිෆායි 17:21–24.
12. ගීතාවලිය 127:3.

# පියවරුන්ගේ සහ මවුවරුන්ගේ පූජනීය කාර්‍යභාරය 10

*1 කොටසඃ පියවරුන්ගේ කාර්‍යභාරය*

## අදාළකරගැනීම සඳහා අදහස්

ඔබගේම අවශ්‍යතාවයන් සහ තත්වයන්ට අනුව, මෙම යෝජනා එකක් හෝ දෙකම අනුගමනය කරන්න.

- "පවුල; ලෝකයට ප්‍රකාශනයකි" යන්නෙහි හත්වෙනි ඡේදයේ පෙන්වාදී තිබෙන පියවරුන්ගේ සහ මවුවරුන්ගේ කාර්‍යභාරය නැවත කියවන්න. (බලන්න පිටුව iv). මෙම උපදේශය ඔබගේ නිවසට අදාළවන අයුරු සහ එය අනුගමනයකිරීමට ඔබ කරන්නේ කුමක්ද යයි යාච්ඤාවෙන් යුතුව අධිෂ්ඨානකරන්න.
- ඔබගේ පියාට හෝ සීයාට ලිපියක් ලියන්න.

## කියවීමේ පැවරුම

පහත සඳහන් ලිපිය කියවන්න. ඔබ විවාහක නම්, ඔබගේ සහකරු සමග ලිපිය කියවා සාකච්ඡා කරන්න.

### ඉශ්‍රායල් පියවරුන් වෙතටයි

සභාපති එස්රා ටැෆ්. බෙන්සන්
සභාවේ 13වෙනි සභාපතිවරයා

මගේ හිතවත් සොයුරනි, මෙම දෙවියන්වහන්සේගේ පූජකවරයේ ශ්‍රේෂ්ඨ සභාවේ ඔබත් සමග සිටීමට ලැබීම ගැන මම කෘතඥවෙමි. මා ඉතා වැදගත් මාතෘකාවක් ගැන කතාකරන මේ අවස්ථාවේ ස්වාමීන්වහන්සේගේ ආත්මය මා සමග සහ ඔබත් සමග සිටිත්වා'යි මම යාච්ඤාකරමි. මේ සැඳෑවේදී මෙහි රැස්ව සිටින සහ සභාවේ සියලුම පියවරුන්ට, ඔවුන්ගේ පූජනීය කැඳවීම් ගැන කථාකිරීමට මම කැමැත්තෙමි.

තරුණ මිනිසුන් වන ඔබලාද, දැන් සභාවේ අනාගත පියවරුන්වීමට හැකිතරම් දුරට සූදානම්වන නිසා ප්‍රවිශමෙන් සවන්දෙනු ඇතැයි මම සිතමි,

#### සදාකාලික කැඳවීමක්

පියවරුනි, සදාකාලික කැඳවීම ඔබලාගේ වන අතර, එයින් ඔබලා කිසිදිනක මුදා නොහැරේ. සභාවේ කැඳවීම්, එහි පවතින ස්වභාවය අනුව, ඒවා වැදගත්වන තරමටම, එක් කාල සීමාවක් සඳහා පමණක්ම වන අතර, තවද ඉන්පසුව අදාළ මුදාහැරීම සිදුවන්නේය. නමුත් පියාගේ කැඳවීම සදාකාලිකය, එමෙන්ම එහි වැදගත්කම කාලය මුළුල්ලේම පවතී. එය මෙලොව සහ සදාකාලය යන දෙකම සඳහා කැඳවීමකි.

සභාපති හැරල්ඩ් බී. ලී සත්‍යලෙසම මෙසේ සඳහන් කළේය, "ස්වාමීන්වහන්සේගේ වැඩවලින් ඔබ [පියවරු] කරන ඉතාමත්ම වැදගත් කටයුත්ත වන්නේ ඔබගේම නිවසේ බිත්ති අතර ඔබ කරන කටයුතුය. ඉගැන්වීම, සභානායකත්වයේ කටයුතු, සහ වෙනත් රාජකාරි සියල්ලක්ම වැදගත් නමුත්, වඩාත් වැදගත් කටයුත්ත තිබෙන්නේ ඔබගේ නිවසේ බිත්ති අතරය" (*Strengthening the Home* [පත්‍රිකාව, 1973], 7).

එසේ නම්, පියෙකුට ඔහුගේ නිවසේ බිත්ති අතර තිබෙන විශේෂිත වගකීම කුමක්ද? සෑම ඉශ්‍රායෙල් පියෙකුටම තිබෙන මූලික වගකීම් දෙකක් මම යෝජනා කරමි.

#### ලෞකික අවශ්‍යතාවයන් සපයාදෙන්න

පළමුව, ඔබගේ පවුලේ ලෞකික අවශ්‍යතාවයන් සපයාදීමේ පූජනීය වගකීමක් ඔබට ඇත.

ධර්මිෂ්ඨ පරම්පරාවක් ගොඩනගමින් ඔවුන් රක්ෂාකිරීමේ කාර්‍යභාරයන් ගැන ස්වාමීන්වහන්සේ පැහැදිළිව විස්තර කළසේක. ආරම්භයේදී ආදම්ට, ඒවාට නොවේ, ඔහුගේ මුහුණේ ඩහදියෙන් යුක්තව උපයාගෙන කෑමට උපදෙස් ලැබින.

පාවුළු ප්‍රේරිතවරයා ස්වාමිපුරුෂයන්ට සහ පියවරුන්ට මෙසේ උපදෙස් දුන්නේය, "යමෙක් තමාගේ අය, ප්‍රධාන කොටම තමාගේ පවුලේ අය රක්ෂා නොකරන්නේ නම්, ඔහු ඇදහිල්ල එපා කළේය. ඔහු නොඇදහිලිකාරයෙකුට වඩා නරකය" (1 තිමොති 5:8).

නැවත පිහිටුවන ලද සභාවේ මුල් ඉතිහාසය තුළදී, ස්වාමීන්වහන්සේ විශේෂයෙන්ම මිනිසුන්ට ඔවුන්ගේ භාර්‍යාවන් සහ පවුල් රක්ෂාකිරීමේ යුතුකම පවරාදුන්සේක. 1832 ජනවාරි මස එතුමා මෙසේ කීසේක, සැබවක් මම නුඹලාට කියමි, එනම් තමාගේ පවුල රක්ෂාකිරීමේ වගකීමෙන් බැඳීසිටින සෑම මිනිසෙක්ම, ඔහු සැපයුම් ලබාදිය යුතු අතර, ඔහු කෙසේ වත් තම යුතුකම නැතිකර නොගතයුතුය (බලන්න ධීසහගී 75:28). මාස තුනකට පසුව ස්වාමීන්වහන්සේ නැවතත්, කාන්තාවන්ගේ නඩත්තුව තම ස්වාමිපුරුෂයන් බාරගන්නා තෙක්, තම ස්වාමිපුරුෂයන් ගෙන් එසේ ඉල්ලා සිටීමට කාන්තාවන්ට අයිතිවාසිකමක්

ඇත යයි කීසේක (බලන්න ඩීසහසී 83:2). භාර්‍යාවකගේ සහ මවකගේ දිව්‍යමය අයිතිවාසිකම මෙය වන්නේය. ඇය නිවසේදී තම දරුවන් රැකබලා පෝෂණයකරත්දී, ඇයගේ ස්වාමිපුරුෂයා පවුල සඳහා මුදල් උපයන අතර, එය මෙම පෝෂණයට හැකියාව ලබාදෙයි.

වැඩකළ හැකි ස්වාමිපුරුෂයන් සිටින නිවසක, පවුලේ දිවි රක්ෂාකිරීම ඔහුගෙන් අපේක්ෂා කෙරෙයි. ආර්ථික අසීරුකම්, ස්වාමිපුරුෂයන්ගේ රැකියා අහිමිවීම නිසා, එහෙත් තවදුරටත් තම පවුල රක්ෂාකිරීමට ස්වාමිපුරුෂයාට හැකියාව තිබුනද, තම භාර්‍යාවන් නිවසින් පිටව වැඩකිරීම අපේක්ෂාකරන ස්වාමිපුරුෂයන් ගැන සමහර අවස්ථාවලදී අපට අසන්ට ලැබේ. මෙවැනි සිද්ධීන්වලදී, අපි ස්වාමිපුරු ෂයාගෙන් ඉල්ලා සිටින්නේ, තම සියලු බලයෙන් කටයුතුකර, රැකියාව ආරක්ෂාකර ගැනීමට හැකිවී, පවුලේ වියදම් අධිකවීමෙන් එය සුදුසු නොවුනද, තම භාර්‍යාවට නිවසේ නතරවී ළමුන් බලාගැනීමට ඉඩදී ඔහුට හැකි පමන හොඳින් දිගටම ඔහුගේ පවුල රක්ෂාකිරීමය.

එසේම. පවුලේ දිවි රක්ෂාකරන්නා ලෙස භාර්‍යාවට වැඩකිරීමට ඉඩදීම සඳහා ළමුන්ගේ අධ්‍යාපනය හෝ ලෞකික දේවල්වල අවශ්‍යතාවය කල්තැබීම සාධාරණ නොවේ.

### සභාපති කිම්බල්ගේ උපදේශය

අපගේ ආදරණීය අනාගතවක්තෘ ස්පෙන්සර් ඩබ්ලිව්. කිම්බල් විවාහක ශිෂ්‍යයන්ට දුන් උපදේශය මට මතක තිබේ. ඔහු මෙසේ කීවේයඃ "අපගේ දස දහස් ගණන් තරුණ ජනතාවට මා ප්‍රකාශකර තිබෙන්නේ, ඔවුන් විවාහවී දරුවන් ලැබීමට, ඔවුන්ගේ පාසල් කටයුතු සහ මූල්‍යමය අභිප්‍රායන් සම්පූර්ණ කරගන්නා තුරු නොසිටින ලෙසය....ළමුන්ට පැමිණීමට ඉඩහරිමින්, ඔවුන් සාමාන්‍ය ලෙස එකට ජීවත්විය යුතුය ....

සභාපති කිම්බල් දිගටම කථාකරමින්, "තරුණ කාන්තාවන් තම පවුල් නතරකරගෙන, රැකියාවට යමින්, තම සැමියන් පාසල් යැවීමට අවසරදුන් ශුද්ධ ලියවිල්ලක් ගැන මම නොදනිමි. පාසල් යාමට තමන්ගේම මාර්ගයක් සකස්කරගනිමින් තම පවුල් ජීවත්කිරීමට කටයුතුකරන දහස් ගණන් ස්වාමිපුරුෂයන් සිටිති" යයි කීවේය ("Marriage Is Honorable," *Speeches of the Year* තුලිනි, *1973* [1974], 263).

### නිවස තුල මවගේ කාර්‍යභාරය

පූජකවරයේ සොහොයුරෙනි, මව්වරුන් නිවසේ නතරවී, ඔවුන්ගේ දරුවන් පෝෂණයකරමින්, රැකබලාගෙන, ධර්මිෂ්ඨ මූලධර්මයන්ට අනුව පුහුණුකිරීමේ වැදගත්කම මම නිරන්තරයෙන්ම අවධාරණයකරමි.

මම ලොව පුරා සභාවල සංචාරයකරන විට, පසු-දවස්වල ශුද්ධවන්ත මවුවරුන් විශාල බහුතරයකට මෙම උපදේශය ඉතා උනන්දුවෙන් අනුගමනයකිරීමට අවශ්‍ය බව මට හැඟේ. නමුත් අපි දන්නා පරිදි සමහර අවස්ථාවලදී, තම ස්වාමිපුරුෂයාගේ දිරිගැන්වීම හෝ සහයෝගයෙන් යුතුව පවා, මව නිවසින් පිටත වැඩකරයි. සැපපහසු භාණ්ඩ මිළදීගැනීමට අමතර ආදායමක් අවශ්‍ය වන්නේ ඔහුටය. එවන් අවස්ථාවන්හිදී කරදරයට පත්වන්නේ පවුල පමණක්ම නොව, සොහොයුරෙනි, නමුත් ඔබගේම ආත්මික වර්ධනය සහ දියුණුවද ඉන් වැළකී යන්නේය. මම ඔබ සියලුදෙනාටම කියමි, ස්වාමීන් වහන්සේ මිනිසුන්ට ඔවුන්ගේ පවුල් රක්ෂාකිරීමේ වගකීම භාරදී ඇති ක්‍රමය අනුව, නිවසේ මවගේ කාර්‍යභාරය ඉටුකිරීමට බිරිඳට එමගින් අවසර ලබාදී ඇත.

### පවුල සූදානම්කිරීම අද වඩාත් හදිසි අවශ්‍යතාවයකි

පියවරුනි, ඔබගේ පවුලේ ලෞකික අවශ්‍යතාවයන් සැපයීමේදී බැලිය යුතු තවත් වැදගත් පැත්තක් නම්, හදිසි අවස්ථාවයකදී ඔබගේ පවුල සඳහා ඔබ සැලසිය යුතු දේවල්ය. පවුල සූදානම්කිරීම බොහෝ ඉහතදී-පිහිටුවන ලද සුභසාධන මූලධර්මයකි. එය අදට පවා වඩාත් හදිසි අවශ්‍යතාවයකි.

මම ඉතා උනන්දුවෙන් ඔබට කියමි, ඔබ ඔබගේ පවුල සඳහා වසරකට සෑහෙන ආහාර, ඇඳුම් සහ අවසර ඇති පරිදි ඉන්ධන සපයා තිබේද? ආහාර සපයා ගබඩාකිරීමට දුන් එළිදරව්ව, නෝවාගේ දවස්වල ජනතාව සඳහා නැවක් සෑදීම වැදගත්වූ ලෙස, අපගේ ලෞකික සුභසාධනය සඳහා අදටද අත්‍යාවශ්‍යවන්නේය.

එසේම, ඔබ ඔබගේ ආදායමට සරිලන ලෙස ජීවත්වී, මඳක් ඉතිරිකරන්නේද?

ඔබගේ දසයෙන් කොටස ගෙවීමෙන් ඔබ ස්වාමීන්වහන් සේට අවංක වන්නේද? මෙම දිව්‍යමය නීතියට අනුව ජීවත්වීමෙන් ආත්මික සහ ලෞකික ආශිර්වාදද ගෙන දෙයි.

එසේය, සොයුරනි, ඉශ්‍රායෙල් පියවරුන් ලෙස ඔබගේ පවුලේ ලෞකික අවශ්‍යතාවයන් සපයාදෙමින්, හදිසි අවශ්‍යතාවයකට වුවමනාවන කළමනා රැස්කර තැබීමට ඔබට විශාල වගකීමක් ඇත.

### ආත්මික නායකත්වය සපයන්න

දෙවනුව, ඔබගේ පවුල තුල ආත්මික නායකත්වය සැපයීම සඳහා පූජනීය වගකීමක් ඔබට ඇත.

වසර කිහිපයකට පෙර දොළොස්දෙනාගේ උපදේශක මණ්ඩලය විසින් ප්‍රකාශයට පත්කළ පත්‍රිකාවකින්, අපි පහත සඳහන් ප්‍රකාශය කළෙමුඃ "පීතෘත්වය නායකත්වයකි, වඩාත් වැදගත් ආකාරයේ නායකත්වයකි. එය නිතරම එසේ තිබීද ඇත; එය නිතරම එසේම තිබෙනුද ඇත. පියා, ඔබගේ සදාකාලික සහකරුගේ සහයෝගය, උපදේශය සහ දිරිගැන්වීම අනුව, ඔබ නිවසේ මූලිකත්වය උසුලනු ලබයි" (*Father, Consider Your Ways* [පත්‍රිකාව, 1973], 4–5).

කෙසේවුවද, එම මූලිකත්ව තනතුරත් සමග වැදගත් යුතුකම්ද ඇතුළත්වේ. සමහර අවස්ථාවලදී මිනිසුන්ගේ යම් විස්තර, සභාව තුලදී පවා, අපට ඇසේ. නිවසේ ප්‍රධානියා ලෙස ඔවුන් මත කෙසේ හෝ උත්තරීතර තත්වයක් දමාගෙන, අණකිරීමට සහ ඔවුන්ගේ පවුල් මත නියමයන් පැනවීමට අවසර ඇති බව ඔවුහු සිතති.

පාවුළු ප්‍රේරිතවරයා මෙසේ පෙන්වාදෙයි. "ක්‍රිස්තුස්ව හන්සේ සභාවේ හිසව සිටින්නා සේම, පුරුෂයාත් භාර්‍යාවගේ හිසව සිටියි" (එපීස 5:23; ඉතාලි අකුරු ඇතුළත්ය). නිවසේ මූලිකයා ලෙස අපගේ කාර්‍යභාරයේදී අප අනුගමනයකල යුතු ආදර්ශය එයයි. ගැලවුම්කරු වාණන් රළු හෝ අකරුණාවන්ත හස්තයකින් සභාව මෙහෙයවීමක් අපි නොදකිමු. ගැලවුම්කරුවාණන් අගෞරවයෙන් හෝ නොසැලකිල්ලෙන් එතුමාගේ සභාවට සැලකීමක් අපි නොදකිමු. ගැලවුම්කරුවාණන් එතුමාගේ අරමුණු ඉටුකරගැනීමට බලය හෝ බලහත්කාරකම පාවිච්චිකිරීමක් අපි නොදකිමු. ගැලවුම්කරුවාණන් අපව ගුණවත්කිරීම, ඔසවාතැබීම, සහනයදීම සහ සභාව උත්කෘෂ්ඨ කිරීම හැර එතුමා වෙනත් කිසිවක් කරනු අපි කොහේවත් නොදකිමු. සොයුරනි, ඉතා සන්සුන් ලෙස මම ඔබලාට කියමි, අපි අපගේ පවුල් තුල ආත්මික නායකත්වය ගැනීමේදී, අපි අනුගමනයකල යුතු ආදර්ශය එතුමාණන්ය.

විශේෂයෙන්ම ඔබගේ භාර්‍යාව සමග ඔබ පවත්වන සම්බන්ධය තුළදී මෙය සත්‍යක්ද.

### ඔබගේ භාර්‍යාවට ප්‍රේමකරන්න

මෙන්න නැවතත් පාවුළු ප්‍රේරිතවරයාගේ වඩාත් අලංකාර සහ ගැළපෙන උපදේශය; ඔහු සරලව මෙසේ කීවේය, පුරුෂයෙනි, ක්‍රිස්තුස්වහන්සේ සභාවට ප්‍රේමකළාක් මෙන්, නුඹලාත් නුඹලාගේ භාර්‍යාවන්ට ප්‍රේමකරපල්ලා" (එපීස 5:25).

පසු-දවස්වල එළිදරව්වක් තුලින්, මෙම යුතුකම ගැන ස්වාමීන්වහන්සේ නැවතත් කථාකරමින් මෙසේ කීසේක, නුඹ නුඹගේ මුළු සිතින්ම නුඹගේ භාර්‍යාවට ප්‍රේමකරමින්, වෙනත් කිසිවෙකුට නොව, නුඹ ඇයට ඇළුම්කරන්නෙහිය (බලන්න ධීසහසී 42:22). මගේ අවබෝධයට අනුව අපගේ මුළු හදින්ම ප්‍රේමකිරීමට ශුද්ධ ලියවිලි වලින් අපට අණකර තිබෙන තවත් එකම දෙය නම්, දෙවියන්වහන්සේට පමණය, එහි අදහස කුමක්දැයි සිතන්න!

මේ අන්දමේ ප්‍රේමයක් විවිධ ආකාරයෙන් ඔබලාගේ භාර්‍යාවන්ට පෙන්විය හැකිය. පළමුව සහ ප්‍රධාන වශයෙන්, ඔබගේ ජීවිතය තුල ඔබගේ භාර්‍යාවය දෙවියන්වහන්සේට හැර ප්‍රමුඛත්වය ලබාගනියි—වැඩ නොවේ, විනෝදවීම නොවේ, විනෝදාංශ නොවේ. ඔබගේ භාර්‍යාව ඔබගේ වටිනාම, සදාකාලික සහකාරියයි—ඔබගේ මිතුරියද වන්නේය.

ඔබගේ මුළු සිතින්ම යමෙකුට ප්‍රේමකරන්න, යන්නෙහි අදහස කුමක්ද? එහි අදහස ඔබගේ මුළු චෛතසික හැඟීම්වලින් සහ ඔබගේ සම්පූර්ණ භක්තියෙන්ම ප්‍රේමකිරීමය. සැබැවින්ම, ඔබ මුළු සිතින්ම ඔබගේ භාර්‍යාවට ප්‍රේමකරන විට, ඇය පහත් ලෙස සැලකීමට, ඇව විවේචනයකිරීමට, ඇය මත වරද තැබීමට, හෝ වචනයෙන් ඇයට අපවාද නැගීමට, අමනාපව හැසිරීමට හෝ ක්‍රියාකිරීමට ඔබට නොහැකිය.

"ඇයට ඇළුම්ව සිටින්න" යන්නෙහි අදහස කුමක්ද"? එහි අදහස ඇයට සමීපව සිටීම, ඇයට පක්ෂපාතීව සහ විශ්වාසීව සිටීම, ඇය සමග කථාබස්කිරීම, සහ ඇයට ප්‍රේමය ප්‍රකාශකිරීම වේ.

ප්‍රේමකිරීම යනු, ඇයගේ හැඟීම්වලට සහ අවශ්‍යතාව යන්ට සංවේදීව සිටීමය. ඇයට සැලකිල්ල සහ අගයකිරීම අවශ්‍යවේ. ඔබ ඇයව දකින්නේ ප්‍රේමයෙන් සහ දැකුම්කළුබවින් සහ ඇය ඔබට වැදගත්වන බවද කීම ඇයට අවශ්‍යවේ. ප්‍රේමකිරීම යනු, ඇයගේ සුභසාධනය ගැන ඔබගේ ජීවිතයේ ඉහළම ප්‍රමුඛත්වය ඇයට ලබාදීමය.

ඇය ඔබගේ ළමයින්ගේ මව සහ නිවසේ රැජිනියවීම ගැන ඔබ කෘතඥවිය යුතුය, ඇය නිවාස සැලසුම්කරණය සහ මාතෘත්වය තෝරාගෙන—දරුවන් බිහිකිරීමට, පෝෂණයකිරීමට, ප්‍රේමකිරීමට සහ ඔබගේ ළමයින් පුහුණුකිරීමද—සියල්ලෙන්ම උදාරතම කැඳවීම තෝරාගැනීම ගැනද කෘතඥවන්න.

ස්වාමිපුරුෂයෙනි, ඔබගේ භාර්‍යාවගේ බුද්ධිමත්බව සහ ඔබ සමග සැබෑ කොටස්කාරියක් ලෙස, පවුලේ සැලසුම්, පවුලේ ක්‍රියාකාරකම්, සහ පවුලේ අයවැය ගැන ඇය සතු හැකියාව හඳුනාගන්න.

ඇයට බුද්ධිමත්වද, චෛතසිකව සහ සමාජමය මෙන්ම ආත්මිකවද දියුණුවීමේ අවස්ථාව ලබාදෙන්න.

සොහොයුරෙනි, ප්‍රේමය කුඩා සංකේතවලින් පෝෂණය කළ හැකි බව මතකතබාගන්න. විශේෂිත අවස්ථාවන්හිදී මල් කළඹක් අපූරුය. නමුත් අපි කැමැත්තෙන්ම පිඟන් සේදීම, සනීපාරක්ෂක ළමා ඇඳුම් මාරුකිරීම, රාත්‍රියේදී ළමයෙකු හඬන විට නැගිටීම, රාත්‍රී අහාරගන්නා විටදී රූපවාහිනිය හෝ පුවත්පත් නොබැලීද එලෙසම අපූරුය. ඒවා අපගේ ක්‍රියා තුලින් "මම ඔබට ප්‍රේමකරමි" යයි පැවසීමේ නිහඬ මාර්ග වන්නේය. එවැනි කුඩා උත්සා හයන් තුලින් බොහෝ වටිනා ප්‍රතිඵල ලැබෙන්නේය.

මේ අන්දමේ පූජකවරයේ නායකත්වය ඔබගේ බිරිඳට මෙන්ම ඔබගේ ළමුන්ටද අදාළවේ.

### නිවස තුල පියෙකුගේ කාර්‍යභාරය

මවකගේ වැඩ කොටස නිවසේ හදවත මෙන් වැදගත් කාර්‍යභාරයකි. නමුත් නිවසේ ප්‍රධානියා ලෙස පියෙකු විසින් කළ යුතු, පෝෂණයකිරීම, පුහුණුකිරීම, සහ ඔවුන්ගේ ළමුන්ට ප්‍රේමකිරීමේ එකසමාන වැදගත් කාර්‍යභාරය එමගින් කිසිසේත්ම අඩුනොවේ.

ඔබගේ නිවසේ ආදි පීතෘවරයා ලෙස, ඔබගේ ළමයින් සමග කටුයුතුකරමින් නායකත්වය ක්‍රියාත්මක කිරීමේ බරපතල වගකීමක් ඔබට ඇත. ස්වාමීන්වහන්සේගේ ආත්මය වාසයකරන නිවසක් නිර්මානයකිරීමට ඔබ උදව්කළ යුතුය. ඔබගේ ස්ථානය වන්නේ පවුල් ජීවිතය මුළුල්ලේම මගපෙන්වීම දීමය. පවුල් නීති සහ හික්මීම ගොඩනැගීමට ඔබ ක්‍රියාකාරී කොටසක් කළ යුතුය.

ඔබගේ නිවාස ඔබගේ පවුල සඳහා සමාදානය සහ සතුට ඇති ස්වර්ග විය යුතුය. සැබවින්ම කිසිදු ළමයෙක් තමාගේම පියාට—විශේෂයෙන්ම පූජකවරයේ පියාට බියවිය යුතු නැත. පියෙකුගේ රාජකාරිය වන්නේ ඔහුගේ නිවස ප්‍රීතිය සහ සතුට ඇති ස්ථානයක් කිරීමය. එහි

සණ්ඩු දබර, වාද විවාද හෝ අධර්මිෂ්ඨ හැසිරීම තිබෙන විට ඔහුට එය කළ නොහැක. ධර්මිෂ්ඨ පියවරු ආදර්ශමත් වීමෙන් ඇතිවන බලවත් ප්‍රතිපල වන හික්මවීම, සහ පුහුණු කිරීම, පෝෂණයකිරීම සහ ප්‍රේමකිරීම ඔහුගේ ළමයින්ගේ ආත්මික සුභාසාධනයට වැදගත්වේ.

**ආත්මික නායකත්වය දෙන්න**

ඉශ්‍රායෙල් පියවරුන්ට මගේ හදවතේ ප්‍රේමය සමග, පියවරුන්ට ඔවුන්ගේ ළමයින්ට ආත්මික නායකත්වය දිය හැකි විශේෂ මාර්ග දහයක් මම යෝජනා කරමි.

1. ඔබගේ ළමයින්ට පීතෘ ආශිර්වාදය දෙන්න. ඔබගේ ළමයින් බව්තීස්මකර ස්ථිරකරන්න. ඔබගේ පුතුන් පූජකවරයට පත්කරන්න. මේවා ඔබගේ ළමයින්ගේ ජීවිතවල වැදගත් සිද්ධීන් බවට පත්වෙනු ඇත.

2. පවුලේ යාච්ඥාව, දිනපතා ශුද්ධ ලියවිලි කියවීම, සහ සතිපතා පවුල් නිවාස සැන්දෑවන් පෞද්ගලිකවම මෙහෙයවන්නෙ. ඔබ පෞද්ගලිකවම මැදහත්වීම මගින් සැබැවින්ම මෙම ක්‍රියාකාරකම් කෙතරම් වැදගත්දැයි ඔබගේ ළමුන්ට පෙන්වාදෙයි

3. හැකි සෑම විටකම, සභා රැස්වීම්වලට පවුලක් මෙන් එක්ව සහභාගිවන්න. ඔබගේ නායකත්වය යටතේ පවුලේ නමස්කාරය ඔබගේ ළමයින්ගේ ආත්මික සුභසාධනයට වැදගත්වේ.

4. පියා-දියණි දිනවලට සහ පියා-සහ-පුතුන්ගේ ගමන්වලට ඔබගේ ළමයින් සමග යන්න. පවුලක් ලෙස, කඳවුරු ගමන් සහ විනෝද ගමන්වලට, ක්‍රීඩා තරඟ සහ පුහුණුවීම්වලට, පාසල් වැඩසටහන්වලට, යනාදියට යන්න. පියා සිටීමෙන් පූර්ණ වෙනසක් ඇතිකරයි.

5. පවුලේ නිවාඩු ගමන්, විනෝද ගමන් සහ ගමන් චාරිත්‍ර ගොඩනගන්න. මෙම මතකයන් ඔබගේ ළමයින් කිසිදා අමතක නොකරනු ඇත.

6. ඔබගේ ළමයින් එකිනෙකා බැහැදැකීම නිතිපතා කරන්න. ඔවුන් කැමති දෙයක් කථාකිරීමට ඔවුන්ට ඉඩදෙන්න. ඔවුන්ට සුභාරංචි මූලධර්ම උගන්වන්න. සැබෑ වටිනාකම් ගැන ඔවුන්ට උගන්වන්න. ඔබ ඔවුන්ට ප්‍රේමකරන බව කියන්න. ඔබගේ ළමයින් සමග පුද්ගලිකව කාලය වැයකිරීමෙන් පියාගේ ප්‍රමුඛත්වයන් ගැන ඔවුන්ට කියාදෙනු ලබයි.

7. ඔබගේ ළමයින්ට වැඩකිරීමට උගන්වා. සුදුසු ඉලක්කයක් කරා වැඩකිරීමේ වටිනාකම ඔවුන්ට පෙන්වා දෙන්න. ඔබගේ ළමයින් සඳහා දූත මෙහෙය අරමුදල් සහ අධ්‍යාපනික අරමුදලක් ගොඩනැගීමෙන් පියා වැදගත් ලෙස සලකන්නේ මොනවාදැයි ඔවුන්ට පෙන්වා දෙන්න.

8. ඔබගේ නිවාස තුල යහපත් සංගීතය, කලා සහ පොත්වලට දිරිගන්වන්න. සුචරිතමත් සහ අලංකාරවත් ආකල්පයකින් යුත් නිවාස ඔබගේ ළමයින් සදාකාලයටම ආශිර්වාදිත කරනු ඇත.

9. ඉතා ඈතක නොවේ නම්, ඔබගේ බිරිඳ සමග ක්‍රමානුකූලව දේවමාළිගාවට සහභාගිවන්න. එවිට ඔබගේ ළමයින්ට දේවමාළිගා විවාහය සහ දේවමාළිගා පොරොන්දු සහ සදාකාලික පවුල් ඒකකවල වැදගත්කම ගැන හොඳින් තේරුම්ගනු ඇත.

10. සභාවට සේවයකිරීමෙන් ඔබගේ සතුට සහ තෘප්තිය දැකගැනීමට ළමුන්ට සලස්වන්න. මෙය ඔවුන්ටද බෝවීමෙන්, එනිසා ඔවුන්ද, සභාවේ සේවයකිරීමට වුවමනාවී, රාජ්‍යයට ප්‍රියකරනු ඇත.

**ඔබගේ වඩාත් වැදගත් කැඳවීම**

ඕ, ඉශ්‍රායෙල් ස්වාමිපුරුෂයන් සහ පියවරුනි, ඔබගේ පවුල්වල ගැලවීම සහ උත්කර්ෂය සඳහා ඔබට බොහෝ දේවල් කළ හැකිය! ඔබගේ වගකීම් එතරම්ම වැදගත්ය.

ඉශ්‍රායෙල් පියෙක් ලෙස ඔබගේ පූජනීය කැඳවීම—මෙලොව සහ සදාකාලය දක්වා වන ඔබගේ ඉතා වැදගත් කැඳවීම— එය ඔබව කිසිදා මුදා නොහරින කැඳවීමක් බව මතකතබාගන්න.

ඔබගේ පවුලේ ලෞකික අවශ්‍යතාවයන්, ඔබගේ සදාකාලික සහකාරිය ඔබ අසල තබාගනිමින් සපයාදීමට ඔබට හැකිවේවා, ඔබගේ නිවස තුල ආත්මික නායකත්වය සැපයීමේ ඔබගේ පූජනීය වගකීම ඉටුකිරීමට ඔබට හැකිවේවා,

ඔක්තෝබර් 1987 President බෙන්සන් විසින් Priesthood සැසිවාරයකදී කළ කථාවකිනි, Church General Conference හි (බලන්න Conference Report, ඔක්තෝ. 1987, 59–63; හෝ *Ensign*,නොවැ. 1987, 48–51).

# පියවරුන්ගේ සහ මවුවරුන්ගේ පූජනීය කාර්යභාරය 11

*2වන කොටසඃ මවුවරුන්ගේ කාර්යභාරය*

## අදාළකරගැනීම සඳහා අදහස්

ඔබගේම අවශ්‍යතාවයන් සහ තත්වයන් අනුව, මෙම යෝජනා එකක් හෝ දෙකම අනුගමනයකරන්න.

- පවුල නම් ප්‍රකාශනය තුල, "පියවරුන්ට සහ මවුවරුන්ට සම කොටස්කරුවන් ලෙස එකිනෙකාට උපකාරකිරීමේ යුතුකමක් තිබෙන බවට" අපට උපදෙස් දෙනු ලැබේ (මෙම උපදෙස් පොතේ iv පිටුව බලන්න). ඔබගේ සහකාරිය සමග මෙම උපදෙස් පොතේ පිටු 41–42 එන සභාපති එස්රා ටැෆ්. බෙන්සන්ගේ පියවරුන් සඳහා වන යෝජනා 10 සහ මවුවරුන් සඳහා වන යෝජනා 10 පිටු 45–47 නැවත කියවන්න. එකට වැඩකරමින් මෙම වගකීම් ඉටුකිරීමට එකිනෙකාට සහයෝගය දිය හැකි මාර්ග ගැන සාකච්ඡාකරන්න.
- ඔබගේ මවට හෝ ආච්චීට ලිපියක් ලියන්න.

## කියවීමේ පැවරුම

පහත සඳහන් ලිපිය කියවන්න. ඔබ විවාහක නම්, ඔබගේ සහකාරිය සමග ලිපිය කියවා සාකච්ඡාකරන්න.

### "මක්නිසාද ඇය මවක් නිසාය"

වැඩිහිටි ජෙෆ්රි ආර්. හොලන්ඩ්
ප්‍රේරිතවරුන් දොළොස්දෙනාගේ ගණපූර්ණය

#### මවුවරුන්ට උපහාරයක්

වික්ටර් හියුගෝට ගුණවාචකවූ පේළි කිහියක් ඇති අතර එයින් මෙසේ කියවේඃ

"ඇය පාන් කෑලි දෙකකට කඩා. ඒවා තම ළමයින්ට දුන්නාය. ඔවුහු ඒවා ඉතා ආශාවෙන් කෑවෝය. 'ඇය තමාට කිසිවක් තබාගත්තේ නැත,' යයි සාජන්වරයා මැසිවිලි කීය.

"'මක්නිසාද ඇයට කුසගිනි නැති නිසාය,' සොල්දාදුවෙක් කීවේය.

"'නැත,' සාජන්වරයා කීවේය, "මක්නිසාද ඇය මවක් නිසාය.'"

අයිවෝ, නෙබ්රෙස්කා සහ වයෝමින් හරහා අසීරු අති දුෂ්කර ගමනක් නිමකළ අයගේ ඇදහිල්ල සහ නිර්භීතභාවය අප විසින් සමරන මෙම වසර තුලදී, එම දීර්ඝ ගමනේදී තම දරුවන් රැකගනිමින්, ඔවුන් වෙනුවෙන් යාච්ඤාකරමින්, මෙන්ම නිතරම මෙන් තම බිළිඳුන් මිහිදන්කරමින් පැමිණි එම පුරෝගාමී මවුවරුන්ගේ නූතන ප්‍රතිරූපයන්ට උපහාර දැක්වීමට මම කැමැත්තෙමි. මගේ කටහඬ ඇසෙන මානයේ සිටින මව්වරුන් වීමට ආදරයෙන් බලාටින හෝ එසේ නැති අයට, එම මාතෘකාව ගැන ඔබේත්, මාගේත් කඳුළු අතරින් මම මෙසේ කියමි, දෙවියන්වහන්සේ තවමත්, ඉදිරිකාලයේ තිබෙන යම් දිනෙක "හුදකලාවූ සිත[ට] බලාපොරොත්තුවක්" ගෙනදෙන බව මම කියමි.[1] අනාගතවක්තෘවරුන් මෙම දේශනාකුඩව තුල සිට නැවත නැවත ඉගැන්වූ පරිදි, අවසානයේදී ඇදහිලිමතුන්ගෙන් ආශිර්වාද ක්ෂණයකින් නොපැමිණුනද, "කිසිදු ආශිර්වා දයක් නවතාගන්නේ නැත"[2] ඒ අතරතුර, පෝෂණයකිරීමේ කැඳවීම අපගේ දරුවන්ට පමණක් සීමා නොවීම ගැන අපි සතුටුවෙමු.

මවුවරුන් ගැන කථාකිරීමේදී පියවරුන්ගේ ඉතා වැදගත්, අත්‍යාවශ්‍ය කාර්යභාරය ගැන, විශේෂයෙන්ම "අපගේ කාලයේ ප්‍රධාන සමාජ ප්‍රශ්නයක්" ලෙස සමහ රෙක් සිතන පියානොමැති නූතන නිවාස මම අතපසු නොකරමි.[3] ඇත්තවශයෙන්ම, පියානොමැතිවීම, පියා සිටින නිවෙස්වල පවා—කැමගැනීම සහ නිදාගැනීම, "දුරස්ථ පාලකයකින්" කථාකිරීම වැනි ප්‍රශ්නයක් විය හැකිය. නමුත් එය වෙනත් දිනයක පූජකවරයේ පණිවුඩයක් සඳහාය. අද මා ප්‍රශංසාකිරීමට බලාපොරොත්තු වන්නේ බිළිඳුන්ගේ තොටිල්ල පැදවූ මාතෘ අත්වලටය. එහිදී තම දරුවන්ට ධර්මිෂ්ඨකම තුලින් ඉගැන්වූ ඔවුහු, මැරෙන සුළු ජීවිතයේ අප සඳහා වන ස්වාමීන්වහන්සේගේ අරමුණෙහි හරි මැද සිටිති.

එසේ කථාකරමින් මම පාවුළු තුමාගේ නාදය අසමි. ඔහු තිමොතිවරුන්ගේ අව්‍යාජ ඇදහිල්ලට ප්‍රශංසාකරමින් ලිවීය…, "ඒ ඇදහිල්ල පළමුකොට" යයි ඔහු කීවේය. "නුඹේ ආච්චිවූ ලොයිස් තුළද, නුඹේ මෑණියන්වූ එවුනීකි [තුළද] වාසය කළාය"[4] "[නුඹගේ බාල වයසේ පටන්] නුඹ ශුද්ධ ලියවිලි දැනගෙන සිටියෙහිය" ඔහු කීවේය.[5] අපි සියලුම මවුවරුන්ට සහ ආච්චිලාට එවැනි යුගවල එවන් සත්‍යයන් දැනගැනීමට සැලසීම වෙනුවෙන් අපගේ ස්තුතිය පුදකරන්නෙමු.

### තරුණ මවුවරුන් විසින් කළ පරිත්‍යාග

සාමාන්‍ය මවුවරුන් ගැන කථාකරමින්, මම විශේෂයෙන්ම තරුණ මවුවරුන්ට ප්‍රශංසාකරමින්, දිරිගැන්වීමට කැමැත්තෙමි. මවකගේ කටයුතු අසීරුය, ඒවා නිතරම මෙන් අගය නොකරන කටයුතුය. තරුණ කාලය ස්වාමිපුරුෂයා හෝ භාර්යාව—හෝ දෙදෙනාම වුවත් තවදුරටත් පාසලේ සිටිය හැකිය, නැතහොත් ස්වාමිපුරුෂයා රැකියා තත්වයන් දියුණුකරන එම මුල් හෝ දීර්ඝ අවධියේ හෝ සිටියි. දිනපතාම පවුලේ මුදල් තත්වය අඩුවෙමින් හෝ කිසිවක් නැති තත්වයට හෝ පත්වෙයි. නිවස සාමාන්‍යයෙන් ලක්ෂණ මෝස්තර එකකින් හෝ දෙකකින් යුත්—පරණ ලී බඩුවලින් සරසා ඇත. නැතහොත් ඒවා ඇත්තේම නැති හෝ විය හැකිය. මෝටර් රථය, එවැන්නක් තිබේ නම්, තුනීවී ගිය ටයර්වලින් හෝ හිස් ටැන්කියකින් යුතුව දුවයි. නමුත් රාත්‍රී කිරිදීම නිතරම සියල්ලටම වඩා තරුණ මවකට විශාලතම අභියෝගය වන්නේ නිකම් වෙහෙසවීම පමණය. මෙම කාලය තුළදී, මවුවරු බොහෝ විට නිදි නැතිව සිටිමින්, මගේ ජීවිතයේ මා දන්නා වෙනත් කිසිදු කණ්ඩායමකට වඩා තම පෞද්ගලික වාසිය අඩුවෙන් ලබමින් අන් අය හට වැඩියෙන් දෙන්නෝය. ඔවුන්ගේ ඇස් යට ඇති කළු පැල්ලම් සමහර අවස්ථාවලදී බොහෝ විශාල ඒවා වෙයි.

ඇත්තවශයෙන්ම මෙය නිතරම කැඳවීමක් දීමට අපට වුවමනාවන—හෝ කොට්ටාශයේ සහ ස්ටේක් උපශාඛාවල සේවය සඳහා—කැඳවීමට අවශ්‍ය සොහොයුරියක් වීම කණගාටුවකි. එය තේරුම්ගත හැකිය. සෑම කෙනෙක්ම, ඥානවන්තවීම සඳහා, මෙම තරුණ ලොයිස්ලා සහ එවුනිකීලාගේ ආදර්ශය ගැනීමට වුවමනා නොවන්නේ කාටද? පවුල් විශේෂයෙන්ම එම හැඩගැස්වෙන කාලයේදී, අන් සෑමදේකටම වඩා ඉහළම ප්‍රමුඛත්වය ලැබිය යුතු බව මතකතබාගන්න. එසේවුවද, තරුණ මවුවරු සභාව තුල ඇදහිලිමත්ව සේවයකිරීමට තවදුරටත් විශිෂ්ඨ මාර්ග සොයන අතර, අන් අය සේවයකරමින් ඒ අන්දමින්ම ඔවුන්ව සහ ඔවුන්ගේ පවුල් ශක්තිමත් කරති.

මේ කාලය තුළදී හැකි පමන හොඳින් කටයුතු කරන්න. නමුත් ඔබ කරන වෙනත් දේවල්වලින් එම කාර්‍යභාරය ගැන ප්‍රීතිවෙමින්, එම කාර්‍යභාරය එතරම්ම අද්විතීය බැවින් ඒ සඳහා ස්වර්ගයෙන්ම ඔබ සහ ඔබගේ කුඩා දරුවන් රැකබලාගැනීමට දේවදූතයන් එවනු ලබයි. ස්වාමිපුරුෂයන්—විශේෂයෙන්ම ස්වාමිපුරුෂයන්—සභා නායකයන් මෙන්ම මිතුරන්ද හැම පැත්තකින්ම උපකාරවත්වී, සංවේදීව ඥානවන්තවන්න. "ස්වර්ගයෙන් යට සෑමදෙකටම, සහ සෑම අරමුණකටම, කාලයක් සහ වෙලාවක් ඇතිබව" මතකතබාගන්න.[6]

මවුවරුනි, ඔබගේ සෑම පියවරකම ඇති ඔබගේ ඇදහිල්ල අපි පිළිගෙන වැදගත් කොට සලකමු. එය එදාටත්, දැනට සහ සදාකාලයටම වටිනා බව කරුණාකර දැනගන්න. තවද කුමන කාලයක වුවද, ඔබ මෙම නිර්භීත උත්සාහය,ඔබ සමග ඔබගේ ස්වාමිපුරුෂයා නොමැතිව තනිවම ගන්නේනම්, එවිට ඔබ සඳහා අපගේ යාච්ඤා සියල්ලටම වඩා ශ්‍රේෂ්ඨව, අපගේ සවන්දීමේ සහ උපකාරකිරීමේ අධිෂ්ඨානය වඩාත් ස්ථිරවනු ඇත.

### මවුවරු දෙවියන්වහන්සේගේ වැඩ කරති

එක් තරුණ මවක් මෑතකදී කරුණු තුනක් සනාථක රගැනීමට ඇය තුළ ඇති මහත් ආශාව ගැන මට ලියුවාය. එකක් නම්, පදගු මාතෘත්වය ගැන කතා ඇය අසන විට, තම කටයුතු කරගැනීමට අවශ්‍ය හැකියාව ඇයට නැති බව හැඟෙන නිසා ඇය කණගාටුවීමය. දෙවැන්න, තම ළමයින්ට කියවීම, ලිවීම, අභ්‍යන්තර මෝස්තර, ලතින්, කැල්කලස්, සහ අන්තර්ජාලය ඉගැන්වීම ලෝකයා තමාගෙන් අපේක්ෂාකිරීම තමාට හැඟෙන බවය. එම සියල්ලම කළ යුත්තේ බිළිඳා සමාන්‍ය ලෙස කථාකිරීමටත් පෙරය. මන්ද, ඇයට ලැබුන උපදේශ හෝ ඇයට ලැබුන ප්‍රශංසා මගින් මානසික ප්‍රයෝජනයක්, ආත්මික සහ චෛතසික ප්‍රයත්නයක් සහ මුළු දහවලත් මුළු රාත්‍රියත් පෞද්ගලිකව වැය කලද ප්‍රයෝජනයක් නොවන බව පෙනීම සහ සමහර අවස්ථාවලදී ඇය දේව මාතාවක්වීමට උත්සාහකිරීම සහ එසේ වීමට අපේක්ෂාකිරීමද පෙනෙන්ට තිබීම නිසාය.

නමුත් එක දෙයක් නම්, යයි ඇය තවදුරටත් ලියා තිබිනා "මෙම හොඳ සහ නරක කාලය තුලදී, එසේම විටින් විට ඒ සියල්ලේම කඳුලින් යුතුව, *මා කරන්නේ දෙවියන්වහන්සේගේ කටයුතු බව ඇතුලාන්තයේ ගැඹුරින්ම මම දනිමි.* දෙවියන්වහන්සේගේ සමහර දරුවන් උන්වහන්සේව හැඬීමට සැලැස්සුවද, දෙමාපියෙක් වීම මගින් උන්වහන්සේගේ අවසාන අරමුණ සහ අර්ථය ගැන මම ගැඹුරින්ම දනිමි.

"මෙම අවබෝධය අනුව" යයි ඇය කියමින්, "මේ සියල්ලම මඳක් මා යටපත්කරන විට, එම අනිවාර්‍ය අසීරු දවස් ගැන සිහිපත්කිරීමට මම උත්සාහ කරමි. සමහරවිට එය නියතලෙසම උන්වහන්සේ වෙත ලඟාවී, අපවෙත නැවත ඒමට, උන්වහන්සේගේ හැකියාව වැඩිකිරීමට අපගේ නොහැකියාව සහ උනන්දුව අපගෙන් ඉල්ලනවා විය හැකිය. සමහරවිට, අපි උත්සුකවීම එතුමා රහසින් බලාපොරෝතුවනවා විය හැකිය" ඇය කීවාය, "එසේම අපි එතුමාගේ උපකාර ඉල්ලන්නෙමු. එවිට, මෙම ළමුන්ට අප තුලින්, කිසිදු විරුද්ධත්වයක් නොමැතිව කෙලින්ම ඉගැන්වීමට එතුමාට හැකි බව, මම විශ්වාස කරමි. එම අදහසට මම කැමැත්තෙමි" කියමින් ඇය අවසන් කරයි, "එය මා තුල බලාපොරොත්තු ඇතිකරයි. මගේ ස්වර්ගයේ වැඩසිටින පියාණන් ඉදිරිපිට, මට ධර්මිෂ්ඨව ජීවත්විය හැකි නම්, සමහරවිට අපගේ ළමයින් සඳහා වන එතුමාගේ මගපෙන්වීම්වලට බාධා නොවනු ඇත. සමහරවිට එවිට, ඉතා සත්‍ය ලෙසම එය උන්වහන්සේගේ වැඩ සහ උන්වහන්සේගේ මහිමය වීමට පුළුවන."[7]

### ඔබගේ ළමයි ඔබ ආශිර්වාදිතබව කියති

එවැනි අන්දමේ ආලෝකයක් තුලින්, පැහැදිළිව පෙනෙන්නේ මෙම ඇස් යට විශාල ලප පැමිණෙන්නේ, ළමුන් බලාගැනීමෙන් සහ ළමුන් පාසල් ප්‍රවාහනය කිරීම

නිසාම නොව, නමුත් ආත්මය සෝදිසිකිරීමට නිදි නැති රාත්‍රී කිහිපයක් ගතකිරීමත්, දෙවියන්වහන්සේට අවශ්‍ය පරිදි මෙම ළමුන් ඇතිදැඩි කිරීමට උත්න්දුවෙන් හැකියාව සෙවීම නිසා බවය. එම අන්දමේ කැපවීමක් සහ අධිෂ්ඨානයකින් කටයුතුකිරීම මගින්, සියලුම මවුවරුන්ට පොදුවේ ස්වාමීන්වහන්සේගේ නාමයෙන් ඔබ විශිෂ්ඨ බව මම කියමි. ඔබ අතිශය හොඳින් කටයුතු කරයි. ඔබට එවැනි වගකීමක් ලබාදීමේ එකම කාරණාව නම්,ඔබගේ ස්වර්ගය් වැඩසිටින පියාණන්වහන්සේ ඔබ තුල තබා ඇති විශ්වාසයේ සදාකාලක සාක්ෂියයි. ඔබ දරුවෙකුට උපත ලබාදීමේ ඔබ සියල්ල දත් කෙනෙකු බවට පත් නොවන බව එතුමා දන්නාසේක. ඔබ සහ ඔබගේ ස්වාමිපුරුෂයා දෙවියන්වහන්සේට ප්‍රේමකිරීමට පරිශ්‍රමදරමින් සුභාරංචිය අනුව ජීවත්වන්නේ නම්; ඇදහිලිමතුන්ට ශුද්ධාත්මයාණන් පොරොන්දුවන එම මගපෙන්වීම සහ සැනසීම සඳහා ඔබ ආයාචනා කරන්නේ නම්; ඔබ දෙදෙනාම දේවමාළිගාවට ගොස් මෙම ලෝකයේ කාන්තාවක් හෝ මිනිසෙක් තැබිය හැකි වඩාත් පූජනීය ගිවිසුම්වල පොරොන්දු තබමින් ඒවා ඉල්ලාසිටීමට හැකි නම්; ඔබගේ දරුවන්ද ඇතුළුව, අනුකම්පාව සහ ස්වර්ගයෙන් පෙන්වීම ඔබට අවශ්‍යවන කමාදීමේ හදවතක්, ඔබ අන් අයටද පෙන්වන්නේ නම්; හොඳ සහකරුවෙක් වීමට ඔබට හැකි පමන හොඳින් උත්සාහ කරන්නේ නම්, මනුෂ්‍යයෙකුට කළ හැකි සියල්ල ඔබ කර ඇති අතර, දෙවියන්වහන්සේ ඒ සියල්ල ඔබෙන් අපේක්ෂාකරනසේක.

සමහර අවස්ථාවලදී ළමයෙකුගේ හෝ මුනුපුරෙකුගේ තීරණය ඔබගේ හදවත කඩනු ඇත. සමහර අවසථාවලදී අපේක්ෂාවන් ක්ෂණයකින් ඉටුනොවනු ඇත. සෑම මවක් සහ පියෙක්ම ඒ ගැන කණගාටු වෙති. එම ආදරණීය සහ ශ්‍රේෂ්ඨ ලෙස සාර්ථක දෙමාපියෙක්වූ සභාපති ජෝසෆ් එෆ්. ස්මිත් මෙසේ ආයාචනාකරයි, "අහෝ! දෙවියනි, මගේම අය මාගෙන් අහිමි නොකරන්න.'[8] එය සෑම දෙමාපියෙකුගේම අඳෝනාව වන අතර, එය සෑම දෙමාපියෙකුගේම කිසියම් බියක්දවේ. නමුත් උත්සාහකළ සහ යාච්ඤාකල කිසිවෙක් අසමත්වී නැත. ඔබට කලින් සිටි මව් පරම්පරාවේ සිටි අය ඔබගේම පැතුම් ඇතිව සහ ඔබට ඇති බියම ඇතිව සිටියාක් මෙන්, ඔබගේ ළමයි ඔබගේ නම ආශිර්වාදිතබව කීම අවසානයේදී ධෛර්‍යමත්ව දැනගැනීමට සෑම අයිතිවාසිකමක්ම ඔබට ඇත.

මනුෂ්‍ය පවුලේ සියලුදෙනාගේම මව වන, ඒවාගේ උදාර සංස්කෘතිය ඔබගේය, "මිනිසුන් [සහ කාන්තාවන්] සතුට ඇතිවන පිණිස"[9] ඇයට සහ ආදම්ට වැටීමට සිදුවුන බව ඇය තේරුම්ගත්තාය. තවද සතුට තිබිය යුතුය. සාරා, සහ රෙබෙකා සහ රේබල්ගේ උදාර සංස්කෘතිය ඔබගේය, ඔවුන්ගෙන් තොරව ආබ්‍රහම්, අයිසෙක් සහ යාකොබ්ට ඔවුන් ආශිර්වාදිතවූ එම විශිෂ්ඨ ආදි පීතෘ පොරොන්දු නැතිවීමට ඉඩ තිබුනි. ලොයිස් සහ එව්නිකී සහ ගැටවරයන් 2,000කගේ මවුවරුන්ගේද සංස්කෘතිය ඔබගේය. මෙම ලෝකය ඇතිවීමට පෙර සිටම තෝරා පත්කර, දේව පුත්‍රයාණන් පිළිසිඳ, උසුලා, දරාසිටීමට පූර්ව නියමකළ මරියාගේ සංස්කෘතිය ඔබගේය. අපි ඔබ සියලුදෙනාටම, අපගේම මවුවරුන්ද ඇතුළුව, ස්තුති කරමින්, මෙසේ කියන්නෙමු, දෙවියන්වහන්සේගේ වැඩවලට සහ මහිමයට එතරම් සෘජුව සහභාගිවෙමින්, එතුමාගේ දියණියන්ට සහ පුත්‍රයන්ට මැරෙන සුළුබව සහ පෙළොවේ ජීවිතය ලබාදෙමින්, අමරණීය බව සහ සදාකාලික ජීවනය එම ඉහළින් පිහිටි සෙලෙස්ටියල් රාජ්‍යයන්වලදී ලබාදීම තරම් ඉතා වැදගත් වෙනත් කිසිවක් මෙම ලෝකයේ තවත් නැත.

**සදාකල්හිම ගැලවුම්කරුවාණන් මත විශ්වාසය තබන්න**

ඔබ නිහතමානීව හදවතේ යටහත් පහත් කමින් යුතුව ස්වාමීන්වහන්සේ වෙතට පැමිණිවිට, එක් මවක් කී පරිදි, "ස්වර්ගයේ දොරටුවලට තට්ටුකර මෙම අපූර්ව කාර්‍යයට අවශ්‍ය මගපෙන්වීම, ප්‍රඥාව සහ උපකාරය ඉල්ලා ආයාචනාකළ විට," එම දොරටු විවරවී සියලු සදාකාල යටම අවශ්‍ය බලය සහ උපකාරය ඔබට ලැබෙනු ඇත. ලෝකයාගේ ගැලවුම්කරුවාණන්ගේ පොරොන්දු ඉල්ලා සිටින්න. ඔබ හෝ ඔබගේ ළමයින් පීඩාවිඳින ඕනෑම ප්‍රශ්නයකදී වන්දිගෙවීමේ සුවකිරීමේ ආලේපය ඉල්ලා සිටින්න. ඇදහිල්ල තුලින් ඔබ හෝ, වඩාත් නිවැරදිව, ඔබ නිසා, සියල්ලම නිවැරදි කරනු ඇත.

ඔබට මෙය තනිවම කිරීමට හැකියාවක් නැත. නමුත් ඔබට උපකාර ඇත. ස්වර්ගයේ සහ පොළොවේ ආචාරීන්වහන්සේ ඔබට ආශිර්වාදකිරීමට සිටිනසේක—නැතිවුන බැටළුවන් සොයා නිර්භීතව යන්නේ එතුමාය, නැතිවුන කාසිය සෑම තැනම සොයන්නේ එතුමාය, අකීකරු පුත්‍රයා නැවත එන තුරු සදාකාලිකවම බලාසිටින්නේ එතුමාය. ගැලවීමේ කටයුතු ඔබගේය, තවද එමනිසා ඔබ උසස්කර, වන්දිගෙවා, අවංකව උත්සාහයන් දරන විට, ඔබ සිටියාට වඩා හොඳින් වෙනස්කරනු ඇත. කෙතරම් දුර්වල වුවද එය සමහර අවස්ථාවල ඔබට හැඟෙනු ඇත.

මතකතබාගන්න, ඔබගේ මාතෘත්වයේ සියලුම දවස් මතකතබාගන්නඃ "ක්‍රිස්තුස්වහන්සේ තුල නොසැලෙන විශ්වාසයෙන් යුක්තව, ගැලවීමේ මහා බලසම්පන්නවූ උන්වහන්සේගේ කුසල් කෙරෙහි සම්පූර්ණ විශ්වාසය තබමින්, උන්වහන්සේගේ වචනය මගින් හැර, නුඹලා මෙතරම් දුරක් නොපැමිණියාහුය." [10]

උන්වහන්සේ මත විශ්වාසය තබන්න. උන්වහන්සේ මත තදබල ලෙස විශ්වාසය තබන්න. සදහටම උන්වහන්සේ මත විශ්වාසය තබන්න. තවද "ක්‍රිස්තුස්වහන්සේ තුල ස්ථිරව, සම්පූර්ණ ආලෝකමත් බලාපොරොත්තුවකින්ද, ඉදිරියටම යා යුතුය." [11] ඔබ කරන්නේ දෙවියන්වහන්සේගේ වැඩකටයුතුය. ඔබ එය අපූර්ව ලෙස හොඳින් කරයි. එතුමා ඔබට ආශිර්වාද කරමින් සිටින අතර, එතුමා ඔබට ආශිර්වාදකරනසේක. එසේවුවද—ඔබගේ දිනයන් සහ ඔබගේ රාත්‍රිකාලයන් ඉතා අභියෝගාත්මක වුවද. එහි—විශේෂත්වයක් නැත. නිර්නාමිකව, නිහතමානීව, සමහරවිට පසුබටව සහ ලජ්ජාශීලීව, ආචාරීන්වහන්සේගේ වස්ත්‍රයේ වාටිය ඇල්ලීමට සෙනග අතරින් අසීරුවෙන් ගිය කාන්තාවට මෙන්, මවුවරුන් ලෙස ඔවුන්ගේ වගකීම් වෙනුවෙන්

කණගාටුවී, කල්පාකරමින්, සමහර අවස්ථාවලදී හඩාවැටෙන අයට, ක්‍රිස්තුස්වහන්සේ මෙසේ කියනසේක, "දියණිය, හොඳ සැනසීමෙන් සිටින්න, නුඹගේ ඇදහිල්ල නුඹව සුව කළේය."[12] තවද එය ඔබගේ දරුවන්ද සුවකරනු ඇත.

වැඩිහිටි හොලන්ඩ් විසින් 1997 අප්‍රේල් මස Church General Conference හි තුල කළ කථාවකිනි (බලන්න Conference Report, අප්‍රේ. 1997, 46–49; හෝ *Ensign,* මැයි 1997, 35–37).

සටහන්

1. "ඉශ්‍රයෙල් Redeemer," *Hymns,* අංක. 6; තවද බලන්න 3 Nephi 22:1.
2. බලන්න Joseph Fielding Smith, *Doctrines of Salvation,* සකස්. Bruce R. McConkie, 3 වෙළුම. (1954–56), 2:76;[1] Harold B. Lee, *Ye Are the Light of the World: Selected Sermons and Writings of President Harold B. Lee* (1974), 292;[2] සහ ගෝර්ඩන් බී. හින්ක්ලි, Conference Report තුලිනි, අප්‍රේ. 1991, 94.
3. Tom Lowe, "Fatherlessness: The Central Social Problem of Our Time," Claremont Institute Home Page Editorial, ජන. 1996.
4. 2 තිමොති 1:5.
5. 2 තිමොති 3:15.
6. දේශනාකාරයා 3:1.
7. පෞද්ගලික ලිපි
8. ජෝසෆ් එෆ්. ස්මිත් , *Gospel Doctrine,* 5වෙනි ප්‍රකා. (1939), 462.
9. 2 නිෆායි 2:25.
10. 2 නිෆායි 31:19.
11. 2 නිෆායි 31:20.
12. මතෙව් 9:22.

## සයෝනයේ මවුවරුන් වෙතටය

සභාපති එස්රා ටැෆ්ට් බෙන්සන්
සභාවේ 13වෙනි සභාපතිවරයා

සයෝනයේ මවුවරුනි, දෙවියන්වහන්සේ ඔබට ලබාදී තිබෙන කාර්‍යභාරයන් ඔබගේම උත්කර්ෂයට සහ ඔබගේ පවුලේ ගැලවීමට සහ උත්කර්ෂයට ඉතාමත් වැදගත්වන්නේය. ළමයෙකුට තම මව, මුදලට ගත හැකි සියල්ලට වඩා අවශ්‍යවේ. ඔබගේ ළමයින් සමග කාලය ගතකිරීම සියල්ලටම වඩා ශ්‍රේෂ්ඨතම දීමනාව වන්නේය.

සයෝනයේ මවුවරුන් වෙත මගේ හදවතේ ප්‍රේමයෙන් යුතුව, මම දැන් මවුවරුන්ට තම ළමයින් සමග සාර්ථකව කාලය ගතකල හැකි විශේෂිත මාර්ග දහයක් යෝජනාකිරීමට කැමැත්තෙමි.

*ඔබගේ ළමයාගේ ජීවිතය මුළුල්ලේම ඔහු සමග සිටින්න.* පළමුව, ඔබගේ ළමයින් එන යන විට —ඔවුන් පාසල් යන විට සහ එන විට, දින වලට ඔවුන් යන විට සහ එන විට, ඔවුන් මිතුරන් නිවසට ගෙනඑන විටද ඔවුන් සමග සිටින්න. ඔබගේ ළමයින්ගේ වයස හය හෝ දහසය වුවද ඔවුන්ගේ ජීවිතය තුල සිටින්න. හිතෝපදේශයක අපි මෙසේ කියවමු, "අත්හරිනු ලබන දරුවා තමාගේ මව් ලජ්ජාවට පමුණුවයි" (හිතෝපදේශ 29:15). අපගේ සමාජයේ විශාලතම ප්‍රශ්න අතර මිලියන ගණන් ළමයි සිටිති. ඔවුහු වැඩකරන දෙමාපියන්ගේ පරීක්ෂාවට ලක් නොවන, පාසල් නිමවී හිස් නිවාසවලට එන ළමයින්ය.

*සැබෑ මිතුරෙක් වන්න.* දෙවැන්න, මවුවරුනි, ඔබගේ ළමුන්ගේ සැබෑ මිතුරෙකු වීමට කාලය වැයකරන්න. ඔබගේ ළමයින්ට සවන්දෙන්න, සැබවින්ම සවන්දෙන්න. ඔවුන් සමග සිනහසෙමින්, විහිළුකරන්න. ඔවුන් සමග ගී ගයන්න. ඔවුන් සමග සෙල්ලම්කරන්න. අවංකවම ඔවුන්ට ප්‍රශංසාකරන්න. එසේය, හැම ළමයකු සමගම ක්‍රමානුකූල විවේකයෙන් යුතුව කාලය ගතකරන්න.ඔබගේ ළමයින්ට සැබෑ මිතුරෙක්වන්න.

*ඔබගේ ළමයින්ට කියවන්න.* තුන්වැන්න, මවුවරුනි, ඔබගේ ළමයින්ට කියවීමට කාලය වැයකරන්න. තොටිල්ලෙන් පටන්ගෙන, ඔබගේ පුතුන්ට සහ දියණියන්ට කියවන්න. කවියෙකු කියා ඇති දෙය සිහිපත්කරන්නඃ

ඔබට ස්පර්ශකළ හැකි අප්‍රකාශිතවූ;
මිණිමුතු කරඬු සහ රන් පෙට්ටගම් තිබිය හැකිය.
ඔබට සහ මට කිසිදාක නොහැකි ලෙස පොහොසත්ද විය හැකිය—
එහෙත් කියවන මවක් මට සිටියාය.
(Strickland Gillilan, "The Reading Mother.")

ඔබ ක්‍රමානුකූලව ඔබගේ ළමයින්ට කියවන්නේ නම්, හොඳ පොත්වලට ප්‍රියකිරීමට සහ ශුද්ධ ලියවිලිවලට සැබෑ ආදරයක් ඔවුන් තුල රෝපනයකිරීමට ඔබට පුළුවන

*ඔබගේ ළමයින් සමග යාච්ඤාකරන්න.* හතරවැන්න, ඔබගේ ළමයින් සමග යාච්ඤාකිරීමට කාලය වැයකරන්න. පියාගේ මගපෙන්වීම යටතේ, පවුලේ යාච්ඤාවන්, උදෑසන සහ රාත්‍රියේ පැවැත්විය යුතුය. ඔබ ඔවුන්ට ස්වර්ගීය ආශිර්වාද ඉල්ලන විට, ඔබගේ ඇදහිල්ල ඔබගේ ළමුන්ට හැඟීමට සලසන්න. යාකොබ්ගේ වචන නැවත කිවහොත්, "ධර්මිෂ්ඨ [මවක්] ඔප්පුකරන කන්නලව්ව කරණකොටගෙන මහත් දේ ඉෂ්ඨ වෙයි" (යාකොබ් 5:16). පවුලේ සහ පෞද්ගලික යාච්ඤාවන්ට ඔබගේ ළමයින් සහභාගිකරගෙන, ඔවුන්ගේ ස්වර්ගයේ වැඩසිටින පියාණන්වහන්සේට ඔවුන් කථාකරන මිහිරි වචන වලින් සතුටුවන්න.

*සතිපතා නිවාස සැන්දෑවන් පවත්වන්න.* පස්වැන්න, අර්ථවත් සතිපතා නිවාස සැන්දෑවන් පැවැත්වීමට කාලය වැයකරන්න. මූලාසනය දරන ඔබගේ ස්වාමිපුරුෂයා

සමග, හැම සතියකම ආත්මික, සහ නගාසිටුවන නිවාස සැන්දෑවන්වලට සහභාගිවන්න. ඔබගේ ළමයින්ව ක්‍රියාකාරීව සහභාගිකරවාගන්න. ඔවුන්ට නිවැරදි මූලධර්ම උගන්වන්න. මෙ යඹබගේ පවුලේ ශ්‍රේෂ්ඨ සිරිතක් කරගන්න. නිවාස සැන්දෑවන් ප්‍රථමවරට සභාවට හඳුන්වාදුන් විට, සභාපති ජෝසෆ් එෆ්. ස්මිත්ගේ අපූර්ව පොරොන්දුව සිහිපත්කරන්න, "මෙම උපදේශයට ශුද්ධවන්තයන් කීකරුවන්නේ නම් විශාල ආශිර්වාද ප්‍රත්ඵල ලෙස ලැබෙන බව අපි පොරොන්දු වන්නෙමු. නිවසේ ප්‍රේමය සහ දෙමාපියන්ට කීකරුකම වැඩිවේ. ඉශ්‍රායෙල් තරුණ හදවත්වල ඇදහිල්ල වර්ධනයවී, ඔවුන්ට පීඩාකරන නපුරු බලපෑම් සහ පරීක්ෂාවන් හා සටන්කිරීමට අවශ්‍ය බලය ඔවුන්ට ලැබෙනු ඇත" James R. Clark, සකස්., *Messages of the First Presidency of The* Church of Jesus Christ of Latter-day Saint තුලිනි, 6 වෙළු. [1965–75], 4:339). මෙම ශ්‍රේෂ්ඨ පොරොන්දුව අදද තවමත් ක්‍රියාත්මකව පවතී.

*කෑම වෙලාවේදී එක්ව සිටින්න.* හයවැන්න, හැකි සෑම අවස්ථාවකදීම කෑම වේලාවලදී එකට එක්ව කාලය මිඩංගුකරන්න. ළමයින් වයසින් වැඩී කාර්‍යබහුලව ජීවත්වන විට මෙය අභියෝගයකි. නමුත් මවුවරුන් සහ පියවරු සහ ළමයින් එකට කටයුතුකරන විට, ප්‍රීතිමත් සංවාද, දවසේ සැලසුම් සහ කියාකාරකම් බෙදාගැනීම් සහ ඉගැන්වීමේ අවස්ථාවන් කෑමවේලාවේදී ඇතිවනු ඇත.

*දිනපතාම ශුද්ධ ලියවිලි කියවන්න.* හත්වැන්න, පවුලක් මෙන් එකට ශුද්ධ ලියවිලි කියවීමට කාලය වැයකරන්න. තනි තනිව ශුද්ධ ලියවිලි කියවීම වැදගත් නමුත්, පවුලේ ශුද්ධ ලියවිලි කියවීමද අත්‍යාවශ්‍යවේ. පවුලක් මෙන් එකට එක්ව මෝර්මන්ගේ පොත කියවීමෙන්, විශේෂයෙන්ම ඔබගේ නිවසට ආත්මිකබව වැඩියෙන් ගෙනඑමින්, දෙමාපියන්ට සහ ළමයින්ටද පරීක්ෂාවන්ට විරුද්ධවීමේ බලය ගෙනදී, ශුද්ධාත්මයාණන් ඔවුන්ගේ සහායකයා ලෙස ලබාගත හැකිය. මෝර්මන්ගේ පොත ඔබගේ පවුලේ ජීවිත වෙනස්කරන බව මම ඔබට පොරොන්දුවෙමි.

*පවුලක් ලෙස එකට වැඩකරන්න.* අටවැන්න, පවුලක් මෙන් එකට වැඩකිරීමට කාලය වැයකරන්න. පවුලේ ගමන්, විනෝද ගමන්, උපන්දින සාද, සහ විශේෂිත අවස්ථාවල සංචාරගමන් සිහිවටන ගොඩනැගීමේ ගමන් කරගන්න. හැකි සෑම විටකදීම, එක් පවුල් සාමාජිකයෙක් සම්බන්ධවන, පාසල් ක්‍රීඩාවක්, බෝල තරඟයක්, කථාවක්, සංගීතය වැනි අවස්ථාවලට පවුලක් මෙන්, සහභාගිවන්න. සභාරැස්වීම්වලට එකට එක්ව සහභාගිවී, පවුලක් මෙන් ඔබට හැකි විට එකට හිඳගන්න. එකට එක්ව යාච්ඤා කිරීමට සහ ක්‍රීඩාකිරීමට පවුල්වලට උදව්කරන මවුවරු, එකට හිඳිමින්, ළමයින්ගේ ජීවිත සදාකාලයටම ආශිර්වාද කරන්නෝය.

*ඔබගේ ළමයින්ට උගන්වන්න.* නමවැන්න, ඔබගේ ළමයින්ට ඉගැන්වීමට කාලය වැයකරන්න. ඉගැන්වීමේ අවස්ථා සොයාගන්න. දවසේ ඕනෑම අවස්ථාවක—කෑමවෙලාවේදී, සාමාන්‍ය අවස්ථාවල, හෝ විශේෂිතව හිඳගෙන සිටින අවස්ථාවලදී, දහවල් කාලය අවසානයේ ඇඳ පාමුලදී, හෝ හිමදිරි උදෑසන එකට ඇවිදින විටදී මෙය කළ හැකිය. මවුවරුනි, ඔබ ඔබගේ දරුවන්ගේ හොඳම ගුරුවරිය වෙයි. මෙම මාහැඟි වගකීම දිවා සුරැකීම් මධ්‍යස්ථානවලට සහ සේවිකාවන්ට ලබා නොදෙන්න. තම දරුවන් සඳහා වන මවකගේ ප්‍රේමය සහ සැලකිල්ල තම ඉගැන්වීම්වල වඩාත් වැදගත් අවශ්‍ය ද්‍රව්‍යයන් වන්නේය.

සුභාරංචි මූලධර්ම ළමයින්ට උගන්වන්න. එයින් යහපතක්වන බව ඔවුන්ට උගන්වන්න. පාපය තුල ආරක්ෂාවක් නැති බව ඔවුන්ට උගන්වන්න. යේසුස් ක්‍රිසතුස්වහන්සේගේ සුභාරංචියට සහ එහි දේවත්වය පිළිබඳ සාක්ෂියකට ප්‍රේමකිරීමට ඔවුන්ට උගන්වන්න.

ඔබගේ දූ පුතුන්ට විනීතබාවය ගැන උගන්වන්න. එසේම පුරුෂභාවයට සහ ස්ත්‍රීභාවයටගරුකිරීමට ඔවුන්ට උගන්වන්න. ඔබගේ ළමයින්ට ලිංගික පවිත්‍රතාවය ගැන, නිසි දියේදීමේ ප්‍රමිතීන් ගැන, දේවමාළිගා විවාහය, ධර්මදූත ස්වය, සහ සභා කැඳවීම් පිළිගෙන ඒවා දියුණුකිරීම ගැනද උගන්වන්න.

වැඩකිරීමට ප්‍රියකිරීම සහ හොඳ අධ්‍යාපනයක වටිනාකම ගැන ඔවුන්ට උගන්වන්න.

නිසි ආකාර විනෝදවීම්, සුදුසු චිත්‍රපට සහ වීඩියෝ පට සහ සංගීතය, පොත්ද ඇතුළු සඟරාවල වැදගත්කම ගැන ඔවුන්ට උගන්වන්න. කාමුක සඟරාවල සහ මත්ද්‍රව්‍යවල නපුර ගැන සාකච්ඡාකර, පිරිසිදු ජීවිතයක් ගතකිරීමේ වටිනාකම ගැන ඔවුන්ට උගන්වන්න.

එසේය, මවුවරුනි, ඔබගේ ළමයින්ට ඔබගේම නිවසේදී සහ ඔබගේම ගිනි කඳවුරුවලදී සුභාරංචිය උගන්වන්න. මෙය ඔබගේ ළමයින්ට කිසිදා නොලැබෙන වඩාත් සාර්ථක ඉගැන්වීම් වන්නේය. මෙය ස්වාමීන් වහන්සේගේ ඉගැන්වීමේ ක්‍රමය වෙයි. ඔබ උගන්වන ලෙස ඉගැන්වීමට සභාවට නොහැකිය. පාසලට නොහැකිය. දිවා සුරැකීම් මධ්‍යස්ථානයට නොහැකිය. නමුත් ඔබට පුළුවන. ස්වාමීන්වහන්සේ ඔබට ආධාරකරනසේක. ඔබගේ ළමයින්ට ඔබගේ ඉගැන්වීම් සැමදා මතක තිබෙනු ඇත. එසේම ඔවුන් මහළුවූ විට, ඔවුන් එයින් පිට නොයනු නැත. ඔබ ආශිර්වාදිතවූ—ඔවුන්ගේ සැබෑ මව් දේවදූතිකාව බව ඔවුන් කියනු ඇත.

මවුවරුනි, මේ අන්දමේ ස්වර්ගීය, මාතෘමය ඉගැන්වීම්වලට කල්ගතවේ—බොහෝ කල් ගතවේ. එය අර්ධකාලීනව සාර්ථක ලෙස කළ නොහැකිය. ඔබගේ ළමයින්ට ගැලවීම සහ උත්කර්ෂය ලබාදීම සඳහා එය හැම වෙලාවේදීම කළ යුතුය. මෙය ඔබගේ දිව්‍යමය කැඳවීමවේ.

*ඔබගේ ළමයින්ට අවංකවම ප්‍රේමකරන්න.* දසවෙනිව සහ අවසාන වශයෙන්, මවුවරුනි, ඔබගේ ළමයින්ට අවංකව ප්‍රේමකිරීමට කාලය වැයකරන්න. මවකගේ සුදුසුකම් නැති ප්‍රේමය, ක්‍රිස්තුස් වැනි ප්‍රේමයකට ලඟාවේ.

මෙහි දැක්වෙන්නේ පුතෙකුගෙන් ඔහුගේ මවට පිදූ අලංකාර උපහාරයකිඃ ඇයගේ කැමැත්ත පිළිබඳ දර්ශනය හෝ ඇයගේ සමාජ ගෞරවය ගැන හෝ මට වැඩිපුර මතක නැත; එසේම ළමා පුහුණුව හෝ ආහාරදීම, සහ ඇතිදැඩිකිරීම් ගැන මට සිහිපත් කළ නොහැකිය. මට දැන් නැවත එම වසර ගණනාවක සිහිවටන අතරින්

සිහිපත්වන ප්‍රධාන දෙය නම් ඇය මට ප්‍රේමකළ බවය. මා සමග තණ පිටියේ වැතිරී සිටිමින් කථාන්තර කීම හෝ ළමුන් වන අප සමග දුවගොස් සැඟවීම ඇය ප්‍රිය කළාය. ඇය නිතරම මට හාදුදෙන්නීය. මම එය ප්‍රිය කළෙමි. ඇයට සිනහ මුහුණක් තිබිනි. මට එය දෙවියන්වහන්සේ සහ උන්වහන්සේ ගැන කියවෙන සියලුම ආශිර්වාද වාක්‍ය වැනිය. එසේම සින්දු කීමය!. ඇයගේ ඔඩොක්කුවට දණගාගෙන ගොස් ඇය විශාල පුටුව පද්දමින් ගී කියන විට මා නින්දට යාම හා සැසඳීමට මගේ ජීවිතයට ප්‍රසන්නවූ සියලුම බලවත් හැඟීම් කිසිවකට නොහැකිය. මේ ගැන සිතමින්, මා කල්පනාකරන්නේ, අද කාන්තාව සතු, ඇයගේ සියලුම අතිවිශාල මතයන් සහ සැලසුම් වලින්, තම දරුවා තුවාලවලින් සහ වේදනාවලින් වළකාගැනීමේ ඇය සතු බලය ගැන ඇයට අවබෝධයක් තිබේද යන්නය. ළමයෙකුගේ ජීවිතය තුල කොපමණ අව්‍යාජ ප්‍රේමයක් සහ අවධානයක් අවශ්‍යද කියා ඇයට වැටහේදැයි මම කල්පනා කරමි.

මවුවරුනි, ඔබගේ ගැටවර ළමුන්ටද එවැනි අන්දමේ ප්‍රේමයක් සහ අවධානයක් අවශ්‍යවේ. බොහෝ මවුවරුන්ට සහ පියවරුන්ට තම ළමුන්ගේ බාලවියේදී ඔවුන්ට ප්‍රේමය ප්‍රකාශකිරීම සහ පෙන්වීම පහසු බවක් පෙනේ. නමුත් වඩාත් අසීරු වන්නේ ඔවුන් වැඩෙන විටය. මේ ගැන යාච්ඤාවෙන් යුතුව කටයුතු කරන්න. පරම්පරා හිදසක් තිබීමේ අවශ්‍යතාවයක් නැත. එසේම සාධකය ප්‍රේමය වන්නේය. අපගේ තරුණ අයට ප්‍රේමය සහ අවධානය අවශ්‍යවේ. කැමැත්තට ඉඩදීම නොවේ. ඔවුන්ට අවධාරණය සහ තේරුම්ගැනීම අවශ්‍යවේ. පියවරුන් සහ මවුවරුන්ගේ වෙනස්කම් නොවේ. ඔවුන්ට දෙමාපිය කාලය අවශ්‍යවේ. ගැටවර පුතෙකුට හෝ දියණියකට ඇති මවකගේ කාරුණික ඉගැන්වීම් සහ ඇයගේ ප්‍රේමය සහ විශ්වාසයට, දුෂ්ඨ ලෝකයෙන් ඔවුන්ව සත්‍ය ලෙසම ගලවාගත හැකිය.

1987 පෙබර වාරි 22වෙනි දින දෙමාපියන් සඳහාවූ ගිනි කඳවුරකදී සභාපති බෙන්සන් කළ කථාවකිනි.

# ආදර්ශය සහ උපදේශය තුලින් ලමුන්ට ඉගැන්වීම

12

## අදාළකරගැනීම සඳහා අදහස්

ඔබගේම අවශ්‍යතාවයන් සහ තත්වයන් අනුව, මෙම යොජනා එකක් හෝ දෙකම අනුගමනයකරන්න.

- ඔබගේ ළමයින්ගේ අවශ්‍යතාවයන් ගැන හෝ ඔබගේ මුනුපුරන්ගේ, ලේලියන් හෝ බෑනාවරුන් හෝ ඔබ හඳුනන වෙනත් ළමයින්ගේ අවශ්‍යතාවයන් ගැන මෙනෙහිකරන්න. ඔබගේ ක්‍රියා සහ වචන තුලින් මෙම ළමුන්ට ඉගැන්වීමට අවස්ථාවන් සඳහා සැලසුම්කරන්න.
- පහත සඳහන් පත්‍රිකාවල දැක්වෙන පවුලේ ඉගැන්වීම් සඳහා වන කරුණු සමාලෝචනය කරන්න, *ඉගැන්වීමට වඩා ශ්‍රේෂ්ඨ වෙනත් කැඳවීමක් නැත* (36123), පිටු 127–43, සහ *පවුලේ නියමු පොත,* (31180), පිටු 4–10. ඔබ විවාහක නම්, මෙම කරුණු ඔබගේ සහකාරිය සමග කියවා සාකච්ඡාකරන්න.

## කියවීමේ පැවරුම

පහත සඳහන් ලිපිය අධ්‍යයනය කරන්න. ඔබ විවාහක නම්, ඔබගේ සහකාරිය සමග ලිපිය කියවා සාකච්ඡා කරන්න.

### යහපත් දෙමාපියත්වය—ලෝකයේ විශාලතම අභියෝගයයි

වැඩිහිටි ජේම්ස් ඊ. ෆවුස්ට්
ප්‍රේරිතවරුන් දොළොස්දෙනාගේ ගණපූර්ණය

#### දෙමාපියෙක් වීම දිව්‍යමය කැඳවීමකි

මා තෝරාගත් ලෝකයේ විශාලතම අභියෝගය යයි කියන මාතෘකාව ගැන සාකච්ඡාකිරීමට මා පෙළඹවීමක් ලද බව මට හැඟෙයි. යහපත් දෙමාපියන් වීමේ වරප්‍රසාදය සහ වගකීම එයට අදාළවේ. මෙම මාතෘකාව ගැන දෙමාපියන් මෙන්ම, බොහෝ මතද ඇත. එහෙත් සියලුම පිළිතුරු ඇතිව සිටින්නේ ටික දෙනෙකි. මම ඇත්තවශයෙන්ම ඔවුන්ගෙන් කෙනෙක් නොවෙමි.

මගේ ජීවිත කාලය තුල වෙනත් කිසිදු අවස්ථාවකට වඩා බොහෝ විශ්ෂ්ඨ තරුණ මිනිසුන් සහ තරුණ කාන්තාවන්, වර්තමානයේදී අපගේ ජනතාව අතර සිටින බව මට හැඟේ. මෙම විශිෂ්ඨ තරුණ ජනයා බොහෝ දෙනෙක් යහපත් නිවාසවලින් සහ කැපවීමක් ඇති, සැලකිලිමත් දෙමාපියන්ගෙන් පැමිණ ඇත. එසේ වුවද, වඩාත් හෘදයාංගම දෙමාපියෝ ඔවුන් යම් වරදක් කර ඇති බව සිතති. එක් අවස්ථාවක මා සිතා නොබලා යමක් කල විටකදී, මගේම මව මෙසේ කියනු මට මතක තිබේ, "මට වැරදුනේ කොහේද?"

ස්වාමීන්වහන්සේ මෙලෙස මග පෙන්වමින්, අපගේ දරුවන් ආලෝකය සහ සත්‍යය තුලින් හදාවඩා ගැනීමට කීසේක (බලන්න ඕසහගී 93:40). මට ඊටත් වඩා මනුෂ්‍ය උත්සාහයක් තවත් නැත.

පියෙක් හෝ මවක් වීම විශාල අභියෝගයක් පමණක් නොව, එය දිව්‍යමය කැඳවීමක්ද වෙයි. එය කැපවීම අවශ්‍ය උත්සාහයකි. සභාපති ඩේවිඩ් ඕ. මැකේ සඳහන් කළ පරිදි දෙමාපියන්වීම යනු, "මනුෂ්‍යයන්ට දී තිබෙන විශාලතම විශ්වාසයකි" (*The Responsibility of Parents to Their Children* [පත්‍රිකාව, දි නැ.], 1).

#### සාර්ථක නිවාස නිර්මානයකිරීම

මනුෂ්‍යයාට ඇති අභියෝග කිහිපයක් යහපත් දෙමාපියන් වීමට විශාලතම අභියෝග වීම නිසා, සතුටුවීමට වඩාත් හැකිවීම සඳහා අවස්ථා කිහිපයක් පිරිනමනු ලබයි. අපගේ ළමයින් ධර්මිෂ්ඨව, ප්‍රීතිමත්ව, ගෞරවනීයව සහ ප්‍රතිඵලදායි ලෙස සූදානම්කිරීමට වඩා, සැබැවින්ම මෙම ලෝකයේ කළ යුතු වෙනත් වැදගත් වැඩ කිසිවක් නැත. තම ළමයින් තමන්ට සහ තම ඉගැන්වීම්වලට ගෞරවකිරීමට සැලැස්වීමට වඩා වෙනත් සම්පූර්ණ සතුටක් දෙමාපියන්ට ලැබෙන්නේ නැත. එය දෙමාපිය තත්වයේ මහිමයවේ, යොහාන් මෙසේ සාක්ෂි දැරුවේය, "මාගේ දරුවන් සත්‍යතාවෙහි හැසිරෙන බව ඇසීමට වඩා මහත් ප්‍රීතියක් මට නැත" (3 යොහාන් 1:4). මගේ මතය අනුව, අපට ජීවිතයේ තිබෙන වෙනත් කිසිදු අභියෝගයකට වඩා අවශ්‍ය වන්නේ, ළමුන්ට ඉගැන්වීම, ඇතිදැඩිකිරීම, සහ පුහුණුකිරීම බුද්ධිය, තීරක අවබෝධය, නිහතමානීත්වය, ශක්තිය, ප්‍රඥාව, ආත්මිකබව, දැඩි උත්සාහය සහ වෙහෙසවී කටයුතුකිරීමය. මෙය විශේෂයෙන්ම එසේ වන්නේ, ගෞරවය සහ වැදගත්බව නැමැති සදාචාරාත්මක පදනම් අප අවටින් සේදීයාමය. සාර්ථක නිවාස ලැබීමට නම්, වටිනාකම් ගැන ඉගැන්විය යුතුය. එසේම නීති තිබිය යුතුය, ප්‍රමිතීන් තිබිය යුතුය, තවද පරමාර්ථයන්ද තිබිය යුතුය. බොහෝ සමාජවල සදාචාරාත්මක වටිනාකම් ඉගැන්වීමට සහ ඒවාට ගෞරවකිරීමට දෙමාපියන්ට දෙන්නේ ඉතා මඳ සහයෝගයකි. සංස්කෘතීන් කිහිපයක්ම ඉඳුරාම

නොවටිනා බවට පත්වෙමින් තිබෙන අතර, එම සමාජවල බොහෝ තරුණ ජනතාව සදාචාරයට නින්දාකරන්නන් බවට පත්වෙමින් සිටිති.

සමාජයන් සම්පූර්ණයෙන්ම වාගේ ක්ෂයවෙමින් සහ ඔවුන්ගේ සදාචාර අනන්‍යතාවයන් නැතිකරගැනීමේදී, නිවාස බොහොමයක්ද කැඩී බිඳී ඇත. හොඳම බලාපොරොත්තුව නම්, දැඩි අවධානයක් සහ උත්සාහයක් ගෙන ඊළඟ පරම්පරාවට—අපගේ ළමයින්ට ඉගැන්වීමය. මෙය කිරීම සඳහා, අප පළමුවෙන් ළමුන්ගේ ප්‍රාථමිකයේ ගුරුවරුන් ශක්තිමත්කළ යුතුය. මොවුන් අතරින් ප්‍රධාන වන්නේ, දෙමාපියන් සහ අනෙක් පවුල් සාමාජිකයන් වන අතර, හොඳම පරිසරය විය යුත්තේ නිවසය. කෙසේවෙතත්, යම් ලෙසකින්, අපගේ නිවාස ශක්තිමත් කිරීමට අපි දැඩිව උත්සාහකළ යුතුය. එවිට ඒවා අප අවට ව්‍යාප්තවන අපවිත්‍ර, සදාචාර විරෝධී විනාශකාරී පෙළඹවීම්වලට විරුද්ධ රක්ෂස්ථාන වනු ඇත. නිවසේ සමගිය, සතුට සමාදානය සහ ප්‍රේමය මගින් ජීවිත අභියෝගයන්ට මුහුණදීම සඳහා ළමයින්ට අවශ්‍ය අභ්‍යන්තර ශක්තිය ලබාගැනීමට උපකාර කරයි. බාබරා බුෂ්, [එක්සත් ජනපදයේ] ජනාධිපති ජෝජ් බුෂ් මහතාගේ භාර්‍යාව, මාස කිහිපයකට පෙර වෙල්ස්ලි විද්‍යාලයේ උපාධිධාරීන්ට මෙසේ කීවාය:

"නමුත් කුමන යුගයක වුවද, කුමන කාලයක වුවද, එක් දෙයක් කිසිදා වෙනස් නොවේ: පියවරුනි සහ මවුවරුනි, ඔබට ළමයින් සිටීනම් ඔවුන් ප්‍රධාන තැන ගත යුතුය. ඔබ ඔබගේ ළමයින්ට කියවිය යුතුය, තවද ඔබ ඔබගේ ළමයින් සිප වැළඳගත යුතුය. එසේම ඔබ ඔබගේ ළමයින්ට ප්‍රේමකළ යුතුය. පවුලක් මෙන් ඔබගේ සාර්ථකත්වය, සමාජයක් ලෙස අපගේ සාර්ථකත්වය රඳා පවතින්නේ ධවල මන්දිරයේ සිදුවන දේවල් මත නොව, නමුත් ඔබගේ නිවස තුල සිදුවන දේවල් අනුවය" (*Washington Post*, 2 ජූනි 1990, 2).

යහපත් පියෙක් සහ මවක් වීමට දෙමාපියන් තම අවශ්‍යතාවයන් සහ ආශාවන් බොහොමයක් ඔවුන්ගේ ළමයින්ගේ අවශ්‍යතාවයන් වෙනුවෙන් වෙනස්කිරීම අවශ්‍යවන්නේය. මෙම පරිත්‍යාගවල ප්‍රතිඵලයක් ලෙස, හෘදයාංගම දෙමාපියන් චරිතයේ උදාරබව වර්ධනයකර, ගැලවුම්කරුවාණන් විසින්ම උගන්වන ලද අත්මාර්ථ නොවූ සත්‍යයන් ක්‍රියාත්මක කිරීමට පුරුදුවනු ඇත.

තනි දෙමාපියන්ට මා තුල විශාලතම ගෞරවයක් ඇත. ඔවුහු පරිශ්‍රමදරමින්, පරිත්‍යාගකරමින්, පවුල එකට තබාගැනීම සඳහා මිනිසත්බව ඉක්මවාගිය නොයෙක් ක්‍රියාවලට විරුද්ධව උත්සාහ දරති. ඔවුන්ට ගෞරවකරමින් ඔවුන්ගේ වික්‍රමාන්විත උත්සාහයන් වලදී ඔවුන්ට උදව් කළ යුතුය. නමුත් ඕනෑම මවකගේ හෝ පියෙකුගේ ගෙදර දොර කටයුතු නිවසේ ක්‍රියාත්මකවන දෙමාපියන් දෙදෙනෙක් සිටින විට වඩාත් පහසුය. ළමයි නිතරම දෙමාපියන් දෙදෙනාගේම ශක්තිය සහ ප්‍රඥාවට අභියෝගකරමින් වෙහෙසට පත් කරති

## ඔබ පවුලේ යාච්ඤාව කොපමණ වතාවක් පවත්වන්නේද?

වසර කිහිපයකට පෙර, ස්ටැන්ලි ස්මූට් සභානායකව රයාව සභාපති ස්පෙන්සර් ඩබ්ලිව්. කිම්බල් විසින් සම්මුඛසාකච්ඡාවකට බඳුන් කරන ලදී. සභාපති කිම්බල් මෙසේ ඇසීය, "ඔබ පවුලේ යාච්ඤාව කොපමණ වතාවක් පවත්තන්නේද?

සභානායක ස්මූට් පිළිතුරු දෙමින්, "දිනකට දෙවරක් පවුලේ යාච්ඤාව පැවැත්වීමට අපි උත්සාහ කරන නමුත් අපි සාමාන්‍යයෙන් පවත්වන්නේ එක්වතාවක් පමණකි" යයි කීවේය.

සභාපති කිම්බල් පිළිතුරු දෙමින්, "අතීතයේදී නම්, පවුලේ යාච්ඤාව එක් වතාවක් පැවැත්වීමේ වරදක් නොතිබිනි. නමුත් අපි අපගේ පවුල් ගලවාගැනීමට නම්, අනාගතයේදී එය ප්‍රමාණවත් නොවනු ඇත" යයි කීවේය.

පවුල් නිවාස සැන්දෑවන් සාමාන්‍ය ලෙස කලාතුරකින් පැවැත්වීමෙන් අපගේ ළමයින්ට ප්‍රමාණවත් සදාචාර ශක්තියක් ලබාදීමට හැකි දැයි මම කල්පනාකරමි. අනාගතයේදී, කලාතුරකින් කරන පවුලේ ශුද්ධ ලියවිලි අධ්‍යයනය, අපගේ ළමයින් ජීවත්වන සදාචාර මුක්ත පරිසරයට මුහුණදීම සඳහා අවශ්‍ය ගුණ ධර්මවලින් පෝෂණයකිරීමට ප්‍රමාණවත් නොවිය හැකිය. ළමයින් නිවසෙන් හැර, පතිව්‍රතාව, ගුණවගාව, අවංකත්වය, සහ මූලික මිනිස් සදාචාරයන් ලෝකයේ වෙනත් කොතැනින් ඉගෙනගන්නද? මෙම වටිනාකම්, ඇත්තවශයෙන්ම, සභාවේදී ශක්තිමත්වන නමුත්. දෙමාපිය ඉගැන්වීම් වඩාත් නිත්‍ය වන්නේය.

## දෙමාපියන් ආදර්ශයක් තැබිය යුතුය

දෙමාපියන් තම ළමයින්ට අනතුරු වළක්වාගැනීමට උගන්වන විට, තම ළමයින් අමතා, "අපි ලෝකය ගැන අත්දැකීම් තිබෙන ඥානවන්ත අය නිසා, අපට ඔබලාට වඩා අනතුරු ගැන දැනීමක් ඇත" යයි කීම පිළිතුරක් නොවේ. දෙමාපිය කුහකකම මගින් ඔවුන් නිවසේදී උගන්වන දේවල් ළමුන් පිළි නොගෙන ඔවුන් ඒවා විශ්වාස නොකරනු ඇත. උදාහරණයක් ලෙස, දෙමාපියන් බලන චිත්‍රපටි ඔවුහු ළමයින්ට තහනම් කරන විට, දෙමාපිය ගෞරවය පහව යන්නේය. ළමුන් අවංකවීම අපේක්ෂාකරන්නේ නම්, දෙමාපියන් අවංකවිය යුතුය. ළමුන් ගුණගරුකවීම අපේක්ෂා කරන්නේ නම්, දෙමාපියන් ගුණවත්විය යුතුය. ඔබ ඔබගේ ළමුන් ගෞරවාන්විත වීම අපේක්ෂා කරන්නේ නම්, ඔබ ගෞරවනීය විය යුතුය.

අන් අයට ගරුකිරීම ගැන ළමුන්ට ඉගැන්විය යුතු අනෙකුත් වටිනා දේවල් අතර, ළමුන්ගේ දෙමාපියන් සහ පවුලෙන්ම ආරම්භකර, ඇදහිල්ලේ සංකේතයන්ට සහ අන් අයගේ මූලක විශ්වාසයන්ට ගරුකිරීම; නීතියට සහ නියමයන්ට ගරුකිරීම; අන් අයගේ දේපළවලට ගරුකිරීම; අධිකාරිත්වයට ගරුකිරීම කළ යුතුය. පාවුළු තුමා අපට මෙසේ සිහිපත්කරයි, දරුවෝ පළමුකොට, "තමන්ගේ පවුල ගැන භක්තිවන්ත ලෙස හැසිරිය යුතුය" (1 තිමොති 5:4).

## දරුවන් හික්මවීම

දෙමාපියන්ට ඇති එක් අභියෝගයක් වන්නේ සුදුසු පරිදි දරුවන් හික්මවීමය. දරුවන් බලාගැනීම අතිශයින්ම පෞද්ගලික දෙයකි. සෑම ළමයෙක්ම විවිධ මෙන්ම අද්විතීයද වෙයි. එක් අයෙකුට සරිලන දෙය අනෙකාට සරිලන්නේ නැත. ළමුන්ට වඩාත් ප්‍රේමකරන, ඔවුන්ගේ දෙමාපියන් හැර, වඩාත් රළු හෝ වඩාත් මුදු මොලොක් හික්මීම වන්නේ කුමන දෙයදැයි කීමට වඩාත් ඥනවන්ත වන්නේ කවුදැයි මම නොදනිමි. එය දෙමාපියන්ගේ යාච්ඤාශීලී අවබෝධයකි. ඇත්තවශයෙන්ම ප්‍රධාන උපකාරශීලී මූලධර්මය වන්නේ ළමුන් හික්මවීම දඬුවමට වඩා ප්‍රේමයෙන් පෙළඹවීම මත විය යුතුය. බ්‍රිගම් යන්ග් මෙසේ උපදෙස් දුන්නේය, "ඔබ කිසිදාක යම් පුද්ගලයෙක්ව බැනීමෙන් හික්මවන්නේ නම්, ඔහුව බැඳතැබීම සඳහා ඔබ තුල ඇති දයාව ඉක්මවා එය කිසිදා නොකරන්න" (*Discourses of Brigham Young*, තෝරා. John A. Widtsoe [1954], 278). මගපෙන්වාදීම සහ හික්මවීම, කෙසේවුවද, ඇත්තවශයෙන්ම ළමුන් හදාවඩා ගැනීමේ අත්‍යාවශ්‍ය කොටසකි. දෙමාපියන් තම දරුවන් හික්මවන්නේ නැතිනම්, එවිට මහජනයා ඔවුන්ව දෙමාපියන් අකමැති අන්දමට හික්මවීමට ඉඩ ඇත. හික්මීමකින් තොරව, ළමුන් නිවසේ තබා සමාජයේවත් නීතිවලට ගරු නොකරනු ඇත.

හික්මවීමේ ප්‍රධාන අරමුණ වන්නේ කීකරුකම ඉගැන්වීමය. සභාපති ඩේවිඩ් ඕ. මැකේ මෙසේ සඳහන් කළේයඃ "තම ළමයින්ට කීකරුකම ඉගැන්වීමට දෙමාපියන් අසමත්වී, [ඔවුන්ගේ] නිවාසවල කීකරුකම වර්ධනය නොවන්නේ නම්, සමාජය ඔවුන්ව කීකරුකරනු ඇත, එමනිසා වඩාත් සුදුසු වන්නේ නිවසේදීම කරුණාවෙන්, අනුකම්පාවෙන් සහ අවබෝධයෙන් යුතුව ළමුන්ට කීකරුකම ඉගැන්වීම හොඳය. නැතහොත් නිවසේදී එම යුතුකම ඉෂ්ඨනොවන්නේ නම්, සමාජය විසින් ඔහුට අනුකම්පා විරහිතව දරුණු ලෙස කර්කෂව හික්මීම උගන්වනු ලබන්නේය." (*The Responsibility of Parents to Their Children*, 3).

## ළමුන්ට වැඩකිරීම ඉගැන්වීම

ළමයින්ට හික්මීම සහ වගකීම ඉගැන්වීමේ අත්‍යාවශ්‍ය කොටසක් නම්, ඔවුන්ට වැඩකිරීම පුහුණුවීමට සැලැස්වීමය. අප වැඩෙන විට, අප බොහෝ දෙනෙක්, "මම වැඩකිරීම ප්‍රියකරමි; එය මා වශීකරයි. මට පැය ගණන් හිඳගෙන ඒ දෙස බලා සිටීමට හැකිය" යයි කියන මිනිසා මෙන් විය හැකිය." (Jerome Klapka Jerome, *The International Dictionary of Thoughts* තුලිනි, සංස්. John P. Bradley, Leo F. Daniels, සහ Thomas C. Jones [1969], 782). නැවතත්, වැඩකිරීමේ මූලධර්ම ගැන ඉගැන්වීමේ හොඳම ගුරුවරු නම් දෙමාපියන්ම වෙති. මා හට නම්, වැඩකිරීම සතුටක් ගෙනදුන්නේ, මා ප්‍රථම වරට මගේ පියා, සීයා සහ මාමලා සහ සොහොයුරන් සමග වැඩකිරීම නිසාය. මා නිතරම උපකාරයකට වඩා කරදරයක්වූ බව මට විශ්වාස නමුත්, එම මතකයන් මිහිරිවන අතර, ඉගෙනගත් පාඩම්වල වටිනාකමක් ඇත. ළමයින් වගකීම සහ ස්වාධීනත්වය ගැන ඉගෙනීම අවශ්‍යවේ. දෙමාපියන් පෞද්ගලිකවම පෙන්වා දෙමින්, ප්‍රදර්ශනයකරමින්, පැහැදිළිකිරීමට කාලය වැයකරන්නේද, එවිට ලිහායි ඉගැන්වූ පරිදි ළමයින්ටද, "තමන් කෙරෙහි ක්‍රියාකරවීමට නොව…තමන් වෙනුවෙන් ක්‍රියාකිරීමට"? හැකිවනු ඇත (2 නීෆායි 2:26).

ලූතර් බර්බැන්ක් නම්, ලෝකයේ ශ්‍රේෂ්ඨතම උද්‍යාන විශේෂඥයෙක් ප්‍රකාශකල පරිදි, "අප අපගේ ළමයින්ට දක්වන අවධානයට වඩා වැඩි අවධානයක් ගස් වලට දැක්වූයේ නැති නම්, අපි දැන් ජීවත්වනු ඇත්තේ, වල් පැල වලින් පිරීගිය කැලෑවකය" (*Elbert Hubbard's Scrap Book* තුලිනි, [1923], 227).

## දෙමාපියන්ට ඇති විශේෂ අභියෝග

ළමුන් සදාචාරාත්මක කර්තෘත්වයේද ප්‍රතිලාභීන් වන අතර, එමගින් අප සියලුදෙනාටමද දියුණුවට, වැඩීමට සහ වර්ධනයවීමට හැකියාව ඇත. එම කර්තෘත්වයම ආත්මාර්ථය,, නාස්තිය, ස්වයං තෘප්තිය සහ ආත්ම විනාශය පසුපස යාම තෝරාගැනීමටද ළමයින්ට අවසර ලබාදෙයි. ළමයින් නිතරම මෙම කර්තෘත්වය ප්‍රකාශකරන්නේ ඉතා බාල අවධියේ සිටය.

හෘදයාංගම, ප්‍රේමනීය සහ සැලකිලිමත්ව සිටි දෙමාපියන්, තමාට හැකි පමණ හොඳින් ධර්මිෂ්ඨතාවයේ මූලධර්මවලට අනුව ජීවත්වෙමින්, තම ළමුන් කිහිප දෙනෙකුගේ ක්‍රියාවන් නොතකා ඔවුන් හොඳින් සිටිබව දැනසිටිති. ළමුන්ටද සවන්දීමට, කීකරුව, සහ ඉගෙනගැනීම වගකීමක් ඇත. තම ළමුන්ගේ නොමනා හැසිරීමට දෙමාපියන් නිතරම වගකිව යුතු නොවන්නේ, ළමුන් යහපත් ලෙස හැසිරීම සහතික කිරීමට ඔවුන්ට නොහැකි නිසාය. සාලමොන්ගේ ප්‍රඥාවත්, යෝබ්ගේ ඉවසීමත් ඇත්තේ ළමුන් කිහිපදෙනෙකුට පමණි.

සමෘධිමත්වීම හෝ වැඩි නිදහසක් ලබාදෙන දෙමාපියන්හටනිතරම විශේෂ අභියෝගයක් ඇත. යම් ලෙසකින් කිවහොත්, එම තත්වයන් යටතේ සිටින සමහර ළමයි දෙමාපිය නීති යටතේ ලැබෙන ඔවුන්ගේ සහයෝගය මගින් දෙමාපියන්ව ප්‍රාන ඇපකරුවන් ලෙස තබාගෙන ළමුන්ගේ ඉල්ලීම් කෙසේ හෝ ලබාගනිති. වැඩිහිටි නීල් ඒ. මැක්ස්වෙල් මෙසේ ප්‍රකාශකර ඇත, "තම ළමයින් සඳහා සීමා රහිතව කටයුතුකරන අය තම ළමයින්ගේ පාලනය නැතිකර ගනිති. බොහෝ ළමයි වෙනුවෙන් බොහෝ දේවල් කර ඇති බැවින් ඔවුන් සම්පූර්ණයෙන්ම නාස්තිවී හෝ විනාශවී ඇත." (Conference Report තුලිනි, අප්‍රේ. 1975, 150; හෝ *Ensign*, මැයි 1975, 101). මනුෂ්‍ය ස්වභාවය වන්නේ, අප විසින්ම උපයා නොගත් ලෞකික දේවල් ගැන සම්පූර්ණයෙන්ම තෘප්තිමත් නොවීමය.

සමහර දෙමාපියන් තම දරුවන්ට පිළිගැනීමක් සහ ඔවුන්ගේ සමාජයේ ජනප්‍රියවීමට ඇති උනන්දුවට යම් කරුණක් ඇත; එහෙත් මෙම දෙමාපියන්ම තම දරුවන්, ඔවුන්ගේ සමානයන් අනුගමනය කිරීම ගැන බියකින්ද පසුවෙති.

### ළමයින්ට වටිනාකම් උපයෝගීකර ගැනීමට උපකාරකිරීම

ප්‍රධාන වශයෙන්, මත්ද්‍රව්‍ය, මත්පැන්, ලිංගික අපචාර වලින් වැළකී සිටීමට තීරණ ගන්නා ළමයි, ඔවුන්ගේ දෙමාපියන් ජීවත්වූ නිවාසවල හැදී වැඩී එම දැඩි වටිනාකම් සිතට ගත් අයවෙති. අසීරු තීරණ ගැනීමේ අවස්ථාවලදී ඔවුහු තම දෙමාපියන්ගේ ඉගැන්වීම් අනුගමනය කරමින්, ඔවුන්ගේ සමානයන් හෝ මාධ්‍යවල ප්‍රයෝග ලෙස මත් පැන් පානයට ගිජුවීම, දුරාචාරය, නොඇදහිල්ල, වංකකම සහ අනෙකුත් නරක දේවලට යොමු නොවෙති. ඔවුන් හීලමන්ගේ තරුණයන් දෙදහස මෙන්, ඔවුන්ට ඔවුන්ගේ මවුවරුන් විසින් උගන්වා තිබූ ලෙස, ඔවුන් සැක නොකළහොත්, දෙවියන්වහන්සේ ඔවුන්ව මරණයෙන් ගලවාගන්නාසේක (බලන්න ඇල්මා 56:47). "තවද ඔවුහු ඔවුන්ගේ මවුවරුන්ගේ වදන්… පුහුණුවෙමින්, අප සැක නොකරන බව අපගේ මවුවරු දනිති යයි කීහ (ඇල්මා 56:48).

දෙමාපියන්ගේ ඉගැන්වීම් සහ වටිනාකම් ළමුන්ගේ ජීවිත තුල ශක්තිමත්ව තැන්පත්කිරීමට උපකාරවත්වන්නේ දෙවියන්වහන්සේ තුල ඇති දැඩි විශ්වාසය බව පෙනේ. මෙම විශ්වාසය ඔවුන්ගේ ආත්මයේ කොටසක් බවට පත්වූ විට, ඔවුන්ට අභ්‍යන්තර ශක්තිය ඇතිවේ. එනිසා, ඉගැන්වීමට තිබෙන මේ සියල්ලෙන්ම, දෙමාපියන් ඉගැන්විය යුත්තේ කුමක්ද? ශුද්ධ ලියවිලි අපට උගන්වන පරිදි, දෙමාපියන් තම දරුවන්ට උගන්වන්නේ, ජීවමාන දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් වන ක්‍රිස්තුස්වහන්සේ තුල ඇදහිල්ල, සහ බෞතීස්මය සහ ශුද්ධාත්මයාණන්ගේ දීමනාව ගැන, සහ පසුතැවිල්ලේ දහමය (බලන්න ධ්‍යසහසී 68:25). මෙම සත්‍යයන් නිවස තුල ඉගැන්විය යුතුය. ඒවා පොදු පාසල්වල උගන්වන්නේ නැත, එසේම ඒවා රජය හෝ සමාජය විසින් පෝෂ්‍ය කරන්නේද නැත. ඇත්ත වශයෙන්ම, සභා වැඩසටහන්වලට උපකාරකිරීමට හැකි නමුත්, ඉගැන්වීම් වඩාත් සාර්ථකව කෙරෙන්නේ නිවස තුලය.

### ප්‍රේමයේ නූල් දහස

දෙමාපිය ඉගැන්වීමේ අවස්ථා විශාල හෝ නාට්‍යාකාර හෝ බලවත් හෝ විය යුතු නැත. අපි මෙය ප්‍රධාන ගුරුවරයාගෙන් ඉගෙනගන්නෙමු. චාර්ල්ස් හෙන්රි පාර්ක්හර්ස්ට් මෙසේ කීවේයඃ

"ක්‍රිස්තුස්වහන්සේගේ ජීවිතය සම්පූර්ණ කල අලංකාරය නම්, එකතුකරගත් අලංකාරයකි—ළිඳ ලඟ සිටි කාන්තාව සමග කථාකරමින්;…තරුණ පාලකයාව ස්වර්ග රාජ්‍යයෙන් වැළැක්වීමට ඔහුගේ සිතෙහි තිබූ ගුප්ත අභිප්‍රායන් ඔහුට පෙන්වාදෙමින්;… අනුගාමිකයන්ට යාච්ඤාකරන අන්දම ගැන කුඩා ගැටයක් ගැන උගන්වමින්;…තම ගෝලයන් රාත්‍රියේ මසුන් මරමින් සිට, ශීතලෙන්, වෙහෙසවී, සහ අධෛර්යයෙන් වෙරළට පැමිණිවිට, ඔවුන්ට දිවා ආහාර සඳහා ගිනි අවුලුවා මසුන් පුළුස්සා තැබීම වැනි කුඩා අප්‍රකට ක්‍රියාවල අලංකාරයෙන් එක් කරගත් අලංකාරයකි. මේ සියලුම දේවල්වලින්, ඔබට පෙනෙන පරිදි, [ක්‍රිස්තුස්වහන්සේගේ] සැබෑ ගුණාංග සහ වචනය අපට පහසුවෙන්ම එක්කරගත හැකිය. එතුමාගේ කැමැත්ත, එතරම්ම විශේෂිත, එතරම්ම කෙටියෙන්, කුඩා දේවල හොඳින්ම ඇති අතර, වෙලාවට සුදුසු ලෙස යොමුකර ඇත" ("Kindness and Love," *Leaves of Gold* තුලිනි, [1938], 177).

දෙමාපියන්වීමද එලෙසමය. පවුලේ විචිත්‍ර ගෙත්තමට මසා තිබෙන විශාල දේවල දහස් ගණන් නූල්වන්නේ, ප්‍රේමය, ඇදහිල්ල, හික්මීම, පරිත්‍යාගය, ඉවසීම, සහ වැඩ කටයුතුවැනි කුඩා දේවල්ය.

### ගිවිසුමේ දරුවෝ

මෙම සභාවේ ඇදහිලිමත් දෙමාපියන්ට උපකාරවත්වන ශ්‍රේෂ්ඨ ආත්මික පොරොන්දු කිහිපයක් ඇත. සාදකාලිකව මුද්‍රාකල ළමයින්ට තම ගිවිසුම් උදාර ලෙස තැබූ වීර මුතුන් මිත්තන් තැබූ දිව්‍යමය පොරොන්දු ලැබී තිබිය හැකිය. ගිවිසුම් සිහිපත්වන දෙමාපියන්ව දෙවියන්වහන්සේට සිහිපත්වේ. ළමයි මෙලෙස මෙම ශ්‍රේෂ්ඨ ගිවිසුම් සහ පොරොන්දුවල ප්‍රතිලාභීන් සහ උරුමක්කරුවන් බවට පත්වෙති. මෙසේ වන්නේ ඔවුන් ගිවිසුම්වල ළමයින් වන නිසාය. (බලන්න Orson F. Whitney, Conference Report, තුලිනි, අප්‍රේ. 1929, 110–11).

මෙම ලෝකයේ පරිශ්‍රම දරන, පරිත්‍යාගශීලී, ගෞරවනීය දෙමාපියන්ට දෙවියන්වහන්සේ ආශිර්වාද කරනසේක. එතුමා විශේෂයෙන්ම අප අතර සිටින ගිවිසුම් තැබූ සහ මෙම ගිවිසුම් කල දරුවන් රැකබලාගන්නා දෙමාපියන්ට ගරුකරත්වා.

වැඩිහිටි ෆවුස්ට් විසින් 1990 ඔක්තෝබර් Church General Conference හි කළ කථාවකිනි (බලන්න Conference Report, ඔක්තෝ. 1990, 39–43; හෝ *Ensign*, නොවැ. 1990, 32–35).

---

## ප්‍රේමයෙන් පෝෂිතවූ මේසයක්

හැත්තෑවරුන්ගේ
වැඩිහිටි ලීග්‍රෑන්ඩ් ආර්. කර්ටිස්

නිවසක වැදගත්කම ගැන බොහෝ දේවල් ලියා ඇත. වැඩිහිටි මේරියන් ජී. රොම්නි අපට මෙසේ කියා ඇත," සමාජයේ හදවතේ ඇති දරුණුම රෝගය නම් පවුලේ අස්ථාවරබවය."[1] සමහර නිවාස, විශාලවන අතර, දයාවන්තබව ඇති, සුඛෝපභොගීද නිවාස බව අපි පිළිගනිමු. සමහර ඒවා කුඩාය, එමෙන්ම අඩුවෙන් බඩුමුට්ටු වලින් යුත් නිහතමානී නිවාසය. එහෙත් සෑම "නිවාසයක්ම, අපි ප්‍රේමයෙන් පිරුන විට,…අපි සිටිය යුතුවූ, පොළොවේ ස්වර්ගයක් විය හැකි" බව අප ආදරයකරන ගීතිකාවක් අපට සිහිපත්කරවයි.[2]

බොහෝ නිවාසවල දක්නට ලැබෙන වඩාත් වැදගත් බඩුමුට්ටු නම් මුළුතැන්ගෙයි තිබෙන මේසයයි. දැන් එය කුඩා විය හැකිය, එය විශාල විය හැකිය, නැතහොත් කුඩා කාමරයක ආහාර සහ ද්‍රව්‍යයන් තබන කවුන්ටරයක් වැනි එකක් විය හැකිය එහි ප්‍රධාන කාර්‍යය නම් පවුලේ විවිධ සාමාජිකයන්ට පෝෂණය ලබාදීමට ස්ථානයක් සැපයීමය.

මෙම විශේෂිත අවස්ථාවේ මාගේ කැමැත්ත වන්නේ, ඔබගේ අවධානය, අපගේ නිරෝගිතාවය සඳහා පෝෂණය වඩාත් ලබාගත හැකි, මුළුතැන් ගෙයි මේසයේ ඇති ගැඹුරු, වැදගත් කටයුත්ත වෙත යොමුකිරීමය.

**මේසය වටා සුභාරංචි සාකච්ඡා පැවැත්වීම**

පවුලක සාමාන්‍යයෙන් විවිධ වයස්වල සාමාජිකයන් දෙදෙනෙක් හෝ වැඩි ප්‍රමාණයක් සිටිය හැකිය. නමුත් පවුලක් එකට හමුවීම අවශ්‍යවන්නේ—අවශ්‍යයෙන්ම කෑමට පමණක්ම නොව, නමුත් යාච්ඤාකිරීමට, කථාකිරීමට, සවන්දීමට, බෙදාගැනීමට, ඉගෙනගැනීමට සහ එකට වැඩීමටය. සභාපති ගෝර්ඩන් බී. හින්ක්ලි එය ඉතා හොඳින් ප්‍රකාශකර ඇත:

"මගේ ආයාචනය—සහ මා සිතන ලෙස එය වඩාත් ව්‍යක්ත ලෙස මා ප්‍රකාශකර ඇත—එය ළමුන් ගලවාගැනීමේ ආයාචනයකි. ඔවුන් බොහෝ දෙනෙක් කටයුතුකරන්නේ බියමුසු වේදනාවකින්, හුදකලාබවින් සහ බලාපොරොත්තු රහිතවය. ළමුන්ට හිරුඑළිය අවශ්‍යවේ. ඔවුන්ට සතුට අවශ්‍ය වේ. ඔවුන්ට ප්‍රේමය සහ පෝෂණය අවශ්‍ය වේ. ඔවුන්ට කරුණාව, නවතාවය සහ ආදරය අවශ්‍ය වේ. සෑම නිවසකටම, නිවසේ වටිනාකම නොතකා, ප්‍රේමනීය පරිසරයක් සපයාදීමට හැකිය. එය ගැලවීමේ පරිසරයක් වනු ඇත." [3]

බොහෝ පවුල් සාමාජිකයෝ නිවසින් පිටත ලෝකයේ නොයෙක් බලවේගවලට, මෙන්ම ගුවන් විදුලිය, රූපවාහිනිය, වීඩියෝ පට, සහ අප නිවාසවලට රැගෙන එන වෙනත් බොහෝ දේවල්වල බලපෑමට යටත්ව සිටිති.

පවුලක් මේසය වටා එකතුව සිටීම, සමහරවිට මුළුතැන්ගෙයි මේසය වටා රැස්ව, සුභාරංචිය ගැන කථාකිරීම, සක්‍රමේන්තු රැස්වීමක පණිවුඩ ගැන කථාකිරීම, වර්තමාන එන්සයින් හෝ නිව් ඒරා සඟරා ගැන කථාකිරීම, පාසැල සහ එහි ව්‍යාප්තිය ගැන කථාකිරීම, ප්‍රධාන සම්මන්ත්‍රනය ගැන කථාකිරීම, ඉරුදින පාසලේ පාඩම් ගැන කථාකිරීම, හොඳ සංගීතයට සවන්දීම, යේසුස් ක්‍රිස්තුස් වහන්සේ සහ උන්වහන්සේගේ ඉගැන්වීම් ගැන කථාකිරීම සිතින් මවාගන්න. ලැයිස්තුව විශාල කල හැකිය. පියවරුන් පමණක් නොව, පවුලේ සියලුම සාමාජිකයන්, සෑම පුද්ගලයෙකුගේම සහභාගීත්වය කථාකිරීමට සහ සහභාගිවීමට විපුල ප්‍රයෝජනයක් ලබාදෙන බව නිශ්චිත කරගැනීමට ඥානවන්තවිය යුතුය

**මේසය වටා පවුලේ යාච්ඤාව**

පවුලක් මේසය වටා දණගසා (රූපවාහිනියක් නොමැතිව) යාච්ඤාකරමින්, උපකාර පතා ආයාචනා කරමින්, ආශිර්වාද පතා අපගේ පියාණන් ගැන සිතමින්—ප්‍රේමනීය ස්වර්ගික පියාණන්ගේ වැදගත්කම ගැන සියලුම අයට ඉගැන්වීමට ඇති හැකියාව ගැන සිතන්න. කුඩා ළමුන් සමග පවුලේ යාච්ඤාව පැවැත්වීම මගින් වැඩිහිටි අය හොඳින් වර්ධනයකර, යම් දිනෙක ඔවුන්ගේ පවුල් සමග ඔවුන් යාච්ඤාකරනු ඇත.

වැඩිහිටි තෝමස් එස්. මොන්සන් එය හොඳින් සඳහන් කළේය:

"ස්වාමීන්වහන්සේ ප්‍රකාශකල ලෙස අපගේ පවුලේ යාච්ඤාවට එතුමා මෙසේ මගපෙන්වූසේක: 'නුඹලාගේ පවුල් සමග පියාණන්ට, නිතරම මාගේ නාමයෙන්, යාච්ඤාකිරීමෙන්, නුඹලාගේ භාර්‍යාවන් සහ නුඹලාගේ දරුවන් ආශිර්වාදිතවනු ඇත,' (3 නිෆායි 18:21.)

"පසු-දවස්වල ආදර්ශමත් පවුලක් ස්වාමීන්වහන්සේට යාච්ඤාවක් පුදකිරීම දෙස බැලීමට මා සමග ඔබ එක්වන්නේද? පියා, මව, හැම ළමයෙක්ම දණගසමින්, ඔවුන්ගේ හිස් නමාගෙන, ඔවුන්ගේ ඇස් වසා සිටිති. මිහිරි ප්‍රේමයක, එකමුතුකමක, සහ සමාදානයක ආත්මික බවකින් නිවස පිරීයයි. [යම්] පියෙක් තම සිඟිති පුතා දෙවියන්වහන්සේට යාච්ඤාකරමින්, ඔහුගේ පියා නිවැරදි දේ කරමින්, ස්වාමීන්වහන්සේගේ නියමයන්ට කීකරුවීම ගැන කීම අසන එවන් පියෙක්, තම ආදරණීය පුත්‍රයාගේ එම යාච්ඤාවට ගරු නොකරන බව ඔබ සිතනවාද? තරුණ දියණියක් තම ආදරණීය මව ස්වාමීන්වහන්සේට ආයාචනාකරමින්, තම දියණිය තම සහකරු සෙවීමේදී ආනුභාසම්පන්නවී, ඇය දේවමාළිගා විවාහයකට සුදානම්වීම ගැන කීම අසන විට, එවන් දියණියක්, තමා ඉතා ආදරයකරන තම මවගේ මෙම නිහතමානී, ආයාචනයට ගරුකරන බව ඔබ නොසිතන්නේද? පියා, මව සහ හැම ළමයෙක්ම උනන්දුවෙන් යාච්ඤාකරමින්, පවුලේ මෙම කදිම පුතුන් සුදුසුව ජීවත්වෙමින්, යථා කාලයේදී ඔවුන් ස්වාමීන්වහන්සේගේ තානාපතිවරු ලෙස සභාවේ දූත ක්ෂේත්‍රයේ සේවයකිරීමට කැඳවීම ලබන බව කියන විට, එවන් පුතුන් ධර්මදූතයන් ලෙස සේවයකිරීමට බලවත් කැමැත්තකින් යුතුව තරුණ වැඩිහිටියන් ලෙස වැඩීම අපි දකින්නේ නැතිද?" [4]

බොහෝ දෙනෙක් කියා ඇති පරිදි, "ඔබ සියලුදෙනාම හැම දිනකම එකට එක්ව ස්වාමීන්වහන්සේ සමග කථාකරන්නේ නැතිව, ඔබගේ දෙමාපියන් සහ ඔබගේ දරුවන් පිටස්තර ලෝකය තුලට යැවීමට ඔබට හැකියාවක් ලැබෙන්නේ කෙසේද?" ඥානවන්ත දෙමාපියෝ යාච්ඤාවේ ආශිර්වාද සඳහා පවුල එකට එකතුකිරීම සඳහා දිනපතාම එක් වතාවක් තම කාලසටහන සහ සැලසුම දෙස බලති. පවුලේ තරුණ සාමාජිකයන් පවුලේ යාච්ඤාවේ ඇති වටිනාකම් දැනගැනීමට තම වාරය කෙසේ ලබාගන්නේදැයි ඉක්මණින්ම දැනගනු ඇත.

**නිවස ප්‍රීතිමත් ස්ථානයක් කරගන්න**

මා කලින් සඳහන්කළ පරිදි, "නිවාස ප්‍රීතිමත් ස්ථානයක් විය යුතුය, මන්ද සියලුම වැඩ එලෙස සතුටින් තිබිය යුතු නිසාය. සතුට නිවසේ සාදන ලද්දක් බවට කියමනක් ඇත,

එනිසා අපි අපගේ නිවාස අප සහ අපගේ දරුවන් සඳහා ප්‍රීතිමත් සහ ප්‍රසන්න ස්ථාන බවට පත්කිරීමට උත්සාහකල යුතුය. ප්‍රීතිමත් නිවස සුභාරංචියේ ඉගැන්වීම් වටා කේන්ද්‍රවූවකි. මෙයට නිරන්තරයෙන්ම, සියලු දෙයක්ම සම්බන්ධ සැලකිලිමත් උත්සාහය අවශ්‍යවේ."5

විශාල පවුලක කාර්‍යබහුල ගැටවරයෙක් පවුලේ යාච්ඤාවට ගතවන කාලය සම්බන්ධව චෝදනා කළේය. ඊලඟ දිනයේ ඥානවන්ත මව යාච්ඤාකරන විට, ඇය සිතාමතාම එම ගැටවරයාව පවුලේ යාච්ඤාවෙන් ඉවත් කළාය. යාච්ඤාව අවසන්වූ විට, එම කාර්‍යබහුල ළමයා සිය මව අමතා, "අම්මා, ඔබ මාව යාච්ඤාවෙන් ඉවත් කළා" යයි කීවේය. කාරුණික මව පැහැදිළි කරමින්, ඇය කලේ එම ගැටවරයාගේ චෝදනාවට ප්‍රතිචාර දැක්වීමක් පමණක් බව කීවාය. කාර්‍යබහුල ළමයා චෝදනා කරමින්, "මාව ඉවත්කරන්න එපා" යයි කීවේය.

### මේසය වටා ශුද්ධ ලියවිලි අධ්‍යයනයකිරීම

පවුලක් ශුද්ධ ලියවිලි විවෘතකරගෙන මේසයක් වටා රැස්ව, බොහෝ සත්‍යයන් සහ පාඩම් සිතට ගැනීමට සාකච්ඡා කරමින් සිටීම සිතින් මවාගන්න. මෙය ඇත්තවශයෙන්ම ප්‍රේමයෙන් වටවුන මේසයකි!

ළමයින්ට පාසලෙන් පිටත වඩාත් වැඩියෙන් කියවීම අවශ්‍ය බව උගත්තු එකඟව සිටිති. අපට මුළුතැන්ගෙයි මේසයේදී—අපගේ ළමයින් සමග දිනපතා ශුද්ධ ලියවිලි කියවා ඔවුන්ව ආශිර්වාදකිරීමට අපට පුළුවන.

මුළුතැන් ගෙයි මේසය වටා පවුලේ අය හමුවීමට කාලය වෙන්කර ගැනීමට කල්පානකාරීව ප්‍රවේශමෙන් සැලසුම්කිරීම අවශ්‍යවිය හැකි නමුත්, පවුලේ එකමුතුබව, පවුලේ ආත්මික දියුණුව, ප්‍රේමයෙන් යුතුව පවුලේ සාමාජිකයන් කථාකරමින්, සවන්දෙමින් සහ ප්‍රතිචාරදක්වන විට ගොඩනගන සම්බන්ධතාවයට වඩාත් වැදගත්වන්නේ කුමක්ද? අපගේ සාර්ථකත්වයට මූලිකවන්නේ—නැවත නැවත උත්සාහකිරීමය.

### පවුලේ සම්බන්ධකම් ශක්තිමත්කරන්න

පවුල සහ නිවස විනාශකිරීම සඳහා සොයන බොහෝ බලවේග අද ලෝකයේ ඇත. ඥානවන්ත දෙමාපියෝ පවුලේ සම්බන්ධකම් ශක්තිමත්කිරීම, නිවසේ ආත්මික බව වැඩිකිරීම, යේසුස් ක්‍රිස්තුස් වහන්සේ සහ දේවමාළිගා ක්‍රියාකාරකම් ගැන යොමුවීමට පරිශ්‍රම දරති. සභාපති හොවාඩ් ඩබ්ලිව්. හන්ටර් අපට මෙසේ කියා ඇත:

"අපි එකිනෙකාට වඩාත් කරුණාවෙන්, වඩාත් ආචාරශීලීව, වඩාත් නිහතමානීව සහ ඉවසීමෙන් සහ කමාවදීමෙන් සලකන ලෙසට මම යාච්ඤාකරමි....

"දෙවනුව, එම ආකල්පයෙන් යුතුවම, මම සභාවේ සාමාජිකයන්ට ආරාධනාකරන්නේ ස්වාමීන් වහන්සේගේ දේවමාළිගාව ඔවුන්ගේ සාමාජිකත්වයේ ශ්‍රේෂ්ඨ සංකේතය ලෙස සහ ඔවුන්ගේ ඉතාමත් පූජනීය ගිවිසුම්වල දිව්‍යමය ස්ථානය ලෙස සලකා කටයුතුකිරීමටය. මගේ හදවතේ ගැඹුරුම ආශාව වන්නේ, සභාවේ සෑම සාමාජිකයෙක්ම දේවමාළිගා සුදුසුකම් ලැබීමය." [6]

සභාපති හන්ටර් දුන් මගපෙන්වීම් මගින් මුළුතැන් ගෙයි මේසය වටා සිදුවන දේවල් විශිෂ්ඨ ලෙස දියුණුවිය හැකිය

අපගේ නිවාස තුල අන් අයට සලකන අන්දම අප පුහුණුවිය යුතය. ගෝයිති එතරම් හොඳින් ප්‍රකාශකල ලෙස, "ඔබ [පුද්ගලයෙකුට] ඔහු සිටින ලෙසටම සලකන්නේ නම්, ඔහු එලෙසම සිටිනු ඇත, නමුත් ඔහු සිටිය යුතු ලෙසට ඔබ ඔහුට සලකන්නේ නම්,...සමහරවිට ඔහු [ඔහු විය යුතු ලෙසටම] [තවද වීමට හැකි] පුද්ගලයෙක් වනු ඇත." [7]

### නිවාස භක්තිමත් ස්ථාන කරන්න

වැඩිහිටි බොයිඩ් කේ. පැකර් මෙසේ සඳහන් කළේය: "ස්වර්ගයේ පවතින දේවල් ස්වල්පයක් නිවසට ගෙනඒම සඳහා පවුල් සාමාජිකයන් සභා දායකත්වය ඉහළින්ම කරන බවට සහතික කරගන්න. පවුල් නිවාස සැන්දෑව යනු, ඇත්ත වශයෙන්ම, මෙයටම සකස්කළ දෙයකි—නිවසක රැස්වීමක් සෑම අවශ්‍යතාවයකටම සරිලන ලෙස සංවිධානයකල හැකිය; තවද එය දේවස්ථානයක පැවැත්වෙන, සභා රැස්වීමක් වැන්නක්, හෝ එවැන්නක්ම විය හැකිය." [8]

මෙම උපදේශය වැඩිහිටි ඩීන් එල් ලාසන් අපට පවසා ඇති දෙයට එකඟවෙයි: "අපට නමස්කාරකල හැක ස්ථාන අපගේ සභා ගොඩනැගිලි පමණක්, නොවේ. අපගේ නිවාසද වන්දනාමානකරන ස්ථාන විය යුතුය. හැම දිනකම 'සභාවේ නිවසට යාමට' අපට හැකි නම් එය ඉතා හොඳය. ස්වාමීන් වහන්සේගේ ආත්මය වඩාත් හොඳින් පිළිගැනෙන සහ වඩාත් පහසුවෙන් ලඟාවිය හැකි අපගේම නිවාසවලට වඩා හොඳ වෙනත් ස්ථානයක් නොතිබිය යුතුය.' [9]

අපගේ නිවාසවල මෙම සියලුම දේවල් ඉටුකරගැනීමට අපි කටයුතුකරන විට, සභාපති හැරල්ඩ් බී. ලීගේ ප්‍රකාශයේ ඇති වැදගත්කම ගැන සිහිපත්වීමට අපි හොඳින් වැඩකරන්නෙමු: "ස්වාමීන්වහන්සේ වැඩකිරීමේදී [ඔබ සහ මා] කරන වඩාත්ම වැදගත් කටයුතු වන්නේ... [අපගේම] නිවාස බිත්ති අතර අප කරන කටයුතු බව මතකතබාගන්න." [10]

අද මාගේ ඉල්ලීම වන්නේ අප හැම කෙනෙක්ම අපගේ නිවාස සහ මුළුතැන් ගෙයි මේසය දෙස සැලකිල්ලෙන් බලා, අපගේ නිවාසවලට ස්වර්ගය රැගෙන විත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වෙතට පැමිණීමට පරිශ්‍රම දැරීමය

වැඩිහිටි කර්ටිස් විසින් 1995 අප්‍රේල් Church General Conference හි කළ කථාවකිනි (බලන්න Conference Report, අප්‍රේ. 1995, 109–11; හෝ *Ensign,* මැයි 1995, 82–83).

සටහන්

1. "Scriptures As They Relate to Family Stability," *Ensign,* පෙබ. 1972, 57.
2. "Home Can Be a Heaven on Earth," *Hymns,* අංක. 298.
3. Conference Report තුලිනි, ඔක්තෝ. 1994, 74–75; හෝ *Ensign,* නොවැ. 1994, 54.
4. *Pathways to Perfection* (1973), 26–27.
5. Conference Report තුලිනි, ඔක්තෝ. 1990, 13; හෝ *Ensign,* නොවැ. 1990, 12.
6. "President Howard W. Hunter: Fourteenth President of the Church තුලිනි," *Ensign,* ජූලි 1994, 4–5.
7. Emerson Roy West, *Vital Quotations* තුලිනි (1968), 171.
8. "Begin Where You Are—At Home," *Ensign,* පෙබ. 1972, 71.
9. Conference Report තුලිනි, ඔක්තෝ. 1989, 78; හෝ *Ensign,* නොවැ. 1989, 63.
10. *Strengthening the Home* ( පත්‍රිකාව, 1973), 7.

# සුභාරංචි මූලධර්ම ළමයින්ට ඉගැන්වීම

# 13

*1වෙනි කොටස*

## අදාළකරගැනීම සඳහා අදහස්

ඔබගේම අවශ්‍යතාවයන් සහ තත්වයන් අනුව, මෙම යෝජනා එකක් හෝ දෙකම අනුගමනය කරන්න.

- දහම සහ ගිවිසුම 68:25–28 කියවන්න. ඔබ කියවන විට, ස්වාමීන්වහන්සේ විසින් දෙමාපියන්ට ඔවුන්ගේ ළමයින්ට ඉගැන්වීමට අණ කල මූලධර්ම සහ නියෝග හඳුනාගන්න. මෙ මූලධර්ම සහ නියෝග ඔබගේ ළමයින්ට, හෝ මුණුපුරන්ට, ලේලියන් සහ බෑණාවරුන්ට, හෝ ඔබ හඳුනන වෙනත් ළමයින්ට ඉගැන්වීමට ඔබට කල හැකි දේවල් කිහිපයක් සැලසුම් කරන්න.
- පහත සඳහන් ලිපිය ඔබ කියවන විට, වැඩිහිටි රොබට් ඩී. හේල්ස් විසින් දී තිබෙන යෝජනා එකක් හෝ දෙකක් තෝරාගෙන ඒවා ගැන යොමුවන්න. විවිධ ප්‍රස්ථාවන් මතුවන විට, ලිපියේ වෙනත් යෝජනාගැන යොමුවන්න.

## කියවීමේ පැවරුම

පහත සඳහන් ලිපිය අධ්‍යයනය කරන්න. ඔබ විවාහක නම්, ඔබගේ සහකරු සමග ලිපිය කියවා සාකච්ඡාකරන්න.

### පවුල් ශක්තිමත්කිරීම: අපගේ පූජනීය රාජකාරියකි

ප්‍රේරිතවරුන් දොළොස්දෙනාගේ ගණපූර්ණයේ
වැඩිහිටි රොබට් ඩී. හේල්ස්

#### ආත්මයාණෝ පවුල් ශක්තිමත්කරණසේක

දෙමාපියන්, ළමයින්, ඥාති පවුල් සාමාජිකයන්, නායකයන්, ගුරුවරුන් සහ සභාවේ පෞද්ගලික සාමාජිකයන් වශයෙන් පවුල් ශක්තිමත්කිරීම අපගේ රාජකාරියකි.

පවුල් ආත්මික වශයෙන් ශක්තිමත් කිරීමේ වැදගත්කම ගැන ශුද්ධ ලියවිලිවලින් පැහැදිළිව උගන්වනු ලැබේ. ආදම් පියා සහ මව ඒවා, ඔවුන්ගේ පුතුන්ට සහ දියණියන්ට සුභාරංචිය ඉගැන්වූහ. ස්වාමීන්වහන්සේ ප්‍රේම කල ආබෙල්ගේ පඬුරු උන්වහන්සේ පිළිගත්සේක. අනෙක් අතට, කේන්, දෙවියන්වහන්සේට වඩා සාතන්ට ප්‍රේමකරමින් බරපතල පාපයන් කළේය. ආදම් සහ ඒවා කේන් සහ ඔහුගේ සහෝදරයන් නිසා ස්වාමීන්වහන්සේ ඉදිරියේ වැළපුන නමුත්, ඔවුන්ගේ ළමුන්ට සුභාරංචිය ඉගැන්වීම නතර නොකළෝය (බලන්න මෝසෙස් 5:12, 18, 20, 27; 6:1, 58).

අපගේ ළමයින් විවිධ දීමනා සහ දක්ෂතා සහිතව පැමිණෙන බව අපි අවබෝධ කරගත යුතු වෙමු. සමහරෙක්, ආබෙල් මෙන්, උපතේදීම ඇදහිල්ලේ දීමනා ලබා ඇති බව පෙනෙන්ට ඇත. තවත් අය ඔවුන් ගන්නා සෑම තීරණයකදීම පරිශ්‍රම දරති. දෙමාපියන් ලෙස, අපගේ ළමුන්ගේ සෙවීම් සහ පරිශ්‍රම වලින් ස්වාමීන්වහන්සේ තුල අපගේ ඇදහිල්ල අවිනිශ්චිතවීම හෝ නැතිකරගැනීමට හෝ අපි ඉඩ නොදිය යුතුවෙමු.

බාල ඇල්මා, බලවත් වේදනාවෙන් පීඩිතව…[සහ] [ඔහුගේ] බොහෝ පාපයන් මගින් අතිශය ඛේදජනකව සිටින විට, ලෝකයාගේ පව්වලට වන්දිගෙවීම සඳහා දෙවියන් වහන්සේගේ පුත්‍රයෙක් වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ, පැමිණීම ගැන ඔහුගේ පියා උගන්වනු අසා සිටි බව ඔහුට සිහිපත්විය (ඇල්මා 36:17). ඔහුගේ පියාගේ වචන ඔහුගේ හැරී ඒමට මගපෙන්වීය. ඒ අන්දමින්ම, අපගේ ඉගැන්වීම් සහ සාක්ෂිය අපගේ ළමයින්ට සිහිපත්වනු ඇත.

හීලමන්ගේ හමුදාවේ සිටි 2,000ක ගැටවර රණසූරයෝ ඔවුන්ගේ ධාර්මික මවුවරුන් ඔවුන-ට සුභාරංචි මූලධර්ම බලවත් ලෙස ඉගැන්වූ බවට සාක්ෂි දැරූහ (බලන්න ඇල්මා 56:47–48).

ආත්ම පරීක්ෂාවක බලවත් ලෙස යෙදුන අවස්ථාවක, ඊනොස් මෙසේ කීවේය, "මා විටින් විට ඇසූ මගේ පියා විසින් අනන්ත ජීවිතය ගැන කථා කළ වචන…මගේ හද තුලට තදින් කාවැදිනි" (ඊනොස් 1:3).

දහම සහ ගිවිසුම තුලින් පියවරුන් අමතන ස්වාමීන්වහන්සේ, ඔවුන්ගේ ළමයින්ට "පසුතැවීමේ දහම, ක්‍රිස්තුස්වහන්සේ වන ජීවමාන දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් තුල ඇදහිල්ල, සහ ඔවුන්ගේ අටහැවිරිදි වියේදී, බෞතීස්මය සහ අත්තැබීම මගින් ශුද්ධාත්මයාණන්ගේ දීමනාව ගැනද උගන්වන ලෙස ප්‍රකාශකරනසේක….

තවද ඔවුහු ඔවුන්ගේ ළමයින්ට යාච්ඤාකිරීමට, සහ ස්වාමීන්වහන්සේ ඉදිරියේ සෘජුව කටයුතු කිරීමටද උගන්වනු ලබන්නෝය (බලන්න ධීසහසී 68:25, 28).

**සුභාරංචිය ඉගැන්වීමෙන් පවුල් ශක්තිමත්වේ.**

අපි වචනය සහ ආදර්ශය තුලින් අපගේ ළමයින්ට සුභාරංචිය උගන්වන විට, අපගේ පවුල් ආත්මිකව ශක්තිමත්වී, ආරක්ෂිතවේ.

අපගේ පවුල් ආත්මිකව ශක්තිමත්කිරීමේ අපගේ පූජනීය වගකීම සම්බන්ධ දී තිබෙන ජීවමාන අනාගත වක්තෘවරුන්ගේ වචන පැහැදිළිය. 1995දී පළවෙනි සභාපතිත්වය සහ ප්‍රේරිතවරුන් දොළොස්දෙනාගේ සභාව මෙසේ ප්‍රකාශකරමින් ලෝකයට ප්‍රකාශනයක් නිකුත් කළහ. "පවුල මැවුම්කරුවාණන්ගේ දරුවන්ගේ සදාකාලික ගමනාන්තය සඳහාවන උන්වහන්සේගේ සැලසුමේ කේන්ද්‍රස්ථානය වන්නේය. …ස්වාමිපුරුෂයා සහ භාර්‍යාවට එකිනෙකාට සහ ඔවුන්ගේ දරුවන්ට ප්‍රේමකරමින් රැකගැනීමේ උදාර වගකීමක් ඇත…. දෙමාපියන්ට තම දරුවන් ප්‍රේමයෙන් සහ ධර්මිෂ්ඨව ඇතිදැඩි කිරීමටත්, ඔවුන්ගේ ලෞකික සහ ආත්මික අවශ්‍යතාවයන් ලබාදීමටත්, එකිනෙකාට ප්‍රේමකරමින් සේවයකිරීමට [සහ] දෙවියන්වහන්සේගේ පණිත් පිළිපැදීමට ඉගැන්වීමේත් පූජනීය රාජකාරියක් ඇත" ("පවුලː ලෝකයට ප්‍රකාශනයකි" *Ensign*, නොවැ. 1995, 102).

මෙම වසරේ පෙබරවාරි මාසයේදී, පළවෙනි සභාපතිත්වය සියලුම දෙමාපියන්ට කැඳවීමක් නිකුත් කරමින්, "තම දරුවන්ට සුභාරංචි මූලධර්ම උගන්වමින් ඒ අනුව ඇති දැඩි කිරීම සඳහා දැඩි උත්සාහයකින් කැපවන ලෙසත්, එමගින් ඔවුන් සභාවට සමීපව තබන බවත් කීවේය. ධර්මිෂ්ඨ ජීවිතයක පදනම වන්නේ නිවස වන අතර, වෙනත් කිසිදු ආයතනයකට එහි ස්ථානය ගැනීමට හෝ මෙම දෙවියන්වහන්සේ දුන් එහි අත්‍යාවශ්‍ය කාර්‍යයන් ඉදිරියට ගෙනයාමට හෝ නොහැකිය."

පෙබරවාරි මස ලිපිය තුලින් පළවෙනි සභාපතිත්වය මෙසේ ඉගැන්වීය, ළමයින්ට සුභාරංචි මූලධර්ම උගන්වා, ඒ අනුව ඇතිදැඩි කිරීම මගින්, දූෂිත දේවලින් පවුල් ආරක්ෂා කරගැනීමට දෙමාපියන්ට හැකිවේ. ඔවුහු තවදුරටත් දෙමාපියන්ට සහ ළමයින්ට උපදෙස් දෙමින්, "පවුලේ යාච්ඤාවට, පවුල් නිවාස සැන්දෑවට, සුභාරංචි අධ්‍යයනයට සහ උපදෙස්වලට, සහ යහපත් පවුල් ක්‍රියාකාරකම්වලට උසස්ම ප්‍රමුඛස්ථානය දීමට කීහ. කෙසේවුවද, වෙනත් ඉල්ලීම් හෝ ක්‍රියාකාරකම් සුදුසු හෝ අදාළනම් ඒවාට ඉඩදිය හැකි වුවද, එමගින් දෙමාපියන්ට සහ පවුල්වලට පමණක් සුදුසු පරිදි ඉටුකිරීමට හැකි දිව්‍යමය වශයෙන් නියම කල රාජකාරීන් වෙනස් නොකළ යුතුය" (First Presidency letter, 11 Feb. 1999; *Church News* තුලිනි, 27 පෙබ. 1999, 3).

ස්වාමීන්වහන්සේ සහ උන්වහන්සේගේ ධර්මයේ උපකාරයෙන් යුතුව, අභියෝගවලින් පවුලකට මුහුණදීමට සිදුවන සියලුම සිත් වේදනාවල ප්‍රතිඵල තේරුම්ගැනීමට සහ ජයගැනීමටද පුළුවන. පවුල් සාමාජිකයන්ගේ අවශ්‍යතාවය කුමක් වුවද, අනාගතවක්තෘවරුන් විසින් ලබාදී තිබෙන උපදෙස් අප අනුගමනය කරන විට, අපගේ පවුල් ශක්තිමත්කිරීමට අපට හැකිය.

අපගේ පවුල් ශක්තිමත්කිරීමේ සාධකය නම්, ස්වාමීන්ව හන්සේගේ ආත්මය අපගේ නිවාසවලට පැමිණීමට සැලැස්වීමය. අපගේ පවුල්වල ඉලක්කය නම්, සෘජු සහ පටු මාවතේ සිටීමය.

**පවුල් ශක්තිමත්කිරීම සඳහා අදහස්**

අපගේම නිවාසවල බිත්ති අර සිට පවුල ශක්තිමත්කිරීම සඳහා ගිණිය නොහැකි දේවල් කළ හැකිය. අපගේම පවුල් ශක්තිමත්කිරීමට අවශ්‍යවන අංශයන් හඳුනාගැනීමට උපකාරවත්වන අදහස් කිහිපයක් බෙදාගැනීමට මම කැමැත්තෙමි. මා ඒවා පිරිනමන්නේ දිරිමත්කිරීමේ ආකල්පයකින් යුතුව, හැම පවුලක්ම—සහ හැම පවුල් සාමාජිකයෙක්ම—අද්විතීය බව දැනගෙනය.

**නිවස ආරක්ෂිත ස්ථානයක් විය යුතුය.**

- අපගේ නිවාස හැම පවුල් සමාජිකයෙකුටම ප්‍රේමය සහ තමා ඊට අයත්බවට හැඟීමක් ඇතිවන ආරක්ෂිත ස්ථානයක් කරන්න. හැම සාමාජිකයෙක්ගේම දීමනා සහ හැකියාවන් වෙනස් බවත්; හැම කෙනෙක්ම විශේෂ ප්‍රේමයක් සහ සැලකිල්ලක් අවශ්‍ය පුද්ගලයෙක් බව අවබෝධකරගන්න.
- "මෘදු උත්තරයකින් කෝපය පහවෙන බව," මතකතබාගන්න (හිතෝපදේශ 15:1). මගේ ආදර බිරිඳ සහ මම සෝල්ට් ලේක් දේවමාළිගාව තුල මුද්‍රාලැබූ විට, වැඩිහිටි හැරල්ඩ් බී. ලී අපට නුවණැති උපදේශයක් දුන්නේයː "ඔබ කෝපයෙන් උස් හඬින් කථාකරන විට, ආත්මයාණන් ඔබගේ නිවසින් පිටවී යනසේක." අප කිසිදා අමනාපයෙන් යුතුව, අපගේ නිවාස හෝ හදවත් දොරවල් අපගේ දරුවන්ට අගුළු නොදැමිය යුතුය. අකීකරු පුත්‍රයා මෙන්, අපගේ දරුවන්ට අවශ්‍යවන විට, ප්‍රේමය සහ උපදෙස් පතා අප වෙත හැරීමට ඔවුන්ට හැකි බව ඔවුහු දනිති.
- අපගේ දරුවන් සමග පෞද්ගලිකව කාලය ගතකර, ක්‍රියාකාරකම හෝ කථාවේ මාතෘකාව තෝරාගැනීමට ඔවුන්ට ඉඩ සලසන්න. වෙනත් අරමුණු අවහිර කරන්න.

**ළමුන්ට යාච්ඤාකිරීමට, ශුද්ධ ලියවිලි කියවීමට, සහ සුදුසු සංගීතයට සවන්දීමට උගන්වන්න**

- අපගේ ළමයින්ට, පෞද්ගලික යාච්ඤාව, පෞද්ගලික ශුද්ධ ලියවිලි අධ්‍යයනය, විශේෂිත අවශ්‍යතා සඳහා උපවාස කිරීම වැනි, පෞද්ගලික ආගමික හැසිරීම්වලට දිරිගන්වන්න. ඔවුන්ගේ භාෂාව හැසිරවීම, සහ අන් අය ඉදිරියේ හැසිරීම සොයාබලමින් ඔවුන්ගේ ආත්මික දියුණුව මැන බලන්න.
- අපගේ ළමුන් සමග දිනපතා යාච්ඤාකරන්න.

- එකට එක්ව ශුද්ධ ලියවිලි කියවන්න. මගේ මව සහ පියා ශුද්ධ ලියවිලි කියවන විට ළමුන් වන අපි පොලොව මත හිඳගෙන සවන්දී සිටීම මට මතකය. සමහර අවස්ථාවලදී ඔවුහු අප අමතා, "එම ශුද්ධ ලියවිල්ල ගැන ඔබ කුමක් සිතන්නේද" හෝ "එය ඔබට කුමන හැඟීමක් ඇතිකරන්නේද?" යයි අසති. ඉන්පසුව අප අපගේම වචන වලින් ප්‍රතිචාර දක්වන විට ඔවුහු අසා සිටිනු ඇත.
- සභා සඟරාවලින් ජීවමාන අනාගතවක්තෘවරුන්ගේ වචන සහ ළමුන්, තරුණ අය සහ වැඩියන් සඳහාවන අනෙකුත් ආනුභාවාත්මක ලිපි කියවන්න.
- අපි එකට එක්ව ගීතිකා පොත්වලින් සහ ළමා ගී පොතෙන් ගීතිකා ගායනාකරන විට, සුදුසු සංගීත නාදයෙන් අපගේ නිවාස පුරවාලීමට අපට පුළුවන.

**පවුල් නිවාස සැන්දෑවන් සහ පවුල් උපදෙස් සභා පවත්වන්න**

- සෑම සතියකම පවුල් නිවාස සැන්දෑවන් පවත්වන්න. දෙමාපියන් ලෙස, අපි සමහර අවස්ථාවලදී අපගේ ළමයින්ට ඉගැන්වීමේදී සහ සාක්ෂිදැරීමේදී වඩා හිතවත් කමක් දක්වන්නෙමු. මගේම ජීවිතය තුලදී මම එම වරද කර ඇත්තෙමි. අපගේ ආත්මික හැඟීම් අපගේ ළමයින් සමග බෙදාගැනීම සහ ඔවුන්ට උගන්වමින් සාක්ෂිය ඔවුන් සමග බෙදාගැනීමද ඔවුන්ට අවශ්‍යවේ.
- පවුලේ සැලසුම් සහ හැඟීම් සාකච්ඡා කිරීමට පවුල් උපදෙස් සභා පවත්වන්න. වඩාත් සාර්ථක පවුල් උපදෙස් සභාවන් වන්නේ, හැම පවුල් සාමාජිකයෙක් සඳහාම වෙන- වෙනම පවත්වන ඒවාය. ඔවුන්ගේ අදහස් වැදගත් බව දැනගැනීමට අපගේ ළමුන්ට උපකාරකරන්න. ඔවුන්ට සවන්දී, ඔවුන්ගෙන් ඉගෙනගන්න.

**සුභාරංචිය බෙදාගන්න, සභා නායකයන්ට සහයෝගය දෙන්න, පවුලක් මෙන් එකට සහභාගිවන්න**

- අඩු ක්‍රියාකාරී හෝ සාමාජික නොවන මිතුරන්ට ඉගැන්වීමට ධර්මදූතයන්ට අපගේ නිවාසවලට ආරාධනා කරන්න.
- අපි සභා නායකයන්ට සහයෝගයදී, ආධාරකරන බව පෙන්වන්න.
- හැකි අවස්ථාවලදී එකට කෑම ගනිමින්, කෑම වෙලාවේදී අර්ථවත් සාකච්ඡා පවත්වන්න.
- යම් වැඩක් අපම කරගැනීම ඉක්මන් සහ පහසු විය හැකි වුවත්, පවුලක් ලෙස එකට වැඩකරන්න. අපගේ පුතුන් සහ දියණියන් සමග කථා කරමින් අපි එකට වැඩකරමු. හැම සෙනසුරාදාවකම මගේ පියා සමග මට එම ප්‍රස්ථාවය ලැබී ඇත.

**යහපත් මිතුරන්වී අනාගතයට සූදානම්වීමට අපගේ ළමුන්ට උගන්වන්න**

- යහපත් මිත්‍රත්වයක් ගොඩනගාගන්නා අන්දම සහ ඔවුන්ගේ මිතුරන්ට අපගේ නිවාසවලට පිළිගැනීමේ හැඟීමක් ඇතිවීමට අපගේ ළමයින්ට උපකාර කරන්න. අපගේ ළමුන්ගේ දෙමාපියන් හඳුනාගැනීමට සලස්වමු.
- අපගේ ළමුන්ගේ කාලය සහ සම්පත් පාලනයකිරීමට උගන්වන්න. ඔවුන්ට ආත්ම ශක්තිය සහ අනාගතය සඳහා සූදානම්වීමේ වැදගත්කම ගැන ඉගෙනගැනීමට උපකාර කරන්න.

**පවුලේ උරුමයන් සහ සම්ප්‍රදායන් බෙදාගන්න**

- අපගේ ළමුන්ට අපගේ මුතුන්මිත්තන්ගේ ඉතිහාසය සහ අපගේම පවුල් ඉතිහාසය ගැන උගන්වන්න.
- පවුලේ සම්ප්‍රදායන් ගොඩනගන්න. අපගේ ළමුන්ගේ අවශ්‍යතාවයන්, දක්ෂතා, සහ හැකියාවන් සලකාබලමින් පවුලම එක්ව අර්ථවත් නිවාඩු චාරිකා සැලසුම්කර ක්‍රියාත්මක කරන්න. ඔවුන්ට ප්‍රීතිමත් මතකයන් ඇතිකරගැනීමටත්, ඔවුන්ගේ දක්ෂතාවයන් දියුණුකරගන, ආත්ම වටිනාකම ගොඩනගාගැනීමටත් ඔවුන්ට උදව්කරන්න.

**පණත්වලට කීකරුවීම සහ ව්‍යවස්ථානියෝග ලබාගැනීමේ වැදගත්කම ගැන උගන්වන්න**

- වචනයෙන් සහ ආදර්ශයෙන්, සදාචාරාත්මක අගයන් සහ පණත්වලට කීකරුවීමට කැපවීම ගැන උගන්වන්න.
- මගේ බෞතීස්මයෙන් සහ ස්ථිරකිරීමෙන් පසුව, මගේ මව මා පසෙකට කැඳවා, "ඔබට කුමක් හැඟෙන්නේදැයි" මගෙන් ඇසුවාය. මට ඇතිවූ සහනදායි, ප්‍රීතිමත්, සමාදානයේ උණුසුම් හැඟීම මට හැකි හොඳම අයුරින් මම විස්තර කළෙමි. මව පැහැදිළිකරමින්, මට ඇතිවූ හැඟීම්, මා දැන් ලබාගත්, ශුද්ධාත්මයාණන් වහන්සේගේ දීමනාව බව කීවාය. මා එයට සුදුසුව ජීවත්වුවහොත්, එම දීමනාව මට දිගටම තබාගැනීමට හැකි බව ඇය මට කීවාය. එය මගේ ජීවිතය මුළුල්ලේම මා සමග තිබෙන ඉගැන්වීමේ මොහොතකි.

බෞතීස්මය සහ ස්ථිරකිරීම, ශුද්ධාත්මයාණන්ගේ දීමනාව ලබාගැනීම, සක්‍රමෙන්තුව භුක්තිවිඳීම, පූජකවරයට ගරුකිරීම, සහ දේවමාළිගා ගිවිසුම් තබා ඒවා ආරක්ෂා කිරීම ගැන අපගේ ළමයින්ට උගන්වන්න. දේවමාළිගා නිර්දේශයක් සඳහා සුදුසුව ජීවත්වීම සහ දේවමාළිගා විවාහයකට සූදානම්වීමේ වැදගත්කම ගැන දැනගැනීම ඔවුන්ට අවශ්‍යවේ.

- ඔබ තවමත් ඔබගේ ළමයින්ට සහ සහකරුට දේවමාළිගාව තුල මුද්‍රාකර නොමැති නම්, පවුලක් මෙන් දේවමාළිගා ආශිර්වාද ලැබීමට කටයුතුකරන්න. පවුලක් මෙන් ඉලක්කයක් තබන්න.

- සොහොයුරෙනි, ඔබ උසුලන පූජකවරයට සුදුසුව ජීවත්වී, ඔබගේ පවුලේ ජීවිතවලට ආශිර්වාදකිරීමට එය පාවිච්චිකරන්න.

### සමාජ, පාසල් සහසභා ක්‍රියාකාරකම් ගැන දැනුවත්ව සිටින්න

නිවසින් බාහිරව සම්පත් තිබේ. ඒවා ඥානවන්තව පාවිච්චිකිරීමෙන් අපගේ පවුල් ශක්තිමත් වනු ඇත.

- සභාවට සහ සමාජයට සේවයකිරීමට අපගේ ළමයින් දිරිමත්කරන්න.
- අපගේ ළමුන්ගේ ගුරුවරුන්, පුහුණුකරුවන්, අනුශාසකයන්, උපදේශකයන්, සහ සභා නායකයන් සමග අපගේ හැඟීම් සහ අපගේ ළමුන්ගේ අවශ්‍යතාවයන් ගැන කථාකරන්න.
- අපගේ ළමුන් ඔවුන්ගේ අමතර කාලයේදී කරන දේවල් ගැන දැනගන්න. ඔවුන් කැමති චිත්‍රපට, රූපවාහිනී වැඩසටහන් සහ වීඩියෝ දර්ශන ගැන සොයා බලන්න. ඔවුන් අන්තර්ජාලයට පිවිසි විට, ඔවුන් කරන්නේ කුමක්දැයි දැනගන්න. යහපත් විනෝදාංශවල වැදගත්කම අබබෝධකරගැනීමට ඔවුන්ට උදව්වන්න.
- ප්‍රයෝජනවත් පාසල් ක්‍රියාකාරකම්වලට දිරිගන්වන්න. අපගේ ළමුන් ඉගෙනගන්නා දේවල් දැනගන්න. ඔවුන්ගේ ගෙදර වැඩවලට උදව්කරන්න. අධ්‍යාපනය සහ රැකියාවකට සූදානම්වීම මෙන්ම ස්වයං පූර්ණත්ව යෙහි වැදගත්කම අවබෝධකරගැනීමට ඔවුන්ට උපකාරකරන්න.
- තරුණ කාන්තාවෙනි, ඔබ 18වෙනි උපන්දිනයට අවතීර්ණවන විට, සහන සමිතියට සහභාගිවන්න. ඔබලාගෙන් සමහරෙක් එම පරිවර්තනය කිරීමට පසුබට විය හැකිය. ඔබ සුදුසු නොවේ යැයි ඔබ සිතිය හැකිය. මගේ තරුණ සොහොයුරියනි, ප්‍රශ්නය එය නොවේ. ඔබ සඳහා බොහෝ දේවල් සහන සමිතියේ ඇත. එය ඔබගේ මුළු ජීවිත කාලයටම ආශිර්වාදයක් විය හැකිය.
- තරුණයෙනි, ආරෝනික පූජකවරයට ගරුකරන්න. එය ඔබව මෙල්කිසදෙක් පූජකවරයට සූදානම්කිරීමේ පූජකවරයකි. ඔබව මෙල්කිසදෙක් පූජකවරයට පත්කල විට, වැඩිහිටි ගණපූර්ණය තුල සම්පූර්ණයෙන්ම ක්‍රියාකාරීවන්න. සහෝදරත්වය, ගණපූර්ණ උපදෙස්, සහ අන් අයට සේවයකිරීමේ ප්‍රස්ථාවන් මගින් ඔබට සහ ඔබගේ පවුලට ඔබගේ ජීවිත කාලය මුළුල්ලේම ආශිර්වාද ලැබෙනු ඇත.

### ස්වාමීන්වහන්සේගේ ප්‍රේමයේ ආදර්ශය අනුගමනයකරන්න

අපගේ නිවාස තුලට ස්වාමීන්වහන්සේගේ ආත්මය රැගෙනවිත්, උන්වහන්සේගේ ආදර්ශය තුලින් අපි උගන්වන්නේ නම්, අපගේ පවුල් එක් අංශයකින් හෝ යම් ආකාරයකින් ශක්තිමත්කිරීමට පුළුවන.

- ඇදහිල්ල සමගින් ක්‍රියාකරන්න; බියෙන් යුතුව ප්‍රතිචාර නොදක්වන්න. අපගේ ගැටවරයන් පවුල් වටිනාකම් පරීක්ෂාකරන විට, හැම පවුල් සාමාජිකයාගේම විශේෂිත අවශ්‍යතාවයන් සඳහා උපදෙස් පතා දෙමාපියන් ස්වාමීන්වහන්සේ වෙතට යා යුතුය. තේරීම්කරන ආකාරය ගැන ඉගැන්වීම සඳහා ඔබගේ ඉගැන්වීම්වලට, වැඩි ප්‍රේමයක්, සහයෝගයක් සහ ශක්තියක් එකතුකල යුතු වෙලාව මෙයවේ. අපගේ ළමයින් කරන වැරදිවලින් ඔවුන්ට ඉගෙනගැනීමට සැලැස්වීම බියජනක දෙයකි. නමුත් ස්වාමීන්වහන්සේගේ ක්‍රමය සහ පවුලේ අගයන් තෝරාගැනීමට ඔවුන් දක්වන කැමැත්ත අනුව ඔවුන් තුලින්ම එන තේරීම, එම අගයන් ඔවුන් තුලට බලෙන් ඇතුළුකිරීමට අප දරන උත්සාහයට වඩා වටනේය. ප්‍රේමය දැක්වීමේ සහ පිළිගැනීමේ ස්වාමීන්වහන්සේගේ මාර්ගය, විශේෂයෙන්ම ගැටවරයන් හදාවඩා ගැනීම්දී, සාතන්ගේ මාර්ගය වන බලකිරීම සහ බලහත්කාරයට වඩා හොඳය.
- අනාගතවක්තෘ ජෝසෆ් ස්මිත්ගේ වචන මතකතබාගන්න: "පාප අමතකකර දැනීම සඳහා මිනිසුන්ව මෙහෙයවීමට, ඔවුන්ගේ අත් අල්ලාගෙන සහ කරුණාවෙන් ඔවුන් ගැන සොයාබැලීමට වඩා හොඳ වෙනත් කිසි මගක් නැත. ප්‍රති විරුද්ධ කණ්ඩායම් මනුෂ්‍ය සිත කර්කශ ලෙස රිදවා, කලකිරීමට කැමැත්තක් දක්වන විට, යම් පුද්ගලයන් මා හට අඩු ප්‍රමාණයක හෝ කරුණාවක් සහ ප්‍රේමයක් ප්‍රකාශකරන විට, අහෝ, මගේ සිතට කෙතරම් බලයක් ඇතිවේද" (*Teachings of the Prophet Joseph Smith,* තෝරා, Joseph Fielding Smith [1976], 240).

### නොමග ගිය ළමුන් නැවත පැමිණෙනු ඇත

- අපට කළ හැකි සියල්ලම කළද, අපගේ සමහර ළමුන් ධර්මිෂ්ඨ මාවතෙන් නොමගට යාමේදී, අප බලාපොරොත්තු කඩවී සිටින විට, ඕර්සන් එෆ්. විට්නිගේ වචනවලින් අපට සැනසීමක් ලැබිය හැකිය: "සමහර බැටළුවන් ඉබාගතේ ගියද, යහපත් එඬේරාගේ දෙනෙත් ඔවුන් මතය, එසේම ඉක්මණින්ම හෝ පසුව දේව ආරක්ෂාවේ අඩු ඔවුන් වෙත ලඟාවී ඔවුන්ව නැවතත් රැලට ඇදගනු ලැබේ. මෙම ජීවිතයේ හෝ මතු ජීවිතයේ වුවද, ඔවුන් නැවත පැමිණෙනු ඇත. සාධාරණත්වයට ඔවුන්ගේ ණය ගෙවීමට ඔවුන්ට සිදුවනු ඇත; ඔවුන්ගේ පාපවලට ඔවුන් වේදනා විඳිනු ඇත; කටු මාවතක ගමන්කිරීමට ඔවුන්ට සිදුවනු ඇත; නමුත් අවසානයේදී පසුතැවිලිවූ පුත්‍රයා මෙන්, ඔවුන්ට ප්‍රේමනීයවූ කමාවදෙන [මවකගේ සහ] හදවතකට සහ නිවසකට මග පෙන්වනු ඇත, වේදනාත්මක අත්දැකීම අසාර්ථකවී නැත. [අපගේ] අපරීක්ෂාකාරී සහ අකීකරු ළමයින් වෙනුවෙන් යාච්ඤාකරන්න. [අපගේ] ඇදහිල්ල ඔවුන්ට දිගුකරන්න. දෙවියන්වහන්සේගේ ගැලවීම ඔබ දකින තුරු, බලාපොරොත්තු තබන්න, විශ්වාසය තබන්න" (උපුටාගැනීම Joseph Smith, Conference Report තුලිනි, අප්‍රේ. 1929, 110).

## අවිවාහක වැඩිහිටියන් සහ ඥාති පවුලවලට ශක්තිය ලබාදිය හැකිය

- ඔබ අවිවාහක නම් හෝ ළමයින් ලැබීමට ආශිර්වාදිත නොවූ අය නම් තත්වය කුමක්ද? පවුල් සම්බන්ධ උපදෙස් ගැන සැලකිලිමත්වීම ඔබට අවශ්‍යද? එසේය. එය මෙම පොළොවේ ජීවිතය තුලදී අප හැම කෙනෙක්ම ඉගෙනගත යුතු දෙයකි. අවිවාහක වැඩිහිටි සාමාජිකයන්ට විටින් විට පවුලට විශේෂ ශක්තියක් ලබාදී, අතිවිශාල සහයෝගයක්, පිළිගැනීමක්, සහ ප්‍රේමයක් ඔවුන්ගේ පවුල්වලට සහ ඔවුන් අවට පවුල්වලටද ලබාදිය හැකිය.
- ඥාති පවුල්වල බොහෝ වැඩිහිටියෝ ඔවුන්ගේම යුතුකම් අනුව බොහෝ දෙමාපිය කටයුතු කරති. සීයලා, නැන්දලා සහ මාමලා, සොයුරු, සොයුරියන්, ලේලිලා සහ බෑනලා, ඥාති සොහොයුරන් සහ වෙනත් පවුල් සාමාජිකයන්ට පවුල ගැන විශාල බලපෑමක් කල හැකිය. මගේම ඥාති පවුලේ අය ඔවුන්ගේ ආදර්ශයෙන් සහ සාක්ෂිය මගින් මට මගපෙන්වීම ගැන මගේ කෘතඥතාවය ප්‍රකාශකිරීම මට අවශ්‍යවේ. සමහර අවස්ථාවලදී ඥාති පවුල්වල සාමාජිකයන්ට කිව හැකි දේවල්, දෙමාපියන්ට වාදයක් පටන් නොගෙන කිව නොහැකිය. තම මව සමග පෞද්ගලික සාකච්ඡාවකින් පසුව, එක් තරුණ කාන්තාවක් මෙසේ කීවාය: "මා යම් වරදක් කල බව ඔබට සහ පියාට කීම භයානකය. නමුත් සුසාන් නැන්දාට කීම ඊට වඩා භයානකය. ඇයගේ බලාපොරොත්තු කඩකිරීමට මට නොහැකිය."

## සර්ව සම්පූර්ණවූ පවුල් නොමැත

අප මැරෙන සුළු ජීවිතයේ සිටින්නේ ඉගෙනගැනීමට සහ ඇදහිල්ල වර්ධනයකිරීමට බව දැනසිටිමින්, සෑම දෙයකටම විරුද්ධ පැත්තක් තිබිය යුතු බව අපි දැනගත යුතු වෙමු. අපගේ නිවසේ පවුලේ සභාවක් පැවැත්වෙන විට, මගේ බිරිඳ මෙසේ කීවාය, "යමෙකුට සර්ව සම්පූර්ණ පවුලක් තිබිය හැකි බව කියන්නේ නම්, ඔබට ඔවුන් ගැන හොඳ ප්‍රමාණවත් දැනීමක් නැත."

## නිවස සහ පවුල නිසි පිළිවෙළකට සකස්කරන්න

සොයුරු, සොයුරියනි, ස්වාමීන්වහන්සේ විසින් ජෝසෆ් ස්මිත්ට සහ සභාවේ නායකයන්ට 1833දී දුන් අවවාද මෙන්ම, තරවටුවද දෙමාපියන් වශයෙන් අපි අසමු, [අපගේ] නිවස නිසි පිළිවෙලකට තබමු (බලන්න ධීසහසී 93:43). නුඹලාගේ ළමයින් සත්‍යයට සහ ආලෝකයට ගෙන එමින් හදාගැනීමට මම නුඹලාට අණ කර ඇත්තෙමි (බලන්න ධීසහසී 93:40). [අපගේ] පවුල නිසි පිළිවෙලකට තබා, ඔවුන් නිවස ගැන වඩාත් උනන්දුවෙන් සැලකිලිමත්වෙමින්, නිතරම යාච්ඤාකරන අන්දම බලන්න, නැතහොත් ඔවුන්ගේ ස්ථානවලින් පිටතට ඉවත්කරනු ලබන්නේය (බලන්න ධීසහසී 93:50).

අපගේ කාලයේ අනාගතවක්තෘවරු ඒ අන්දමේම දැනමුතුකමක් සහ අවවාදයක් අපගේ පවුල් නිසි පිළිවෙලකට තබාගැනීම සඳහා දෙමාපියන්ට දී ඇත. අපගේ පවුල්වල ඇදහිල්ල තුලින් සතුරාට මුහුණදීමට අවශ්‍ය ආනුභාවය සහ ප්‍රේමය සමගින් අප ආශිර්වාදිත වේවා, අපගේ පරීක්ෂාවන් ස්වාමීන්වහන්සේට සහ එකිනෙකා වෙත අපව සමීපකරවීම සඳහා බව එවිට අපි දැනගන්නෙමු. අනාගතවක්තෘවරයාගේ හඬට සවන්දී අපගේ නිවාස පිළිවෙලකට තබාගැනීමට අපට හැකිවේවා, (බලන්න ධීසහසී 93:41–49). අපි ස්වාමීන්වහන්සේ වෙතට සමීපවන විට, පවුල ශක්තිමත් වෙන අතර, අපි එකිනෙකාව ඔසවාතබමින්, ශක්තිමත්කර, ප්‍රේමයෙන්, සැලකිලිමත්වන විට, පවුලේ හැම සාමාජිකයාම ශක්තිමත්වේ. "නුඹ මා ඔසවන විට, මම නුඹ ඔසවමි, එවිට අපි එකට ඉහළට යන්නෙමු" (කෝකර් හිතෝප දේශයක්).

අපගේ පවුල් ශක්තිමත්කරගැනීම සඳහා ස්වාමීන්ව හන්සේගේ ආත්මය පිළිගෙන පවත්වාගැනීමට අපට හැකිවේවා. එසේම අපගේ හැම පවුල් සාමාජිකයෙක් හටම සදාකාලික ජීවනයට මග පෙන්වන "සෘජු සහ පටු මාවතේ" සිටීමට ලැබේවා.(2 නිෆායි 31:18), මම යාච්ඤාකරමි.

Elder හේල්ස් 199 අප්‍රේල් මස කල කථා වකිනි Church General Conference හි බලන්න Conference Report, අප්‍රේල්. 1999, 39–44; හෝ *Ensign,* මැයි 1999, 32–34).

# සුභාරංචි මූලධර්ම ළමයින්ට ඉගැන්වීම

# 14

*2 වෙනි කොටස*

## අදාළකරගැනීම සඳහා අදහස්

ඔබගේම අවශ්‍යතාවයන් සහ තත්වයන් අනුව, මෙම යෝජනා එකක් හෝ වැඩියෙන් අනුගමනය කරන්න.

- පවුලක් මෙන්, එකට එක්ව ඔබට සේවයකල හැකි ක්‍රියාකාරකමක් සැලසුම්කරන්න.
- ඔබගේ ළමයෙක් හෝ මුනුපුරෙක්, ලේලිය හෝ බෑණා හෝ ඔබගේ පවුලේ වෙනත් ළමයෙකු සමග නිවසේ යම් වැඩක් කරන්න. ඔබ වැඩකරන අතර එම ළමයා සමග කථාකරන්න. උදව්කරන ළමයාගේ උත්සාහයන් විවේචනය නොකර ඉගැන්වීමේ වාසිය ලබාගන්න.
- *තරුණයන් ශක්තිමත්කිරීම සඳහා* (34285) යන පත්‍රිකාවේ පහත සඳහන් කොටස් කියවන්න: "මාධ්‍යය: චිත්‍රපට, රූපවාහිනී, ගුවන් විදුලිය, වීඩියෝ කැසට් පට, පොත්, සහ සඟරා" (පිටු 11–12), "සංගීතය සහ නැටුම්" (පිටු 13–14), සහ "ලිංගික පවිත්‍රතාවය" (පිටු 14–16). ඔබ මෙම කරුණු නැවත බැලීමෙන් පසුව, මෙම කරුණු ඔබත් සමග කියවීමෙන් ඔබගේ ළමයින්ගෙන් කවරෙක් ප්‍රයෝජන ලබන්නේදැයි නිශ්චය කරන්න.

## කියවීමේ පැවරුම

පහත සඳහන් ලිපිය අධ්‍යයනය කරන්න. ඔබ විවාහක නම්, ඔබගේ සහකාරිය සමග ලිපිය කියවා සාකච්ඡාකරන්න.

### ළමයින්ට උගන්වන්න

සභාපති බොයිඩ් කේ පැකර්
ප්‍රේරිතවරුන් දොළොස්දෙනාගේ ගණපූර්ණයේ
වැඩබලන සභාපතිවරයා

මෙහි සහ අනෙකුත් ස්ථානවල රැස්වසිටින ජනතාව යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසු-දවස්වල ශුද්ධවන්තයන් ගෙන් යුත් සභාවේ සමාජිකත්වය හා බැඳුනු සත්‍යය සඳහා පවතින නොසංසිඳෙන පිපාසය ගැන සාක්ෂි දරති.

ඔබට වඩාත් සුදුසු දෙය ගැන මා යාච්ඤාකරන විට, තව සති තුනකින් මා 75 වෙනි උපන්දිනයට ලඟාවෙන බව මට දැනීමෙන්, *ඉහළ මධ්‍යම වයස* වශයෙන් හැඳින්වෙන මා තෝරාගත් දෙයට යොමුවෙමි.

මම වසර 50කට වඩා කාලයක් ගුරුවරයෙක්ව සිටියෙමි. ස්ථිරලෙසම මා ඉගෙනගත් යමක් ඔබට ප්‍රයෝජනවත්විය හැකිය.

මා මෙය ඉගෙනගත්තේ අත්දැකීමෙනි: ජීවිතය අපට අපට දැනගැනීම අවශ්‍ය බව අප නොසිතන යම් දේවල් අපට උගන්වයි. මෙ අසීරු පාඩම් වඩාත් වටිනා දේවල් වීමට පුළුවන.

*මා ඉහළ මධ්‍යම වයස* ගැන ඉගෙනගැනීමේදී, වෙනත් යමක් මම ඉගෙනගත්තෙමි. වෛද්‍යවරයෙකු සහ රෝගියෙක් අතර සිදුවන මෙම සංවාදය ගැන සිතා බලන්න.

වෛද්‍යවරයා: "මගෙන් ඔබට වුවමනා උපකාරය කුමක්ද? පෙනීමට තිබෙන ඔබගේ ප්‍රශ්නය කුමක්ද?"

රෝගියා: "එය මගේ මතකය ගැනයි වෛද්‍යතුමනි, මා කියවන දෙය, මතකතබාගන්න මට බැහැ. මා කාමරයකට ආවේ මන්දැයි සිහිපත්කරන්න මට බැහැ. මා බඩු තිබ්බේ කොහේදැයි මට මතක නැහැ."

වෛද්‍යවරයා: "හොඳයි මට කියන්න, කොපමණ කාලයක් මෙම තත්වයෙන් ඔබ පීඩාවින්දේද?"

රෝගියා: "කොපමණ කාලයක් මොන තත්වයකින් මා පීඩා වින්දේද?

දැන්, එයින් ඔබ විනෝදවූවා නම්, ඔබ වයස 60ට අඩුය නැතහොත් ඔබ ඔබ ගැනම සිනාසෙන්නෙකි.

#### ළමුන්ගේ බාල කාලයේදී ඔවුන්ට ඉගැන්වීම

ඔබ වයසට යන විට, ඔබගේ බාල කාලයේදී හැකිවූ පරිදි ඉගෙනගැනීමට හෝ මතක්කරගැනීමට හෝ අධ්‍යයනය කිරීමට ඔබට නොහැකිය. අනාගතවක්තෘ ඇල්මා මෙසේ උපදෙස් දුන්නේ එනිසා විය හැකිය, "නුඹගේ බාලකාලයේදීම ප්‍රඥාව ඉගෙනගන්න. එසේය, නුඹගේ තරුණ කාලයේදී දෙවියන්වහන්සේගේ පණත් පැබීමට ඉගෙනගන්න"?[1]

මට ශුද්ධ ලියවිලි සහ කවි පද මතකතබාගැනීම බොහෝ අසීරුවේ. මගේ තරුණ කාලයේදී මා යම් දෙයක් වරක් හෝ දෙවරක් කියවූ විට එය මතකතබාගත හැකිය. මා එය කිහිප වතාවක් කී විට, විශේෂයෙන්ම මා එය ලියා තැබුවහොත්, එය මගේ මනසේ ස්ථිරවම සටහන්ව තිබේ.

පහසුවෙන් ඉගෙනගත හැක්කේ තරුණ කාලයේය. ළමයින්ගේ සහ තරුණයන්ගේ ගුරුවරු ආරම්භයේම

වාගේ සිටම සහ නායකයන් සඳහා එපමණ සැලකිල්ලක් දැක්වූයේ එම නිසාය.

ළමයින්ට සහ තරුණයන්ට සුභාරංචිය සහ ජීවිත පාඩම් ඉගැන්වීම සම්පූර්ණයෙන්ම වැදගත්වේ.

ස්වාමීන්වහන්සේ පළවෙනි වගකීම දෙමාපියන් මත තබා ඔවුන්ට මෙසේ අවවාදකරන සේක:

"සයෝනයේ ළමයින් සිටින දෙමාපියන්,...ඔවුන්ට පසුතැවීමේ දහම, ජීවමාන දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් වන ක්‍රිස්තුස්වහන්සේ තුල ඇදහිල්ල, සහ බෞතීස්මය සහ අත් තැබීම මගින් වන ශුද්ධාත්මයාණන්ගේ දීමනාව ගැන, අට හැවිරිදි වියේදී තේරුම්ගැනීමට උගන්වන්නේ නැති නම්, පාපය දෙමාපියන්ගේ හිස් මත වන්නේය."[2]

මෙම සභාවේ මූලික අරමුණ වන්නේ තරුණයන්ට ඉගැන්වීමය: පළමුව නිවසේ වන අතර දෙවනුව සභාව තුලය.

### අවබෝධය ගබඩාකිරීම

මා ඉගෙනගත් තවත් දෙයක් නම්, අප බාල වියේදී ඉගෙනගන්නා දේවල් මතකතබාගැනීමට සම්බන්ධය. තරුණ මනසක ගබඩාකර තිබෙන අවබෝධය එය අවශ්‍යවන මෙහොත දක්වා වසර ගණනාවක් පැවතිය හැකිය.

මම එය පෙන්වා දෙන්නෙමි: සභානායකවරයාගේ උපදෙස් ගැන නොසැලකීමට හෝ අනෙක් අන්තය වන, තමා ගැන වැඩි බලාපොරොත්තු තැබීමට සාමාජිකයන් තුල තිබෙන කැමැත්ත ගැන මම ඉතා සැලකිලිමත්වෙමි.

මම සභානායකවරයා ගැන ප්‍රධාන සම්මන්ත්‍රනයේදී කථාකිරීමට තීරණය කළෙමි.

මම යාච්ඤාවෙන් යුතුව සූදානම්වූවෙමි, එවිට අවුරුදු 50ක අතීතයක සංවාදයක් මගේ මනසට පැමිණියේය. ගුරුවරයෙකු ලෙස මගේ අවශ්‍යතාවය එයින් ඉෂ්ඨවිය.—එය හොඳින්ම ඉෂ්ඨ විය. දැන් මම ප්‍රධාන සම්මන්ත්‍රනයේ කල ලෙස එය උපුටා දක්වමි:

"වසර ගණනාවකට පෙර, මම එම්රි වයිට් සමග ස්ටේක් උසස් උපදේශක සභාවේ සේවය කළෙමි.වසර 10ක කාලයක් එම්රි සභානායකවරයෙක් ලෙස ග්‍රාමීය හාපර් කොට්ඨාශයේ සේවයකර ඇත. ඔහුගේ බිරිඳ ලුසිලී, අපගේ ස්ටේක් සහන සමිතියේ සභාපතිනිය බවට පත්වූවාය.

"වසන්තයේ එක් උදෑසනක අසල්වැසියෙක් ඇයගේ නිවසට පැමිණ, එම්රි ගැන ඇසූ බව ලුසිලි මට කීවාය. ඔහු කුඹුරේ පෝරුගාන බව ඇය ඔහුට කීවාය. අසල්වැසියා එවිට බලවත් සැලකිල්ලකින් යුතුව කථා කළේය. කලින් එම උදෑසන ඔහු කුඹුර පසුකරගෙන යන විට, එම්රිගේ අශ්වයන් කණ්ඩායම අඩක් නිම කල කුඹුරේ සිටගෙන සිටි බවත්, උන්ගේ රේන්ස් පටි නගුල මත තිබූ බවත් කීවේය. එම්රි කිසි තැනෙක දක්නට නොසිටියේය. අසල්වැසියා ඒ ගැන වැඩි තැකීමක් නොකළද, පසුව ඔහු නැවතත් කුඹුර පසුකර යන විට, අසුන් කණ්ඩායම එලෙසම සිට ඇත. ඔහු වැටට උඩින් පැන කුඹුර මැදින් අසුන් වෙත ගියේය. එම්රි කිසි තැනක දක්නට නොවීය. ඔහු ඒ ගැන ලුසිලි ගෙන් සොයා බැලීමට ඉක්මණින් නිවසට පැමිණියේය.

සන්සුන්ව පිළිතුරු දුන් ලුසිලි, 'ඕ, භයවෙන්න එපා, කරදරයට පත් යමෙක් සභානායකවරයා ගෙනයාමට පැමිණ ඇති බවට කිසි සැකයක් නැතැයි' කීවාය.

"එම අසුන් කණ්ඩායම පැය ගණනාවක් කුඹුරේ සිටගෙන සිටීමේ නිරූපනයෙන් සංකේතමත්වන්නේ, සභාව තුල සභානායකවරයාගේ සහ ඔහු ලඟ සිටින උපදේශකයන්ගේ කැපවීමය. සෑම සභානායකවරයෙක් සහ සෑම උපදේශකවරයෙක්ම, උපමාරූපකව කථාකරන්නේ නම්, යමෙකුට අවශ්‍යතාවයක් ඇති විට, තම කණ්ඩායම නිම නොකල කුඹුරු යායක තනිකර යති."[3]

මම එම අත්දැකීම මීට පෙර කථාවකදී පාවිච්චිකර නැත—ඒ ගැන සිතුවේද නැත.

සම්මන්ත්‍රනයකදී ඒ ගැන කථාකිරීමට පෙර එය මගේ මනසේ තහවුරුකර ගැනීමට මට අවශ්‍යවූ නිසා, මම එම්රි වයිට්ගේ දියණිය සොයාගත්තෙමි. ඔවුන්ගේ පැරණි නිවසේදී මා හමුවී, එදින ඇයගේ පියා පෝරු ගාමින් සිටි කුඹුර මට පෙන්වීමට ඇය එකඟවූවාය.

එක් ඉරුදින උදෑසනක මගේ එක් පුතෙක් මා එහි රැගෙන ගියේය. ඔහු පින්තූර රාශියක් ගත්තේය.

එය වසන්තයේ මනරම් උදෑසනකි. කුඹුර වසර ගණනාවකට පෙර මෙන් අළුතින් පෝරු ගා තිබිනි. මුහුදු ලිහිනියෝ අළුතින් පෙරලූ පස්වල ආහාර බුදිමින් සිටියහ.

එය මට අමුත්තක් නොවූ, එම සංවාදය සිහිපත්වී, මගේ මතකය අළුත් කළේය. එමගින් මගේ තරුණ කාලයේදී අහම්බෙන්—මා මතකයේ තබාගත්, එක්—ශුද්ධ ලියවිල්ලක සත්‍යය නැවතත් තහවුරු විය.

"නුඹලා කිවයුතු දෙය කලින් සිතීම අවශ්‍ය නොවේ; නමුත් ජීවනයේ වචන නිතරම නුඹලාගේ සිත් තුල ගබඩාකර ගනිල්ලා, එවිට නියම පැයේදී සෑම මනුෂ්‍යයෙකුටම සුදුසු වන්නාවූ එම කොටස නුඹලාට දෙනු ලබන්නේය"[4]

ඥානය ගබඩාකරගන්නා අයට පොරොන්දුවක් දී ඇත:

"නුඹලාව පිළිගන්නේ කවරෙක්ද, මාද එතැන සිටින්නෙමි, මන්ද මම නුඹලා ඉදිරියෙන් යන්නෙමි. මම නුඹලාගේ වම් අතේද, නුඹලාගේ දකුණු අතේද සිටින අතර,මගේ ආත්මය නුඹලාගේ හදවත්වල සිටිනු ලබන්නේය. තවද මාගේ දේවදූතයෝ නුඹලා අවට සිටිමින්, නුඹලා උසුලා ගන්නවා ඇත."[5]

එය මට කදිම පාඩමක්වූ නමුත්, මගේ පාඩම එයින් නිම නොවීය.

මගේ තරුණ වියේදී මම චිත්‍ර සහ ලී කැටයම් වැඩ කර ඇත්තෙමි, මම විශාල වශයෙන් ස්ව-යං ඉගෙනීමක් ලැබුවෙමි. ළමයින් වැඩෙන විටදී, මම මගේ ළමා කාලයේදී ජීවිතය ගැන සහ චිත්‍ර වැඩ ගැන මා ඉගෙනගත් දේවල් ඔවුන්ට ඉගැන්වීමට මගේ කාලය කැප කළෙමි.

ඔවුන් වැඩීමෙන් පසුව, ලී කැටයම් වැඩ කරගෙන ගියේ විවේකයට මෙන්ය. මම කුරුල්ලන් කැටයම් කල අතර, කැටයමක් කිරීමට පැය ගණන් ගත කළෙමි. "මෙය කැටයම්කිරීමට පැය කීයක් ගතවෙනවාදැයි" යමෙක් ඇසූ විට, මම නොදනිමි, මා දැනගත් විට, මම මෙය නතර කරමි" යයි මම නිතරම පිළිතුරු දුනිමි.

මා මගේ අත්වලින් වැඩකල එම හෝරාවන් තුළදී, අසිරිමත් නිර්මාන සහ වැගිරෙන ආනුභාවය ගැන මම මෙනෙහි කළෙමි. මම ලී කැටයම්කරන විට, මම කථා කැටයම් කළෙමි.

කැටයම් වැඩ මට විවේකශීලී විය. සමහර අවස්ථාවලදී මම මඳක් වෙහෙසවී, දුෂ්කර බවක් දැනුන විට, මගේ බිරිඳ, "ඔබ වෙනත් කැටයමක් පටන්ගතහොත් හොඳයි" යයි මට කියයි.

මගේ ඉහළ මධ්‍යම වයසේ මතකය එමගින් මඳක් මුවහත් විය. එම එක් කැටයමක් පෙන්වා එමගින් කුමන කථාවක් නියෝජනය වන්නේදැයි මට කිවහැකි විය. එම නිසල අවසථාවලදී මට වැඩ දෙකක් එක විට කල හැකිවූ බව මම ඉගෙනගත්තෙමි.

### ඉගැන්වීමෙන් අස්වැන්න නෙළාගැනීම

මට එම කැටයම් වැඩ වැඩි දුරටත් කළ නොහැකි විය. වැඩ එතරම් සියුම් බැවින්ද, ළමා අවධියේ පෝලියා නිසා දැන් මඳක් අත් ඇඟිලි පුරුක්ද දරදඬුය. ඒ හැර, මගේ කැඳවීමේ වැඩිවෙන පීඩනය මගින් කැටයම්වලට සහ කථාවලට සූදානම්වීම යන දෙකටම කාලය කැපකීරීමද මට සීමා සහිතය.

කැටයම් කිරීමේ හැකියාව මට දැන් විශාල වශයෙන් අහිමිව ගොස් තිබුනද, අපගේ ළමයින්ට එසේ නැත. ඔවුන්ගේ බාල කාලයේදීම අපි එය ඔවුන්ට ඉගැන්වූයෙමු.

කුඹුරේ සිටගෙන සිටි එම කණ්ඩායමේ ප්‍රතිරූපය මා සමග නැවතී ඇත. සභානායකගේ කණ්ඩායම නගුල මත වැටුන රේනිස් පටි සමග කුඹුරේ සිටගෙන සිටීම මට සමහර විට චිත්‍රයකට නැගිය හැකි බව මම සිතුවෙමි.

මම පසුබට වුනේ මා අවසන් වරට පින්තුරයක් චිත්‍රගත කර වසර නවයක් පසුවී ඇති නිසාය. අසමාන දක්ෂතා සහ ආනුභාවය ඇති මිතුරන් දෙදෙනෙක් සභානායකගේ කණ්ඩායම චිත්‍රගත කිරීමට උපකාරකළ අතර. ජූලි ගමන්කිරීමේ විවේකය ලබාදුන් නිසා මම ආරම්භ කළෙමි.

එම මිතුරන් දෙදෙනාගෙන් මම බොහෝ දේවල් ඉගෙන ගත්තෙමි. සැබෑ අන්දමින් ඔවුහු මගේ චිත්‍රය තුල සිටිති. නමුත් මගේ පුතුන් දෙදෙනාගෙන් මම වැඩි උපකාරයක් ලැබුනි. එක් පුතෙක් එම පෝරුගාන ලද කුඹුරේ එම පින්තුර ගත්තේය. මම නිතරම කැටයමක හෝ චිත්‍රයක හෝ කථාවකදී යමක් විස්තරකරන විට ඉතා නිවැරදිව කිරීමට උත්සාහ කළෙමි.

එය තවත් පාඩමකි. අපගේ ළමයින් ඔවුන්ගේ තරුණ කාලයේ ඉගෙනගත් යමක් නැවත ගැනීමට මට හැකිවිය.

අනෙක් පුතා සභානායකගේ කණ්ඩායම මගේ චිත්‍රයේ සහායකයෙක් ලෙස ලෝකඩවලින් මූර්තිමත් කිරීමට තීරණය කළේය. අපි එකිනෙකාට උදව්කරමින් ඵලදායක පැය ගණනාවක් ගත කළෙමු.

ඔහු වසර 50කට වැඩි කාලයක් අත්‍යාවශ්‍ය ලෙස එල්ලා තිබූ පාවිච්චි නොකල පරන සන්නාහ දෙකක් අපගේ අටුවෙන් ගත්තේය. ඔහු ඒවායෙහි දූවිලි පිසදමා ඒවා නිවසට රැගෙන ගියේය. ඔහු එක සන්නාහයක් ඉතා ඉවසිලිවන්තව දුවන අශ්වයෙකුගේ පිට මත දැමීය. එය එහි නිශ්චලව තිබූ අතර, ඔහු සන්නාහය නිසි පිළිවෙලට සකස්කර එහි විස්තර සහිත රූපයක් ඇඳ ගත්තේය.

ඔහුගේ අසල්වැසියා පරණ නගුල් කිහිපයක් එකතුකර තිබුනේය. ඒවා අතර නිසි කාලයේ නගුල්ද තිබුන අතර, ඔහු ඒවාවලද රූප සටහන් ගත්තේය.

තවද ඒ අනුව අපි අපගේ පුතුන්ට ඔවුන්ගේ තරුණ කාලයේ දුන් දේවල් නැවත එළි දැක්කේය. අපගේ අනෙකුත් ළමයින්ද, ඔවුන්ගේ ඉතා බාල අවධියේදී දෙමාපියන් ලෙස අප ඔවුන්ට ඉගැන්වූ දේවල් ඔවුහු දියුණු කළහ. තවද පොළොව මත අපගේ දවස් දිගුවන්නේ නම්, දෙවෙනි අස්වැන්වූ—අපගේ මුනුපුරන්ද—සමහරවිට මී මුනුපුරන්ද පැමිණෙන්නේය.

### උදාසීන දක්ෂතා පුබුදුවාලීම

මම වෙනත් යමක් නැවත ඉගෙන ගත්තෙමි, ඉහතදී වරක් මගේ ළමා කාලයේදී මට ඇසුනු අදහස්වලින් ප්‍රබෝධමත්ව මම චිත්‍රයක් ඇඳ ඇත්තෙමි. එයින් විලාඩ් කඳු ශිඛර විස්තර කෙරෙයි. වයසක ජනයා ඒවා සභාපතිත්වයට සමාන කරනු මම අසා ඇත්තෙමි. මෙම අහස දක්වා උසැති යෝධ, ශක්තිමත් ශිඛර සභාවේ නායකයන් ආදේශකරයි.

එය වසර නවයකට පෙරය. මගේ පුතා මාව විලාඩ්, යුටා, රැගෙන ගොස් ගිරි ශිඛර ඡායාරූපගත කළේය. අපි නැවතත් දෙවන වතාවටත් එහි සෙවනැලි සහ අසමානකම් බොහෝ ඇති විටද එහි ගියෙමු.

එම ගෙවීගිය වසරවලින් පසුව මා අමතක කල අසමානකම් පුබුදුවාලීමට මට සිදුවිය. ආරම්භයේදී එය දැඩි පරිශ්‍රමයක් විය. කිහිප අවස්ථාකදීම නවතා දැමීමට මම තර්ජනය කළෙමි. මගේ එක් මිත්‍රයෙක්, "ඉදිරියටම යන්න! පතුලේ නිතරම බොහෝ ඉඩකට ඇත"කියමින් මට ආයාචනාකළේය.

මම නතර නොකලෙමි. හුදෙක් එසේ කිරීමට මගේ බිරිඳ මට අවසර නුදුන්නාය. එසේ නොකිරීම ගැන මම දැන් සතුටුවෙමි. සමහරවිට, මම දැන් නැවතත් එහි නියැලෙමින් සිටිමි, යම් අවස්ථාවක මා තවත් චිත්‍රයක් කරන බව—දන්නේ කවුද.

චිත්‍ර වැඩ නැවත කිරීම යනු, වසර ගණනාවක් සභාවේ අක්‍රීයව සිටි තැනැත්තෙක් නැවත රැලට එක්වීමට තීරණය කිරීමකට සම කල නොහැක. උදාසීනව තිබූ නමුත් සැබවින්ව නැතිවී ගොස් නැති දේවල් ගැන හැඟීමට පරිශ්‍රමදැරීම සඳහා කාලයක් ඇත. තවද එයට මිතුරෙක් හෝ දෙදෙනෙක් සිටීම උපකාරයකි.

එය ඉගෙනගැනීමේ තවත් මූලධර්මයකි.—ජීවිතයේ සාමාන්‍ය අත්දැකීම්වලින් පාඩම් ඉගෙනගැනීමකි.

*සභානායකගේ කණ්ඩායමේ එම චිත්‍රය ඉක්මණින්ම නිමවනු ඇත. මගේ පුත්‍රයාගේ මූර්තිය ලෝකඩවලින් නිමවෙමින් ලෝහ වැඩපොලේ ඇත.*

ඔහුගේ මුරිතිය, එකත් එකට, මගේ චිත්‍රයට වඩා බොහෝ හොඳය. එය විය යුතු පරිදිම එසේ විය. ඔහුගේ තරුණ ඇඟිලි සහ මනස මට වඩා වේගයෙන් ප්‍රතිචාර දක්වයි.

අප *ඉහළ මධ්‍යම* වයසට යන විට, පරණ කටු පහසුවෙන් නොනැමෙන බවත්, පරණ සංදි එතරම් ඉක්මණින් ක්‍රියා නොකරන බවත් අපි දැනගන්නෙමු. ඔබ 60 වෙනි වියේ මැදට වේගයෙන් ඇදී යන විට, ඔබගේ සපත්තු නූල බැඳගැනීම පහසු නොවේ—එවිට ඔවුහු පොළොව තවත් පහත් කරති.

එම පාඩම නැවතත් සිහිපත්වේ, "නුඹලාගේ තරුණ කාලයේදී ප්‍රඥාව ඉගෙනගනිල්ලා; එසේය, නුඹලාගේ තරුණ කාලයේදී දෙවියන්වහන්සේගේ පණත් ආරක්ෂාකිරීම ඉගෙනගනිල්ලා." [6]

"දෙවියන්වහන්සේගේ මහිමය නම් ඥානය වන්නේය, හෝ, වෙනත් වචනවලින්, ආලෝකය සහ සත්‍යය වන්නේය." [7]

"නුඹලාගේ ළමයින් ආලෝකයෙන් සහ සත්‍යයෙන් ඇති දැඩි කිරීමට මම නුඹලාට අණ කර ඇත්තෙමි." [8]

ශුද්ධාත්මයාණන්ගේ දිව්‍යමය දීමනාව ළමයින් මත දානයකරනු ලබන්නේ ඔවුන් අට හැවිරිදි වියට පත්වූ විට පමණය.

"පියාණන්වහන්සේ කෙරෙන් මා විසින් නුඹලාට එවන සැනසිලිකාරයාණන්වහන්සේ වන ශුද්ධාත්මයාණන්වහන්සේ, මා නුඹලාට කී දේවල් *සියල්ල* නුඹලාට *උගන්වමින්, සියල්ල* නුඹලාගේ මතකයට ගෙන එනසේක." [9]

*ඉගැන්වීම* සහ *මතකයට ගෙන* ඒම යන වචන හොඳින් බලන්න.

ළමයින්ට ඉගැන්වීම මගින් යහපත් ප්‍රතිඵල අත්වේ. ඔබ උගන්වන විට, ඔබගේ ළමයින් ඉගෙනගන්නවාට වඩා ඔබ ඉගෙනගන්නා බව ඔබ තවමත් දැනගත්තේ නැතිද?

**ආත්මික මතකයන් ඇදගැනීම**

ලෞකික ඥානය අත්කරගැනීම සහ ආත්මික ඥානය අත්කරගැනීම අතර වෙනසක් ඇත. ශිෂ්‍යයෝ පරීක්ෂණ දිනයේ එය ඉගෙනගනිති. ඔබ පළමුවෙන් ඉගෙන නොගත් දෙයක් මතක්කරගැනීම අතිශයින් අසීරු දෙයකි.

එය ලෞකික ඥානය ගැන සත්‍යයකි, නමුත් ආත්මිකව උපතට පෙර දක්වා දිවයන මතකයක් ඇදගැනීමට අපට පුළුවන. අපගේ බාල කාලයේදී අපට තේරුම්ගත නොහැකිවූ දේවල සචේතනික බව වර්ධනයකර ගැනීමට අපට හැකිය.

වර්ඩ්ස්වර්ත් කිවිවරයා පෙර ජීවිතය ගැන අත්විඳි යමක් ගැන මෙසේ ලීවේය,

*අපගේ උපත නිද්‍රාවක් සහ අමතකවීමකිඃ*
*අප සමග නැගී එන ආත්මය, අපගේ ජීවිතයේ*
*තාරකාව වේ,*
*එහි සැකසුම වෙනත් තැනක සිදුවී,*
*බොහෝ ඈතක සිට පැමිණේඃ*
*සම්පූර්ණ අමතකබවකින් නොව,*
*එසේම පූර්ණ නග්නත්වයකින්ද නොවේ,*
*නමුත් මහිමයේ වළාවන් ඇදාගෙන අපි පැමිණෙන්නේ*
*දෙවියන්වන්සේ වෙතින්ය, එතුමා අපගේ නිවස්නයයි.*[10]

එම පද පේලි මා ඇදගත්තේ මගේ මතකයෙනි, ඒවා මා ගබඩාකර ගත්තේ, මගේ පාසල් වියේදී ඉංග්‍රීසි පංති කාලයකදීය.

වඩාත් වැදගත් පාඩම් එන්නේ ජීවිතයේ සාමාන්‍ය සිදුවීම් වලින්ය.

සමහරු ඔවුන්ගේ සාක්ෂිය ස්ථිරකරගැනීමට ආත්මික අත්දැකීම් බලකරන තුරු බලා සිටිති. ඒ අන්දමට එය ක්‍රියා නොකරයි. දෙවියන්වහන්සේගේ දරුවන් ලෙස අපගේ අනන්‍යතාවය පිළිබඳ සහතිකය අපට ලබාදෙන්නේ සාමාන්‍ය දේවල පෙළඹවීම් සහ සිත් කාවැද්දීම්වලින්ය. අප අපූරු සිදුවීම්වල සලකුණු සොයමින්, "මීදුමෙන් එහා" [11] බලන විට, අපි අපගේ වරප්‍රසාදවලට බොහෝ පහතින් ජීවත් වෙන්නෙමු.

අපි දේව දරුවෝ වෙමු. මන්ද අපි මැරෙන සුළු ජීවිතයට පෙර එතුමා සමග ජීවත් වුනෙමු. විටින් විට, එම තිරය වෙන්වී ඇත. අප කවුද, සහ සදාකාලික වැඩ පිළිවෙලේ දේවල්වල අපගේ ස්ථානය කුමක්ද කියා සංඥාව එහිදී අප වෙත එයි. එම මතකය හෝ ආත්මික ඥානය, එය යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සුභාරංචිය සත්‍යබවට වන සාක්ෂිවලින් එකකි. අපි උගන්වන විට, එවැනි එළිදරව් පැමිණෙයි.

සභාපති මේරියන් ජී. රොම්නි (1897–1988) මෙසේ කියනු මා වරක් අසා ඇත, "මා කථාකරන දෙයින් යමක් මා ඉගෙනගන්නා නිසා, මා ශුද්ධාත්මයාණන්ගේ ආනුභාවයෙන් කථාකරන බව මම නිතරම දන්නෙමි.

ස්වාමීන්වහන්සේ වැඩිහිටියන් අමතා මෙසේ කීසේකඃ

"නුඹලා යවා ඇත්තේ ඉගෙනගැනීමට නොව, නමුත් මගේ ආත්මයේ බලය මගින් මා නුඹලාගේ හස්තවලට දුන් සියලුම දේවල් මිනිස් දරුවන්ට ඉගැන්වීම සඳහාය;

"තවද නුඹලාට උගන්වනු ලබන්නේ ඉහළින්ය. නුඹලාව පවිත්‍රකරගන්නා විට, නුඹලාව බලයෙන් එන්ඩවුකරනු ලබන්නේය, එවිට මා කථාකල ලෙස නුඹලාට දිය හැකි වන්නේය." [12]

හැරී එන්නන්ගේ අස්වැන්න ධර්මදූතයන්ට සුළු වුවද, ආත්මික බලය ඔවුන්ට සහ සභාවට පැමිණෙන්නේ, ඔවුන්ගේ ඉගැන්වීම් තුලින් ඔවුන් ඉගෙනගන්නා නිසාය.

උපස්ථායකයන්ගේ ගණපූර්ණයේ සභාපතිවරයා උපදේශක සභාවේ හිඳගෙන ඔහුගේ සහෝදර උපස්ථායකයන්ට උගන්වනු ලබයි.[13] වැඩිහිටි ගණපූර්ණයේ සභාපතිවරයා ඔහුගේ ගණපූර්ණයේ සාමාජිකයන්ට ගිවිසුම අනුව උගන්වනු ලබයි.[14]

පාවුළු තිමොතිවරුන් අමතා මෙසේ කීවේය "බොහෝ සාක්ෂිකාරයන් ඉදිරියේ නුඹ මාගෙන් ඇසූ දේම වෙන අයටත් උගන්වන්ට සමර්ථවූ විශ්වාසවූ මනුෂ්‍යයන්ට භාරදීපන්න.' [15]

ඉගැන්වීම මගින් ප්‍රතිඵල ලැබෙන අන්දම ගැන ඔහු වචන නවයකින් පැහැදිළි කළේය;

"අනිකෙකුට උගන්වන්නාවූ නුඹ නුඹටම උගන්වාගන්නේ නැද්ද? සොරකම් නොකළ යුතුයයි දේශනාකරන්නාවූ නුඹ සොරකම් කරනවාද?

"කාමමිථ්‍යාචාරය නොකල යුතුයයි කියන්නාවූ නුඹ කාම මිථ්‍යාචාරය කරනවාද?" [16]

## ඉගෙනගැනීමට කැමැත්තෙකු වීම

පසුගිය දිනක මට බොහෝ අවස්ථාවලදී මෙන් කමාව ඉල්ලීමේ ලිපියක් ලැබින. එය ලැබුනේ මා නොදන්නා කෙනෙකුගෙන්ය. මෙම ලිපියෙන් කියැවුනේ, එම සාමාජිකයා, මා කළ කථාවක් නිසා, මා කෙරෙහි බොහෝ කාලයක සිට අමනාපයකින් සහ කෝපයකින් සිටි අන්දමය. එම කමාව පතා කළ ඉල්ලීමකි.

මම ඉක්මණින්ම කමාව දෙන්නෙක්මි. මම කථාකිරීමට සහ කමාව දිගුකිරීම යන දෙකටම නියෝජිතයෙක්මි.

අනාගතවක්තෲවරුන් සහ ප්‍රේරිතවරුන්ගේ ඉගැන්වීම් ඉශ්‍රායෙල්වරුන්ට සහ නිෆායීවරුන්ට දරාගැනීමට කෙතරම් "අසීරුදැයි" [17] එළිදරව්කරන පාඨ ගණනාවක් ශුද්ධ ලියවිලි වල අඩංගුවේ. ඉගැන්වීම්වලට විරුද්ධවී ගුරුවරිය සමග අමනාපවීම ඉතා පහසුය. ආරම්භයේ සිටම බොහෝ අනාගතවක්තෲවරුන්ට සහ ප්‍රේරිතවරුන්ට එය සිදුවිය.

එක් ආශිර්වාද වාක්‍යයක මෙසේ උගන්වයි:

'තවද මා නිසා මිනිසුන් නුඹලාට නින්දාකර, හිංසා පීඩාකර, අසත්‍ය ලෙස නුඹලාට සියලු ආකාරයේ නරක කියන විට, නුඹලා භාග්‍යවන්තහුය.

"නුඹලා උදක්ම සන්තෝශ වන්නහුය; මන්දයත් ස්වර්ගයෙහි නුඹලාගේ විපාකය මහත් වන්නේය. මන්ද යත් ඔවුහු නුඹලාට පෙර විසූ දිවැසිවරුන්ට එසේම වධහිංසා කළහ." [18]

සාමාන්‍යයෙන් එම කමාව ඉල්ලන ලිපිවලමෙසේ කියයි, "මා එතරම් අපහසුතාවයකට සහ වරදකාරී හැඟීමකට පත්කිරීමේ අවශ්‍යතාවයක් ඔබට හැඟුනේ කෙසේදැයි මට තේරුම්ගැනීමට නොහැකිවිය. ඉන්පසුව ඔවුන් දරන පරිශ්‍රමවලදී, ඥානය, ආනුභාවය, හේතුව සහ ප්‍රතිඵල ගැන අවබෝධය මතුවේ. අවසානයේදී සුභාරංචිය එසේ වන්නේ මන්දැයි ඔවුන්ට දැකීමට සහ අවබෝධ කරගැනීමට හැකිය.

මාතෘකාවන් කිහිපයක් අතරින් එකක් මම සඳහන් කරන්නෙමි. අපි මවුවරුන්ට සිය ළමයින්ද සමග නිවසේ නතරව සිටීමේ වැදගත්කම ගැන අවධාරණය කරන්නේ මන්දැයි යම් සොහොයුරියක් අවසානයේදී සොයාබැලිය හැකිය. ආත්මාර්ථකාමී නොවන මාතෘත්වය තුලින් පැමිණෙන උත්කෘෂ්ඨ ශෝධනයකට සමාන වෙනත් කිසිදු සේවයක් නැති බව ඇයට අවබෝධවේ. එසේම ඇයට බුද්ධිමය හෝ සංස්කෘතික හෝ සමාජ ශෝධනයකට ලක්වීමට හෝ වුවමනා නැත. මන්ද ළමයින්ට ඉගැන්වීම තුලින් ලැබෙන සදාකාලික ගුණධර්මවලට ඔවුන් සහභා ගිවන නිසා, නිසි කාලයේදී—ඒ දේවල් ගලපනු ලබන්නේය.

මවක් සිය දරුවන්ට ඉගැන්වීම හා සමාන කිසිදු ඉගැන්වීමක්, වඩාත් ආත්මික එලදායි හෝ වඩාත් උත්කෘෂ්ඨ හෝ නැත. මවක් තම පවුලට ඉගැන්වීමට කාලය වැයකරන නිසා ශුද්ධ ලියවිලි පරිණිතබවින් තමා අඩු බව ඇයට හැඟීයා හැකිය. ඇය අඩු ප්‍රතිඵලයක් ලබන්නේ නැත.

සභාපති ග්‍රාන්ට් බැන්ගර්ටර් බ්‍රසීලයේ දූතමෙහෙයක සංචාරයකරන සභාපති ජෝසෆ් ෆීල්ඩින් ස්මිත් සමග ධර්මය පිළිබඳ සංවාදයක යෙදුනේය. සවන්දෙමින් සිටි බැන්ගර්ටර් සොහොයුරිය අවසානයේදී මෙසේ කීවාය, "ස්මිත් සභාපතිතුමනි, මම මගේ දරුවන් ඇති දැඩි කරමින් සිටි නිසා ඔහු මෙන් ශුද්ධ ලියවිලි ප්‍රවීනයෙකු වීමට කාලයක් නොතිබිනි. ග්‍රාන්ට් සමග මටද සෙලස්ටියල් රාජ්‍යයට යාමට පුළුවන්ද?

සභාපති ස්මිත් මොහොතක් සන්සුන්ව කල්පනාකර ඉන්පසුව, "හොඳයි, සමහරවිට, ඔබ ඔහුට කැවිලි සාදාදීමට කැමතිවුවහොත්" යයි කීවේය.

යම් මිනිසෙක් හට තම බිරිඳ ඔවුන්ගේ දරුවන්ට ඉගැන්වීමෙන් ස්වභාවිකවම අත්කරගන්නා ආත්මික ශෝධනයේ ප්‍රමාණයට සමවීම සඳහා තද බලයක් යෙදිය යුතුවේ. තවද ඔහු සුභාරංචිය හොඳින්ම දැන සිටියද, ඇය නොමැතිව උත්කර්ෂවීමට ඔහුට නොහැකි බව ඔහු දනියි.19 ඔහුගේ හොඳම බලාපොරොත්තුව නම්, ඔවුන්ගේ ළමයින්ට ඉගැන්වීමේදී, ඇහුම්කන් දෙන වගකිවයුතු කොටස් කරුවෙකු ලෙස නායකත්වය දීමය.

## ගුරුවරුන් හට ආශිර්වාද

දැන්, මෙම පොරොන්දුව සලකාබලන්න.

"නුඹලා උනන්දුවෙන් උගන්වන විට, මගේ අනුග්‍රහය නුඹලාට [ගුරුවරයාට] පැමිණ, එනම් නුඹලා [ගුරුවරයා, මව සහ පියා] වඩාත් සම්පූර්ණ ලෙස, න්‍යායානුකූලවද, මූලධර්මානුකූලව, ධර්මානුකූලවද, සුභාරංචි නීත්‍යානුකූලවද, දෙවියන්වහන්සේගේ රාජ්‍යයට සම්බන්ධ සියලුම දේවල්, නුඹලාට [මව, පියා] හට තේරුම්ගැනීම සඳහා උගන්වනු ලැබේ." [20]

පොරොන්දුව ශිෂ්‍යයා වෙනුවට ගුරුවරයාට බව සලකන්න.

"නුඹලා උනන්දුවෙන් උගන්වන විට මගෙ අනුග්‍රහය නුඹ වෙත [නුඹගේ ළමයින්ට හෝ ප්‍රාථමිකයේ, ඉරුදින පාසලේ, තරුණ කාන්තා සහ පිරිමි, පූජකවරයේ, සෙමෙනේරියේ, සහන සමිතියේ] උගන්වන ගුරුවරයාට පැමිණෙනු ඇත, ඒ බව නුඹ දැනගන්නවා ඇත.

"ස්වර්ගයේ සහ පොළොවේ යන දෙකේම, සහ පොළොව යට දේවල් ගැන; තිබුන දේවල්, තිබෙන දේවල්, ඉක්මණින් සිදුවීමට තිබෙන දේවල්; නිවාසවල තිබෙන

දේවල්, පිටරට තිබෙන දේවල්, යුද්ධ සහ ජාතීන්ගේ ව්‍යාකූලතාවයන්, සහ දේශය මත ඇති විනිශ්චයන්; රටවල් සහ රාජ්‍යයන් ගැන තිබෙන අවබෝධයද—

"එනම් නුඹලා [උගන්වන තැනැත්තා] මා නුඹව කැඳවා තිබෙන කැඳවීම දියුණුකිරීමට මා නුඹව නැවතත් යවන විට, සහ මා නුඹට ආඥාකර තිබෙන දූතමෙහෙයට යාමට සියලු දේවල් වලින් සූදානම්විය යුතුය." [21]

පාවුළු තරුණ තිමොතිට අනාවැකි කීවේය. "එනම් අන්තිම දවස්වලදී විපත්ති කාල පැමිණෙනු ඇත." [22] ඔහු මෙසේ කීවේය, "නපුරු මිනිසුන් සහ මුලාකරන්නන්, වඩ වඩාත් නරක්වී, රවටමින්, රැවටිලිවලටද අසුවේ." [23]

නමුත් අපට තවදුරටත් ආරක්ෂාවිය හැකිය. අපගේ ආරක්ෂාව තිබෙන්නේ ළමුන්ට ඉගැන්වීම තුලය:

"දරුවෙකු සුදුසු මාර්ගයෙහි පුහුණුකරපන්න; එවිට ඔහු වයස්ගතවූ කලත් එයින් අහක්ව නොයන්නේය" [24]

පාවුළු තිමොතිවරුන්ට මෙසේ උපදෙස් දුන්නේය:

"එහෙත් නුඹ ඉගෙනගත්තාවූ, නුඹට සහතිකවූ කාරණා කොයි තැනැත්තන්ගෙන් ඉගෙනගත්තෙහිද කියාත්;

"ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි ඇදහිල්ල කරණකොට ගෙන ගැලවීම පිණිස නුඹ නැණවත්කරන්ට පුළුවන්වූ ශුද්ධ ලියවිලි නුඹ බාල වයසේ පටන් දැනගෙන සිටින බවත්, දැන, ඒවායේ පිහිටා සිටපන්න." [25]

මෙය යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සභාවය, එය උන්වහන්සේගේ සභාවය, එතුමා අපගේ ආදර්ශකයාණන්, අපගේ ගැලවුම්කරුවාණන් වනසේක. අපට අණ කර තිබෙන්නේ "උන්වහන්සේ මෙන් වීමටය"[26]

එතුමා ළමුන්ගේ ආචාරීන්වහන්සේය. එතුමා යෙරුසලමේදී තම ගෝලයන්ට අණ කරමින්, "දරුවන් නොවලක්වා මා ළඟට එන්ට ඉඩහැරපල්ලා, මක්නිසාද ස්වර්ග රාජ්‍යය මෙබඳුවූවන්ගේය" [27] යි කීසේක.

නිෆායිට්වරුන් අතර ගැලවුම්කරුවාණන්ගේ මෙහෙය පිළිබඳ වාර්තාව තුල, උන්වහන්සේගේ ආත්මය තුල, සමහරවිට වෙනත් ස්ථානයකට වඩා ගැඹුරින්ම දැකීමට අපට පුළුවන:

"තවද එය මෙසේ සිදුවිය, ඔවුන්ගේ කුඩා දරුවන් ගෙනෙන ලෙස උන්වහන්සේ අණ කළසේක

"එබැවින් ඔවුහු තම කුඩා දරුවන් ගෙනවුත් උන්වහන්සේ අවට බිම තැබූහ. තවද යේසුස්වහන්සේ මැද සිටගත්සේක; තවද ඔවුන් උන්වහන්සේ වෙත ගෙනඒමට ජනකාය ඉඩ සැලැස්වූහ.

"...උන්වහන්සේ හැඬූසේක. තවද ජනකාය මේ ගැන සාක්ෂි දරති. තවද උන්වහන්සේ ඔවුන්ගේ කුඩා දරුවන් එකිනෙකා තමන්වහන්සේ වෙත කැඳවා ඔවුන්ගේ ඔවුන් ආශිර්වාදකර, ඔවුන් වෙනුවෙන් පියාණන්වහන්සේ වෙත යාච්ඤා කළසේක.

"තවද උන්වහන්සේ මෙසේ කළ පසු නැවතද හැඬූසේක;

"තවද උන්වහන්සේ සමූහයාට කථාකොට මෙසේ කීසේක: බලන්න නුඹලාගේ කුඩා දරුවන්.

"තවද ඔවුන් බැලීමට සැරසෙත්ම ඔවුහු ස්වර්ගය දෙස නෙත් යොමු කළහ. තවද ඔවුහු ස්වර්ගය විවර වෙනු දුටුහ. තවද ගින්නෙන් වටවූවාක් මෙන් දේවදූතයන් ස්වර්ගයෙන් බසිනු ඔවුහු දුටුහ; තවද ඔවුහු බැස කුඩා දරුවන් වටකර ගත්හ. තවද ඔවුහු ගින්නෙන් වටවී සිටියහ. තවද දේවදූතයෝ ඔවුන්ට උපස්ථාන කළහ.

"තවද සමූහයා මෙය දැක අසා ඒ ගැන සාක්ෂි දැරූහ. තවද තමුන්ගේ සාක්ෂිය සත්‍ය බව ඔවුහු දනිති. මන්ද යත් ඔවුන් සියලු දෙනා තම තමන් විසින්ම දැක අසා ගත්හ." [28]

එම වාර්තාව සත්‍ය බව මම දනිමි. මම උන්වහන්සේ ගැන සාක්ෂිදරමින් සහ උන්වහන්සේගේ නාමයෙන් ළමයින්ට උගන්වන ඔබ සියලු දෙනාටම ආශිර්වාදකරමි.

1999 අගෝස්තු 17 වෙනිදා බ්‍රිගම් යන්ග් විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන සතියේ ඇදහිල්ල පිළිබඳව කළ කථාවකිනි (බලන්න *Ensign*, පෙබ. 2000, 10–17).

සටහන්

1. ඇල්මා 37:35.
2. දහම සහ ගිවිසුම 68:25.
3. "සභානායක සහ ඔහුගේ උපදේශකයන්," *Ensign*, මැයි 1999, 57.
4. දහම සහ ගිවිසුම 84:85.
5. දහම සහ ගිවිසුම 84:88.
6. ඇල්මා 37:35.
7. දහම සහ ගිවිසුම 93:36.
8. දහම සහ ගිවිසුම 93:40.
9. යොහාන් 14:26; ඉතාලි අකුරු ඇතුලත්ය.
10. "Ode: Intimations of Immortality," ස්ටැන්සා 5.
11. යාකොබ් 4:14.
12. දහම සහ ගිවිසුම 43:15–16.
13. බලන්න දහම සහ ගිවිසුම 107:85.
14. බලන්න දහම සහ ගිවිසුම 107:89.
15. 2 තිමොති 2:2.
16. රෝම 2:21–22; ඉතාලි අකුරු ඇතුලත්ය.
17. බලන්න යොහාන් 6:60; 1 නිෆායි 16:2; 2 නිෆායි 9:40; හෙලාමන් 14:10.
18. මතෙව් 5:11–12; තවද බලන්න 21:12; යොහාන් 15:20; 3 නිෆායි 12:12.
19. බලන්න දහම සහ ගිවිසුම 131:1–4, 132:19–21.
20. දහම සහ ගිවිසුම 88:78; ඉතාලි අකුරු ඇතුළත්ය.
21. දහම සහ ගිවිසුම 88:79–80.
22. 2 තිමොති 3:1.
23. 2 තිමොති 3:13.
24. හිතෝපදේශ 22:6.
25. 2 තිමොති 3:14–15; ඉතාලි අකුරු ඇතුළත්ය.
26. 1යොහාන් 3:7.
27. මතෙව් 19:14.
28. 3 නිෆායි 17:11–12, 21–25.

# ළමයින් තීරණ ගැනීමේදී ඔවුන්ට මගපෙන්වීම

# 15

## අදාළකරගැනීම සඳහා අදහස්

ඔබගේම අවශ්‍යතාවයන් සහ තත්වයන් අනුව, මෙම යෝජනා එකක් හෝ දෙකම අනුගමනයකරන්න.

- පහත දැක්වෙන කියවීමේ පැවරුම තුලින්, වැඩිහිටි රසල් එම්. බැලඩ් අපට පහත සඳහන් යෝජනා හතර දෙමින් "අපගේ නිවාස තුල ඇඳහිල්ලේ බලකොටුවක් ගොඩනැගීමට සහ...අපගේ තරුණ පක්ෂය දේවමාළිගාවට ඇතුළුවීමට පිරිසිදුව සහ නිර්මලව සහ පවිත්‍රව සම්පූර්ණයෙන්ම සුදුසුව සූදානම්කිරීමට උපකාර කරයි." ඔහුගේ යෝජනා සමාලෝචනයකර, ඔබගේ නිවසේ මෙම යෝජනා අනුගමනයකිරීමට නිශ්චිත සැලසුම් සකස්කරන්න.
- ඔබගේ පවුලේ එක් එක් ළමයා පාසලේදී, නිවසේදී, සහ වෙනත් ස්ථානවලදී ගත හැකි තීරණ ගැන සිතන්න. එක් එක් ළමයාට ධර්මිෂ්ඨ තීරණ ගැනීමට ඔවුන්ව සූදානම්කිරීමට උපකාරකිරීමට ඔබට කල හැකි දේවල් ගැන සලකා බලන්න.

## කියවීමේ පැවරුම

පහත සඳහන් ලිපිය අධ්‍යයනය කරන්න ඔබ විවාහක නම්, ඔබගේ සහකාරිය සමග ලිපිය කියවා සාකච්ඡාකරන්න.

### නොනිමෙන ගිනි දැල්ලක් මෙන්

ප්‍රේරිතවරුන් දොළොස්දෙනාගේ ගණපූර්ණයේ
වැඩිහිටි එම්. රසල් බැලඩ්

#### දේවමාළිගා විවාහයේ සතුට

ස්වාමීන්වහන්සේගේ ගෘහය තුල සුදුසු තරුණ දෙපලක් විවාහවී මුද්‍රතබන විට එය මෙහෙයවීමේ වරප්‍රසාදය ඇතැම්විට මට ලැබේ. මේවා නිතරම පවුලට සහ මිතුරන්ට විශේෂිත අවස්ථාවන් වේ. එවන් අවස්ථාවල ඇතිවන හැඟීම් මිහිරි වන අතර, පොළොවේ සතුට සහ සදාකාලික ජීවිතයේ ප්‍රීතිය මිශ්‍රවූ තෘප්තියක් කඳුළු පිරුනු මවගේ ඇස්වල දැකිය හැක්කේ, මෙම දිනය සඳහා ඔවුන්ගේ මුළු හදින්ම යාච්ඤා කළ නිසාය. පියාගේ ඇස්වලද ඔබට එය දැකිය හැක්කේ, ඔහු මාස ගණනාවකින් පසුව පළමු වතාවට, සියලුම වියදම් ගෙවන්නේ කෙසේදැයි බාහිර යමක් ගැන සිතමින් සිටින නිසාය. නමුත් වැඩි වශයෙන් ඔබ එය ගුණවත් මනාලියගේ සහ මනාලයාගේ දෙනෙත්වල දකින්නේ ඔවුන් සුභාරංචියේ ඉගැන්වීම්වලට අවංකව ජීවත්වී, ලෝකයේ පරීක්ෂාවන්ගෙන් ඉවත්ව සිටි නිසාය. පිරිසිදුව, පවිත්‍රව සහ නිර්මලව සිටි අයට විශේෂිත,, ප්‍රතික්ෂේප නොවන හැඟීමක් අත්විඳීමට ඉඩ ලැබේ.

#### සදාචාර ප්‍රමිතීන් ඒකාන්තය

අපගේ තරුණයන් සහ තරුණ කාන්තාවන් බොහෝ දෙනෙක් ලෝකයා මගින් පනවන ලද දුෂ්ට පණිවුඩ සහ දුරාචාර හැසිරීම්වලට වසඟවී සිටිති. ලුසිෆර් තරුණ සහ මහළු සියලු ආත්මවලට එක සමානව දුෂ්ට සටනක් මෙහෙයවන අතර, හදිසි අනතුරු ගණනද ඉහළ නගියි. ලෝකයේ ප්‍රමිතීන් සුලඟින් විසිරීගිය කාන්තාරයක වැලි මෙන් ඉහල නැග ඇත. කලින් නොඇසූ හෝ පිළිනොගත් දේවල් දැන් සාමාන්‍ය තත්වයක ඇත. සදාචාරාත්මක සංස්කෘතික ප්‍රමිතීන්වලට ඇලීසිටීම තෝරාගත් අය පුදුම අය ලෙස දැකීමට ලෝකයාගේ දර්ශනය එතරම්ම විශ්මයජනක ලෙස යොමුවීමෙන්, දෙවියන්වහන්සේගේ පණත් ආරක්ෂාකිරීමට ඔවුන් තුල ඇති කැමැත්ත සම්පූර්ණයෙන්ම වාගේ ඔවුන් සාධාරණීය කල යුතු තත්වයකට පත්ව ඇත.

නමුත් එක් දෙයක් සහතිකයඃ පණත් වෙනස්වී නැත. ඒගැන කිසි සැකයක් ඇතිකරගත යුතු නැත. ගෞරවනීයව හෝ දේශපාලන නිවැරදිබව පෙන්වීමට කෙතරම් දක්ෂලෙස කබාය හැඳ සිටියද, හරිදෙය කවදත් හරිය. වරද කවදත් වරදමය. විවාහයට පෙර පතිවෘත්තාවය සහ සදාකාලික භක්තිමත්බව ගැන අපි විශ්වාසකරමු. එම ප්‍රමිතිය වනාහි සත්‍යයේ ඒකාන්ත ප්‍රමිතියයි. එයට මහජන අදහස්වල ඡන්දයක හෝ අවස්ථාවන් හෝ තත්වයන් මත හෝ පවතින දෙයක් නොවේ. ඒ ගැන හෝ සුභාරංචි ප්‍රමිතීන් ගැන හෝ වාදකිරීම අවශය නොවේ.

#### නිවස තුල ඇඳහිල්ලේ බලකොටු ගොඩනැගීම

නමුත් අපගේ තරුණ පක්ෂයට ප්‍රේමය, අගයකිරීම සහ සුභාරංචියේ ප්‍රමිතීන්ට අනුව ජීවත්වීමට උදව්කිරීමේ බලාපොරොත්තු නොවන අවශ්‍යතාවයක් දෙමාපියන්ට, නායකයන්ට, සහ ගුරුවරුන්ට ඇත. දෙමාපියන් සහ තරුණ පක්ෂය දක්ෂ සහ නපුරු බලවේගවලට විරුද්ධව නැගී සිටිය යුතුය. විනාශකිරීමට නපුරා උත්සාහකරන විට

සුභාරංචිය අනුව ජීවත්වීමට අප දරන උත්සාහයේදී අපි කැපවුන, සාර්ථක සහ අධිෂ්ඨානශීලී අය විය යුතුය.

අප ඉදිරියේ ඇති අභියෝගය විශාලය. අපි ප්‍රේමකරන අයගේ දුරාචාර ආත්ම අවදානමක පවතී. අපගේ නිවාස තුල ඇදහිල්ලේ බලකොටු ගොඩනැගීමට අපට හැකිවීමට සහ, විශේෂයෙන්ම අපගේ තරුණ පක්ෂය පිරිසිදුව, නිර්මලව සහ පවිත්‍රව, දේවමාළිගාවට යාමට සම්පූර්ණයෙන්ම සුදුසුවීම සඳහා මම මාර්ග හතරක් යෝජනා කරමි.

## ළමයින්ට සුභාරංචිය උගන්වන්න

පළමුවැන්න සුභාරංචි තොරතුරුය. එය මා දන්නා වඩාත් වැදගත්, ජීවිත වෙනස්කරන තොරතුර නම්, අප සත්‍ය ලෙසම අපගේ සදාකාලික පියාණන්ගේ දේව දරුවන් වන අවබෝධයයි. මෙය ධර්මානුකූලව නිවැරදිවනවා පමණක් නොව, එය ආත්මිකවද ඉතා වැදගත්ය. ගැලවුම්කරුවාණන් වහන්සේ තම බලවත් මැදහත් යාච්ඥාවේදී මෙසේ කීසේක, "සදාකාල ජීවනය නම් මේය-එකම සැබෑවූ දෙවියන්වහන්සේ වන ඔබ සහ ඔබ විසින් එවන ලද තැනැත්තා වන යේසුස් ක්‍රිස්තුස් ඔවුන් විසින් ඇඳිනගැනීමය" (යොහාන් 17:3). ස්වර්ගික පියාණන්වහන්සේ දැනගැනීමට සහ අපගේ පියාණන් සහ අපගේ දෙවියන්වහන්සේ ලෙස අපට ඇති එතුමාගේ සම්බන්ධතාවය තේරුම්ගැනීම යනු, මෙම ජීවිතයේ අර්ථය සහ මතු ජීවියේ බලාපොරොත්තුව සොයාගැනීමය. උන්ව හන්සේ සැබෑ බවත්, අපි ඇත්ත වශයෙන්ම, එතුමාගේ පුතුන් සහ එතුමාගේ දියණියන් සහ උන්වහන්සේ සතු සියල්ලේම දැනට සහ සදාකාලයටම හිමිකරුවන් බව අපගේ පවුල් දැනගැනීම අවශ්‍යවන්නේය.

## සැප පහසුවෙන් නොව, ගිවිසුම අනුව ජීවත්වන්න

කෙසේ හෝ අපි මඳින් මඳ අපගේ එම පුරෝගාමී මුතුන්මිත්තන් මෙන්, අපගේ හදවත් තුලට යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සුභාරංචිය ගැන බලවත් සාක්ෂිය ඇතුල්කිරීම අවශ්‍යවේ. 1846 සැප්තැම්බර් මස නවුවූ නගරය කඩාවැටී, දුර්වල කඳවුරුවල සිටි ශුද්ධවන්ත යන්ගේ පීඩාකාරී තත්වය සිහිපත්කරන්න. වින්ටර් ක්වාටර්ස් වෙත පණිවුඩය ලැබුන විට, බ්‍රිගම් යන්ග් විගසකින්ම සොහොයුරන් එක්රැස් කළේය. තත්වය ගැන පැහැදිළිකිරීමෙන් පසුව, නවුවූ දේවමාළිගාවේදී කල ගිවිසුම ගැන ඔවුන්ට සිහිපත්කරමින්, පැමිණීමට කමැති කිසිවෙක් කෙතරම් දුප්පත් වුවද, එහි තනිකර නොදමන ලෙස කියා, ඔහු මෙම විශිෂ්ට අභියෝගය ඔවුන්ට දුන්නේය:

"වෙහෙසවිය යුතු කාලය දැන් පැමිණ ඇත," ඔහු කීවේය. "ඔබ ස්වාමීන්වහන්සේගේ ගෘහය තුල තැබූ *ගිවිසුමේ ගින්න, ඔබගෙ හදවත් තුල නොනිමෙන ගින්නක්* කරගන්න" (සාකච්ඡා ස්ථානයේදී, උසස් උපදේශක මණ්ඩලයට, 27 සැප්තැම්බර් 1846, බ්‍රිගම් යන්ග් ලියවිලි, ඓතිහාසික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසු-දවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාව, 1; ඉතාලි අකුරු ඇතුලත්ය). දින කිහිපයක් තුලදී, වින්ටර් ක්වාටර්ස්වල අන්ත අසරණ තත්වය ගැනද නොසලකා, බොහෝ අශ්ව කරත්ත මිසිසිපි ගංගාව අසබඩ දුර්වල කඳවුරුවල ශුද්ධවන්තයන් ගලවාගැනීම සඳහා උතුරු දෙසට ගමන් කළේය.

මුල් ශුද්ධවන්තයන් දරාසිටි දුක් පීඩා සහ පරිත්‍යාග ගැන අපි නිතර අසන්නෙමු. එසේම අපි අපගෙන්ම අසමු. ඔවුන් එය කලේ කෙසේද? ඔවුන්ට එවන් ශක්තියක් දුන් දෙය කුමක්ද? පිළිතුරෙන් කොටසක් සභාපති යන්ගේ බලවත් වචනවල තිබේ. එම පසු-දවස්වල මුල් ශුද්ධවන්තයන් දෙවියන්වහන්සේ හා ගිවිසුම් කරතිබූ අතර,එම ගිවිසුම් නොනිමෙන ගින්නක් ලෙස ඔවුන්ගේ හදවත් තුල ඇවිලින.

සමහර අවසථාවලදී අපගේ ජීවිත ගිවිසුමට වඩා සැපපහසුව මගින් වැඩියෙන් පාලනයකිරීමට ඉඩදීමට අපි පෙළඹෙන්නෙමු. සුභාරංචි ප්‍රමිතීන් අනුව ජීවත්වීම සහ සත්‍යය වෙනුවෙන් නැගී සිට, නැවත පිහිටුවීම ගැන සාක්ෂිදැරීම නිතරම පහසු දෙයක් නොවේ. අන් අය සමග සුභාරංචිය බෙදාගැනීම සාමාන්‍යයෙන් පහසු නැත. සභාවේ කැඳවීමකට, විශේෂයෙන්ම අපගේ හැකියාවන් දිගහැරෙන එකකට ප්‍රතිචාර දැක්වීම නිතරම පහසු නැත. අපි ගිවිසුම් තබා තිබෙන පරිදි, අන් අයට අර්ථවත් ලෙස සේවයකිරීමේ ප්‍රස්ථාවයන්, පහසු වෙලාවක පැමිණෙන්නේ කලාතුරකිනි. බලය පැමිණෙන්නේ අපි ගිවිසුම් තබන විටය. අපි මෙම මුල්කාලීන ශුද්ධවන්තයන්ගේ ජීවිත දෙස බැලීමේදී, ඔවුන්ගේ ජීවිතවල ප්‍රධානතම බලය වූයේ ඔවුන්ගේ ගිවිසුම් බව අපට පෙනේ. ඔවුන්ගේ ආදර්ශය සහ සාක්ෂි, ඔවුන්ගේ දරුවන්ගේ පරම්පරාවෙන් පරම්පරාවට බලපෑමට තරම් ප්‍රමාණවත්ය.

## සදාචාරය ගැන දරුවන්ට උගන්වන්න

අපගේ ළමයින් වැඩෙන විට, සුදුසු සහ නුසුදුසු දෙය කුමක්ද කියා වඩාත් ඍජුව සහ සරලව ඔවුන්ගේ දෙමාපියන් විසින් උගන්වන තොරතුරු ඔවුන්ට අවශ්‍යවේ. කාම සගරා, පින්තූර හෝ කථාවලින් වැළකීමට දෙමාපියන් ළමයින්ට ඉගැන්වීම අවශ්‍යවේ. ඕනෑම ආකාරයක කාම සඟරා යක්ෂයාගේ උපකරණ බව ළමයින් සහ තරුණයන් දෙමාපියන්ගෙන් දැනගත යුතුය.තවද යමෙක් ඒවාට ගැති වුවහොත්, එයට ඇබ්බැහිවීමට, උදාසීනකිරීමට සහ මනුෂ්‍ය ආත්මය විනාශකිරීමට පවා ඒවාට බලය ඇත. ග්‍රාමීය භාෂාව පාවිච්චි නොකිරීමට සහ ස්වාමීන්වහන්සේගේ නාමය කිසිවිට නිකරුනේ නොගැනීමට ඔවුන්ට ඉගැන්වීම අවශ්‍යවේ. රළු විහිළු ඇසුන විට ඒවා නැවත නොකිය යුතුය. ඉන්ද්‍රියන් පිනවන සංගීතයට සවන්දෙමින් විනෝද නොවීමට පවුල් සාමාජිකයන්ට උගන්වන්න. ස්ත්‍රී පුරුෂ භාවය ගැන සහ පතිවෘත්තාව ගැන සුභාරංචියේ ඉගැන්වීම් ඔවුන් සමග සරලව කථාකරන්න. දෙමාපියන්ගේ මෙම තොරතුරු සුදුසු අන්දමට නිවස තුලින් පැමිණීමට ඉඩ සලසන්න. සියලුම පවුල් සාමාජිකයන් නීති දැනගෙන ආත්මිකව ශක්තිමත්වීම අවශ්‍යවේ, එවිට ඔවුන්ට ඒවා ආරක්ෂාකල හැකිය. එසේම වැරදි සිදුවූ විට, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ආශ්චර්‍යමත් වන්දිගෙවීම තේරුම්ගෙන

පිළිගතයුතු අතර, එවිට සමහර අවස්ථාවලදී අසීරුවූ ක්‍රියාවලියවූ පසුතැවිල්ල, කමාවදීම සහ අනාගතය සඳහා වන නිරන්තර බලාපොරොත්තුද ලබාගත හැකිය. සදාකාලික ජීවනය සඳහා වන අපගේ පෞද්ගලික සහ පවුලේ ප්‍රශ්න අප කිසිදා අත් නොහැරිය යුතුය.

අවාසනාවකට මෙන්, වර්තමාන ලෝකයේ බොහෝ දෙමාපියන් මෙම අගැයීම් සහ අනෙක් සභාවේ ධර්මය, ඔවුන්ගේ පවුල්වලට ඉගැන්වීමේ වගකීම, අන් අය කරන බව සිතා අත්හැර දමා ඇතඃ සමකාලීන කණ්ඩායම්, පාසල, සභා නායකයන් සහ ගුරුවරුන්, මාධ්‍ය පවා ඒවා අත්හැර ඇත. අපගේ ළමයි දිනපතාම ඉගෙනගනිමින්, පෞද්ගලික ඇගයීමේ ක්‍රමයට තදින්ම බලපාන අත්දැකීම් සහ ඥානය ඔවුන්ගේ හදවත් තුලට පුරවා ගනිති.

### එකිනකාගේ දුර්වලකම්වලින් ඔවුන්ව ශක්තිමත්කරන්න

සොයුරු, සොයුරියනි, අපි එකිනෙකාට උපදෙස් දෙමින්, අපගේ හදවත් තුලට ගැඹුරු ඇදහිල්ල බිඳෙන් බිඳ ඇතුල්කර, දුෂ්ටකම් නිතිපතා වැඩිවන ලෝකයක පණත් තැබීමට ධෛර්‍යය සමගින් අපව ශක්තිමත්කිරීම අපට අවශ්‍යවේ. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සුභාරංචියට තදින්ම හැරී ඒම අපට අවශ්‍යවේ, එවිට ගිවිසුමේ ගින්න, නොනිමෙන දැල්ලක් මෙන් අපගේ හදවත් තුල දැල්වේ. තවද ඒ අන්දමේ ඇදහිල්ලක් සමගින් අවංකව සහ සුදුසුව සිටීමට අවශ්‍ය දෙය අපි කරන්නෙමු.

### ළමයින් සමග විවෘතව කථාබස් කරන්න

දෙවැන්න කථාබස් කිරීමයි. අපගේ තරුණ පක්ෂය සමග සාකච්ඡා කිරීමේ හැකියාව—සහ සමහරවිට, වඩාත් වැදගත් ලෙස, ඔවුන්ගේ ප්‍රශ්න ගැන සැබැවින්ම සවන්දීම—සාර්ථක සම්බන්ධකම් ගොඩනැගෙන පදනම වන්නේය. බොහෝ විට, අපි ඇස්වලින් දකින දෙය සහ අපගේ හදවතින් අප අත්විඳින දෙය අප අසන හෝ කියන දෙයට වඩා බොහෝ සේ ප්‍රකාශකරනු ඇත. ඔබගේ ළමයින්ට වචනයක්ඃ ඔබගේ දෙමාපියන්ට කිසිදා අගෞරව නොකරන්න. ඔබ ඇහුම්කන්දීමටද ඉගෙනගත යුතුය. විශේෂයෙන්ම ඔබගේ මවට සහ පියාට සහ ආත්මයාණන්ගේ පෙළඹවීම්වලටය. අපගේ පවුල් සම්බන්ධතාවයන්හිදී නිතරම ඇතිවෙන ඉගැන්වීමේ අවසථාවන් ගැන පරීක්ෂාකාරීව ඒවා අල්ලාගැනීම අපට අවශ්‍යවේ. එසේම සෑම සඳුදින රාත්‍රියකම පවුල් නිවාස සැන්දෑව පැවැත්වීමට අප දැන් අධිෂ්ඨාන කරගත යුතුය.

කථාබස් කිරීමේ බලවත් අවස්ථාවන් ක්‍රමානුකූල පවුලේ යාච්ඥාව තුලින් සහ පවුලේ ශුද්ධ ලියවිලි අධ්‍යයනයකිරීම තුළින් ඇතිවේ. ශුද්ධ ලියවිලි පවුලේ ඇගයීම් සහ ඉලක්ක විස්තරකිරීමට උපකාරවත්වන අතර, ඔවුන් ගැන එක්ව කථාකිරීමෙන් පවුල් සාමාජිකයන්ට පෞද්ගලික සුරක්ෂිතබව, ආත්මිකව ශක්තිමත්වීම, සහ ආත්ම-ශක්තිය ඇතිකරගැනීමට පුරුදුවීමට උපකාරකරයි. මෙයට කාලය අවශ්‍යවන අතර, එනිසා අප එකට එක්ව රූපවාහිනියට කොපමණ වේලාවක්ද, චිත්‍රපට, වීඩියෝ, වීඩියෝ තරග කොපමණද, අන්තර්ජාලයට කොපමණ වේලාවක්ද සහ නිවාස ක්‍රියාකාරකම්වලට කොපමණ වේලාවක් ඉඩලබාදිය යුතුද කියා සාකච්ඡාකිරීම අපට අවශ්‍යවේ.

### දෙමාපියන් සහ නායකයන් මැදිහත්විය යුතුය

තුන්වැන්න මැදිහත්වීමය. වැරදි තේරීම්කරන බව දුටු විට, ඊට මැදිහත්වීම දෙමාපියන්ගේ යුතුකමකි. ළමයින්ගේ වටිනා කර්තෘත්වය ඔවුන්ගෙන් ගැනීම එයින් අදහස් නොවේ. මන්ද කර්තෘත්වය දෙවියන්වහන්සේ දුන් දීමනාවක් නිසාය. අවසානයේදී ඔවුන් කරන දේවල් කුමක්ද, ඔවුන් හැසිරෙන්නේ කෙසේද, සහ ඔවුන් විශ්වාස කරන්නේ කුමක්ද යන්න නිතරම ඔවුන්ට අයිති දෙයකි. නමුත් දෙමාපියන් වශයෙන් අපගේ අවශ්‍යතාවය වන්නේ, ඔවුන් සුදුසු ලෙස හැසිරීම සහ ඔවුන් වැරදි සහගත මාර්ගයක යන්නේ නම් එහි ප්‍රතිඵල ඔවුන් තේරුම් ගැනීම ස්ථිරකරගැනීමය. නිවස තුල නීත්‍යානුකූල නොවන කපාදැමීමක් නොමැතිබව මතකතබාගන්න. චිත්‍රපට, සඟරා, රූපවාහිනී, වීඩියෝ. අන්තර්ජාලය සහ වෙනත් මාධ්‍යයන් අමුත්තන් ලෙස ඇති අතර, ඒවාට අවසර දිය යුත්තේ ඒවා පවුලේ විනෝදය සඳහා සුදුසු නම් පමණකි. ඔබගේ නිවස සමාදානයේ සහ ධර්මිෂ්ඨතාවයේ ස්වර්ගයක් කරන්න. ඔබගේ ආත්මික පරිසරයට නපුරු බලපෑම්වලට කථාබස් කිරීමට ඉඩ නොදෙන්න. කාරුණිකවන්න, කල්පනාකාරීව සහ ආචාරශීලීවී, ඔබ කියන දෙය සහ ඔබ අන් අයට සලකන අන්දම ගැන සිතාබලන්න. එවිට සුභාරංචි ප්‍රමිතීන් මත පදනම්වූ පවුලේ ඉලක්ක යහපත් තීරණගැනීමට පහසුවක් ඇතිකරයි.

එම මූලධර්මම සභානායකවරුන්, ගුරුවරුන් සහ අනෙකුත් සභා නායකයන් වන ඔබලා පවුල්වලට සහායවන විට ඔබටද අදාළවේ. ඔබට භාරකාරත්වය තිබෙන අය දුර්වල සදාචාර තේරීම්කරන විට ඔබ නිකරුනේ බලාසිටීම අවශ්‍ය නොවේ. අපගේ යම් තරුණයෙක් ඔහුගේ ජීවිතයේ සදාචාර විරෝධී මාර්ගයක සිටින විට, බොහෝ විට නිතරම,—දෙමාපියෙක්, නායකයෙක්—ප්‍රේමයෙන් සහ කරුණාවෙන් මැදිහත්වී වෙනසක් කිරීමට හැකි යමෙක් එහි සිටිය යුතුය.

### ළමයින්ට යහපත් ආදර්ශයක් වන්න

හතරවැන්න ආදර්ශයයි. වෙහෙසට පත් යාත්‍රිකයෙකුට කොම්පාසුවක ආධාරයක් නොමැතිව සිතියමක් නොමැති සාගරයක මාර්ගය සොයාගැනීම අසීරුවන්නාක් මෙන්, ළමයින්ට සහ තරුණ අයට යහපත් ආදර්ශමත් මගපෙන්වීමේ ආලෝකයෙන් තොරව ජීවිතය නැමැති සාගරයේ මාර්ගය සොයාගැනීම කොහෙත්ම නොහැකිය. ඔවුන්ගේ දෙමාපියන් මූලධර්ම කඩකරමින් සුභාරංචිය අනුව ජීවත්වීමට අසමත් බව ඔවුන් දකින විට, ඔවුන් නුසුදුසු දේවලින් වැළකීම අපේක්ෂාකිරීමට අපට නොහැකිය.

දෙමාපියන්, ගුරුවරුන්, සහ නායකයන් වශයෙන්, අපගේ උදාර රාජකාරිය වන්නේ ධර්මිෂ්ඨව ශක්තිමත්කිරීම, ධෛර්‍යය, පරිත්‍යාගය, පරාර්ථ සේවය, සහ ආත්ම සංයමය ගැන පෞද්ගලික ආදර්ශයක් තැබීමය. මේවා ඔබගේ

තරුණයන්ට සුභාරංචියේ යකඩ රිට තදින් අල්ලාගෙන ඍජු සහ පටු මාවතේ සිටීමට උදව්වන මාර්ගයන් වේ.

### සුභාරංචිය අනුව ජීවත්වීම වැරදිකිරීමෙන් වැළකීමට උපකාරකරයි

තොරතුරුවලට, කථාබස් කිරීමට, මැදිහත්වීමට සහ ආදර්ශමත්බවට යොමුවීමෙන් එහි ප්‍රතිපලයක් ලෙස, සර්ව සම්පූර්ණ පවුලක් සර්ව සම්පූර්ණ ළමයින් සමග ලබාගත හැකි බවත්, ඔවුන් සුභාරංචි මූලධර්මවලින් ඉවත්ව නොයන බවත් ඔබට කීමට හැකි බව මම සිතමි. අවාසනාවකට මෙන්, තත්වය මෙය නොවේ. නමුත් සුභාරංචි මූලධර්ම සහ ප්‍රමිතීන් ඉගැන්වීම සහ ඒ අනුව ජීවත්වීම, මගින් බරපතල වැරදිවල වේදනාවෙන් ඔවුන්ව බොහෝ දුරට වළක්වන බව පවුල් දැන සිටියි. බොහෝ කාලයක සිට සුභාවදී කථාබස් කිරීමේ ක්‍රමය පිහිටුවාගෙන, ඇදහිලිමත් ආදර්ශය පවතින විට, පෞද්ගලික ප්‍රශ්න ගැන එකමුතුව සාකච්ඡාකරමින් අවශ්‍ය වෙනස්කම් ගැන කටයුතුකිරීම පහසු කර, එමගින් සෑම පවුල් සාමාජිකයෙක්ම ආශිර්වාදිත වේ.

බෙන්ජමින් රජතුමාගේ වැදගත් උපදේශයට සවන් දෙන්නඃ

"නුඹලා විසින් පව් කල හැකි සෑම ක්‍රමයක්ම නුඹලාට කියාදීමට මට නොහැකිය; මන්ද යත්, මා විසින් ගණන් කල නොහැකි තරම් නොයෙකුත් මාර්ග සහ ක්‍රම ඇත්තේය.

එහෙත් මෙතරම් ප්‍රමාණයක් මට නුඹලාට කිව හැකිය. එනම් නුඹලා නුඹලාම රැකබලා නොගතහොත්, නුඹලාගේ සිතිවිලි, වදන් සහ ක්‍රියා ගැන ප්‍රවේශම් නූවහොත්, දෙවියන් වහන්සේගේ පණත් අනුසාර නොකළහොත්, නුඹලාගේ ජීවිතාන්තය දක්වා පවා අප ස්වාමීන්වහන්සේගේ පැමිණීම ගැන නුඹලා අසා ඇති දේ ගැන විශ්වාසයෙන් නොසිටින්නේ නම්, නුඹලා විනාශවිය යුතුය. තවද දැන් අහෝ මිනිස, මතකතබා ගන්න, විනාශ නොවෙන්න" (මොසායා 4:29–30).

මගේ සොයුරු, සොයුරියනි, අපගේ ගිවිසුම්වල ගින්න අපගේ හදවත් තුල නොනිමෙන ගින්නක් ලෙස ඇවිළීමට දෙවියන්වහන්සේ අප සැමට ආශිර්වාදකරන සේක්වා, හැම සතියකම අප සක්‍රමේන්තුව භුක්තිවිඳින විට අපගේ පූජනීය ගිවිසුම් අළුත්කිරීමට අපට ආත්මික සූදානම්වීමට හැකිවේවා, එනම් අප ස්වාමීන්වහන්සේට ගෞරවකරමින්, මෙම වඩාත් අපූර්ව පසු-දවස්වලදී අපගේ කොටස උනන්දුවෙන් ඉටුකර, අපගේ පවුල් ශක්තිමත්කරමින් උන්වහන්සේගේ සභාව ගොඩනැගීමට අපට හැකිවේවා යනු මගේ නිහතමානී යාච්ඤාවයි.

වැඩිහිටි බැලඩ් 1999 අප්‍රේල් මස කළ කථාවකිනි Church General Conference හි, (බලන්න Conference Report, අප්‍රේ, 1999, 111–15; හෝ *Ensign*, මැයි 1999, 85–87).

# පවුලේ යාච්ඤාව, පවුලේ ශුද්ධ ලියවිලි අධ්‍යයනය, සහ පවුල් නිවාස සැන්දෑව

16

## අදාළකරගැනීම සඳහා අදහස්

ඔබගේම අවශ්‍යතාවයන් සහ තත්වයන් අනුව, මෙම යෝජනාවලින් එකක් හෝ දෙකම අනුගමනය කරන්න.

- ඔබගේ පවුල පවුලේ යාච්ඤාව, පවුලේ ශුද්ධ ලියවිලි අධ්‍යයනය සහ පවුලේ නිවාස සැන්දෑව නිතිපතා පවත්වන්නේ නම්, මෙම අවස්ථා එකක් හෝ වැඩියෙන් දියුණුකිරීමට ඔබට හැකි මාර්ග ගැන යාච්ඤාවෙන් යුතුව සලකා බලන්න. ඔබගේ පවුල මේ දේවල් කරන්නේ නැති නම්, මෙම ක්‍රියාකාරකම් ඔබගේ නිවසේ පිහිටුවීම සඳහා උපකාරකිරීමට ඔබට කල හැකි දේවල් ගැන සලකා බලන්න.
- පවුලක් මෙන එකට එක්ව ඔබට කල හැකි ක්‍රියාකාරකමක් සැලසුම් කරන්න.
- *ඉගැන්වීමට වඩා වෙනත් ශ්‍රේෂ්ඨ කැඳවීමක් නැත,* (36123). 137–39 පිටුවල සඳහන් කරුණු නැවත බලන්න.

## කියවීමේ පැවරුම

පහත සඳහන් ලිපිය කියවන්න. ඔබ විවාහක නම්, ඔබගේ සහකාරිය සමග ලිපිය කියවා සාකච්ඡා කරන්න.

### පවුලේ යාච්ඤාවේ තිබෙන ආශිර්වාද

සභාපති ගෝර්ඩන් බී. හින්ක්ලි
පළවෙනි සභාපතිත්වයේ පළවෙනි උපදේශකවරයා

පාවුළු ප්‍රේරිතවරයා තිමොතිට මෙසේ ප්‍රකශ කළේය:

"නුමුත් අන්තිම දවස්වලදී අන්තරා සහිත කාලවල් පැමිණෙන බව දැනගනින්න.

"මක්නිසාද මනුෂ්‍යයෝ තමන්ටම ප්‍රේම කරන්නෝව, මුදලට ප්‍රේමකරන්නෝව,පාරට්ටුකරගන්නෝව, උදාරම්කාර යෝව, අපහාසකරන්නෝව, මවුපියන්ට අකීකරුවන්නෝව, ස්තුතිවන්ත නොවන්නෝව, අභක්තිකයෝව,

"ජන්ම ස්නේහය නැත්තෝව, සමාදාන නොවන්නෝව, කේලාම් කියන්නෝව, තෘෂ්ණාව මැඩපවත්වා නොගන් නෝව, කෲරයෝව, යහපතට ප්‍රේමනොකරන්නෝව,

"ද්‍රෝහියෝව, හිතුවක්කාරයෝව, අහංකාරයෝව, දෙවියන්වහන්සේට වඩා සැප සෙල්ලමට ප්‍රේමකරන්නෝය" (2 තිමොති 3:1–4).

අපගේ කාලය තුල අවංකත්වයට, චරිතයට සහ ගුණගරුකබවට නව අවධාරණයක අවශ්‍යතාවයක් ඇත. අප නැවත වරක් අපගේ ජීවිතවලට සැබෑ ශිෂ්ටාචාරයේ සාරය වන ගුණධර්ම ගොඩනගාගත් විට පමණක් අපගේ කාලයේ ක්‍රමය වෙනස්වන්නේය. අප මුහුණ දෙන ප්‍රශ්නය නම්, අපි ආරම්භකරන්නේ කොහෙන්ද? යන්නය.

එය ආරම්භකල යුත්තේ, දෙවියන්වහන්සේ අපගේ සදාකාලික පියාණන් බවත්, එතුමාගේ දරුවන් ලෙස එතුමාට ඇති අපගේ සම්බන්ධතාවය ගැනත් හඳනාගෙන, උන්වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය පිළිගෙන එතුමා සමග කථාබස් කිරීමෙන් සහ අපගේ කටයුතුවලට මගපෙන්වීමට දිනපතා යාච්ඤාකිරීමෙන් නම්, මම තෘප්තිමත් වෙමි.

අපගේ ජනතාවගේ නිවාස තුල පරණ ක්‍රමයට නැවත පැමිණ යාච්ඤාව සහ පවුලේ යාච්ඤාව පැවැත්වීම, අපගේ සමාජයේ චරිතය සෝදා පාලුවන භයානක විෂබීජය සීමාකිරීමේ මූලික බෙහෙත් ලෙස මම ඉදිරිපත් කරමි. එක් දිනකින් හාස්කමක් අපේක්ෂාකිරීමට අපට නොහැකිය. නමුත් පරම්පරාවක් තුලදී අපට හාස්කමක් දැකිය හැකිය.

පරම්පරා එකක් හෝ දෙකකට පෙර, ලෝකය මුළුල්ලේම ක්‍රිස්තියානි ජනතාවගේ නිවාසවල පවුලේ යාච්ඤාව බොහෝ සෙයින් කැමගැනීම මෙන් දිනපතා ක්‍රියාවක කොටසක් ලෙස පැවතින. මෙම පුරුද්ද නැතිවීයාමත් සමගම, පාවුළු ප්‍රේරිතවරයා කථාකල සදාචාරය ක්ෂයවීයාමද ස්ථිරවී ඇත.

පියා, මව, සහ ළමයින්—උදෑසන සහ සවස එකට දණගැසීමේ පුරුද්දට සමවන ප්‍රමාණවත් කිසිවක් නැති බවට තෘප්තිමත් හැඟීමක් මට ඇතිවේ. මෙය මෘදු කාපට්වලටත් වඩා, ලක්ෂණ තිර රෙදිවලටත් වඩා, දක්ෂ ලෙස සම කළ වර්ණ සංයෝගවලටත් වඩා, නිවාස වඩා හොඳින් ලක්ෂණ කරන දෙයකි.

පාවුළු තුමා විස්තර කල: "හිතුවක්කාර…අහංකාර" ආකල්පයට වෙනස් යම්කිසි ප්‍රති විරුද්ධ ඉරියව්වක් දණගැසීම තුල ඇත.

පියා සහ මව සහ ළමයින් එකට දණගැසීමේ පුරුද්ද තුල යමක් තිබෙන අතර, එමගින් ඔහු විස්තර කල අන් අයගේ සිරිත් වන; "දෙමාපියන්ට අකීකරුවීම,…ජන්ම ස්නේහය නැතිවීම" යන දුර්ගුණ අතුරුදන්වේ.

දෙවියන්වහන්සේට කථාකිරීමේ එම ක්‍රියාව තුළ අපහාසකිරීම කෙරෙහි සහ දෙවියන්වහන්සේට වඩා සැප සෙල්ලමට ආශාකිරීම කෙරෙහි ඇති කැමැත්ත නැති කරදැමීමේ කිසියම් දෙයක් ඇත.

අභක්තියට නැඹුරුවීම, පවුළු තුමා විස්තර කරන, ස්තුති නොකිරීම, පවුල් සාමාජිකයන් ජීවිතය ගැනත්, සමාදානය සහ ඔවුනට ඇති සියල්ල වෙනුවෙනුත් ස්වාමීන්වහන්සේට ස්තුතිකරන විට මැකී යයි.

ශුද්ධ ලියවිලි මෙසේ ප්‍රකාශකරයිඃ ඃ සියලුම දේවල් තුලින් නුඹලා ස්වාමීන්වූ නුඹලාගේ දෙවියන්වහන්සේට ස්තුතිකල යුතුය (බලන්න ඩීසහසී 59:7). තවද නැවතත්ඃ මනුෂ්‍යයා කිසිවක් තුලින් දෙවියන්වහන්සේ අමනාප නොකරත්වා, නැතහොත් එතුමාගේ හස්තය පිළි නොගන්නා හැර, එතුමාගේ කෝපය වෙනත් කිසිවකින් ඇවිලෙන්නේ නැත (බලන්න ඩීසහසී 59:21).

සියල්ලෝම එක්ව ස්වාමීන්වහන්සේ ඉදිරියේ දුප්පතුන්, සහ පීඩාවට පත්වූවන් සිහිපත්කිරීමෙන්, නොදැනුවත්ව නමුත් සැබෑ ලෙසම, තමාට වඩා අන් අය කෙරෙහි ප්‍රේමයක්, අන්අයට ගරුකිරීම, අන් අයගේ අවශ්‍යතාවයන් වෙනුවෙන් සේවයකිරීමක් වර්ධනයවේ. විපතට පත් අසල්වැසියෙකුට උදව්කිරීම සඳහා යමක් කිරීමට තමා තුල පෙළඹවීමක් නැතිව එම අසල්වැසියාට උදව්කරන ලෙස දෙවියන්වහන්සේගෙන් ඉල්ලීමට අපට නොහැකිය. ළමයින් තම ආත්මාර්ථකාමය පසෙක තබා අන් අයගේ සේවය සඳහා තමා අමතක කරන්නේ නම්, අද ලෝකයේ ළමයින්ගේ ජීවිතවල කුමන ආශ්චර්යයන් සිදුවේවිද. මෙය වසා සිටින බීජය සහ ඵල පිරි වෘක්ෂය හොඳින් සිටුවා, පවුලේ දිනපතා යාච්ඤාව තුලින් පෝෂණය කෙරෙත්වා.

රටට ආදරයකිරීම වර්ධනයවීම සඳහා දෙමාපියන් ඔවුන්ගේ ළමයින් ඉදිරියේ ඔවුන් ජීවත්වන දේශය වෙනුවෙන් යාච්ඤාකර, සර්වපරාක්‍රමයාණන්ගේ ආශිර්වාද ඒ මතට ඉල්ලාසිටිමින්, එහි නිදහස සහ සමාදානය අරක්ෂාකරන ලෙස යැදීමට වඩා වෙනත් හොඳ ක්‍රමයක් මම නොදනිමි. අප ජීවත්වන දේශවල රජයේ බර දරාසිටින නායකයන් සිහිපත්කරමින් ඔවුන්ගේ අධිකාරිත්වයට ගරුකිරීම අපගේ ළමුන්ට වඩාත් අවශ්‍ය වන අතර, එය පවුලේ යාච්ඤාව තුලින් ළමුන්ගේ හදවත් තුලට දැමීම හැර ඊට වඩා හොඳ ක්‍රමයක් ගැන මම නොදනිමි.

දැන්වීම් පුවරුවක මා දුටු ප්‍රකාශනයක මෙසේ කියවේ, "යාච්ඤාවේ නිරතවන ජාතියක් සමාදානයේ නිරත ජාතියකි."

පවුලේ කල බල ගතිය තුනී කරමින්, දෙමාපියන්ට ගරුකරමින් කීකරුවීමට මග පෙන්වන, පසුතැවීමේ ආකල්පයට බලපාන, කැඩුන නිවාසවල හානිය මකාදැමීම සඳහා, එකට එක්ව යාච්ඤාකරමින් , ස්වාමීන්වහන්සේ ඉදිරියේ දුර්වලකම් කියමින් සහ නිවසට සහ එහි වාසය කරන්නන් මත ස්වාමීන්වහන්සේගෙන් ආශිර්වාද ඉල්ලීමට විශාල ලෙස උපකාරවත්වන වෙනත් කිසිවක් ගැන මම නොදනිමි.

බොහෝ කලකට පෙර මියගිය මිනිසෙක් කර තිබූ ප්‍රකාශයකින් මම කලක් මවිතව සිටියෙමි. ජේම්ස් එච්. මොයිලි ඔහුගේ නිවසේ පවුලේ යාච්ඤාව සම්බන්ධයෙන් තම මුනුපුරන්ට ලියා තිබිනි. ඔහු මෙසේ කීවේයඃ "දිව්‍යමය මගපෙන්වීම සහ අනුමැතිය ඉල්ලා සිටීමට යාච්ඤාවෙන් දණගැසීමට පෙර අපි නිදි යහනට ගොස් නැත. හොඳින් පාලනයවන නිවාසවලද වෙනස්කම් පැනනැගිය හැකිය. නමුත් ඒවා …යාච්ඤාවේ ආකල්පය මගින් පහකළ හැකිය….මිනිසුන් අතර වඩාත් ධර්මිෂ්ඨ උසස් ජීවිතයක් ගතකිරීම බොහෝ ලෙස මානසික නැඹුරුවකි. එය සමගිය, ප්‍රේමය, කමාවදීම, හා සේවයකිරීමටද නැඹුරුකරයි.

1872දී ක්ලෝනල් තෝමස් එල්. කේන්, අපගේ ජනතාව අයිවෝ නගරයේ පීඩාවට පත්ව සිටි විට, සහ හමුදාව සොල්ට් ලේක් මිටියාවතට පැමිණි කාලයේ ඔවුන්ගේ ශ්‍රේෂ්ඨ මිතුරෙක්ව සිටි ඔහු, ඔහුගේ බිරිඳ සහ පුතුන් දෙනොද සමග නැවත වරක් බටහිරට පැමිණියේය. ඔවුහු බ්‍රිගම් යන්ග් සමග සාන්ත ජෝර්ජියාවට ගමන්කරන අතර හැම රාත්‍රියකම සභා සාමාජිකයන්ගේ නිවාස වල නැවතුනහ. කේන් මහත්මිය ෆිලඩෙල්පියාවේ සිටි තම පියාට ලිපි ගණනාවක් ලියුවාය. එයින් එක ලිපියක ඇය මෙසේ කීවායඃ

"මෙම ගමනේදී අප නැවතුන සෑම ස්ථානයකම රාත්‍රී අහාරය ගත් විගසම අපි යාච්ඤා කළ අතර, නැවතත් උදය කෑමට පෙරද යාච්ඤා කළෙමු. කිසිවෙක් හට ඉන් නිදහසක් නොලැබුනි…. මෝර්මන්වරු…එක්වරම දණගැසූ අතර, ගෘහ මූලිකයා හෝ ගෞරවනීය අමුත්තා ශබ්දනගා යාච්ඤාකරයි….ඔවුහු දේව වර්ණනා සඳහා ගතකරන්නේ ඉතා සුළු වේලාවකි, නමුත් ඔවුන්ට අවශ්‍ය දේ ඉල්ලමින්, උන්වහන්සේ දුන් දේවල් ගැන ස්තුතිකරති….දෙවියන්වහන්සේ අපගේ ප්‍රියතම නම් සහ මාතෘකා දන්නා බව [ඔවුහු] පිළිගෙන තිබෙන බැවින්, [එම විශේෂිත පුද්ගලයාගේ නමට] ආශිර්වාදයක් ඉල්ලති….මම මෙය ප්‍රියකල අතර, එයට පුරුදු වූවෙමි.

ඕ, අපගේ පුරෝගාමී මුතුන්මිත්තන්ට එපමණටම වැදගත්වූ දෙයක්වූ මෙම පුරුද්ද අපගේ ජනතාවටද සම්පූර්ණයෙන්ම වගාකර ගත හැකිය. පවුලේ යාච්ඤාව, දේවස්ථානයේ රැස්වීම්වල රැස්වීම මෙන් ඔවුන්ගේ නමස්කාරයේද වැදගත් කොටසක් විය. දිනපතා ආරම්භක යාච්ඤාවල තිබූ ඇදහිල්ල සමගින්, ඔවුහු දේශය එළි පෙහෙළි කර, වියළි භූමියට ජලය යවා, කාන්තාරයේ මල් පුබුදුවා, ඔවුන්ගේ පවුල් ප්‍රේමයෙන් පාලනයකර, එකිනෙකා සමග සමාදානයෙන් ජීවත්වී, දෙවියන්වහන්සේට ඔවුන් කල සේවය නිමාවූ විට, ඔවුන්ගේ නාමයන් අමරණීය කළහ.

පවුල සමාජයේ මූලික ඒකකයකි. යාච්ඤාකරන පවුල වඩාත් යහපත් සමාජයක බලාපොරොත්තුවයි. "ස්වාමීන්වහන්සේට සම්බවෙන්ට සිටිද්දී, උන්වහන්සේ සොයාපල්ලා" (යෙසායා 55:6).

අපගේ නිවාස අපි වඩාත් අලංකාරකරන්නේ කෙසේද? එසේය, පවුල් වශයෙන් සත්‍යයේ සියලුම අලංකාර උල්පතට අප විසින්ම කථාකිරීම තුලින්ය. අප ජීවත්වන සමාජය ශක්තිමත්කර එය වඩා හොඳ ස්ථානයක් කිරීමට අපට පුළුවන්ද? එසේය, අපගේ පවුල් ජීවිතයේ ගුණදහම් ශක්තිමත්කිරීම මගින්, එකට දණගැසීම තුලින් සහ සර්වපරාක්‍රමයාණන්ට එතුමාගේ ප්‍රේමනීය පුත්‍රයාණන්ගේ නාමයෙන් යාච්ඤා කිරීමෙන්ය.

මෙම පුරුද්ද, පවුලේ නමස්කාරයට නැවත පැමිණීම, දේශය පුරා සහ පොළොව මුළුල්ලේම පැතිරෙමින්, අපව විනාශකරන රෝගය මැඩපවත්වා විශාල වශයෙන් පරම්පරා ආලෝකකරමින් යනු ඇත. එය අවංකත්වය, අන්‍යෝන්‍ය ගරුත්වය, සහ ජනතාවගේ හදවත් තුල ස්තුතිකිරීමේ ආකල්පයද නැවත පිහිටුවනු ඇත.

ආචාරීන්වහන්සේ මෙසේ ප්‍රකාශ කලසේක, "ඉල්ලා පල්ලා, එවිට නුඹලාට දෙනු ලැබේ; සොයාපල්ලා, එවිට නුඹලාට සම්බවේ; තට්ටුකරපල්ලා, එවිට නුඹලාට දොර හරිනු ලැබේ" (මතෙව් 7:7).

ඔබ අවංකවම පවුලේ යාච්ඤාව අදාලකරගන්නේ නම්, ඔබට ප්‍රතිඵල නොලැබී යන්නේ නැතිබවට මම ඔබට මගේ සාක්ෂිය දෙමි. වෙනස්වීම සූදානම්ව ඇති බව නොපෙනීමට ඉඩ ඇත. ඒවා ඉතාමත්ය සියුම්ය. නමුත් ඒවා සැබැවින්ම පවතියි. මන්ද දෙවියන්වහන්සේ "උන්වහන්සේ සොයන්නන්ට විපාකදෙන කෙනෙකු වනසේක" (හේබ්‍රෙව් 11:6).

අපට ඇදහිලිමත්ව, මෙම පුරුද්දෙන් සහ අන් අයට එසේ කිරීමට දිරිමත්කරමින් ලෝකයා ඉදිරියේ ආදර්ශමත්ව සිටීමට ලැබේවා.

1991 පෙබරවාරි *Ensign*, පෙබරවාරි සඟරාවෙනි, පිටු 2–5.

---

## "එමනිසා මට උගන්වා ඇත"

ප්‍රේරිතවරුන් දොළොස්දෙනාගේ ගණපූර්ණයේ
වැඩිහිටි එල්. ටොම් පෙරී

### යහපත් දෙමාපියන්

මෝර්මන්ගේ පොත ආරම්භවන්නේ මෙම වචනවලිනි: "මම, නිෆායි, යහපත් දෙමාපියන්ගෙන් උපත ලැබ, එනිසාම මගේ පියාගේ සියලුම ඉගෙනීමෙන් යම් ප්‍රමාණයක ඉගෙනීමක් ලැබුවෙමි" (1 නිෆායි 1:1). ස්වර්ගයේ වැඩසිටින අපගේ පියාණන්වහන්සේගේ හැම ළමයෙක්ගේම පෞද්ගලික ජර්නලය යහපත් දෙමාපියන් ලැබ සහ ඔවුන් විසින් උගන්වනු ලැබීම—යන වාක්‍ය කණ්ඩයෙන් ආරම්භවන්නේ නම්, මෙම ලෝකය කෙතරම් වෙනස් එකක් වනු ඇත්ද.

අපි ජීවත්වන්නේ ඉතිහාසයේ එවන් විශේෂිත කාලයකය, ස්වාමීන්වහන්සේගේ සුභාරංචිය එහි පූර්ණත්වය සහිතව නැවත පිහිටුවූ කාලයකය. අපගේ ධර්මදූත බලකාය ගුණයෙන් සහ ගණනින්ද වැඩිවෙමින් සිටියි; මෙලෙස, සුභාරංචිය භාෂා වැඩි ප්‍රමාණයකට සහ ජාතීන් වැඩි ප්‍රමාණයකට සහ කිසිදා නොවූ පරිදි සවන්දෙන කන් විශාල ප්‍රමාණයකට උගන්වනු ලැබේ. ලෝකයේ බොහෝ ප්‍රදේශවල කොට්ඨාශ සහ ස්ටේක් ගොඩනැගෙමින් තිබියදී, නිර්මානාත්මක සිත් ප්‍රබෝධමත්වී සංනිවේදන උපකරන වැඩිදියුණුකරමින්, අනාගතවක්තෘවරුන්ගේ උපදෙස් වඩ වඩාත් ජනතාවගේ කන්වලට ගෙනඒමට එමගින් හැකිවී ඇත. සුභාරංචියේ යහපත් ආරංචිවලට දැන් වඩාත් වේගවත්ව පැතිරෙමින් මනුෂ්‍ය වර්ගයාගේ හදවත්වලට සදාකාලික බලාපොරොත්තු ගෙන ඒමට හැකිය.

### අර්බුද සහිත පවුල් ජීවිත

සුභාරංචියේ එක් ශ්‍රේෂ්ඨ පණිවුඩයක් වන්නේ, පවුල් ඒකකයේ සදාකාලික ස්වභාවය පිළිබඳ දහමය. පවුල් ජීවිතයේ වටිනාකම සහ වැදගත්කම ගැන අපි ලෝකයාට ප්‍රකාශ කරන්නෙමු, නමුත් අද ලෝකයේ පවතින අප දකින බොහෝ ව්‍යාකූලතාවයන් සහ අසීරුකම් පවුලේ පිරිහීම නිසා බව සොයාගෙන ඇත. ළමයින්ට ප්‍රේමනීය දෙමාපියන් මගින් උගන්වා පුහුණුකිරීමේ නිවාස අත්දැකීම් අඩුවෙමින් පවතී.

ළමයින් සහ දෙමාපියන් එකට එක්ව අධ්‍යයනයකිරීම, ක්‍රීඩාකිරීම, සහ වැඩකරමින් කථාබස් කිරීම, වෙනුවට, අද ඉක්මනින්, පෞද්ගලිකව, උදුනක පිසින රාත්‍රී කෑමකට සහ සැන්දෑ කාලය රූපවාහිනිය ඉදිරියේ කාලය ගතකිරීමට වෙන්වී ඇත. 1991දී ජාතික රාජ්‍ය සම්මේලනය, සෝල්ට් ලේක් නගරයේ රැස්වී, නිවසේ බලපෑමේ අඩුපාඩුව අපගේ ජාතීන්ගේ අර්බුද පැනනැගීමේ අවස්ථාකට පත්වී ඇති බව සිතා ඔවුන්ගේ රැස්වීමේ කාලය ඔවුන්ගේ ප්‍රශ්න ගැන සාකච්ඡාකරමින් ගතකළහ. සෑම පවුලකටම සාර්ථකවීමට හැකි අවස්ථා වැඩිකරගත හැකි මූලික සංකල්ප පහක් ඔවුහු හඳුනාගත්හ.

පළමුවැන්න, පවුලේ ක්‍රියාකාරකම් තුලින් සම්බන්ධකම් ශක්තිමත්කිරීම; දෙවැන්න, සාධාරණ නීති සහ බලාපොරොත්තු පිහිටුවාගැනීම; තුන්වැන්න, ආත්ම ගෞරවය ගොඩනගාගැනීම; හතරවැන්න, ඉටුකරගත හැකි ඉලක්ක තැබීම; සහ පස්වැන්න, කාලානුරූපව පවුලේ ශක්තිය සහ අවශ්‍යතාවයන් ඇගයීම.

කාලයේ මුල් ආරම්භයේදීම අපගේ අනාගතවක්තෘවරුන්ගේ හදිසි අනතුරු ඇඟවීමේ හඬ හදිසියේම පැමිණීමට විශේෂිත හේතුවක් ඇත. අපට උපදෙස් දී දිරිගන්වා තිබෙන පරිදි, අපගේ පවුල්වල අයට අප ඇහුම්කන්දී, අපගේ ධර්මදූත කටයුතු වැඩිකරමින් අන් අයට සත්‍යය

සහ පවුල් ඒකකයේ වැදගත්කම ගැන අවබෝධයක් ලබා දිය යුතුය.

### ආදම් සහ ඒව දෙමාපිය රාජකාරීන් ඉගෙනගනිති

මුල් ආරම්භයේදී, ආදම්ට සහ ඒවට දුන් ස්වාමීන්වහන්සේගේ උපදෙස්වලින් දෙමාපියන්ගේ වගකීම් ගැන ඔවුන්ට පැහැදිළි කෙරින. ඔවුන්ගේ කාර්‍යභාරය විස්තර කෙරින. ඔවුන්ට ස්වාමීන්වහන්සේගේ උපදෙස් ලැබුන පසුව, ඔවුන් එතුමාගේ උපදෙස් අනුගමනයකරමින් මෙසේ කියනු අපට පෙනේ:

තවද එදින ආදම් ස්වාමීන්වහන්සේට ආශිර්වාදකර, පිරිගොස්, තවද පොළොවේ සියලුම පවුල් සම්බන්ධයෙන් අනාවැකි කියමින්: දෙවියන්වහන්සේගේ නාමයට ආශිර්වාදිත වේවා, මන්ද මගේ වරද නිසා මගේ ඇස් ඇරින, එසේම මේ ජීවිතයේදී මා සතුට ලබාගෙන, නැවතත් මම මාංශාකාරයෙන් දෙවියන්වහන්සේ දකින්නෙමියි කීවේය.

"තවද ඒව, ඔහුගේ භාර්‍යාව, මේ සියල්ල අසා සතුටුව මෙසේ කීවාය: අපගේ වරද නිසා නොවේ නම්, අපට කිසිදා දරුවන් ලැබීමට සහ යහපත සහ නපුරද, අපගේ මිදීමේ සතුට සහ දෙවියන්වහන්සේ සියලුම කීකරුවන්නන්ට දෙන සදකාලික ජීවනයද ලබාගත නොහැකිවන්නේය.

තවද ආදම් සහ ඒව දෙවියන්වහන්සේගේ නාමයට ආශිර්වාද කර, ඔවුහු සියලුම දේවල් ඔවුන්ගේ පුතුන්ට සහ දියණියන්ට දැනගැනීමට සැලැස්සූහ (බලන්න මෝසෙස් 5:10–12).

### ළමයින්ට උගන්වා පුහුණුකරන්න

එසේය, මුල් ආරම්භයේදීම තම ළමයින්ට ඉගැන්වීමේ දෙමාපිය වගකීම්, අපගේ පොළොවේ දෙමාපියන්ට ස්වාමීන්වහන්සේ දුන් උපදෙස් අතර තිබුනි.

සභාව පිහිටුවූ විට ලැබුන එළිදරව් වර්තමානයේදී නැවතත් තම ළමුන්ට උගන්වා පුහුණුකිරීමේ යුතුකම් ගැන දෙමාපියන්ට අවවාදකරයි. දහම සහ ගිවිසුමේ අනූ-තුන් වැනි කොටසේ තම පවුලේ වගකීම් ගැන අවධානය යොමු නොකරන සමහර සොහොයුරන්ට ස්වාමීන්වහන්සේ තරවටු කරනු අපට දැකිය හැකිය. ශුද්ධ ලියවිලිවල මෙසේ කියවේ:

"නමුත් නුඹලාගේ දරුවන් අලෝකය සහ සත්‍යය තුලින් ඇති දැඩි කිරීමට මම නුඹලාට නියෝගකර ඇත….

"නියෝගයට අනුව නුඹලාගේ දරුවන්ට නුඹලා ආලෝකය සහ සත්‍යය උගන්වා නැත; තවද එම දුෂ්ඨ තැනැත්තාට, තවමත්, නුඹලා කෙරෙහි බලය ඇති අතර, නුඹලාගේ පීඩාවලට හේතුව මෙයයි.

තවද දැන් ස්වාමීන්වහන්සේ අපට පණතක් දෙමින්—අපව ගලවාගැනීමට නම්, අප අපගේ නිවාසවල පිළිවෙලක් ඇතිකල යුතුය, මන්ද අපගේ නිවාසවල පිළිවෙලකට නැති බොහෝ දේවල් ඇත (බලන්න ඩීසහගී 93:40, 42–43).

### පවුල් නිවාස සැන්දෑවේ වැදගත්කම

වසර ගණනකට පෙර සතිපතා පවුල් නිවාස සැන්දෑව පැවැත්වීමට සභාව සියලුම දෙමාපියන්ට අවාද කළේය. අද එම අවවාදය සභා සාමාජිකයන්ගේ නිවාසවල ස්ථාපනයවී ඇත. සඳුදින රාත්‍රිය පවුල්වලට එකට එකතුවීමේ සැන්දෑවක් ලෙස වෙන්කර ඇත. සභා ක්‍රියාකාරීත්වයන් හෝ සමාජ හමුවීම්වලට මෙදින රාත්‍රී බාර නොගත යුතුය. මේ සම්බන්ධයෙන් අපගේ පවුල් ඇදහිලිවන්ත නම්, විශාල ආශිර්වාද ඔවුන්ට පොරොන්දුවී ඇත.

සභාපති හැරල්ඩ් බී. ලී වරක් අපට මෙසේ උපදෙස් දී ඇත:

"දැන් මෙය සිහියේ තබාගන්න; එනම් එලිජාගේ මෙහෙය සම්පූර්ණයෙන්ම තේරුම්ගෙන, ළමයින්ගේ සිත් පියවරුන් වෙතටද, පියවරුන්ගේ සිත් ළමයින් වෙතටද හැරෙනු ඇත. එය තිරයෙන් එහා පැත්තට අදාළවන ලෙසම, තිරයේ මේ පැත්තටද අදාළවේ. අපි අපගේ මෙහි වගකීම් වන පවුල් නිවාස සැන්දෑ රාත්‍රිය මෙහි නොපවත්වා අපි අපගේ පවුල් නොසලකා හරින්නේ නම්, අපගේම නොසැලකිල්ල තුලින් අපි යම් දේවල් නැතිකරගන්නා විට ස්වර්ගය අප දෙස බලන්නේ කෙසේද? අපගේ පරම්පරාව තුලින් ස්වාමීන්වහන්සේ විසින් එවන ලද අයගේ ගැලවීම සඳහා අප අපට හැකි සියල්ල කරන තුරු, ස්වර්ගය ස්වර්ගයක් නොවන්නේය

ඉන්පසු ඔහු මෙසේ කීවේය:

"එනිසා, ඔබ තුල එලිජාගේ සත්‍ය ආත්මය තිබේනම්, පියවරුන් සහ මවුවරුන් වන ඔබලාගේ සිත් දැන්මම ඔබලාගේ දරුවන් වෙත හැරවිය යුතුය. එසේම එය තිරයෙන් එහා සිටින අයට පමණක්ම අදාළවන බව නොසිතන්න. ඔබලාගේ සිත් ඔබලාගේ දරුවන් වෙත හරවා, ඔබගේ දරුවන්ට උගන්වන්න; නමුත් ඔබ එය කල යුත්තේ නිසි ලෙස ඉගැන්වීමට ඔවුන් ප්‍රමාණවත් ලෙස වැඩුන විටදීය. තවද ඔබ ඔබගේ පවුල් නිවාස සැන්දෑව නොසලකා හරින්නේ නම්, ඔබ එලිජාගේ මෙහෙය ආරම්භකිරීම නොසලකා හරින්නේ, ඔබ ඔබගේ පෙළපත් ඉතිහාස තොරතුරුද ස්ථිර ලෙසම නොසලකා හරින්නාක් ලෙසය" (*Relief Society Courses of Study* තුලිනි, *1977–78* [1977], 2; ඉතාලි අකුරු ඇතුළත්ය).

අපගේ පවුලේ මුල් කාලය ගැන සහ අපගේ ළමයින් නිවසේ සිටින විට අප ගත කල ප්‍රීතිමත් කාලය ගැන මම නිතරම සිතුවෙමි. එම කාලය ගැන මම මානසික ඇගයීමක් කර, එම කාලය තුල නැවත වරක් ජීවත්වීමට අපට වාසනාව තිබේනම් අපගේ පවුල් සංවිධානය සහ පාලනය තුල මා කරන වෙනස්කම් ගැන සිතුවෙමි. නැවත වරක් බාල ළමුන් අපගේ නිවසේ සිටීමේ එම වරප්‍රසාදය මට ලබා දුනහොත්. වැඩි දියුණු කරගත යුතු අංශ හතරක් මම නිශ්චයකරන්නෙමි.

පළමුවැන්න වන්නේ, ස්වාමිපුරුෂයා සහ බිරිඳ ලෙස පවුලේ විධායක කමිටු රැස්වීමේ ඉගෙනගැනීම්, කථාබස් කිරීම, සැලසුම්කිරීම සහ දෙමාපියන් ලෙස අපගේ කාර්‍යභාරය හොඳින් ඉටුකිරීමට සංවිධානය කිරීම සඳහා වැඩිපුර කාලයක් ගතකිරීමය.

මා කැමති දෙවැනි වරය නම්, මට එම කාලය නැවතත් ලැබේනම්, පවුලේ කාලය වැඩිපුර ගතකිරීමය. මෙයට ඇතුළත්වන්නේ, වඩාත් එකාකාරී ලෙස, අර්ථවත් පවුල් නිවාස සැන්දෑවන් පැවැත්වීමය.

### සාර්ථකත්වයට තරුණ අයගේ දායකත්වය

පවුල් නිවාස සැන්දෑව සැලසුම්කිරීම සහ සූදානම්කිරීමේ සම්පූර්ණ බර දෙමාපියන්ට පමණක් නොදිය යුතුය. මා දැක තිබෙන ඉතා සාර්ථක ඒවා නම් පවුලේ තරුණ අය සහභාගිවූ ඒවාය.

ශ්‍රේෂ්ඨ උපස්ථායකවරු, ගුරුවරු, සහ පූජකවරු වන ඔබලාද, බීහයිව් ගැහැණු ළමයි, මියා මේඩ් සහ ලෝරල් ළමයින් වන ඔබලාද, ඔබලාගේ පවුල් නිවාස සැන්දෑවන් සාර්ථකකිරීමට ප්‍රධානතම දායකත්වයක් ලබාදෙයි. බොහෝ නිවාසවල ඔබලා පවුලේ හෘදසාක්ෂියයි. අන්තිමේදී, මෙම අත්දැකීමෙන් වඩාත් ප්‍රතිඵල ලබන්නේ ඔබලාය, ඔබලාට සමාදානය, ආරක්ෂාව, සහ ප්‍රස්ථාවන් සහිත ලෝකයක ජීවත්වීමට අවශ්‍ය නම්, ඔබ දායකවන පවුලට ඔබගේ යහපත, එසේය, මුළු ලෝකයටම යහපත සැලැස්විය හැකිය.

එක් වර්ෂයක නත්තල් නිවාඩු කාලයේ අපගේ මුනුපුරන් සමග අපි චාරිකාවක් යන විටදී ඇතිවූ මෙම සිද්ධිය උදාහරණයක් වශයෙන් මට සිහිපත්වේ. සැබෑ එකතුවීමක අත්දැකීමක් ලබාගැනීම සඳහා, එකට ගමන්කිරීමට අපි වෑන්එකක් සංවිධානය කළෙමු. වෑන් එක තුල සීයා, ආච්චී, සහ මගේ පුතා සහ ඔහුගේ වැඩිමහල් ළමයින් තුන්දෙනාද වූහ. මගේ පුතාගේ බිරිඳ පවුලේ බාල සාමාජිකයා සමග නිවසේ නතරවිය. මම මගේ වාරයේදී රථය පදවාගිය අතර, මගේ බිරිඳ මා ලඟ වාඩිවී මගපෙන්වන්නා ලෙස සිටියාය. වෑන් එකේ පිටුපසින්, ඔඩ්රි, වැඩිමහල්ම ළමයා, ඇයගේ පියා සමග සාකච්ඡාකරනු මට ඇසින. ඇය සිය පියාට, "තාත්තා, මේ වර්ෂයේ අපගේ පවුලේ අධ්‍යයන කටයුතුවල අපගේ එක් ඉලක්කයක් නම්, මෝර්මන්ගේ පොත කියවා නිම කිරීමය. වර්ෂයේ අන්තිම දිනය අදයි. අපි කාල සටහන අනුව කටයුතුකරමින්, අපට දැන් එය නිම කිරීමට නොහැකිද?" යයි ඇසුවාය.

මගේ පුතා සහ ඔහුගේ ළමයින් තුන් දෙනා, එකිනෙකා තම වාර අනුව මොරෝනි අවසන් පරිච්ඡේද ශබ්දනගා කියවමින්, ඔවුන්ගේ ඉලක්කය වන මෝර්මන්ගේ පොත සම්පූර්ණ කිරීම අසාගෙන සිටීම කෙතරම් විශේෂිත අත්දැකීමක්ද? මෙම යෝජනාව ගෙනාවේ තරුණ කාන්තාවක් මිස, දෙමාපියන්ගෙන් කෙනෙක් නොවන බව මතකතබාගන්න,

### තරුණ පක්ෂයට අභියෝගයක්

ඔබ මනුෂ්‍ය වර්ගයාගේ ඉතිහාසයේ මෙම විශේෂිත කාලය සඳහා වෙන්කලාවූ—තෝරගත් පරම්පරාවකි. ඔබ අයත්වන පවුල්වල වැඩීම සහ වර්ධනයට එකතුකිරීම සඳහා ලබාදීමට බොහෝ දේවල් ඔබට ඇත. ඔබ සතු එම විශේෂිත යොවුන් වියේ, උනන්දුශීලී ආකල්පයෙන් යුතුව, ඔබගේ පවුල් ඒකකය තුල ඉදිරියට පිය නගා, ඔබගේ නිවාස තුල සුභාරංචිය සැබැවින්ම ජීවමානවීමට කටයුතු කිරීම සඳහා මම ඔබට අභියෝගකරමි. සභාපති ජෝසෆ්. එෆ් ස්මිත් පැවසූ මෙම උපදේශය සිහිපත්කරන්නඃ

"මගේ කැමැත්ත වන්නේ, මගේ ළමයින් සහ සයෝනයේ සියලුම ළමයින්, අනාගතවක්තෘ ජෝසෆ් ස්මිත් තුලින් මෙම පසු-දවස්වලදී පොළොව මත නැවත පිහිටුවූ සුභාරංචිය ගැන අවබෝධය තරම් වටිනා දෙයක් මෙම ලෝකයේ තවත් නැති බව දැනගැනීමය. එහි නැතිවීමට වන්දිගෙවිය හැකි වෙනත් කිසිවක් නැත. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන දැනගැනීමේ උත්කෘෂ්ඨභාවයට සමකල හැකි වෙනත් කිසිවක් පොළොව මත නැත. එමනිසා සයෝනයේ සියලුම දෙමාපියන් තම ළමයින් රැකබලා ගනිමින්, ඔවුන්ට සුභාරංචියේ මූලධර්ම උගන්වමින්, හැකි තරම් පරිශ්‍රම දරමින් ඔවුන්ගේ රාජකාරිය කිරීමට ඔවුන්ට කිව යුතුය—පුරුද්දට මෙන් නොව, මන්ද එය කිරීමට ඔවුන්ගෙන් ඉල්ලනු ලැබේ, නමුත් සත්‍යයේ ආත්මය සහ සුභාරංචියට නොවෙනස් ආදරය බිඳෙන් බිඳ ළමුන්ගේ සිත් තුලට දැමීමට උත්සාහ කරන්න, එවිට ඔවුන් තම රාජකාරිය කිරීම තම දෙමාපියන්ට ප්‍රසන්න නිසා එසේ කරනවා පමණක් නොව, නමුත් එය ඔවුන්ටද ප්‍රසන්න නිසා, ඔවුන් එය කරනු ඇත" (Brian H. Stuy තුලිනි, සංස්., *Collected Discourses Delivered by President Wilford Woodruff, His Two Counselors, the Twelve Apostles, and Others,* 5වෙනි වෙළුම. [1987–92], 5:436).

### පවුල් නිවාස සැන්දෑව නැවත-ප්‍රාණවත්කරන්න

පවුල් නිවාස සැන්දෑවන් දෙමාපියන් දෙදෙනාම සිටින නිවසක් වුවද, එක-දෙමාපියෙක් සිටින නිවසක් වුවද, නැතහොත් එක් සාමාජිකයෙක් සිටින පවුල් ඒකකයක් වුවද, එය සෑම දෙනා වෙනුවෙන්ය. නිවාස ගුරුවරුනි, ඔබගේ ක්‍රමානුකූල බැහැදැකීම්වලදී, පවුල් නිවාස සැන්දෑව පැවැත්වීමට දිරිගන්වා එය ප්‍රාණවත්කිරීමට අපි ඔබෙන් ඉල්ලමු.

අපගේ වර්තමාන අනාගතවක්තෘවරයා වන, සභාපති එස්රා ටැෆ් බෙන්සන්, පවුල් නිවාස සැන්දෑව පැවැත්වීමේ අවශ්‍යතාවය සහ සාර්ථක එකක ඇතුළත් අංගයන් ගැනද අපට නැවත වරක් සිහිපත්කළේය. ඔහු මෙසේ කියා ඇතඃ

"සැලසුම්කර තිබෙන්නේ පවුල සහා [පවුල] ශක්තිමත්කර ආරක්ෂාකිරීමටය, හැම සතියකම රාත්‍රියක නිවාස සැන්දෑ වැඩසටහන පිහිටුවා තිබෙන්නේ පියවරුන්ව සහ මවුවරුන්ව ඔවුන්ගේ පුතුන් සහ දියණියන් නිවස තුල ඔවුන් වටා එක්රැස් කිරීමට ඒ වෙනුවෙන් වෙන්කිරීමටය. යාච්ඤාව පුදනු ලැබේ.

ගීතිකා වෙනත් ගීත ගායනාකරනු ලැබේ. ශුද්ධ ලියවිලි කියවනු ලැබේ, පවුලේ මාතෘකා සාකච්ඡා කෙරේ, දක්ෂතා ප්‍රදර්ශනය කෙරේ, සුභාරංචියේ මූලධර්ම ඉගැන්වේ, තවද බොහෝ විට ක්‍රීඩා පවත්වා, නිවස් සෑදූ අහාර පාන බෙදා දෙනු ලැබේ." (Conference Report තුලිනි, Philippine Islands Area Conference 1975, 10).

අපගේ අපේක්ෂාව වන්නේ ඔබ හැම කෙනෙක්ම අනාගතවක්තෘවරයා සඳහන් කල පවුල් නිවාස සැන්දෑවක ඇතුළත් විය යුතු එම යෝජනා හැම එකක්ම ලියා තබාගැනීමය.

ඉන්පසුව ඔහු මෙසේද කීවේය: "දැන්, සතිපතා [පවුලේ] නිවාස සැන්දෑව පවත්වන අයට දෙවියන්වහන්සේගේ අනාගතවක්තෘවරයා විසින් පොරොන්දු ආශිර්වාද මේවාය: 'ශුද්ධවන්තයන් මෙම උපදේශයට කීකරුවන්නේ නම්, විශාල ආශිර්වාද ප්‍රතිඵල ලෙස ලැබෙන බවට අපි පොරොන්දු වන්නෙමු. නිවසේ ප්‍රේමය සහ දෙමාපියන්ට කීකරුකම වැඩිවෙනු ඇත. ඉශ්‍රායල් තරුණයන්ගේ සිත් තුල ඇදහිල්ල වර්ධනයවී, ඔවුන්ව වටකරගෙන සිටින නපුරු බලපෑම් සහ පෙළඹවීම් හා සටන්කිරීමට ඔවුන්ට බලය ලැබෙනු ඇත'" (Conference Report තුලිනි, Philippine Islands Area Conference 1975, 10; තවද බලන්න *Improvement Era,* ජූනි 1915, 734).

අපගේ අනාගතවක්තෘවරයාගේ උපදේශය අනුගමන යකිරීමට අපි ඔබ හැම කෙනෙක්ම දිරිමත් කරමු. සභාව මුළුල්ලේම සිටින සියලුම පවුල් ඒකක තුල, ක්‍රමානුකූල පවුල් නිවාස සැන්දෑවන් පැවැත්වීමෙන් ඔබට ඇතිවන වර්ධනය නැවතත් ඇගයීමකට ලක්කරන්න. මෙම වැඩසටහන අදාළකරගැනීමෙන් අපගේ කාලයේ නපුරට විරුද්ධවීමට ඔබට පළිහක් සහ ආරක්ෂාවක්වී, පෞද්ගලිකව සහ පොදුවේ ඔබට ශ්‍රේෂ්ඨතම සහ අසීමිත සතුටක් දැන් සහ මෙයින් පසුව සදාකාලිකවම ලැබෙනු ඇත.

පවුල් සාමාජිකයන් ලෙස එකට එක්ව අප සාකච්ඡාකරන විට, මෙම අති විශාල වැදගත් වැඩසටහනට නව පණක් දෙමින් ශක්තිමත්කිරීමට දෙවියන්වහන්සේ අපට ආශිර්වාද කරනසේක්වා.

1994€ අප්‍රේල් මස Church General Conference හි හි වැඩිහිටි පෙරී කළ කථාවකිනි (බලන්න Conference Report, අප්‍රේ. 1994, 47–51; හෝ *Ensign,* මැයි 1994, 36–38).

# යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ

පසුදවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාව

SINHALA

4 02363 57408 0

36357 408